
4. සො'පි තස්සා පටිබද්ධචිත්තො තං මහාගාමං නෙසි. තතො සා තත්‍ථ ගන්ත්වා තස්ස ගෙහෙ වසමානා නිච්චමෙ'ව අට්ඨන්නං භික්ඛූනං සලාකභත්තං දෙති. නිච්චං ධම්මං සුණාති. චෙතිය බොධියාදීනි වන්දන්තී පුඤ්ඤමෙ'ව කරොති. අථෙකදිවසං සා ආසනසාලං ගන්ත්වා භික්ඛූනා වෙය්‍යාවච්චං කුරුමානා කාලං වීතිනාමෙසි. තස්සා පන සාමිකෙ අස්සඩො, තස්මා තං ගෙහමා'ගතෙ

ත්වං පුඤ්ඤකම්මං කරිස්සාමී'ති ගෙහෙ කිංචි කම්මං න කරොසී'ති තස්සා කුජ්ඣිත්වා ගෙහතො නීහරි. සා පන සත්ත දිවසං ඡඩ්ඩිත පතිතගෙහ කුඩ්ඩං නිස්සාය නිරාහාරා වසමානා නිස්සං සයෙන අත්තනො ජහිතභාවං ඤත්වා අනුරාධපුරෙ මම මාතා පිතුන්න, සන්තිමෙ'ව ගමිස්සාමී'ති අනුරාධපුරගාමී මග්ගං පටිපන්නා තත්ථ තත්ථ චෙතියබොධියාදීනි වන්දන්ති අනුපුබ්බෙන නිග්‍රොධසාලඛණ්ඩද්වාරං සම්පාපුණි. අහො, සෙරිචාරිවිහාරිනං එවමෙව පරිහානි හොති-තථාහි.

5. ඛුද්දකං වා මහන්තංවා ඉට්ඨානිට්ඨං කිරියාවිධිං
මාතාපිතාදි වුද්ධානං අනුඤ්ඤායෙ'ව කාරයෙ.

6. ලහන්තෙනා'පි වෙ රජ්ජං නිවජ්ජාය ජනකෙ ජනෙ
බහුමන්තබ්බො න සො ලාහො අනුජාතෙන සූනුනා

7. අනනුඤ්ඤාය වුඩ්ඪෙහි කතං යං අබ්භුතං'පි ච
ගරහන්තානස්සවො එසො සෙරිචාරී'තී ඤාතකා.

8. අනුද්ධතො අචපලො නිපකො සංවුතින්ද්‍රියො
පසංසා ලහතො පුත්තො වුඩ්ඪිං පප්පොති සබ්බසො'ති.

9. සා පනෙසා සද්ධා සුමනා මාතාපිතුන්නං අනාරොචෙත්වා ආගතත්තා එත්තකං දුක්ඛමනුභවි, අථ තත්ථ ඨිතං තං දෙවමනුස්සෙසු චාරිකං චරමානො සක්කො දෙවානමින්දො දිස්වා සද්ධා එසා වත්ථුත්තයමාමිකා'චින්තෙත්වා මහල්ලකවණ්ණෙන හත්තපුටමාදාය තස්සාහි මුඛෙ පාතුභවිත්වා තස්සා සන්තිකං ගන්ත්වා කුහිං ගච්ඡසි අම්මා'ති පුච්ඡි. තාය අනුරාධපුරං ගච්ඡාමීති වුත්තෙ සක්කො ත්වං අතිවිය ජාතරූපාසි. ඉමං හත්තං භුඤ්ජා'ති හත්තපුටං අදසි. සා හත්තපුටං ගහෙත්වා ඉමස්මිං ඨානෙ උදකං නත්ථීති ති වත්වා අට්ඨාසි. සක්කො තස්සා අවිදූරෙ ඨානෙ සුපුප්ඵිතං එකං පොක්ඛරණිං දස්සෙසි. සා පොක්ඛරණිං ගන්ත්වා නහාත්වා හත්තපුටං ගහෙත්වා හත්ථෙ ධොවිත්වා ඨිතා කාලං ඔලොකෙත්වා පුරෙහත්තං තාව අයං'ති ඤත්වා කාලං සොසෙසී, තං සුත්වා තලඞ්ගරසමුද්දපබ්බතවාසී මහාධම්මදින්නථෙරො නිරොධ සමාපත්තිං සමාපජ්ජිත්වා සත්තමෙ දිවසෙ නිරොධා වුට්ඨිතො පත්ත චීවරං ගහෙත්වා තස්සාවිදූරෙ පාකටො අට්ඨාසි. අථසා ථෙරං දිස්වා පසන්නමානසා පත්තං ගහෙත්වා හත්තං පූරෙත්වා ථෙරස්ස දත්වා මුහුත්තං තිට්ඨථ හන්තෙ'තී වත්වා පටිච්ඡන්නට්ඨානං පවිසිත්වා සාඛා භඞ්ගං නිවාසෙත්වා අත්තනා නිවත්ථ වත්ථං ධොවිත්වා චුම්බටකං කත්වා ආදසි. ථෙරො සා මං පස්සතූ'ති අධිට්ඨාය වත්ථුචුම්බටකෙ පත්තං ඨපෙත්වා ආකාසමබ්භුග්ගන්ත්වා විහාරමෙව අගමාසි. සාපි තථා ගච්ඡන්තං ථෙරං දිස්වා පීතියා ඵුටසරීරා ථෙරෙ දස්සනපථමතික්කන්තෙ පඤ්චපතිට්ඨිතෙන වන්දිත්වා දින්නාව සෙසහත්තං භුත්වා අනුරාධපුර මග්ගං පටිපජ්ජි

10. තස්මිං ඛණෙ තස්මිං නිග්‍රොධෙ අධිවත්ථා දෙවතා එකස්මිං

පසිබ්බකෙ අට්ඨදිබ්බවත්ථං ඨපෙත්වා එකස්මිං පස්සෙ දිබ්බ හත්තං ච ඨපෙත්වා දිබ්බමය ගුළපූවෙ ච පූරෙත්වා සකටයොග්ගං ආරුය්හ තං තත්ථ ඨපෙත්වා සකටං පාජෙන්තො තස්සාවිදූරට්ඨානෙ, පාකටො හුත්වා කුහිං ගච්ඡථ අම්මා'ති පුච්ඡි. තාය අනුරාධපුරං ගච්ඡාමී'ති වුත්තෙ තෙන හි ආගච්ඡ ඉමස්මිං. සකටෙ නිසීද. අහම්පි තත්ථ ගච්ඡාමී'ති. සා සාධු අය්‍ය, තයා සද්ධිං පච්ඡතො ගච්ඡාමි සාඛං නිවාසෙත්වා සකටෙ නිසීදිතුං න සක්කා'ති ආහ. තතො සො තස්සා එකං දිබ්බවත්ථං අදසි. ඉමං නිවාසෙත්වා සකටං ආරුය්හථා'ති. සා තං නිවාසෙත්වා සකටා ආරුහි. තං පන සකට දෙවානුභාවෙන මුහුත්ත මත්තෙන චෙතියගිරිං සම්පාපුණි. තද දෙවපුත්තො ගුළපූව තින්තිණිකස්මිං සකටං නිවත්තෙත්වා ඉතො පට්ඨාය මයා ගන්තුං න සක්කා'ති වත්වා පසිබ්බකං තස්සා දත්වා අන්තරධායි. තද තත්ථ නිබ්බත්තා තින්තිණිකදෙවතා තං පසිබ්බකමාදය ගච්ඡන්තිං. දිස්වා තස්සා වෙය්‍යාවච්චකරො හුත්වා තස්සා හත්ථතො තං සබ්බං ගහෙත්වා අනුරාධපුරං පත්වා මහාපාලියං භික්ඛූනං ඔසරණවෙලාය තත්ථ ඨපෙත්වා අන්තරධායි. තතො සා භික්ඛූ දිස්වා පසන්නමානා සා පඤ්චමහාවාසෙ නෙකසතානං භික්ඛූනං ච භික්ඛුණීනඤ්ච දිබ්බහත්ත දිබ්බපූව දිබ්බ සාටකෙ ච අදසි.

11. තද රාජා විහාරං ගච්ඡන්තො මහාපාලියම්හි ඨපිතං එතං සබ්බං දිස්වා පසන්නමානසො කෙනිදං දින්නං ති පුච්ඡි. මනුස්සා සද්ධා සුමනාය දින්නභාවං කථෙසුං. රාජා තං පක්කොසාපෙත්වා දනස්සාගමනං පටිපුච්ඡි. සා තං සබ්බං විත්ථාරෙත්වා කථෙසි. රාජා තස්සා තුස්සිත්වා අත්තනො අග්ගමහෙසිත්තෙන අභිසෙකමදසි.

සා අභිසෙකං පත්වා රාජානං ආදිං කත්වා සකල නගර වාසීනං දිබ්බවත්ථමෙව අදසි.

අට්ඨ දිබ්බසාටකානි පරික්ඛයං නාගමිංසු. සා තතො පට්ඨාය දනාදීනි පුඤ්ඤානි කත්වා දෙවලොක පරායණා අහොසී'ති.

සද්ධාබලං පස්සථ භො ජනානං<br>
ඉධෙව දෙවා තමුපාසයන්ති,<br>
කථන්නු දෙවෙසු ච මානුසෙසු<br>
පරත්ථ තෙසං මහතිං විභූතිං.

**සද්ධාසුමනාය වත්ථුං දසමං**

**උත්තරොළිය වග්ගො ඡට්ඨො.**

# රසවාහිනී
## වනරත්ත ව්‍යාඛ්‍යා

# ලඞ්කාදීපුප්පත්ති වත්ථූනි.
### මිගපොතක වග්ගො පඨමො
### නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

## 1. මුව පැටියාගේ කථාව

**(5) 1. මිගපොතකස්ස, මුවපැටියාගේ: වත්ථුම්හි, කථා වස්තුවෙහි: අයං, මේ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. සීහල දීපෙ කිර, ලක්දිව වනාහි: උද්දලොලක විහාරං නාම, උද්දලොලක විහාර නම්; එකං රමණීයං විහාරං, එක් සිත් කළු විහාරයක්: අහොසි, විය. තද, එකල්හි: විහාරොපවනෙ, විහාර සමීප වනයෙහි: බහූ මිග සූකරා, බොහෝ මුවෝ හා ඌරෝ: වසන්ති, වසති. අථ, එකල්හි: එකස්මිං ගාමෙ, එක් ගමක: නෙසාද පුත්තො, වැදි පුතෙක්: තස්මිං, එහි: බහූ මිග සූකරෙ, බොහෝ මුවන් හා ඌරන්: දිස්වා, දැක: එකං දිවසං, එක් දවසක්: එකස්මිං පදෙසෙ, එක් පැත්තක: කොට්ඨකං කොටුවක්: කත්වා, කොට: වනපරියන්තෙ, වනයෙහි කෙළවර: පණ්ණං බන්ධිත්වා, කොළ අතු බැඳ: ධනු කලාපං, දුන්න හා හියවුර: පග්ගය්හ, රැගෙන: මිගා, මුවන්ගේ: ආගමනං, පැමිණීම: ඔලොකෙන්තො, බලමින්: කොට්ඨකෙ, කොටුවෙහි: අට්ඨාසි, සිටියේය. අථ, ඉක්බිති: එකො මිගො, එක් මුවෙක්: තත්ථ, එහි: ගොචරං, ගොදුරු: ගණ්හිත්වා, ගෙන: පානීයං, පැන්: පාතුං, බොන්නට: තිත්ථං, තොටට: ගච්ඡන්තො, යන්නේ: තස්මිං අස්සම පදෙ, එම ආශ්‍රමයෙහි: ධම්මසවණත්ථාය, බණ අසනු සඳහා: සුට්ඨු සද්දං, දැනුම් දුන් ශබ්දය: සුත්වා, අසා: පසාරිත ගීවො, දික් කළ බෙල්ල ඇත්තේ: උත්තුඞ්ග කණ්ණො, උඩුකුරු කරන ලද කන් ඇත්තේ: අනික්ඛිත්ත දක්ඛිණ පාදෙ. බිම නොතබන ලද දකුණු පා ඇත්තේ: (ඔසොවා ගත් පය ඇතිව) ධම්ම කථිකස්ස, ධර්ම කථිකයාගේ: සරෙ නිමිත්තං ගණ්හිත්වා, කට හඬෙහි නිමිති ගෙන: අට්ඨාසි, සිටියේ ය. තස්මිං ඛණෙ, එකෙණෙහි: නෙසාදෙ වැද්ද: තං, ඔහු: එකප්පහාරෙන එව, එක පහරින්ම: විජ්ඣිත්වා, විද: ජීවිතක්ඛයං, මරණයට: පාපෙසි, පැමිණ වීය.

2. අථ, ඉක්බිති; සො, ඒ මුවා; කාලං කත්වා, කළුරිය කොට; තත්‍ථ විහාරවාසී මහා අභය ථෙරස්ස එව, එම වෙහෙර වැසි අභය තෙරුන්ගේම; කණිට්ඨිකාය, නැගණියගේ; කුච්ඡියං, කුසෙහි; පටිසන්ධිං ගණ්හිත්වා, පිළිසිඳ ගෙන; දසමාසඩ්ඪ මාසච්චයෙන, දස එකඩ මස් ඇවෑමෙන්; මාතු කුච්ඡිතො, මවු කුසින්; නික්ඛමිත්වා බිහිවී; කමෙන, ක්‍රමයෙන්; අභිවඩ්ඪන්තො, වැඩෙන්නේ; සත්ත වස්සිකො, සත් වයස් ඇත්තෙක්; අහොසි, විය. තතො, ඉක්බිති; මාතා පිතරො, මවුපියෝ; තං, ඔහු; අභයත්ථෙරස්ස, අභය තෙරුන්ගේ; සන්තිකං, සමීපයට; නෙසුං, ගෙන ගියාහුය; සො, හෙතෙම; න චිරෙන කාලෙන, නොබෝ කලකින්; පබ්බාජෙසි, පැවිදි කරවීය. සො පන කුමාරො, ඒ කුමරා වනාහි; පුබ්බෙ, පෙර; මිග භූතෙනත්තනා, තම මුව ආත්මයෙහි; ධම්ම සවනානුභාවෙන, බණ ඇසීමේ ආනුභාවයෙන්; ඛුරග්ගෙ එව, හිස කෙස් බාද්දීම; අරහත්තං, රහත් බවට; පාපුණි, පැමිණියේ ය. තස්ස, ඔහුගේ; මාතුලත්ථෙරො පන, මයිලණු තෙරුන් වහන්සේ වනාහි; පටිලද්ධ, ලබන ලද; පඤ්චාභිඤ්ඤා, පඤ්චාභිඥා ඇත්තේ; අප්පත්ත, නොපැමිණි; අරහත්ත මග්ග ඵලො, අර්හත් මග ඵල ඇත්තේ; හොති, වේ. අථ, එකල්හි; එකස්මිං දිවසෙ, එක් දිනක්, සාමණෙරො, සාමණේරයන් වහන්සේ; පදෙසෙ එව, සවස් කාලයෙහිම; උපජ්ඣායස්ස, උපාධ්‍යායයන් වහන්සේගේ; සන්තිකං, සමීපයට; අගමාසි, ගියේ ය. අථ, ඉක්බිති; අස්ස, ඔහුගේ; උපජ්ඣායො, උපාධ්‍යායයන් වහන්සේ; හත්ථං, අත; වඩ්ඪෙත්වා, ඉදිරියට ඔසවා; පාණිනා, අතින්; චන්දමණ්ඩලං, සඳ මඬල; පරිමද්දන්තො, පිරිමදිමින්; අට්ඨාසි, සිටියේය.

සාමණෙරො, සාමණෙර තෙම; තං, එය; දිස්වා, දැක; භන්තෙ, ස්වාමීනි, එතං, මෙය; රක්ඛිතුං රකින්ට; වට්ටති ඉති, වටී යයි; ආහ, කීය. ථෙරො පන, තෙරුන් වහන්සේ වනාහි; තං, ඔහු; අග්ගඵලෙ, අග්‍ර ඵලය වූ; අරහත්තෙ, රහත් බැව්හි; පතිට්ඨිත භාවං, පිහිටි බැව්; අජානන්තො, නොදන්නේ; තස්ස, ඔහුගේ; වචනං, කීම; සම්මා, මනා කොට; මනසි, සිත්හි; න අකාසි, නො කෙළේය. අථ, එකල්හි; සාමණෙරො, සාමණේරයන් වහන්සේ; ඉද්ධියා, ඍද්ධියෙන්; චන්ද සහස්සං, දහසක් චන්ද්‍රයන්; ආහරිත්වා, ගෙනහැර; ථෙරස්ස, තෙරුන් වහන්සේට; දස්සෙත්වා, දක්වා; භන්තෙ, ස්වාමීනි, චන්ද සතං වා, චන්ද්‍රයන් සියයක් හෝ; සහස්සං වා, දහසක් හෝ; සත සහස්සං වා, ලක්‍ෂයක් හෝ; ආහරණං, ගෙනහැර දැක්වීම; න භාරියං, අමාරු නොවේ. යො පන, යමෙක් වනාහි; එකං එව තණ්හං, එකම තෘෂ්ණාව; පජහති, දුරු කෙරේ ද; සො එව, හෙතෙමේ ම; උත්තමො, උතුම්ය; තං එව, එයම; භාරියං ඉති, බැරෑරුම් යයි; වත්වා, කියා; එවං, මෙසේ; ආහා, කීය.

3. යො පුරිසො, (මුහුද දකිනු කැමැති) යම් පුරුෂයෙක් තෙම; ගන්ත්වා, ගොස්; තීරට්ඨො'ව, වෙරළ අසළ සිටම; මහම්බුධිං, මහා සාගර ජලය; දිස්වා, දැක; අපස්සිත්වා, නුවණැති හෙයින්; අයං සමුද්දො, මේ සියළු

මහ මුහුද; මයා, මා විසින්; දිට්ඨො, දක්නා ලදැයි; භාසති එව, කියන්නේ ද?

4. එවං එව, එපරිද්දෙන්ම; ඉධ, මේ ශාසනයෙහි; යො භික්ඛු, යම් භික්ෂුවක් තෙම; අද්ධුවං, සථිරව නොපවත්නා වූ; අභිඤ්ඤාණ බලං, අභිඥාවන්ගේ බලය; ලද්ධාන, ලැබ; අත්තනි, තමා කෙරෙහි; කෙචි කිලෙසෙ, කිසියම් ක්ලෙශ කෙනෙක්; වික්ඛම්භෙත්වාන, සංසිඳුවා ගෙන;

5. කිලෙසානං, කෙළෙසුන්ගේ; අප්පහන්ත්වා, ප්‍රහාණයට නොපැමිණ; ලද්ධ අත්ථො අස්මි ඉති, ලබන ලද රහත් ඵලය ඇත්තෙමි යි; මඤ්ඤති, සිතා ද;සො හි, හෙතෙම වනාහි; තණ්හා දසව්‍යථො, තෘෂ්ණාදසත්වයෙන්; අමුත්තො එව, නොමිදීම ම; වත්තති, පවතී.

6. යො භික්ඛු, යම් භික්ෂුවක්; අලක්ඛිං, ඉතා නිශ්‍රීක වූ; අසීවං, ශාන්ත භාවයක් නැත්තා වූ; භීමං, භයජනක වූ; අනපායිං, අත් නොහැර යන්නාවූ; අනත්ථදං, අනර්ථදායක වූ; තණ්හං, තෘෂ්ණාව; පජහෙ, දුරු කෙරේද; සො, ඒ මහණ තෙම; මාර බන්ධනා, මාර පාශයෙන්; මුත්තො ඉති, මිදුනේයි.

7. ථෙරො, තෙරුන් වහන්සේ; තං සුත්වා, එය අසා; විපස්සිත්වා, භාවනා කොට; තදහෙව, එදිනම; අරහත්තං, රහත් බවට; පාපුණි, පැමිණියේය.

අථ, ඉක්බිති; දුතියෙ දිවසෙ, දෙවැනි දිනයෙහි; ථෙර කණිට්ඨිකා, තෙරුන්ගේ නැගණිය; සාමණෙරෙන, සාමණේරයන්; සද්ධිං, සමග; ථෙරං, තෙරුන්ට; නිමන්තෙසි, ආරාධනා කළාය. ථෙරො, තෙරුන් වහන්සේ; භගිනිං, නැගණියට; එවං, මෙසේ; ආහ, කීය. උපාසිකෙ, උපාසිකාවෙනි, තයා, තී විසින්; අජ්ජ, අද; බහු භික්ඛු, බොහෝ භික්ෂූන්; දිස්වා, දැක; චිත්තං, සිත; පාසාදෙ තබ්බං, පැහැදිය යුතුයි. පිට්ට්ංසො පන, දන කොටස වනාහි; තෙ උභින්නං එවං, අප දෙදෙනාට පමණක්ම; හොතු ඉති, වේවා යි. තං, ඇය; පෙසෙත්වා, යවා; පුබ්බණ්හ සමයං, පෙරවරු කාලයෙහි; නිවාසෙත්වා, හැඳ පොරවාගෙන; පත්ත චීවරං, පා සිවුරු; ආදය, ගෙන; තිංස සහස්ස මත්තෙහි භික්ඛූහි සද්ධිං, තිස් දහසක් පමණ භික්ෂූන් සමග; අගමාසි, ගියේ ය. සා, ඕ තොමෝ; තං දිස්වා, එය දැක; මාතුල භාගිනෙය්‍යානං ද්විනනං, මාමා හා බෑණා යන දෙදෙනාට; ආසනානි, අසුන්; පඤ්ඤාපෙසි, පැනවීය. තානි, ඒ ආසන; තෙසං, උන්වහන්සේලාගේ; ආනුභාවෙන, ආනුභාවයෙන්; තිංස සහස්සමත්තානි, තිස් දහසක් පමණ; අහෙසුං, වූහ. තෙසං එව, උන්වහන්සේලාගේම; ආනුභාවෙන; ආනුභාවයෙන්; තස්සා, ඇගේ; ගෙහං අපි, ගෙය ද; වඩ්ඪි, විශාල විය. භික්ඛූ භික්ෂූහු; පත්ත පත්ත ආසනෙ එව, පැමිණි පැමිණි අසුන් වලම; නිසීදිංසු, හුන්හ. තෙසං ද්වින්නං එව, ඒ දෙදෙනා වහන්සේට ම; පටියාදිතං, පිළියෙල කරන ලද; සූප බ්‍යඤ්ජනාදී සබ්බං, සූප ව්‍යඤ්ජන ආදී සියල්ල; තිංස සහස්ස

මත්තානං භික්ඛූනං, තිස් දහසක් පමණ භික්ෂූන්ට; යාවදත්‍ථං, ඇති පමණ; පහොනකං, සෑහීම; අහොසි, විය; භුත්තාවසානෙ බො, වළඳ අවසානයෙහි වනාහි; උපාසිකා, උපාසිකා තොමෝ; භුත්තානුමොදනත්‍ථං, භුත්තානුමොදනාව සඳහා; සාමණෙරස්ස, සාමණේරයන් වහන්සේගේ; පත්තං පාත්‍රය; ගණ්හි, ගත්තේ ය. සො'පි, උන්වහන්සේ ද; තෙසං මජ්ඣෙ, උන්වහන්සේලාගේ මැද; මඞ්ගලං වඩ්ඪෙන්තො, සුභ ලකුණු වඩවමින්; මධුරභාරතිං, මිහිරි වදන්; නිච්ඡාරෙන්තො, පිට කරමින්; ධම්මං, ධර්මය; දෙසෙසි, දෙසීය. දෙසනාවසානෙ, දෙශනාවගේ කෙළවර; මාතා පිතූනනං ආදිං කත්‍වා, මවුපියන් මුල්කොට ඇති; පඤ්ච කුල සතානි, කුල පන්සියයක්; සොතාපත්ති ඵලෙ, සෝවාන් ඵලයෙහි; පතිට්ඨහිංසු, පිහිට වූහ. සා දෙසනා, ඒ ධර්ම දෙශනා තොමෝ; බහුනො ජනස්ස, බොහෝ දෙනාට; සාත්‍ථිකා අහොසි, සාර්ථක වූවාය.

8. එවං, මෙසේ; විපිනජ, වනයෙහි උපන්නා වූ; මිගා, මුවෝ පවා; ධම්මං, ධර්මය; දෙසෙන්තෙ, දෙශනා කරන කල්හි; සද්දමත්තෙ, ශබ්ද මාත්‍රයෙහි; නිමිත්තං, නිමිත්තග්‍රහණය; ලද්ධා ලැබ; මනුජං විභවං, මිනිස් ලොව මහත් සම්පත් ද; අපවග්ගං ච; නිර්වාණ සම්පත්තියද; ලභන්ති, ලහත්. බුද්ධෙ, බුද්ධාදී රත්නත්‍රයෙහි; සද්ධං , ශ්‍රද්ධාව; විහිත, පිහිටුවන ලද; මතිමා, නුවණැත්තේ; ධම්මං, ධර්මය; සාධු, මනා කොට; සුත්‍වාන, අසා; මුනිනා, බුදුන් විසින්; වණ්ණනීයෙ, වර්ණිනීය වූ; විමානෙ, දිව්‍ය විමානයන්හි; කිං, කිම? නො රමති, සිත් අලවා වාසය නොකෙරේද? වාසය කෙරේ මැයි.

**මිගපොතකස්ස, මුව පැටියාගේ; වත්‍ථුං, කථාව; පඨමං, පළමු වැන්නය.**

## 2. බණ ඇසූ උපාසිකාවගේ කථාව.

**(5) 2. ධම්මසුත උපාසිකාය, බණ ඇසූ උපාසිකාවගේ; වත්‍ථුම්හි, කථාවස්තුවෙහි; අයං, මෝ; ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. ලඞ්කාදීපෙ, ලක්දිව; රොහණ ජනපදෙ, රුහුණු දනව්වෙහි; භික්ඛු භික්ඛුණී සත සමාකිණ්ණං, සිය ගණන් භික්ෂු භික්ෂුණීන්ගෙන් ගැවසුණු; අනෙක සත විහාරං, නොයෙක් සිය ගණන් වෙහෙර විහාරයන්ගෙන් ද; හිරඤ්ඤ සුවණ්ණ ආදි අනෙක විභව සමාකිණ්ණං, රන් රුවන් ආදී නොයෙක් වස්තූන්ගෙන් සමන්විත; ඉස්සර ජන සමූහ සමාකුලං, ප්‍රභූ ජන සමූහයන්ගෙන් යුක්ත වූ; නච්ච ගීත වාදිතෙහි, නන් නළු ගී හඬින්; නිච්චං, නිතොර; ජන මනො නන්දනං, දන මන පුබුදු කරවන; නිරන්තර, දන කීළා පසුත, නිරතුරු දන්දීම් නැමැති ක්‍රීඩාවේ යෙදුණු; අනෙක ජනා

කුලං, නොයෙක් ජනයන්ගෙන් හෙබි; වත්ථුත්තය පූජාපරෙහි, තුණුරුවන් පිදීමෙහි නැයැලුණු; සද්ධා කුලෙහි, සැදැහැති කුලයන් ගෙන්; අනුසංචරිතං, නිතර පැවැති; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; අනුචරිත, හැසුරුණු; ධම්ම සොණ්ඩක ජනා, දහම්සොඬ මිනිසුන් විසින්; අනුගීත සාධුකාරං, ගීතිකා වශයෙන් පවත්වන ලද සාධුකාර ඇති; මහාගාමං නාම, මහගම නම්; රමණීයං, සිත් කළු; එකං ගාමං, එක් ගමක්; අහොසි, වීය. තත්ථ, එ ගමෙහි; රාජ මහා විහාර මජ්ඣෙ, රාජ මහ වෙහර මැද; ධවලපාකාර පරික්ඛිත්ත, සුදු පවුරින් වට කරන ලද; මුත්තා, මුතු; සත්ථරං ඉව, ඇතුරුවක් වැනි; සෙත පුලිනතල, සුදු වැලි තලාවෙන්; සමලඞ්කත, අලඞ්කාර කළ; මාලක මජ්ඣෙ, මලුව මැද; හූමඞ්ගනා, මිහි කතගේ; මත්ථකාභි හිත, මස්තකයෙහි පළඳනා ලද; රජත කිරීටං ඉව, රිදී ඔටුන්නක් වැනි වූ; සොභග්ගපත්තං, අති දර්ශනීය; මනි චෙතියං නාම, මැණික් වෙහෙර නම්; මහා චෙතියං, මහ වෙහෙරක්; අහොසි, වීය. තත්ථ, ඒ විහාරයෙහි; මහාද්වාර කොට්ඨක සමීපෙ, මහ දෙරටුව සමීපයෙහි; සජ්ජිත, පිළියෙල කරන ලද; මහා ධම්ම මණ්ඩපෙ, මහා ධර්ම මණ්ඩපයෙහි; නිච්චං, නිතර; ධම්ම දෙසනා, දහම් දෙසුම්; පවත්තති, පැවැත්වේ.

2. එකා උපාසිකා, එක් උපාසිකාවක්; ධම්ම සවණත්ථං, බණ ඇසීම පිණිස; අත්තනො, තමාගේ; පුත්තං, පුතා; අඞ්ගුලියං ගහෙත්වා, ඇඟිල්ල අල්වාගෙන; ආගම්ම, අවුත්; පරිසපරියන්තෙ, පිරිස් කෙළවරෙහි; නිසින්නා, හුන්නී; අනඤ්ඤ විහිතා, අන් තැනෙක සිත නොයොද; සක්කච්චං, මනාව; ධම්මං, බණ; සුණාති, අසයි.

අථ, ඉක්බිති; අස්සා පුත්තො, ඇයගේ පුතා; කීළමානො, සෙල්ලම් කරමින්; පාකාර සමීපං, පවුර සමීපයට; ගන්ත්වා, ගොස්; වාලුකං කීළති, වැලි සෙල්ලම් කරයි. අථ, එකල්හි; එකො සප්පො, එක් සර්පයෙක්; පාකාරච්ඡිද්දෙන, පවුරේ සිදුරෙන්; නික්ඛමම, නික්මී; තං, ඔහු; ඩසිත්වා, දෂ්ට කොට; නිලීයි, සැහවුනේය. අථ, එකල්හි; සා, ඕ තොමෝ; පුත්තං, පුතා; ඩසන්තං, දෂ්ට කළ; සප්පං , නයා; දිස්වා, දැක; සචෙ, ඉදින්; කස්සචි, කිසිවෙකුට; ආචික්ඛිස්සාමි, කියන්නෙම් නම්; මෙ, මගේ; ධම්මස්ස, බණ ඇසීමට; අන්තරායො, අනතුරක්; හවිස්සති, වන්නේය; පුත්තා පන, පුත්‍රයෝ වනාහි; න දුල්ලභා, දුර්ලභ නොවෙත්; බුද්ධුප්පාදෙ, බුද්ධොත්පාදය; දුල්ලභො හි, දුර්ලභමය; තථා එව, එසේම; සද්ධම්ම සවණං අපි, බණ ඇසීම ද; දුල්ලභො, දුර්ලභය; තතො, එයිනුත්; මනුස්සත්ත පටිලාභො අපි, මිනිසත් බවක් ලැබීම ද දුල්ලභො, දුර්ලභය; දුල්ලභත්තං ලද්ධාය, ඉතා අමාරුවෙන් ලද ආත්මය ඇති; මයා, මා විසින්; දුල්ලභං ධම්මං, දුර්ලභ ධර්මය; සොතුං, ඇසීම; වරතරං ඉති, ඉතා වටනේ ය යි, කස්සචි, කිසිවෙකුට; අනාරොචෙත්වා, නොකියා; ධම්මං එව, ධර්මයම; අස්සොසි, ඇසීය. අස්සා පුත්තො අපි. ඇගේ පුතා ද; විස වෙගෙන, විෂ වේගයෙන්; සඤ්ඤං විස්සජ්ජෙසි, මූර්ජා වූයේය. තතො, ඉක්බිති; දෙසනං, ධර්ම දෙශනාව; යථා අනුසන්ධිගතො, කෙළවරට ගිය කල්හි;

උපාසිකා, උපාසිකාව; උට්ඨාය, නැගිට; දරකස්ස, දරුවාගේ; සමීපං, සමීපයට; ගන්ත්වා, ගොස්, විස වෙගෙන, විෂ වේගයෙන්; ථද්ධකායං, තද වූ සිරුරක් ඇති; පුත්තං, පුතා; දිස්වා, දැක; අනෙකෙහි මනෙතාසධෙහි, අනෙක් මන්ත්‍ර වලින් හා ඖෂධ වලින්; කිං, කිම? අස්ස, මෙයට; සච්චකිරිය ඔසධං එව, සත්‍යක්‍රියා ඖෂධයම; වරතරං ඉති, ඉතා උසස් යයි; පුත්තස්ස, පුතාගේ; සීසං, හිස; ගහෙත්වා, අල්වා ගෙන; සච්චකිරියං, සත්‍යක්‍රියා; කුරුමානා, කරන්නී; එවං, මෙසේ; ආහ. කීවාය.

3 අහං, මම: යෙන සච්චෙන, යම් සත්‍යයක් හේතුකොට ගෙන; බුඩ සරණෙ, බුදු සරණයෙහි; සුප්පතිට්ඨිතා, මනාව පිහිටි යෙම් ද; තෙන සච්චෙන, ඒ සත්‍ය වචනය හේතුකොටගෙන; මෙ පුත්තො, මගේ පුත්‍ර තෙම; නිබ්බිසො, නිර්විෂ වූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

4. යෙන සච්චෙන, යම් සත්‍යයක් හේතුකොටගෙන; අහං, මම; ධම්ම සරණෙ, දහම් සරණයෙහි; සුප්පතිට්ඨිතා, මනාව පිහිටියෙම් ද; තෙන සච්චෙන, ඒ සත්‍යයෙන්; මෙ පුත්තො, මගේ පුත්‍ර තෙම; නිබබිසො, නිර්විෂ වූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

5. යෙන සච්චෙන, යම් සත්‍යයක් හේතුකොටගෙන, අහං, මම; සඞ්ඝං සරණෙ, සඟ සරණයෙහි; සුප්පතිට්ඨිතා, මනාව පිහිටියෙම් ද; තෙන සච්චෙන, ඒ සත්‍යයෙන්; මෙ පුත්තො, මගේ පුත්‍රතෙම; නිබ්බිසො, නිර්විෂ වූයේ; සුඛිතො හොතුං සුවපත් වේවා.

6. යෙන සච්චෙන, යම් සත්‍යයක් හේතුකොටගෙන; ධම්මං ධර්මය; සුණමානා, අසනු ලබන්නා වූ; අහං, මම; ඛණම්පි ච, ක්ෂණ මාත්‍රයකුදු; අනඤ්ඤවිහිතා ආසිං, අන් තැනෙක සිත නො යෙදීම්ද, තෙන සච්චෙන, ඒ සත්‍යයෙන්; කිබ්බිසං, නපුරු විෂ; හඤ්ඤතු, නසීවා.

7. අක්ඛරං වා, අකුරක් හෝ අපි, නැවත; පදංවා, පදයක් හෝ; කථා මග්ගං වා, කථා මාර්ගය හෝ; අභාපයං, නො පිරිහෙලමින්; පවරං, උතුම් වූ; ධම්මං, ධර්මය; අසොසාසිං, ඇසූයෙම් ද; තෙන, ඒ සත්‍යයෙන්; කිබ්බිසං, නපුරු විෂ; හඤ්ඤතු, නසීවා.

8. බුඩො, බුදුරජාණන් වහන්සේ; නිය්‍යානිකො, නෛර්‍යාණිකාය, ධම්මො, ධර්මය; සන්දිට්ඨිකො, මේ ආත්මයෙහි විපාක දෙන්නේය. අකාලිකො, කල් නො යවා ඵල දෙන්නේය; තෙන සච්චෙන, ඒ සත්‍යයෙන්; මෙ පුතෙතා, මගේ පුත්‍රයා; නිබ්බිසො නිර්විෂ වූයේ; සුඛිතො හොතු, සුවපත් වේවා.

9. සඞ්ඝො, සංඝරත්නය; සුප්පටිපනෙනා ච, මනාව පිළිපන් සේක් ද; චතුමග්ග ඵලෙ, සතර මඟ සතර ඵලයෙහි; ඨිතො, සිටියේ වේද; තෙන සච්චෙන, ඒ සත්‍යයෙන්; මෙ පුතෙතා, මගේ පුත්‍රයා; නිබ්බිසො, විෂ නැත්තෙක්ව; සුඛිතො හොතු, සුවපත් වේවා.

10. සාසනං, බුඩ ශාසනය: සචෙ, ඉදින්: පඤ්චවස්ස සහස්සානි, පන් දහසක් අවුරුදු: තිට්ඨති, සිටින්නේ වේද, තෙන සච්චෙන, ඒ සත්‍යයෙන්: මෙ පුත්තො, මගේ පුත්‍රතෙම: නිබ්බිසො, විෂ නැත්තෙක්ව: සුඛිතො හොතු, සුවපත් වේවා.

11. අථ, ඉක්බිති: අස්සා පුත්තො, ඇගේ පුතා: සච්චකිරියාවසානෙ, සත්‍යක්‍රියාවගේ අවසානයෙහි: සුඛී, සුවපත් වූයේ: නිද්දුක්ඛො, නිදුක් වූයේ: සුත්තප්පබුද්ධො විය. නිඳ පිබිදියෙකු මෙන්: උට්ඨාය, නැගිට: මාතු සන්තිකෙ, මව සමීපයෙහි: අට්ඨාසි, සිටියේ ය. සා, ඕ තොමෝ: සච්චකිරියාය, සත්‍යක්‍රියාවෙන්: පුත්තං, පුතා: අරොගං කත්වා, නිරොගි කොට: ගෙහං, ගෙදරට: ගන්ත්වා, ගොස්: තෙන එව සොමනස්සෙන, ඒ සොම්නසින් මඃබහුනි පුඤ්ඤකම්මානි, බොහෝ පින්කම්: කත්වා, කොට: තතො, ඒ ආත්මයෙන්: චුත, චුත වූවා: සග්ගෙ එව, ස්වර්ගයෙහි ම: නිබ්බත්තා, උපන්නීය.

12. එවං, මෙසේ: මාතුගාමො'පි, ස්ත්‍රී තොමෝ ද: පමුදිත මනො, පමුදිත සිත් ඇත්තී: ධම්මං, ධර්මය: සුත්වා, අසා: කිබ්බි සං වා, නපුරු විෂ හෝ: පහාති, දුරු කරන්නිය. තිදිවෙ, දිව්‍ය ලොකයෙහි: උප්පජ්ජිත්වා, ඉපිද: රමති, සිත් අලවා වාසය කෙරේ. ධම්මෙ, ධර්මයෙහි: සාධු, මනාකොට: චරන්තා, හැසිරෙන්නාවූ: සද්ධා බුද්ධිප්පමුඛ ජනතා, ශ්‍රද්ධා බුද්ධිසම්පන්න ජනතාව: දිබ්ජ මනුජං සම්පදංච, දිව්‍ය මනුෂ්‍ය සම්පත් ද: නිබ්බානංච, නිර්වාණ සම්පත්තිය ද: අනුභොනති, අනුභවකරත්.

**ධම්මසුත, බණ ඇසූ: උපාසිකාය, උපාසිකාවගේ:**

**වත්ථුං, කථාව: දුතියං, දෙවැන්නය.**

---

# 3. කුඩ්ඩරජ්ජවාසී තෙරුන්ගේ කථාව.

### (5) 3. කුඩ්ඩරජ්ජවාසී ථෙරස්ස, කුඩ්ඩරජ්ජවාසී තෙරුන්ගේ: වත්ථුම්හි, කථා වස්තුවෙහි: අයං, මෝ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.

1. සීහලදීපෙ, සිංහලද්වීපයෙහි: මහාගාමෙ, මහගමැ: අනෙක භික්ඛුසත වාසො, නොයෙක් සිය ගණන් භික්ෂූන් වහන්සේ වාසය කරන්නා වූ: මහාවාපී විහාරෝ නාම, මහ වැව නම් විහාරයක්: අහොසි, විය. තස්මිං කාලෙ, එකල: තත්ථ, එහි: අනුසංවච්ඡරං, අවුරුද්දක් පාසා: අරියවංස ධම්ම දෙසනා, අරියවංශ ධර්ම දේශනාව: පවත්තෙන්ති, පවත්වයි. දූරතොපි, දුර සිටත්: බහූ ජනා, බොහෝ ජනයෝ: ඔසරන්තී, රැස්වෙත්. මහාජන සමාගමො, මහත් වූ ජන සමාගමය: හොති, වේ. තදා, එකල්හි: කුඩ්ඩ රජ්ජවාසී, කුඩ්ඩ රජ්ජ නම් දනව් වැසි: එකො මහා ථෙරො, එක්

මහ තෙර නමක්: අහංපි, මම ද; අරියවංස ධම්මං, අරියවංශ ධර්ම දේශනාව: සොස්සාමී'ති, අසන්නෙමියි: තත්‍ථ, එහි: ගන්ත්වා, ගොස්: ඔකාසං, ඉඩක්: අලභිත්වා, නොලැබ: මහා පරිස පරියන්තෙ, මහ පිරිස් කෙළවර: මාලකතො බහිං මලුවෙන් පිටත: එකස්මිං තිණපුඤ්ජමෙහ ඨානෙ, එක් තණ පඳුරෙන් යුත් තැනෙක්හි: ඔකාසං, ඉඩ, ලභි, ලැබීය. සො, හෙතෙම: තත්‍ථ, එහි: ඨත්වා, සිට: සබ්බං රත්තිං, මුළු රැයම: තං ධම්මං, ඒ ධර්මය: සුණමානො, අසමින්: සොමනස්සප්පත්තො, සොම්නසට පැමිණියේ: රොමංචිත ගත්තො, ලොමු ඩැහැගත් සිරුර ඇත්තේ: අහොසි, විය. තස්මිං පන තිණපුඤ්ජමෙහ, ඒ තණ පඳුරෙහි: එකො ගොනස සප්පො, එක් පොළඟෙක්, පටිවසති, වසයි. අථ, ඉක්බිති: සො, ඒ පොළඟා: තතො, එතැනින්: නික්ඛමිත්වා, නික්ම: ථෙරස්ස, තෙරුන්ගේ: පාදන්තරං, පා අතරට: පවිසන්තො, පිවිස, චත්තාරො දයෙ, සතර දළ: නිමුජ්ජෙත්වා, ඔබා: නිසීදන මංසා, (පිඩිමස) තට්ටමට: ඩසී, දෂ්ට කෙළේය. තං අත්‍ථං ඤත්වා, ඒ කරුණ දැන: ථෙරො, තෙරුන්වහන්සේ: සචෙ, ඉදින්: අහං, මම: ඉතො, මෙතැනින්: අපසරාමි, පහව ගියෙම් නම්: ධම්මසවණාය, බණ ඇසීමට: අන්තරායො හොතී'ති, අනතුරු වේ යැයි: හත්‍ථං, අත: ඔතාරෙත්වා, පහත් කොට: සප්පස්ස, පොළඟගේ: සීසං, හිස: දළ්හං ගහෙත්වා, දැඩිකොට අල්වාගෙණ: උපාහණපුච්ඡිකාය, වහන් පසුම්බියෙහි: පක්ඛිපිත්වා, බහා: මුඛං බන්ධිත්වා, කට බැඳ: එකස්මිං පස්සෙ, එක් පසෙක: ඨපෙත්වා, තබා: ධම්මං, ධර්මය: අස්සොසි, ඇසීය. ධම්මසවණානුභාවෙන, බණ ඇසීමේ ආනුභාවයෙන්: තස්ස, උන්වහන්සේගේ: සරීරෙ, ශරීරයෙහි: විසං, විෂ: න පත්‍ථරි, නො පැතුරුණේය. තතො, ඉක්බිති: අරුණෙ, අරුණ: උග්ගතෙ, උදවූ කල්හි: මනුස්සානං, මිනිසුන්: ගත කාලෙ, ගිය කල්හි: ථෙරො, තෙරුන් වහන්සේ: මයා, මා විසින්: සප්පො, සර්පයෙක්: ගහිතො ඉති, ගත්තේ යයි; සප්පං සර්පයා: දස්සෙසි, දැක්වීය. කතර වෙලාය, කවර වේලාවක: තෙ සප්පො, ඒ සර්පයා: ගහිතො, ඉති, ගත්තේ දැයි: භික්ඛුහි, භික්ෂූන් විසින්: පුට්ඨො, විචාරණලද්දේ: නිදාන කථාය, නිදාන කථාව: ආරම්භ කාලෙ එව ඉති, ආරම්භ කළ කාලයේම යයි: ආහ, කීය. භික්ඛු භික්ෂූහු: අච්ඡරියං, පුදුමයි: භන්තෙ, ස්වාමීනි, තයා, ඔබ වහන්සේ විසින්: කතං, කරන ලද්ද: අබ්භුතං: පුදුමයි: ඊදිසෙන, මෙබඳු: ඝොරාසිවිසෙන සප්පෙන, ඝොර විෂ ඇති සර්පයෙකු විසින්: දට්ඨෙන අපි, දෂ්ට කරන ලද්දේ නමුදු, විස වෙගෙන, විෂ වේගයෙන්: අනඤ්ඤ විහිතෙන හුත්වා අන් තැනෙක සිත නොයොද; ධම්මං, බණ: සුණමානෙන, අසන්නා වූ ඔබ විසින්: කතං ඉති, කරන ලද්දේ යයි: ආහංසු. කීවාහුය. තතො, ඉක්බිති; සො, උන්වහන්සේ: ආවුසො, ඇවැත්නි. මෙ, මාගේ ශරීරයෙහි, විසං, විෂ: සාවසෙසං, ඉතිරි විය. තං, ඒ විෂ, සච්චකිරියානුභාවෙන, සත්‍යක්‍රියා බලයෙන්: හනිස්සාමීති, නසන්නෙම් යි: සච්චකිරියං, සත්‍යක්‍රියා: කරොන්තො, කරන්නේ: එවං, මෙසේ: ආහ, කීය.

2. යස්මා, යම් හෙයකින්: අජ්ජ, අද: මයා, මා විසින්

ලොකහිතස්ස, ලොවට හිත වූ: තස්ස, ඒ බුදුන්ගේ: සුභාසිතං, යහපත්කොට දෙශනා කරන ලද්දවූ: ධම්මං, ධර්‍මය, සුස්සුතං, මනාව අසන ලද්දේ ද: තෙ න සච්චෙන, ඒ සත්‍යය කරණකොට ගෙන: පොක්ඛරස්මා, නෙලුම් කොළයෙන් (පහව යන්නාවූ): ආපො විය, ජලය මෙන්: මෙ, මාගේ: විසං, විෂ: විනාසං, විනාසයට, පයාතු, යේවා.

. 3. යස්මා, යම් හෙයකින්: තස්ස, ඒ ධර්‍මයාගේ: පදක්ඛරං, පදයක් අකුරක්: න නාසයන්තො, නො නසමින්: අත්‍ථංච, අර්ථය ද: මනසි කරොන්තො, මෙනෙහි කරමින්: ධම්මං, ධර්‍මය, සුතං අසන ලදි. තෙන, ඒ සත්‍යය කරණකොට ගෙන: පොක්ඛරස්මා, නෙලුම් කොළයෙන්: (පහව යන්නාවූ) තොයං විය, ජලය මෙන්: විසං, විෂ: විනාසං, විනාශයට: පයාතුං, යේවා.

4. පණිධානතො වා, ප්‍රණිධියෙහි පටන්: ජිනස්ස, බුදු රජාණන් වහන්සේගේ: ගුණානුභාවා, ගුණානුභාවයෙන් ද: තෙන එව, ඒන්බුදු විසින්ම: සුදෙසිතෙන, මනාව දෙශනා කරන ලද: ධම්මානුභාවෙන, ධර්‍මානුභාවයෙන් ද: සංඝ තෙජා, සංඝ රත්නයෙහි තේජසින් ද: විසං, විෂ: ඛිප්පං, වහා: විනාසං, විනාසයට: සමුපෙතු, පැමිණේවා.

5. අථ, ඉක්බිති: අස්ස සච්ච කිරියාවසානෙ, මේ සත්‍ය ක්‍රියාවගේ කෙළවර: පදුමිනී පත්තතො, නෙලුම් කොළයෙන් (පහව යන්නාවූ): උදක බින්දූනි විය, දිය බිඳු සේ: විසං, විෂ විනිවට්ටත්වා, පෙරළී: පඨවිං, පොළොවට: පාවිසි, පිවිසියේය. අථ, ඉක්බිති, සො, හෙතෙම: නිබ්බිසො, විෂ රහිත වූයේ: සොමනස්සජාතො, සතුටට පැමිණියේ: භික්ඛූනං, භික්ෂූන්ට: ධම්මානුභාවං, ධර්‍මානුභාවය දක්වමින් ථොමෙන්තො, ස්තුති කරමින්: ආහ, මෙසේ කීය.

6. එසො පන ධම්මො, මේ ධර්‍මය තෙම වනාහි: සුගතප්පසත්‍ථො බුදුන් විසින් පසස්නා ලදී. සංසාර මහණ්ණවස්ස, සංසාර නමැති මහා සාගරයට: තරං ඉව, නැවක් මෙනි. බ්‍රහ්මසුරාදිහි, බ්‍රහ්මසුරාදීන් විසින්: නමස්සනීයො, වැන්ද යුතුය. තිලොකෙ, තුන් ලොකයෙහි: රසානං, රසයන් අතුරෙන්: පරමොරසො, උතුම් රසයයි.

7. ධම්මො, ධර්‍මය තෙම: ජරා මච්චු පහානො, ජරා මරණ පහ කරන්නා වූ: මහාගදෙ, දිව්‍ය ඖෂධයක් වැන්න: සබ්බීති නාසාය, සියළු උවදුරු විනාසයට: වීසෙස මන්තො, දිව්‍ය මන්ත්‍රයක් වැන්න. සබ්බත්‍ථ, සැම තන්හි: දනෙන ච, කැමැති කැමැති වස්තුව දෙන හෙයින්: කප්පරුක්ඛො, කල්ප වෘක්ෂයක් වැන්න: චින්තාමණිං චින්තා මාණික්‍යයක් වැන්න: භද්දඝටො ච, භද්‍රඝටයක් මෙන් ද: වන්නේය.

8. ධම්මං විනා, ධර්‍මය හැර: පිතා ච, පිය කෙනෙක් ද: මාතා ච, මැණි කෙනෙක් ද: නත්‍ථි, නැත්තේය. තං එවං ඒ ධර්‍මයම: තානං, රක්ෂාස්ථානය ය: සරණං පිහිටය: පතිට්ඨා, ප්‍රතිෂ්ඨාධාරයය: හො,

පින්වත්නි, තස්මාහි, එහෙයින් වනාහි; අඤ්ඤදත්ථිච්චප්පහාය, අනික් කටයුතු හැර; ධම්මෙ, ධර්මයෙහි චරථ, හැසිරෙව්; සුණාථ, (ධර්මය) අසව්; ධාරෙථ, දරව්.

9. එවං, මෙසේ, සො, හෙතෙම; සද්ධම්ම ථොමනෙන, සදහම් ස්තුතියෙන්; භික්ඛූනං, භික්ෂූන්ට; ඔවදිත්වා, අවවාද කොට; සකට්ඨානං එව, ස්වකීය ස්ථානයටම; ගන්ත්වා, ගොස්; චිරං, බොහෝ කාලයක්; වසිත්වා, වැස; ආයු පරියොසානෙ, ආයු කෙළවර; සග්ගෙ, ස්වර්ගයෙහි; නිබ්බත්තති, උපන්නේය.

10. එවං, මෙසේ, භො, පින්වත්නි සො භික්ඛු, ඒ මහණ තෙම පමුදිත මනො, සතුටු සිත් ඇත්තේ; ධම්මං, ධර්මය, සුත්වාන, අසා; තස්ස ධම්මානුභාවා, ඒ ධර්මයාගේ ආනුභාවයෙන්; අතිභුසං, ඉතා දඩි වූ; විසං, විෂ; අසං, නිරෝගී බවට; පාපෙසි, පැමිණ වූයේ ය. භවතා, පින්වත්නි; අඤ්ඤ කිච්චප්පහාය, අනික් කටයුතු හැර; ධම්මං, ධර්මය, භජථ, භජනය කරව් තං, ඒ ධර්මය; වො, තොපට; කාමං, ඒකාන්තයෙන්; සග්ගෙ, ස්වර්ගයෙහි; විභවං, සම්පත්ද; මොක්ඛ මග්ගං ච, මොක්ෂ මාර්ගය ද; දදති, දෙන්නේය.

**කුඩ්ඩරජ්ජවාසී, කුඩා රටවැසි; ථෙරස්ස, තෙරුන්ගේ; වත්ථුං, කථාව; තතියං, තෙවැන්නයි.**

## 4. ආරණ්‍යක මහා අභයතෙරුන්ගේ කථාව.

**(5) 4. ආරඤ්ඤක මහාභය ථෙරස්ස, ආරණ්‍යක මහා අභය තෙරුන්ගේ; වත්ථුම්හි, කථා වස්තුවෙහි; අයං, මේ; ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. සීහලදීපෙ කිර, සිංහලද්වීපයෙහි වනාහි; මහා තළාක විහාරං නාම, මහ වැව නම් විහාරයක්; අහොසි, විය. තත්‍ථ, එහි; පරියත්තිධරො, ධර්මධර; තිපිටකො, ත්‍රිපිටකධාරී; අභයො නාම, අභය නම්; එකො ථෙරො, එක් තෙර නමක්; ගාමන්ත සෙනාසනං, ග්‍රාම සේනාසනය; පහාය, හැර; තස්ස, එයට; ආසන්නෙන එව, සමීපයෙහිම; එකස්මිං වන සණ්ඩෙ, එක් වන ලැහැබක; කත, කරන ලද; පණ්ණසාලාය, පන්සලක; පටිවසති, වාසයි කරයි; සො, හෙතෙම; අපරභාගෙ, මෑත් භාගයෙහි; ආරඤ්ඤක මහා අභයත්‍ථෙරො ඉති, ආරණ්‍යක මහා අභය ස්ථවිර යයි; පාකටො අහොසි, ප්‍රසිද්ධ විය. අථ, ඉක්බිති; එකස්මිං සමයෙ, එකල; එකො උපාසකො, එක් උපාසකයෙක්; තං, උන්වහන්සේ කරා; උපසඞ්කමිත්වා, එළඹ; වන්දිත්වා, වැඳ; ධම්මං බණ; සුත්වා, අසා; පසන්නමානසො, පහන් සිත් ඇත්තේ; තං, උන්වහන්සේට; යාචිත්වා,

අභියාචනය කොට; ද්වාදස සංවච්ඡරානි, අවුරුදු දෙළසක්; චතුහි පච්චයෙහි, සිවුපසයෙන්; පටිජග්ගි. උපස්ථාන කෙළේය. සො, හෙතෙම; ථෙරස්ස, තෙරුන් වහන්සේට; චීවරත්ථාය, සිවුරු පිණිස; කාලෙන කාලං, කලින්කල; සාටකං, සළු; දෙති, දෙයි. දින්න දින්නානි සාටකානි, දුන් දුන් සළු; තස්ස එව, එම උපාසකයාගේම; අන්තරගෙහෙ, සමීප ගෙයක; හරන්තිකො නාම, හරන්තික නම්; එකො චොරො, එක් සොරෙක්; රත්තියං ගන්ත්වා, රාත්‍රියෙහි ගොස්; හරති, පැහැර ගෙනයයි. ථෙරො, තෙරුන් වහන්සේ; දුබ්බල චීවරො එව, දුර්වල සිවුරු ඇත්තේම; හොති, වේ. අථ, ඉක්බිති; එකස්මිං දිවසෙ, එක් දිනක්; උපාසකො, උපාසක තෙමේ; විහාරං, විහාරයට; ගන්ත්වා, ගොස් ථෙරස්ස, තෙරුන්ගේ; දුබ්බලානි චීවරානි, දුර්වල සිවුරු දිස්වා, දැක; චීවරත්ථාය, සිවුරු පිණිස; සාටකානි, සළු; දත්වා, දී; එවං, මෙසේ; චින්තෙසි, සිතී, මයා පන, මා විසින් වනාහි; ඉමස්ස, මුන්වහන්සේට; බහූනි චීවරසාටකානි, බොහෝ සිවුරු පිළි; දින්නානි, දෙන ලදි. අපි, නමුත්; චීවරං කත්වා, සිවුරක් කොට; න පාරුපති, නො පොරවයි සන්නිධිට්ඨානං වා, එකතු කිරීමක් හෝ; අඤ්ඤස්ස, අනිකෙකුට; දනං වා, දීමක් හෝන පඤ්ඤායති, නො පෙනේ. ඉමස්ස, මෙයට; කාරණෙන. කරුණක්; භවිතබ්බං ඉති, විය යුතු යැයි; ආසන්නට්ඨානෙ, විහාරය සමීපතැනෙක්හි; මග්ගා, මාර්ගයෙන්; ඔක්කම්ම, ඉවත්ව; ගච්ඡන්ත ආගච්ඡන්තෙ, යන එන්නවුන්; උප පරිකබමානො, පරීක්‍ෂා කරමින්; නිලීනො අට්ඨාසි, සැඟවී සිටියේය. තතො, ඉක්බිති; චොරො, සොරා; ථෙරස්ස, තෙරුන් වහන්සේට; සාටකානි, සළු, උපනීතභාවං ඤත්වා, පිළිගැන්වූ බව දැන; තං, එය; ගණ්හිස්සාමි ඉති, ගන්නෙමියි; රත්තිභාගෙ, රාත්‍රි කාලයෙහි; විහාරං, විහාරයට; ගන්ත්වා, ගොස්, සාටකානි, සළු; ගහෙත්වා, ගෙන; පුන, නැවත; තෙන එව මග්ගෙන, ඒ මගින්ම; ආගච්ඡති, එයි.. තතො, ඉක්බිති; උපාසකො, උපාසක තෙම; සභණ්ඩං, බඩු සහිත; චොරං, සොරා; දිස්වා, දැක; වෙගෙන, වේගයෙන්; ගන්ත්වා, දිව ගොස්; තස්ස, ඔහුගේ; චූළං ගහෙත්වා, ඉසකෙස් වලින් අල්වාගෙන; අරෙ, එම්බල; එත්තකං කාලං, මෙතෙක් කල්; අය්‍යස්ස, තෙරුන් වහන්සේට; මයා මා විසින්; දින්නානි සාටකානි, දුන් සළු; ගණ්හන්තො, ගත්තේ; ත්වං ඉති, තෝ දැයි; පුච්ඡි, විචාළේ ය. තෙන, ඔහු විසින්; ආම සාමි ඉති, එසේය ස්වාමිනියි; සම්පටිච්ඡිතෙ පිළිගත් කල්හි; උපාසකො, උපාසක තෙම; තස්ස, ඔහුගේ, හත්ථතො, අතින්; චීවර වත්ථං, සිවුරු පිළි; ගහෙත්වා, ගෙන; හත්ථ පාදෙහි, අත් පාවලින්; තං, ඔහු; පොථෙත්වා, තලා; දුබ්බලං කත්වා, දුර්වල කොට; ආමක සුසානං, අමුසොහොනට; නෙත්වා, ගෙන ගොස්; මත මනුස්සං, මළ මිනියක්; අධොමුඛං කත්වා, යටිකුරු කොට; තස්ස, ඔහුගේ; පිට්ඨියං, පිටෙහි; උත්තානං සයාපෙත්වා, උඩුකුරුකොට හොවා; හත්ථ පාද පිට්ඨිතො, අත් පා පිටුපස; බන්ධනං, බැඳ අමොචන; කත්වා මුදා ගත නොහැකිසේ කොට, විසුං විසුං දළ්හං කත්වා, වෙන වෙනම තද කොට;

බන්ධිත්වා, බැඳ; සයාපෙත්වා, හොවා; සයං, තෙමේ; නහාත්වා, ස්නානය කොට පුරිතෙරං, පළමු කොට; ගාමං, ගමට; ආගමම, අවුත්; ගාමමජේඣ, ගම මැද; ඨත්වා, සිට; හො ගාම වාසිනො, පින්වත් ගම් වැසියෙනි, මම වචනං, මගේ වචනය; සුණාථ, අසව්; අජ්ජ, අද; රත්තිභාගෙ, රාත්‍රි කාලයෙහි; එකො අමනුස්සො, එක් අමනුෂ්‍යයෙක්; ආගච්ඡති, එයි. සො, හෙතෙම; තුම්හාකං, තොපට; මහාවිනාසං, මහා විනාසයක්; කරිස්සති, කරන්නේ ය. ඛෙමට්ඨානං, (එබැවින්) නිර්භය ස්ථානයකට; පවිසිත්වා, පිවිස; ද්වාරානි, දෙරවල්; පිධාය, වසා; නිසීදථ, හිඳිව්; අහං, මම; අසුකො, අසවලා වෙමි. අසුකස්ස, අසවලාගේ; ඤාතකො, නෑයෙකි. සුහදෙ ඉතිං, මිත්‍රයා යැයි; ආදීනි, ආදිය; වත්වා, කියා; සල්ලපන්තෙ අපි, කථා කරන්නේ නමුදු; තෙන සද්ධිං, ඔහු සමග; කථා, කථාවක්; න කාතබ්බා'ති, නොකටයුතු යයි; උග්ඝොසෙසි, උද්ඝොෂණය කෙළේය.

2. ගාම වාසිනො, ගම්වැසියෝ; තං සුත්වා, එය අසා; භීතා, බිය වූවාහු; තසිතා, තැතිගත්තාහු; ද්වාරානි, දෙරවල්; පිධාය, වසා; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; නිලීයිංසු, සැඟවුණාහ. රත්තියං, රාත්‍රියෙහි; චොරො, සොරා, මත මනුස්සං, මළමිනිය; මුඤ්චිතුං, මුද ගැනීමට; අසක්කොන්තො, නොහැකි වූයේ; තෙන එව සද්ධිං, ඒ මළ මිනිය සමග ම; එකා බද්ධො, එකට බැඳුනේ; අත්තනො, තමාගේ; ගෙහද්වාරං, ගෙදරට; ආගන්ත්වා, අවුත්; හරියං, භාර්‍යාවට; ආමන්තෙසි, ඇමතීය. අහං, මම; හරන්තිකො නාම ඉති, හරන්තික නම්, සා, ඕතොමෝ; භීතා, බියපත් වූවා; තසිතා, තැතිගත්තී; යක්ඛො ඉති, යක්ෂයා යන; සඤ්ඤාය, හැඟීමෙන්; නිලීයි, සැඟවුනා ය. චොරො, සොරා; තං, ඇයට; අනෙකප්පකාරෙන, නන් අයුරින්, සද්දහාපෙන්තො'පි, අදහවන්නේ නමුදු; ද්වාරං, දෙර; විවරාපෙතුං, ඇරවා ගන්ට; අසක්කොන්තො, නො හැක්කේ; තථා එව, එසේම; මාතාපිතුන්නම්පි, මවුපියන්ට ද; ඤාති සාලොහි සහායකානම්පි, ඥාති; සහ ලේ ඥාති. යහළුවන්ගේද; ගෙහං ගන්ත්වා, ගෙවලට ගොස්; තථාඑව, එසේම; ද්වාරං, දෙර අරවා ගන්ට; අලත්ථ, නොහැකිවිය. ගතගතට්ඨානෙ, ගිය ගිය තැන; මනුස්සා, මිනිස්සු; අමනුස්සො, අමනුෂ්‍යයා; ආගතො ඉති, ආයේ යයි; සඤ්ඤාය, හැඟීමෙන්; භයප්පත්තා, බියට පැමිණියාහු; ද්වාරානි, දෙරවල්; න විවරිංසු, විවෘත නොකළහ. චොරො, සොරා; සකලගාමං, ගම මුළුල්ලෙහි; ආහිණ්ඩිත්වා, ඇවිද, අඤ්ඤත්ථ, අනික්; පටිසරණං, පිළිසරණක්; අලභන්තො, නොලබන්නේ; ථෙරං එවං, තෙරුන්වහන්සේම; පටිසරණං කරොමි ඉති, පිළිසරණ කරගනිමියි; විහාරං, විහාරයට; ගන්ත්වා, ගොස්; සාමි, ස්වාමීනි, වො, නුඹ වහන්සේගේ; දසස්ස, දසයාට; පටිසරණං හොහි, පිළිසරණ වන්න. ඉමං මතමනුස්සං, මේ මළසිරුර; මොචෙත්වා, මුදවා; මං, මා; සුඛී කරොහි ඉති, සුවපත් කළ මැනැවැයි; යාචි, ඉල්ලීය. ථෙරො, තෙරුන් වහන්සේ; තං, ඔහු; දිස්වා, දැක, කම්පමාන හදයො, කම්පා වූ ළයැතිව; සීසං, වහා; මත මනුස්සා, මළ මිනිය; මො චෙත්වා, මුදා; දූරෙ, දුර; පක්ඛිපිත්වා,

දමා; තං, ඔහු; උණ්හොදකෙන, උණු දියෙන්; නහාපෙත්වා, නහවා; නාළිකාය, කුලාවෙන්; තෙලං, තෙල්; ගහෙත්වා, ගෙන; තස්ස, ඔහුගේ; සකල සරීරෙ, මුළු සිරුරෙහි, අබ්භඤ්ජිත්වා, ගල්වා; තෙන, ඔහු විසින්; පොඨිතට්ඨානං, පහර දුන් තැන්; සම්බාහනෙන්තො, පිරිමදිමින්; නිසීදි, හුන්නේ ය. පභාතාය රත්තියා, රාත්‍රිය පහන් වූ කල්හි; උපාසකො, උපාසක තෙමේ; චොරො, සොරා; කහං, කොහි; ගතො ඉති, ගියේදැයි; පුච්ඡන්තො විචාරමින්; පරියෙසන්තො, සොයන්නේ; ථෙරස්ස, තෙරුන්වහන්සේගේ; සන්තිකං, සමීපයට, ගන්ත්වා, ගොස්; තස්ස, ඔහුගේ; පිට්ඨිං, පිට; තෙලෙන, තෙලින්, සම්බසන්තං, ගල්වනු; දිස්වා, දැක; ථෙරෙන සද්ධිං, තෙරුන් සමග; සල්ලපන්තො, කථා කරන්නේ; ආහ, මෙසේ කීය.

3. එසො, මේ තෙම; මය්හං; මගේ; සහායො ඉති, යහළුවා යයිද; සො, හෙතෙම; උපකාරං, උපකාරය, කරො ඉති, කෙළේ යයිද; සො චොරො, ඒ සොරා; තං, ඒ උපකාරය; නසරතෙ, සිහි නොකරන්නේය. (එබැවින්) චොරෙ, සොරා කෙරෙහි; සහායතා, යහළු බවක්; නත්ථි, නැත්තේය.

4. එකතො, එකතුව; ඛාදන්තො අපි, කන්නේද; ජීවන්තො පි, පානය කරන්නනේද; සයන්තො'පි, සයනය කරන්නේ ද; අත්තනො, තමන්ගේ; ධම්මං, ස්‌වභාවය; න ජහාති. අත් නොහරී. (එනිසා) චොරෙ, සොරා සමග; සහායතා, යහළුකමක්; නත්ථි, නැත.

5. චොරො, සොරා; මුඛෙන, කටින්; එකං, එකක්; ලපෙ, කියයි. කායෙන, ශරීරයෙන්; එකං, එකක්; කරොති, කරයි; සො, හෙතෙම; ලද්ධොකාසො, ඉඩක් ලද කල්හි; හරන්තො එව, පැහැර ගන්නේමය; චොරෙ, සොරා සමග; සහායතා, යහළුකමක්; නත්ථි, නැත.

6. මාතා පිතා ච, මවුපියෝ ද, බන්ධූ ච, නෑයෝ ද; සහායකා, යහළුවෝ ද; චොරං, සොරා; දිස්වා, දැක; දූරතො ච, දුරින්ම; පරිවජ්ජෙන්ති, දුරු කෙරෙත්; සද, හැම කල්හි; සඞ්ගමෙ, එක්වීමෙහි; කඞ්ඛන්ති, සැක කෙරෙත්.

7. එවං ච පන වත්වා, මෙසේ ද කියා; භන්තෙ, ස්වාමීනි එවරූපං, මෙබඳු; පරස්ස, අනුන්ගේ වස්තුව; හරණක, පැහර ගන්නා; මිත්ත දූහිං, මිත්‍රද්‍රෝහියාට; උපකාරං, උපකාර; මා කරොථ, නොකරනු මැනව; පලාපෙථ ඉති, පලවා හරිනු මැනවැයි; ආහ, කීය. අථ, ඉක්බිති; අස්ස, ඔහට; ඔවජ්ජමානො, අවවාද කරන; ථෙරො, තෙරුන්වහන්සේ; එවං, මෙසේ; ආහ, කීය.

8. යො සා, යම් බල්ලෙක්; යස්ස, යමෙකුගේ; පාදං, පාදය; ඩසෙ, දෂ්ට කෙළේ ද; සො, ඒ පුරුෂතෙම; තස්ස පාදං, බල්ලාගේ පය; න ඩසෙ, දෂ්ට නොකෙරේ. එවමෙවහි, එපරිද්දෙන් වනාහි; දුට්ඨස්ස, අසත්

පුරුෂයාට; අදෙසොව, ද්වේෂ නොකිරීම ම; පසංසිතො, ප්‍රශංසා කරන ලදි.

9. යො, යමෙක්; අකතඤ්ඤුස්ස, අකෘතඥ වූ; පොසස්ස, පුරුෂයාට මෙත්තිං. මෛත්‍රිය; න කරිස්සති, නොකරන්නේ නම්; සො, හෙතෙම; කස්ස, කවරෙක් හට; මෙත්තිංහි, මෛත්‍රිය වනාහි; කයිරා, කරන්නේ ද; තං, එය, චරියං ඉති, අති උතුම් චර්යාව යයි, බුධා, පණ්ඩිතයෝ; ආහු, කියත්.

10. එවංච පන වත්වා, මෙසේ ද කියා; භො, පින්වත එතස්මිං, මොහු කෙරෙහි; චිත්තං, සිත; මා පදූසෙහි, දූෂ්‍ය නොකරව; අත්තනා, තමා විසින්; කත කම්මස්ස, කළ කර්‍මයට; වීපාකො, විපාකය; තෙන, ඔහු විසින්; ලද්ධො'ති, ලබන ලදැයි; වත්වා, කියා; උපාසකං, උපාසකයා; පෙසෙසි, යැවී. තතො, ඉක්බිති; හරන්තිකො, හරන්තික; කතිපාහෙන එව, කීප දවසකින්ම; ලද්ධ, ලබන ලද; බලො, ශක්තිය ඇත්තේ; ථෙරං, තෙරුන් වහන්සේ වෙත; උපසඞ්කමිත්වා, එළඹ; වන්දිත්වා, වැඳ; භන්තෙ, ස්වාමීනි අහං, මම; ඉමිනා එව අත්තභාවෙන; මේ ආත්ම භාවයෙන්ම; අඤ්ඤො විය, අනිකකු මෙන්; ජාතො, විය. පුන, නැවත; ඝරාවාසෙ, ගිහිගෙහි; වසිතුං, වසන්ට; න සක්කොමි, නොහැක්කෙමි; භන්තෙ, ස්වාමීනි අනුකම්පං පටිච්ච, අනුකම්පා උපදවා, මං, මා; පබ්බාජෙථ ඉති, පැවිදි කරනු මැනවි'යි; පබ්බජ්ජං, පැවිද්ද; යාචි, ඉල්ලීය. තතො, ඉක්බිති; ථෙරො, තෙරුන් වහන්සේ; තං, ඔහු; පබ්බාජෙත්වා, පැවිදි කොට; උපසම්පාදෙසි, උපසම්පද කරවිය. සො, හෙතෙම; වත්ත පටිවත්තකුසලො, වත් පිළිවෙත්හි දක්‍ෂවූයේ; භාවනං, භාවනාව; අනුබ්‍රෑහන්තො, වඩන්නේ; න චිරස්ස එව, නොබෝ කලකින්ම; අරහත්තං, රහත් බවට; පත්වා, පැමිණ; හරන්තිකත්ථෙරො ඉති, හරන්තික තෙරුන් වහන්සේ යයි; පාකටො අහොසි, ප්‍රකට විය.

11. යො, යමෙක් තෙම; පඨම සමයෙ, පළමු වයසෙහි; පඤ්චකාමානුගිද්ධො, පංච කාමයෙහි ගිජුව; පාපො හුත්වා, පවිටෙක් ව; පච්ඡා, පසුව; යොනිසො, නුවණින්; ලොකයන්තො, සලකමින්; මදං, ත්‍රිවිධ මදය; වෙ, ඒකාන්තයෙන්; පජහති, අත්හරියි; භො, පින්වත්නි, සොපි අයං, එසේ වූ උත්තම තෙමේ ද; තිභව විභවං, ත්‍රිවිධ භව සම්පත්තිය; කාමං, කැමැති පරිද්දෙන්; ආසාදයිත්වා, ආස්වාදනය කොට; සබ්බුපසත්ථං, බුදුන් විසින් පසස්නා ලද; අග්ගං, අග්‍රවූ; සිවං, ශාන්ත වූ; නිබ්බානං අමතං පුරං, නිවන් නැමැති අමෘත පුරයට; යාති, පැමිණේ.

**ආරඤ්ඤක මහා'භය ථෙරස්ස, ආරණ්‍යක මහා අභයතෙරුන්ගේ; වත්ථුං, කථාව; චතුත්ථං, සිවුවැන්නයි.**

# (5) 5 සිරිනාගගේ කථාව.

**(5) 5 සිරිනාගස්ස, සිරිනාගගේ: වත්ථුම්හි, කථා වස්තුවෙහි: අයං, මෝ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. සීහලදීපෙ කිර, ලඞ්කාද්වීපයෙහි වනාහි: සිරිනාගො නාම, සිරිනාග නම්: එකො බ්‍රාහ්මණ පුත්තො, එක් බ්‍රාහ්මණ පුත්‍රයෙක්: එක දිවසං, එක් දවසක්: පතිසල්ලීනො, හුදකලාව වසනුයේ: එවං, මෙසේ: චින්තෙසි, සිතී, ධනං, ධනය: පරියෙසිත්වා, සොයාගෙන: තෙන, ඒ ධනයෙන්: යොධෙ, යුද්ධ භටයන්: සඞ්ගණ්හිත්වා, එක් රැස් කොට: අනුරාධපුරෙ, අනුරාධපුරයෙහි: ඡත්තං, සේසත්: උස්සාපෙත්වා, ඔසවා: රාජා භවිස්සාමි ඉති, රජ වන්නෙමි යනුයි: තතො, ඊට පසු: සො, හෙතෙම: ධනං, ධනය: කුතො, කොහෙන්: ලභිස්සාමි ඉති, ලබන්නෙමි දැයි: ධනං, ධනය: ආගමනං, එනසැටි: ඔලොකෙන්තො, බලන්නේ: දක්ඛිණ මහා විහාරෙ, දක්ෂිණ මහා විහාරයෙහි: චෙතියං, චෛත්‍යයක්: අද්දස, දුටුවේය. ඉමං, මෙය: භින්දිත්වා, බිඳ: ධනං, ධනය: ගහෙත්වා, ගෙන: පරිසං, පිරිසට: සඞ්ගණ්හිස්සාමි ඉති, සංග්‍රහ කරන්නෙමි'යි: සො, හෙතෙම: බහූ මනුස්සෙ, බොහෝ මිනිසුන්: ගහෙත්වා, ගෙන: තත්ථ තත්ථ, ඒ ඒ තැන: විලුම්පන්තො, පහරන්නේ: දක්ඛිණ මහා චෙතියං, දක්ෂිණ මහා විහාරයට: ආගම්ම, අවුත්: ථූපං, සෑය: භින්දථ ඉති, බිඳිව් යයි: මනුස්සෙ, මිනිසුන්: නියොජෙසි, යෙදවීය. මනුස්සා, මිනිස්සු: චෙතිය සන්ධිං, සෑයේ සන්ධිය: පරියෙසන්තා, සොයන්නාහු: සන්ධිං, සන්ධිය: න පස්සාම, නොදකිමු. සාමී ඉති, ස්වාමීනියි: ආහංසු, කීහ.

තතො, ඉක්බිති: කො, කවරෙක්, තං, එය: ජානාතී'ති, දනීදැයි: සිරිනාගෙන, සිරිනාග විසින්: පුට්ඨා, විචාරණ ලද්දේ: සාමි, ස්වාමීනි, හෙල්ලොලි ගාමෙ, හෙල්ලොලිගම: බහුලො නාම, බහුල නම්: චණ්ඩාලො, සැඩොලෙක්: අත්ථි, ඇත. සො, හෙතෙම: තං, එය: ජානාතීති, දනී යයි: කථෙසුං, කීවාහුය. තතො, ඉක්බිති: සො හෙතෙම: තං, ඔහු: පක්කොසාපෙත්වා, කැඳවා: භණෙ, කොල, ඉමස්මිං චෙතියෙ, මේ සෑයෙහි: සන්ධිං, සන්ධිය: තයා, තා විසින්: ජානන භාවං, දන්නා බව: මනුස්සා, මිනිස්සු: යෙභුය්‍යෙන බොහෝ සෙයින්: වදන්ති, කියත්. සන්ධිං, සන්ධිය: ඤත්වා, දැන: චෙතියං, සෑය: භින්ද'ති බිඳින්නැයි: ආහ, කීය.

අථ, ඉක්බිති: සො, හෙතෙම: භන්තෙ, ස්වාමීනි, අහං, මම: සදෙවකෙ, දෙවියන් සහිත: සමාරකෙ, මරුන් සහිත: සබ්‍රහ්මකෙ, බඹුන් සහිත: සස්සමණ බ්‍රාහ්මණියා පජාය, මහණ බමුණන් සහිත සත්ව සමූහයාගේ: ලොකෙ, ලොකයෙහි: අග්ගස්ස, අග්‍රවූ: සෙට්ඨස්ස, ශ්‍රෙෂ්ඨ වූ: භගවතො, භාග්‍යවත්වූ: අරහතො, අර්හත් වූ: සම්මා සම්බුද්ධස්ස, සම්මා සම්බුදුන්ගේ: සරණං, සරණ: ආපාණ කොටිං, දිවි කෙළවරතෙක්: මෙ, මා විසින්: සරණන්ති, සරණයයි: ගතො, ගිය: උපාසකො, උපාසකයෙක්මි:

අහං, මම: තස්ස දෙවාති දෙවස්ස, ඒ දේවාති දේව වූ බුදුන්ගේ: ධාතුං, ධාතු: පතිට්ඨාපෙත්වා, පිහිටුවා: කත, කරන ලද: චෙතියං, සෑය: භින්දිතුං, බිඳින්ට: න සක්කොමි, නො හැක්කෙමි: භන්තෙ, ස්වාමීනි ආනන්තරිය කම්මසදිසං ඉති, ආනන්තරිය කර්‍මයක් සමාන යයි: ආහ, කීය.

2. අථ, ඉක්බිති: අස්ස, ඔහුගේ: එවරූපං බුද්ධ ගුණං, මෙබඳු බුදුගුණ: කණ්ණෙ, කනෙහි: අය සලාකප්පවෙසනං විය, යකඩ උල් ඇතුල් වන්නාක් මෙන්: අහොසි: විය. සො, හෙතෙම: තස්ස, ඔහුට: කුජ්ඣිත්වා, කිපී: ඉමං, මොහු: නෙත්වා, ගෙන ගොස්: ජීවසූලෙ, දිවස් උලෙහි: උත්තාසෙථ ඉති, උල තබවයි: නියොජෙසි, නියොග කෙළේ ය. තෙ, ඔවුහු: තං, ඔහු: ජීවසූලෙ, දිවස් උල: උත්තාසෙත්වා, උලහිඳුවා: තස්ස, ඔහුට: සත්ත පුත්තා අත්ථි, පුත්තු සත් දෙනෙක් ඇත. තෙපි, ඔවුහු ද: සන්ධි, සන්ධිය: ජානන්ති ඉති, දනිත් යයි, ආහංසු, කීහ. සො'පි, හෙතෙමේ ද: තෙ, ඔවුන්: පක්කොසාපෙත්වා, කැඳවවා: සන්ධිං, සන්ධිය, භින්දථ ඉති: බිඳුවයි: නියොජෙසි, නියොග කෙළේ ය. තෙපි, ඔවුහු ද: තථා එව, එසේම: භගවතො, බුදුන්ගේ: ධාතුං, ධාතු: පතිට්ඨා පෙත්වා, පිහිටුවා: කත, කරන ලද: චෙතියං, සෑය: භින්දිතුං, බිඳින්ට: න සක්කොම ඉති, නොහැක්කෙමු යි: න ඉච්ඡිංසු, අකැමැති වූහ. සිරිනාගො, සිරිනාග තෙමේ: තෙසම්පි, ඔවුනට ද: කුද්ධො, කිපීයේ: තථෙව, එසේම: ජීවසූලෙ, දිවස් උල: උත්තාසෙසි, උල තැබ්බවීය. තථාහි, ඒ එසේමැයි.

3. නීල මක්ඛිකා, නිල මැස්සෝ: සාධුසු, යහපත් වූ: චන්දනා ගරු ගන්ධෙසු, සඳුන්, අගරු ආදී සුගන්ධයන්හි: ගන්ධං, සුවඳ: ආඝාය, ආඝ්‍රාණය කොට: විරජ්ජන්ති, (එහි) නො ඇලෙත්. කුණපෙ, කුණපගන්ධයෙහි: සුරජ්ජන්ති, මනාව ඇලෙත්.

4. තථා, එසේම: සංසාර ඛාණුකා, සසර කණු වැනි සත්වයෝ: බුද්ධං, බුදුන්: දිස්වා ච, දැක ද: සොතරසානං, කනට මිහිරි වූ: ධම්මං, ධර්‍මය: සුත්වාව, අසා ද: මනොභාසං, සිතේ සතුට: න ජනෙන්ති, නූපදවත්.

5. තතො, ඉක්බිති: තෙසං අට්ඨන්නං ජනානං, ඒ අටදෙනාගේ: ගුණානුභාවෙන, ගුණ ආනුභාවයෙන්: දෙවතා, දෙවියෝ: දෙව ලොකතො, දෙව්ලොවින්: රථෙ, රථයක්: අනෙත්වා, ගෙනවුත්: සබ්බෙසං, සියල්ලන්: පස්සන්තානං එව, බලා සිටිද්දීම: රථෙ, රියෙහි: ආරොපෙත්වා, නංවාගෙන: දෙව සෙනාභි සද්ධිං, දේව සේනාවන් සමග: තුසිත නිකායං, තුසිත දිව්‍යලෝකයට: උපනෙසුං, ගෙන ගියහ. තත්‍ථ, එහි: සමාගතා, රැස්වූ: මහාජනකායා, මහා ජන සමූහයා: තං මහන්තං අච්ඡරියං, ඒ මහා ආශ්චර්‍ය්‍යය: දිස්වා දැක: පසන්නචිත්තා, පැහැදුණු සිතැත්තෝ: දෙව, දෙවයන් වහන්ස චෙතියං, සෑය: මා භින්දපෙථ ඉති, නොබිඳවනු මැනවැයි, සිරිනාගං, සිරිනාගට: සඤ්ඤාපෙසුං, දැන්වූහ. තතො, ඉක්බිති: සො, හෙතෙම: තෙසං, ඔවුන්ගේ: වචනං, කීම: සුත්වා, අසා: චෙතියං පහාය, සෑය හැර දමා: පාචීනපස්සං, නැගෙනහිර පැත්තට: (ගොස්) මහා

ගඞ්ගාය සමීපෙ, මහ ගඟ සමීපයෙහි; මධූ පිටඨික ගාමං, මිවිටි නම් ගම; විලුම්පිත්වා, පැහැර; තත්‍ථ, එහි; මධුපිටඨිය නාම චෙතියං, මීවිටි නම් සෑය; භින්‍දපෙත්වා, බිඳුවා; ධනං, ධනය; ගහෙත්වා, ගෙන; තෙන එව, එයින්ම; මහන්‍තං සෙනං, මහත් වූ සේනාවක්; සඞ්ගණ්හිත්වා, එක්කොට; යුද්ධං කරොන්‍තො, යුද්ධ කරන්නේ; රජ්ජං ගහෙත්වා, රාජ්‍යය ගෙන; අනුරාධපුරෙ, අනුරාධපුරයෙහි; ජත්‍තං, සේසත; උස්සාපෙත්වා, නංවා; රජ්ජසිරිං, රාජ්‍යශ්‍රීයට; පත්‍තොසි, පැමිණියේ ය.

තෙන එව අකුසලෙන, එම අකුශලයෙන්ම; අස්ස, ඔහුට; නචිරෙන එව, නොබෝ කලකින්ම; ඛරතරො, අතිශය දරුණු; අතෙකිච්ඡ, පිළියම් නොකළ හැකි;; උදරාබාධො, බඩේ අමාරුවක්; අහොසි, විය. රොගහාරිනො, වෛද්‍යවරු; තිකිච්ඡන්‍තා'පි, බෙහෙත් කරන්නාහු ද; තං, එම රෝගයට; තිකිච්ඡිංතුං, පිළියම් කරන්ට; න අසක්ඛිංසු, නොහැකි වූහ. අථ, ඉක්බිති; සො, හෙතෙම; ධනං සං කඩ්ඪිත්වා, වස්තු රැස්කොට; චෙතියං, සෑයෙහි; පතිට්ඨාපෙත්වා, පිහිටුවා; පාකතිකං කරොන්‍තො, සංස්කරණය කරන්නේ; රොගං, රෝගය; වූපසමෙතුං, සංසිඳුවා ගන්නට; නා සක්ඛි, නොහැකි විය. තෙන එව ආබාධෙන, ඒ ආබාධයෙන්ම; මහා දුක්ඛප්පත්තො, මහ දුකට පැමිණියේ; කුච්ඡිං, බඩ; ඵාලෙත්වා, පලා; කාලකිරියං කත්වා, කළුරිය කොට; උද්ධපාදෙ, පා උඩුකුරු කොට; අවං සිරො, හිස යටිකොට; ජලිත, දිලිසෙන; අඞ්ගාරමාලාසමාකුලෙ, ගිනි අඟුරුවලින් ගැවසුණු; මහා නිරයෙ, මහා නරකයෙහි; නිබ්බත්‍ති, උපන්නේය. තථාහි, ඒ එසේමැයි.

6. යො, යමෙක්; සධාතුකං, සධාතුක වූ; ථූපවරං, උතුම් සෑයක්; භෙදං, බිඳීමට; උපනෙති, පමුණුවයි ද; සො, හෙතෙම; වෙ, ඒකාන්‍තයෙන්; සිරිනාගො ඉව, සිරිනාග මෙන්; කෙවලං, සියළු; දුක්ඛස්ස, දුකට; භාගි හොති, හිමිවන්නේ ය.

7. යො, යමෙක්; ජින බිම්බස්ස, බුද්ධරූපයන්ගේ; හත්‍ථ පාදදි, අත් පා ආදිය; හෙදං; බිඳීම; කරෙ, කෙරේ ද; සො'පි, හෙතෙමේ ද; තාදිසකො හුත්වා, ඒ සිරිනාග මෙන් ව; අපායෙසු, අපායන්හි; උප්පජ්ජති, උපදී.

8. යො, යමෙක්; බොධිමහිරුහං, බෝරුකට; ඡෙජ්ජ හෙජ්ජාදිකං, සිදීම් බිඳිම් ආදිය; කත්වා, කොට; සො, හෙතෙම; වෙ, ඒකාන්‍තයෙන්; පච්චත්‍ථෙ, ඉහාත්මයෙහි; විනාසං අපි, විනාශයට ද; පෙච්ච, පරලොව; රොරුවං අපි, රෞරව නරකයට ද; යාති, යන්නේ ය.

9. ඉධ, මේ ලොකයෙහි; යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; තිහි ද්වාරෙහි, ද්වාරත්‍රයෙන්; ගණං, සඞ්ඝයා වහන්සේට; අපරජ්ඣති, අපරාධ කෙරේද; සො, හෙතෙම; හවෙ, ඒකාන්තයෙන්; චතුරොපායෙ, සතර අපායෙහි; දුක්ඛං, දුකට; භාගී භවිස්සති, හිමිවන්නේය.

10. ඉධ, මේ ලෝකයෙහි; යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම;

9. ඉධ, මේ ලොකයෙහි; යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; තීහි ද්වාරෙහි, ද්වාරත්‍රයෙන්; ගණං, සඞ්ඝයා වහන්සේට; අපරජ්ඣති, අපරාධ කෙරේද; සො, හෙතෙම; හවෙ, ඒකාන්තයෙන්; චතුරොපායෙ, සතර අපායෙහි; දුක්ඛං, දුකට; භාගී භවිස්සති, හිමිවන්නේය.

10. ඉධ, මේ ලෝකයෙහි; යො නරො, යම් මනුෂ්‍යයෙක් තෙම; සම්බුද්ධාගම පොත්ථකං, බුදුන්ගේ පිටකත්‍රය සම්බන්ධු වූ බණ පොත්; විනාසෙති, විනාශ කෙරේද; සො, හෙතෙම; ජිව්හා හිනෙනා, ච හොති, සිදිම් බිදිම් ඇත්තෙක්ම වේ. නිරයං ච, නරකයට ද; නිගච්ඡති, පැමිණෙන්නේය.

11. ඉති, මෙසේ; මහානත්ථකරං, මහත් අනර්ථකරවූ; පාපං, පාපය; පණ්ඩිතො, පණ්ඩිත තෙම; විඤ්ඤාය; නුවණින් දැන; පටිභයං, උවදුරු සහිත වූ; මග්ගං, මාර්ගය; යථා, යම්සේ ද; (එය) දූරතො; දුරින්ම; පරිවජ්ජෙය්‍ය, දුරු කරන්නේය.

12-13. එවං, මෙසේ; අමරා, දේවතාවෝ; කත සුචරිතං, කරන ලද කුසල් ඇති; චණ්ඩාලකම්පි, චණ්ඩාලයා පවා; තිදිවං, දිව්‍යලොකයට; නෙත්වා, ගෙන ගොස්; කාමං, කැමැති පරිද්දෙන්; සග්ග සම්පත්තිදනා, දිව්‍ය සම්පත්තිය දීමෙන්; සාධු, මනාව; පූජෙන්ති, පූජා කරත්. අථො, යලිත්; අකත, නොකරන ලද; සුකතා, කුසල් ඇති; භූමිපාලාපි, රජදරුවෝ ද; කාමං, ඒකාන්තයෙන්; ඝොරං, ඝොර වූ; අපායං, අපායට; ගච්ඡන්ති, යෙත්. පඤ්ඤා, නුවණැත්තෙනි, අපුඤ්ඤං, අකුශල ධර්මයන්; ජහථ, දුරුකරව්. පුඤ්ඤානි, කුශල ධර්මයන්; භජථ, භජනය කරව්.

**සිරිනාගස්ස වත්ථුං, සිරිනාගගේ කථාව; පඤ්චමං, පස්වැන්නයි.**

## 6. සැදැහැතිස්ස ඇමැතියාගේ කථාව.

**(5) 6. සද්ධාතිස්සාමච්චස්ස, සැදැහැතිස්ස ඇමතියාගේ; වත්ථුම්හි, කථා වස්තුවෙහි; අයං, මේ; ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1 ලඞ්කායං කිර, ලඞ්කාවෙහි; සද්ධාතිස්ස මහාරාජෙ, සද්ධාතිස්ස මහ රජතුමන්; රජ්ජං, කාරෙන්තෙ, රාජ්‍යය කරවන කල්හි; චූලරජෙ, සුළුන්නරු නම් ගමෙහි; තිස්සො නාම, තිස්ස නම්; එකො අමච්චො, එක් ඇමතියෙක්; අහොසි, විය. සද්ධා සම්පන්නො, සැදැහැත්තේ, තස්ස, ඔහුගේ; සද්ධාබලං නිස්සාය, ශ්‍රද්ධා බලය නිසා; සද්ධාතිස්ස අමච්චො ඉති, සද්ධාතිස්ස අමාත්‍යයා යැයි; නාමං අහොසි, නම් වීය.

තද, එකල්හි; සො, හෙතෙම; අනුරාධපුරං, අනුරාධපුරයට; ගන්ත්වා, ගොස්; රාජානං, රජතුමන්ට; උපට්ඨහමානො, උවටැන් කරමින්;

ප උපසති, වාසය කරයි. අථ, ඉක්බිති: එක දිවසං, එක් දවසක්: සො, හෙතෙම: රාජුපට්ඨානං කත්වා, රජතුමාට උපස්ථාන කොට: අත්තනො, තමාගේ: ගෙහං, ගෙට: ආගච්ඡන්තො, එන කල්හි: තාළචතුක්කම්හි, තාළ චතුෂ්ක නම් වනයෙහි: සුදස්සන පධාන සාලාය, සුදස්සන නම් පදන් ශාලාවෙහි: වසන්තං, වාසය කරන: පිණ්ඩපාතික තිස්සත්ථෙරං පිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන් වහන්සේ: පිණ්ඩාය, පිඬුපිණිස: චරන්තං, හැසිරෙනු: දිස්වා, දැක: පත්තං, පාත්‍රය: ගහෙත්වා, ගෙන: අත්තනො, තමාගේ: ගෙහං, ගෙට: ගන්ත්වා: ගොස්: හත්තං, බත්: අලභමානො, නොලබන්නේ: භත්ත පුටෙන සද්ධිං, බත් මුලක් සමග: මග්ග පටිපන්නං, මගට පිළිපන්: එකං පුරිසං, එක මිනිසකු: දිස්වා, දැක: සම්ම, මිත්‍රය කහාපණං, කහවනුවක්: ගහෙත්වා, ගෙන: හත්ත පුටං, බත් මුල: මෙ, මට: දෙහි ඉති, දෙන්නැයි: ආහ, කීය. අහං, මම: තෙ, එයට: න දස්සාමි ඉති, නොදෙමියි: වුත්තෙ, කී කල්හි: අනුපුබ්බං, පිළිවෙළින්: වඩ්ඪෙන්තො, වැඩි කරමින්: අට්ඨකහාපණෙ, කහවනු අටක්: ගහෙත්වා, ගෙන: මෙ, මට: දෙහි, දෙන්න: මම, මගේ: හත්ථෙ, අතෙහි: එත්තකං එව ඉති, ඇත්තේ මෙපමණැයි: ආහ, කීය. අථ, ඉක්බිති: සො, හෙතෙම: සාධු ඉති, යහපතැයි: අදසි, දුන්නේය. සො, හතෙම: තං, ඒ බත්මුල: ගහෙත්වා, ගෙන: පත්තෙ, පාත්‍රයෙහි: ආකිරිත්වා, බහා: ථෙරස්ස, තෙරුන් වහන්සේට: අදසි, දුන්නේය. ථෙරො, තෙරුන් වහන්සේ: පිණ්ඩපාතස්ස, පිණ්ඩපාතය: ආගමනං, ඤත්වා, ආහැටි දැන, අත්තනාව, තමා විසින්ම: අත්තානං එව, තමාටම: ඔවදන්තො, අවවාද කරන්නේ: ආහ, මෙසේ කීය.

2. තිස්ස, තිස්සය: එසො උපාසකො මේ උපාසක තෙම: තව, තාපගේ: න පිතා, පියෙක්ද නොවන්නේය: න භාතා, සහෝදරයෙක්ද නොවන්නේය. න මාතුලො, මාමා ද නොවන්නේය. න ඤාති, නෑයෙක්ද නොවන්නේ ය. න සුහදෙ යහළුවෙක් ද නොවන්නේ ය. දිට්ඨ සම්භත්තකො, දැඩි භක්තිමත් මිත්‍රයෙක් ද: න හොති, නොවන්නේය.

3. තයා, තා විසින්: පුරෙ, පළමුව: තස්ස, ඔහුට: කතං, කරන ලද: කිඤ්චි, කිසි: උපකාරං, උපකාරයකුත්: නත්ථි, නැත. තං තෙපි: සීලවන්තො ඉති, සිල්වත් සේකැ යි: ඤත්වා, දැන: තුයහං , තොපට: භොජනං, ආහාර: දස්සති, දුන්නේය. 4 .ත්වං, තෝ: තස්ස ඔහුට: මනන්තරං, අතිශයින් මහත් වූ: ආනිසංසං, ආනිසංසයක්: යදි, ඉදින්: ඉච්ඡසි, කැමැත්තෙහි නම්: ත්වං, තෝ: මියමානොපි, ප්‍රාණය නිරුද්ධ වේ නමුදු: සරාගො, සරාගීව: භොජනං, ආහාරය: න භුඤ්ජාහි, අනුභව නොකරව.

5. සො, ඒ තෙරුන් වහන්සේ: අත්තං, තමාට: ඔවදිත්වාන, අවවාද කොට: තද, එකල්හි: දුක්ඛක්ඛයං, දුක්ඛයාගේ ක්ෂය කිරීම: කත්වා කොට: බුද්ධ සාසන සොභකො, බුද්ධ ශාසනය බබුළු වන්නා වූ ධීරො, පණ්ඩිතතෙම: හත්ත කිච්ච , බත් කිස: අකා, කෙළේ ය.

6. එවං, මෙසේ: සො, උන්වහන්සේ: අත්තානං එව, තමන්ටම; ඔවදිත්වා, අවවාද කොට: ගෙහං, ගෙට: ගන්ත්වා, ගොස්: කරජකායං, කර්මජ ශරීරය ගැන: සම්මසන්තො, විමසා බලමින්: විපස්සිත්වා, විදර්ශනා වඩා: අරහත්තං, රහත් බවට: පත්වා, පැමිණ: පිණ්ඩපාතං, පිණ්ඩපාතය: පරිභුඤ්ජි, වැළඳීය: තදා, එකල්හි: රඤ්ඤො, රජුගේ: ජනෙන, සේසතෙහි: අධිවත්ථා දෙවතා, අධිගෘහිත දෙවතා දුව: සාධුකාරං, සාධුකාර: අදාසි, දුන්නීය: රඤ්ඤා, රජතුමන්: කිං අත්ථාය, කුමක් පිණිස: සාධුකාරං, සාධුකාර: අදාසි ඉති, දුන්නේ දැයි: පුට්ඨා, විචාරණ ලද්දී: සද්ධාතිස්සස්ස, සද්ධාතිස්සගේ: දානං, දානය: නිස්සාය, නිසා: සාධුකාරං, සාධුකාරය: අදාසිං ඉති, දුනිමියි: සබ්බං, සියල්ල: කථෙසි කීවාය.

රාජා, රජතුමා: තං ච, ඔහු ද: මාතාපිතරෙච, මවුපියන් ද, පක්කොසාපෙත්වා, කැඳවා: තෙසං, ඔවුනට: බ්‍රහ්මදෙය්‍යං කත්වා, අත පැන් වත්කොට: වඩ්ඪමාන නගරං, වඩමන් නුවර: අදාසි, දුන්නේය. අථ, ඉක්බිති: අපරස්මිං කාලෙ, පසු කලක: ලඞ්කා, ලංකාව: දුබ්බුට්ඨිකා අහොසි, මද වැසි ඇත්තේ විය. දුස්සස්සා, අයහපත් ධාන්‍ය ඇත්තේ විය: මනුස්සා, මිනිස්සු: පානීය, පැන්: අලභන්තා, නොලබන්නාහු: කිලමන්ති, ක්ලාන්ත වෙති: තදා, එකල්හි: තස්ස, ඒ ඇමතියාගේ: පුඤ්ඤානුභාවෙන, පින් බලයෙන්: දෙවතා, දේවතාවෝ: ජාතස්සරතො, මවන ලද විලකින්: පානීය ඝටං, පැන් කලයක්: ආහරිංසු, ගෙනවුත් දුන්හ. තතො, ඉක්බිති: සො, හෙතෙම: අය්‍යානං, ආයයීයන්ට: පානීයං, පැන්: අදත්වා, නොදී: පරිභොගො, පාවිච්චි කිරීම: මෙ, මට: නයුත්තො ඉති, නුසුදුසු යැයි: චින්තෙත්වා, සිතා: මම, මට: අනුකම්පාය, අනුකම්පා කොට, අය්‍යා, ආයයීයන් වහන්සේලා: ආගච්ඡන්තු ඉති, වඩිත්වායි: කාලං, සොසෙසි, කාල සොෂා කෙළේය. තතො, ඉක්බිති: තිංස සහස්ස මත්තා භික්ඛූ, තිස් දහසක් පමණ භික්ෂූහු: සමාගමිංසු, රැස්වූහ. අථ, එකල්හි: සො, හෙතෙම, තෙ භික්ඛූ, ඒ භික්ෂූන් වහන්සේට: යථාකාමං, කැමැති සේ: පානීයං ඝටෙන, පැන් කළයෙන්: (පැන් දී) උපට්ඨාසි, උපස්ථාන කෙළේ ය.

තදා'පි, එකල්හි ද: රඤ්ඤො, රජුගේ: ජනෙන, සේසතෙහි: අධිවත්ථා දෙවතා, අධිගෘහිත දෙව්දූ: සාධුකාරං, සාධුකාර: අදාසි, දුන්නාය. රාජා'පි, රජතුමා ද: තං, ඔහු: පක්කොසාපෙත්වා, කැඳවා: පුච්ඡිත්වා, විචාරා: යථාභූතං, තත්වූ පරිදි: සුත්වා, අසා: කොට්ඨද්වාරෙ, කොට දෙර: අන්තරගඞ්ගං නාම, අන්තර ගංගා නම් තැනක්: අදාසි, දුන්නේ ය.

7. අථ, ඉක්බිති: එක දිවසං, එක් දිනක්: අන්තරගඞ්ගං, අන්තරගඟට, ගච්ඡන්තො, යන්නේ: කණ්ඩද්වාරං පත්වා, කඩදෙරට පැමිණ: මයූර මංසා, මොනර මස්: ඛාදිතුකාමො, කනු කැමැත්තේ: මනුස්සෙ, මිනිසුන් අතින්: පුච්ඡි, විචාළේය. තෙ, ඔවුහු: නත්ථීති, නැතැයි: ආහංසු, කීහ. අථ, ඉක්බිති: අස්ස, ඔහුගේ: පුඤ්ඤානුභාවෙන, පුණ්‍යානුභාවයෙන්: දෙවතා, දෙවියෝ: මයූර මංසානි, මොනර මස්: උපනෙසුං, එළවූහ. තතො,

ඉක්බිති: සො, හෙතෙම: අයයානං, ආයෑයන් වහන්සේලාට: අදත්වා, නොදී: න පරිභුඤ්ජිස්සාමි ඉති, නො කන්නෙමියි: චින්තෙත්වා, සිතා: අයයා, ආයෑයන් වහන්සේ: ආගච්ඡන්තු ඉති, වඩිත්වායී: උග්ඝොසෙසි, අඬගැසීය. තදපි, එකල්හි ද: බහු භික්ඛු, බොහෝ භික්ෂූහු: සන්නිපතිංසු, රැස්වූහ. සො, හෙතෙම: තෙසං, උන්වහන්සේලාට: යාව දත්ථං, සෑහෙන පමණ: මයුර මංසෙන, මොනර මසින්: පරිවිසි, වැළඳ වීය. තදපි, එකල්හි ද: දෙවතා, දෙවි දූ: තථා එව, පෙර සේම: සාධුකාරං, සාධුකාර: අදසි, දුන්නාය. තද, එකල්හි: රාජා, රජතුමා: තං, ඔහු: පක්කොසාපෙත්වා, කැඳවා: බහු විභවං, බොහෝ සම්පත්: අදසි , දුන්නේය. අථාපරභාගෙ, ඊට පසු කාලයෙහි: රාජා, රජතුමා: චෙතිය පබ්බතෙ, සෑ පව්වෙහි: අම්බත්ථල මහාථූපෙ, අම්බස්ථල මහ සෑයෙහි: මනොසිලා පඩ්කෙන, රත් සිරියල් මඩින්: විලෙපනං, ගැල්වීම: කත්තුකාමො, කරනු කැමැත්තේ, තෙන තිස්සාමච්චෙන සද්ධිං, ඒ තිස්ස ඇමතියා සමග: අම්බත්ථලං, අම්බස්ථලයට: ආගමම, අවුත්: ථූපං, සෑය: මනොසිලා පඩ්කෙන, රත් සිරියලින්: විලිම්පිත්වා, ආලේප කොට: පූජං අකාසි, පූජා කෙළේය. අමච්චො, අපි, ඇමතියා ද: තද, එකල්හි: ද්වාදස සහස්සානං භික්ඛූනං, දොළොස් දහසක් භික්ෂූන් වහන්සේට: මණොසිලාවණ්ණානි, රත් සිරියල් පාට: තිචීවරානි, තුන් සිවුරු: අදසි, දුන්නේය. සබ්බෙ එව, සියළුම: හොන්තො, පින්වතුන් වහන්සේලා: ඉමානි, මේ සිවුරු: පාරුපිත්වා, පොරවා: චෙතියං, සෑය: වන්දන්තු, වඳිත්වා. අථ, අනතුරුව: තෙ, උන්වහන්සේලා: සුනිවත්ථා, මනාව හැඳ: සුපාරුතා, මනාව පොරවා: මනොසිලා පඩ්ක, රත් සිරියල් මඩෙහි: නිමග්ගාවිය, ගැලුණවුන් මෙන්: සොභමානා, බබලන්නාහු: තං චෙතියං, ඒ සෑය: පදක්ඛිණං කරොන්ත, පැදකුණු කරමින්: පටිපාටියා: පිළිවෙළින්: සුවණ්ණහංසා විය, රන් හසුන් මෙන්: ඔතරන්ති, බසිත්. තතො, එයින්: සොමනස්සජාතො, සොම්නසට පැමිණියේ: පීතියා, ප්‍රීතියෙන්: ඵුට සරීරො, පිනා ගිය සිරුරු ඇත්තේ: තෙන සොමනස්සෙන එව, එම සතුටින්ම: තත්ථ, එහි: ඨිතො'ව, සිටම: සොතාපන්නො අහොසි, සෝවාන් විය. රාජ පරිසාය අපි, රජ පිරිසෙන්ද: කෙචි, කිසිවෙක්: සොතාපන්නා අහෙසුං, සෝවාන් වූහ. තං අච්ඡරියං, ඒ පුදුමය: දිස්වා: දැක: බහු, බොහෝ දෙනා: දානං, දන්: දත්වා, දී: සීලං, සිල්: රක්ඛිත්වා, රැක: උපොසථ කම්මං කත්වා, පෙහෙවස් රැක: දෙවලොකෙ, දෙව්ලොව: නිබ්බත්තිංසු, උපන්හ.

8. හො, පින්වත්නි, කත සුචරිතං, කරන ලද සුචරිතය: අච්ඡෙරං, ආශ්චර්‍යය: නිජ්ඣරා ච, දෙවියෝ ද: අභිගන්ත්වා, සමීපයට පැමිණ: මානෙන්ති, බ්‍රහ්මන් කෙරෙත්. අථ, නැවත: එතං, මොහු: ථුතිමුඛා, ස්තුති මුඛයෙන්: වණ්ණන්තං, ගුණ වර්ණනාව: වණ්ණයන්ති වර්ණනා කෙරෙත්: එවං, මෙසේ: හෙයින්: විබුධ මනුජා, පණ්ඩිත මනුෂ්‍යයෙනි, (තෙපි) ඤත්වා, දැන: කිත්තිං, කීර්තිය: ථඤ්ඤමානාය, පැතිරවීමෙන්: ලොකෙ, ලෝකයෙහි: පුඤ්ඤං, පින්: සතතං, නිරන්තරයෙන්: කුරුථ, කරව්. බණං,

මොහොතකුත්: තුච්ඡං, හිස් බවට: මා යාතු, නොයවා.

**සද්ධාතිස්සා මච්චස්ස, සද්ධාතිස්ස අමාත්‍යයාගේ: වත්ථුං, කථාව: ජටඨං, සවැන්නයි.**

## 7. ශ්‍රමණ ග්‍රාම කථාව.

**(5) 7. සමණගාම වත්ථුං, ශ්‍රමණග්‍රාම කථාවස්තුවෙහි: අයං, මේ: අනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. එකස්මිං කිර සමයෙ, එක් කාලයෙක්හි: චෙතිය පබ්බත වාසිනො සෑගිරි වෙහෙර වැසි; ද්වාදස භික්ඛූ, දෙළොස් නමක් භික්ෂූහු; ලඞ්කාය, ලඞ්කාවෙහි; තස්මිං ඨානෙ, ඒ ඒ තැන පිහිටි; බොධි චෙතියානි, බෝධි චෛත්‍යයන්; වන්දමානා, වඳිමින්; අනුපුබ්බෙන, ක්‍රමයෙන්; සමණගාමං, මහණ ගමට; පාපුණිංසු, පැමිණියහ. තද එකල්හි; තෙ, උන්වහන්සේලා; සූරියෙ අත්ථමිතෙ, හිරු බැස ගිය කල්හි; රත්තිං, රාත්‍රියෙහි; අඤ්ඤත්ථ ගන්තුං, අන් තැනකට යන්ට; අසක්කොන්තා, නොහැක්කාහු; තස්ස, ඒ ගමට; පුබ්බ පස්සෙ, පූර්වදිග් භාගයෙහි; පබ්බත පාදෙ, පර්වත පාදයෙක්හි; ඡායාවන්තං, සෙවන ඇති; මහන්තං මාතුල රුක්ඛං, මහ මයිල ගසක්; දිස්වා, දැක; රුක්ඛමූලං, ගස මුලට; උපගම්ම, එළඹ; සයිංසු, නිදගත්හ. අථ බො, එකල්හි වනාහි; තෙසං අන්තරෙ, ඔවුනතුරෙන්; එකො භික්ඛු, එක භික්ෂුවක්; රත්ති භාගෙ, රාත්‍රි කාලයෙහි; උට්ඨාය, නැගිට; කස්සප දසබලෙන, කාශ්‍යප සර්වඥයන් වහන්සේ විසින්; දෙසිතා, දෙශනා කරන ලද; නන්ද බ්‍රහ්මණෙන ච, නන්ද බ්‍රාහ්මණයා විසින් ද; අම්හාකං, අපගේ සුතසොම බොධිසත්තස්ස, සුතසොම බෝධිසත්වයන්ට; කථිතා, කියන ලද; පරමත්ථ වන්තියො, උතුම් අර්ථයෙන් යුක්ත වූ; සතාරහා ගාථායො, සතාරහ ගාථා; (=සියයක පරිත්‍යාගයට සුදුසු) පරිවත්තෙත්වා, කියා; දෙවතානං, දෙවියන්ට; පත්තිං, පින්; අදසි, දුන්නේය. කථං? කෙසේද යත්:-

2. සුතසොම, සුතසොමයෙනි සබ්භි, සත්පුරුෂයන් හා; සකිං එව, එක්වරම; සමාගමො, සමාගමය; හොති, වේද; සා, සංගති, ඒ එක්වීම; තං, ඔහු; පාලෙති, රකියි. අසබ්භි, අසත්පුරුෂයන් හා; බහු, බොහෝ කලක්; සංගමො, එකතු විම; න පාලෙති, නොරකියි. (අයහපත පිණිස වේ.)

3. සබ්භි එව, සත්පුරුෂයන් සමාගම; සමාසෙථ, ආශ්‍රය කරව්. සබ්භි, සත්පුරුෂයන් සමග ම; සත්ථවං, එක්ව වාසය කිරීම; කුබ්බෙථ, කරව්. සතං සද්ධම්මං, සත්පුරුෂයන්ගේ ධර්මය; අඤ්ඤාය, දැනගැනීමෙන්; සෙය්‍යො හොති, උත්තමයෙක් වේ. න පාපියො, පව්ටෙක් නොවේ.

4. සුචිත්තා, මනාව විසිතුරු කරන ලද; රාජරථා, රාජ රථයෝ පවා; වෙ, ඒකාන්තයෙන්; ජීරන්ති, දිරත්. අථ, එපරිද්දිම; සරීරං අපි, ශරීරය ද; ජරං, ජරාවට; උපෙති, පැමිණේ. සතං ච ධම්මො, සත්පුරුෂ ගුණ ධර්‍ම තෙම; ජරං, ජරාවට; න උපෙති, නො පැමිණේ. සන්තො, සත්පුරුෂයෝ තුමූ; වෙ, ඒකාන්තයෙන්; සබ්හි, සත්පුරුෂයන් සමග; පවෙදයන්ති, ප්‍රකාශ කෙරෙත්.

5. රාජා, රජතුමනි, නභා ච, අදහස කෙරෙන් ද; පඨවි, පොළොව; දූරෙ ච, දුර යයි ද; ආහු, කීහ. සමුද්දස්ස, සමුද්‍රයාගේ; තං පාරං, ඒ එතෙර; දූරෙ, දුර යයි; කීහ. සතං ච ධම්මං, සත්පුරුෂ ධර්‍මය ද; අසතං ච, අසත්පුරුෂ ධර්‍මය ද; (යන දෙක) තතො, ඊට ද වඩා; හවෙ, ඒකාන්තයෙන්; දූරන්ති, දුර යයි; වදන්ති, කියත්.

6. තස්මිං රුක්ඛෙ, ඒ රුකෙහි; අධිවත්ථො දෙවපුත්තො, අධිගෘහිත දේව පුත්‍රයා; තං ඒ ගාථා; සුත්වා, අසා; පසන්නො, පහන් සිත් ඇතිව; පභාතාය රත්තියා, රාත්‍රිය පහන් වූ කල්හි; භික්ඛූනං, භික්ෂූන්; ගමන කාලෙ, යන කල්හි; මනුස්සවණ්ණෙන, මිනිස් වෙසින්; ආගම්ම, අවුත්; තෙසං, උන්වහන්සේලාට, එවං, මෙසේ; ආහ. කීය. භන්තෙ ස්වාමීනි, අජ්ජ, අද, මා ගච්ඡථ, නොයනු මැනව; රුක්ඛමූලෙ එව, ගස මුලම; නිසීදථ, හිඳිනු මැනව; අහං, මම; වො, නුඹවහන්සේලාට; පිණ්ඩපාතං, පිණ්ඩපාතය; උපනෙස්සාමි ඉති, එළවන්නෙමි යි; භික්ඛූ; භික්ෂූහු තස්ස, ඔහුගේ; ආරාධනං, ආරාධනාව; සම්පටිච්ඡිත්වා, පිළිගෙන; නිසීදිංසු, වැඩ හුන්හ. තස්ස කිර දෙවපුත්තස්ස, ඒ දේව පුත්‍රයා හට වනාහි; භොජන උප්පාදනෙ, ආහාර ඉපදවීමෙහි; පුඤ්ඤං, පිනක්; නත්ථි, නැත. නිච්චං, එව, නිතරම; බදලතා පණ්ණං, බදලතා කොළ; නිබ්බත්තති, උපදී, සො, හෙතෙම; තං, ඒ කොළ; පරිභුඤ්ජන්තො, අනුභව කරමින්; තත්ථ, එහි; වසති, වසයි. තද එකල්හි; සො, හෙතෙම; භික්ඛූ නම්පි, භික්ෂූන් වහන්සේලාටද; දිබ්බොජ පුණ්ණ, දිව්‍ය ඕජසින් පිරි; බදලතා පණ්ණං එව, බදලත කොළම, උපනෙසි, එළවීය.

භික්ඛූ පි, භික්ෂූහු ද; තෙන, එයින්; කත භත්ත කිච්චා, කරණ ලද බත් කිස ඇත්තාහු; ථොකං, ටිකක්; විස්සමිත්වා, විශ්‍රාම ගෙන; මාරිස, නිදුකාණෙනි මයං, අපි; ගච්ඡාම ඉති, යම්හයි; දෙවපුත්තස්ස, දිව්‍ය පුත්‍රයා හට; අවොචුං කීහ දෙවපුත්තො, දිව්‍ය පුත්‍රයා; තං සුත්වා, ඒ අසා; භදන්තො, පින්වත් ස්වාමිවරුනි බමථ, සමාවනු මැනව; මම සන්තිකා, මාගෙන්; ලූඛ පණ්ණං එව, රළු කොළ ම; පරිභුංජිංසු, වැළඳූහ. මම සහායකො, මගේ යහළු; එකො දෙව පුත්තො පන, එක්දිව්‍ය පුත්‍රයෙක්; අත්ථි, ඇත. සො, හෙතෙම; දිවසන්තරම්පති, දවසක් හැර දවසක්; ඉධ, මෙහි; ආගම්ම, අවුත්; සපරිසො, පිරිවර සහිතව; මහතා ආනුභාවෙන, මහත් ආනුභාවයෙන්; දිබ්බ භොජනං, දිව්‍ය භොජන; පරිභුඤ්ජිස්සති, අනුභව කරන්නේය. සෙව බො පන, හෙට වනාහි; අස්ස, ඔහුගේ; ආගමන දිවසො, එන දිනයයි; අය්‍යා, ආය්‍යීයන් වහන්සේලා; භත්ත

කිච්චාං, බත් කිස; කත්වා, කොට; ගච්ඡන්තු ඉති, යෙත්වායි; නිමන්තෙසි, ආරාධනා කෙළේය.

අථ, ඉක්බිති; අස්ස රත්තියා අච්චයෙන, ඒ රාත්‍රිය ඉකුත් වීමෙන් පසු; සහායො දෙවපුත්තො, යහළු දිව්‍ය පුත්‍රයා; සපරිසො, පිරිවර සහිතව; තස්ස, සන්තිකං, ඔහුගේ සමීපයට; අගමාසි, ගියේය. තස්ස කිර පරිභොගත්ථං, ඔහුගේ පරිභොගයට; තිගාවුතට්ඨාන මග්ගෙ, තුන් ගව්වක් පමණ තැන මගෙහි; දිබ්බ යාගු භාජනානි, දිව්‍යමය කැඳ භාජන; ගහෙත්වා, ගෙන; පටිපාටියා, පිළිවෙළින්; අට්ඨංසු, සිටියාහු ය.

තතො, ඉක්බිති; සො දෙවපුත්තො, ඒ දිව්‍ය පුත්‍ර තෙම; ථෙරෙ, තෙරවරුන්; නිසීදාපෙත්වා, වඩා හිඳුවා; දිබ්බයාගුහි, දිව්‍යමය කැඳ, පරිවිසිත්වා, වළඳවා; පච්ඡා, පසුව; සපරිසො, පිරිවර සහිතව; සයං, තෙමේ; පරිභොගං, පරිභොග; අකාසි, කෙළේය. අථන්තරං, ඊට අනතුරුව; ඛජ්ජකං, කැවිලි; ගහෙත්වා, ගෙන; තථා එව, එසේම; අට්ඨංසු; සිටියාහුය. සො, හෙතෙම; තානිපි, ඒවාද; තථා එව, එසේම; පටිපජ්ජ, පිළිපැද; තතො, ඉක්බිති; උපකට්ඨාය වෙලාය, වේලා ආසන්න වූ කල්හි; නා නා විධ බ්‍යඤ්ජන සහිතං, නොයෙක් ව්‍යංජන සහිත වූ; දිබ්බ භොජනං, දිව බොජුන්; ගහෙත්වා, ගෙන; තථා එව, එසේම; අට්ඨංසු, සිටියාහ. දෙවපුත්තො, දිව්‍ය පුත්‍ර තෙම; දිබ්බ භොජනෙහි, දිව්‍ය ආහාරයෙන්; ථෙරෙ, තෙරවරුන්; සම්මා, පරිවිසිත්වා, මනාව වළඳවා, සක්කාරං අකාසි, සත්කාර කෙළේය. අථ, අනතුරුව; තෙ ථෙරා, ඒ භික්ඛූහු; දෙව පුත්තස්ස, දිව්‍ය පුත්‍රයගේ; මහන්තං දිබ්බසම්පත්තිං, මහා දිව්‍ය සම්පත්; දිස්වා දැක; විම්හිත මානසා, පුදුමයට පැමිණි සිත් ඇත්තෝ, තස්ස, ඔහුගේ; තං කත කම්මං, ඒ කළ පින්කම; පුච්ඡන්තා, විචාරන්නාහු; ආහංසු, ඇසූහ.

7. දෙව, දිව්‍ය පුත්‍රය; මහානුභාවො, මහත් ආනුභාව ඇත්තේ; ඉද්ධිපත්තො, සෘද්ධියට පැමිණියේ; අසි, වෙහි; තෙ, තොපගේ; වණ්ණො, ශරීර වර්ණය; සබ්බාදිසා, සියළු දිසාවන්; පභාසති, ආලෝක කරයි. නානායුධා, නොයෙක් දිව්‍යායුධ ගත් අත් ඇති; චාමර මොර හත්ථා, සෙමර මොනර පිල් ආදිය ගත් අත් ඇති; පරිසා, පිරිස; පරිවාරයන්ති, පිරිවරා සිටිත්.

8. උළාරවණ්ණා, මහත් වූ දිව්‍යාලඞ්කාරයෙන් සැරසුණාවූ; සුරඞ්ගනා, දිව්‍යාඞ්ගනාවෝ; සමන්තා, හාත්පසින්; රඞ්ගගතා, රඟමඩුලු ගියාහු. නච්චෙහි ගීතෙහි, නෘත්‍ය ගීතයෙන්; සමංගීභූතා, යුක්තව; ලයාවියුත්තං, ලයෙන් තොර නොවූ; සවණාමතං, කණට අමාවක් වූ; ගීතං, ගී; ගායන්ති, ගායනා කරත්.

9. කාචි කඤ්ඤා, සමහර දිව්‍ය කන්‍යාවෝ; සමජ්ජ මජ්ඣම්හි ච, නෘත්‍ය මණ්ඩල මධ්‍යයෙහි; සරෙන, ගීතස්වරයෙන්; තන්ති සරං, තන්ත්‍රීස්වරය; නාතික්කමං, නො ඉක්මවා; වීණාදිච, වීණා ආදියද; වංස,

වස් කුලල් ද; තන්ත්‍රි, තන්ත්‍රි ආදිය ද; පග්ගය්හ, ගෙන; ලයන්තියො, ගායනා කරන්තියෝ; තං, තොප; පරිතොසයන්ති. සංතෝෂ කරත්.

10. අනෙකා ජනා, නොයෙක් දිව්‍ය පුත්‍රයෝ; නෙකා, අනෙක ප්‍රකාර වූ; භෙරි, බෙර ද; මුතිඞ්ගා, මිහිඟු බෙර ද; මුරජා ච, මුරජ බෙර ද; දෙණ්ඩිමා, පනා බෙර ද; සනා ච, කුළු තාලම් ආදිය ද; සුසිරා දයොච, හුණු කුලල් ආදී නලාවර්ගද; පග්ගය්හා, ගෙන; පහට්ඨරූපා, තුටු පහටු ස්වරූප ඇත්තාහු; නච්චන්ති, නටත්; කීලන්ති, ක්‍රීඩා කරත්. වාදෙන්ති, වාදනය කරත්.

11. දිබ්බන්නපානෙහි, දිව්‍ය ආහාර පාන වලින්; සුපුණ්ණා, මනාව පිරුණාවූ; සොණ්ණමයාදි, රන් මුවා ආදී වූ; නානාවිධ භාජනානි, නොයෙක් භාජනයන්; පග්ගයහ, ගෙන; තිගාවුතස්මිං, තුන්ගව් පමණ තන්හි; තිට්ඨන්ති, සිටිත්. සපාරි සජ්ජා, පිරිවර සහිත වූ; ත්වං, තෝ; තෙන, එයින්; මොදෙසි, සතුටු වන්නෙහි.

12. මහානුභාව, මහත් ආනුභාව ඇති; දෙව දේවතාවෙනි තෙ, තොපගෙන්; පුච්ඡාමි, අසමි; මනුස්සභූතො, මිනිසෙක් වූ සමයෙහි; කිං පුඤ්ඤ, කවර පිනක්; අකාසි, කෙළේ ද? තෙ, තොපගේ; වතං, ව්‍රතය; කිං, කවරේද? බ්‍රහ්මචරියං පන, බ්‍රහ්මචරියාව වනාහි; කිං, කවරේද? කිස්ස සුචිනස්ස, කවර කුශල කර්මයක්හුගේ; අයං විපාකො, මේ විපාකයද?

13. තතො, ඉක්බිති; සො දෙවපුත්තො, ඒ දිව්‍ය පුත්‍රයා; තෙසං, උන්වහන්සේලාට; අත්තනා, තමා විසින්; අතීත භවෙ, පෙර භවයෙහි; චෙතිය පබ්බතෙ, සෑ පවු වෙහෙරෙහි; සමණො හුත්වා, භික්ෂුවක් වී. අත්තනො, තමන්ට; වස්සග්ගෙන ආහත හත්තතො, වසහින් පමුණුවන ලද ආහාරයෙන්; උපඩ්ඪං, භාගයක්; සඞ්ඝස්ස, සඞ්ඝයා වහන්සේගේ; අත්ථාය, ප්‍රයෝජනය පිණිස; දත්වා, දී; මයා, මා විසින්; ඉමං අධිගතං ඉති, මේ සම්පත්තිය ලබාගතිමියි; පකාසෙන්තො, ප්‍රකාශ කරමින්; ආහ. මෙසේ කීය.

14. ලඞ්කාතලෙ, ශ්‍රී ලඞ්කාද්වීපයෙහි; මිස්සක පබ්බතෙ ඉති, මිස්සක පව්ව යයි; (=මිහින්තලය) පසිද්ධ නාමො, ප්‍රසිද්ධ නමක් ඇති; මහා විහාරො, මහා විහාරයක්; ආසි, වීය. බුද්ධූහි ථූපෙහි, බොහෝ දගැබ් වලින්; විරාජමානො, බබලන; මුනින්ද බිම්බාලය පත්ති යුත්තො, බුදුපිළිම ගෙවල් පඞ්ක්තියෙන් යුක්තය.

15. බොධිමහීරුහෙහි, බොධි වෘක්ෂ පඞ්ක්තියෙන්; විභූසිතො, සැරසුනේය. සෙතකමාලකෙහි, සුදුවැලි මළුවෙන් ද; විරාජිතො, බබලන; සුපුල්ල, මනාව පිපි මලින් හා; සීතොදක, සිසිල් ජලයෙන්; සම්පුණ්ණා, පිරුණා වූ නෙක, අනෙකප්‍රකාර වූ; ජලාසයෙහි; ජලාසයන්ගෙන් ද; සමාකුලො, ගැවසී ගත්තේය.

16. වීසාධිකෙ, විස්සක් අධික කොට ඇති; සත්ත සතෙ, සත්සියයක් හා; ජබ්බීස අධිකෙහි, සවිස්සක් අධික කොට ඇති; සත්ත සතෙහි, සත් සියයක් පමණ වූ; (=එක් දහස් සාරසිය සතළිස් හයක්) පරිවෙණ පන්තීහි, පිරිවෙන් ගෙවල් පංතියෙන්; සමන්තා, හාත්පස; සුදස්සනීයො, අතිශයින් දැකුම් කළුවූ; (ඒ විහාරය) සදා, හැම කල්හි; ජනානං, ජනයන්ට; පීතිං, ප්‍රීතිය; පවඩ්ඪෙති, වඩවයි.

17. තහිං වසන්තා, ඒ පිරිවෙන්වල වාසය කරන්නා වූ; සුපෙසලා, ප්‍රිය ස්වභාව ඇති; නෙකගුණා, නොයෙක් ගුණයෙන්; අධිවාසකා, අධිකව වසන්නා වූ; යතිරාජ පුත්තා, බුද්ධපුත්‍රවූ සඞ්ඝයා වහන්සේ; සබ්බජනෙහි, සියළු ජනයන් විසින්; සම්මා, මනාකොට; කතාදරා, කරන ලද ආදර ඇත්තාහු; අත්තත්ථ, ආත්මාර්ථයාගේ සහ; පරත්ථ, පරාර්ථයාගේ; සිද්ධං, සිදු කිරීම; කරොන්ති, කරත්.

18. හදන්තා, ස්වාමිවරුනි, අහං, මම; දුතියත්තභාවෙ, දෙවෙනි ජාතියෙහි, තහිං. ඒ විහාරයෙහි; එකො සමණො අහොසිං, එක් ශ්‍රමණයෙක් වීමි. තදා, එකල්හි; සද්ධාධුරං, ශ්‍රද්ධා ධුරය හා; සීලධුරං, ශීල ධුරය; වහන්තො, උසුලන්නේ; පටිපත්තිනා, ප්‍රතිපත්තියෙන්; වත්‍ථුතයං, තුනුරුවන්; මහන්තො, පුදන්නෙක් වීමි.

19. තතො, එයින්; අපරස්මිං සමයෙ, මෑත කාලයෙහි; මහා ජනා, මහජනයා; සඞ්ඝං උද්දිස්ස, උදෙසා; සුචිං, පිරිසිදු වූ; පණීතං, ප්‍රණීත වූ; පචුරං, බොහෝ; අන්නපානං, ආහාර පාන; සමුපානයිත්වා, එලවා; සුමනා, යහපත් සිත් ඇත්තාහු; සහත්ථා, සිය අතින්; භික්ඛූ, භික්ෂූන්; භොජෙන්ති, වළඳවත්.

20. අහම්පි, මම ද; මෙ, මා විසින්; ලද්ධං, ලබන ලද; පටිවිංසකං, කොටස; තතො, එයින්; උපඩ්ඪං, භාගයක්; දන්සස්සහි,දනයාගේ වනාහි, එලම්පි, එලයද; සද්දහන්තො, අදහන්නේ; බුද්ධානු භාවං, බුද්ධානු භාවය; මනසි කරොන්තො, මෙනෙහි කරන්නේ; සඞ්ඝස්ස, සඞ්ඝයාට; අදදිං, දුනිමි.

21. මම, මාගේ; ඉදං පදනං, මේ ප්‍රදනය වන්නේය. මම, මාගේ; ඉදං තං වතං, ඒ මේ ව්‍රතය වන්නේය. මයා, මා විසින්; කතෙන, කරන ලද; අනෙන පුඤ්ඤෙන, මේ කුශල කර්මයෙන්; තතො චුතො, එයින් චුත වූයේ භුම්මදෙවෙසු, භූමාට දෙවියන් කෙරෙහි; ජාතො, උපන්නේ අනූනං, ඌනත්වයක් නැත්තා වූ; දිවසිරිං, දිව්‍ය ඓශ්වර්යය; අහං, මම; භුඤ්ජාමි, අනුභව කරමි.

22. සද්ධාය, ශ්‍රද්ධාවෙන්; ඨානෙ, සුදුසු ස්ථානයෙහි; පකතං, කරන ලද; පදනං, දීම; අප්පම්පි, ස්වල්ප වූයේ ද; මහා විපාක හොති එව, මහත් විපාක වේමය; යථා, යම් සේ; සුඛෙත්තෙ, යහපත් ක්ෂෙත්‍රයෙක්හි; වපිත, වපුරවන ලද; අප්ප බීජං, ස්වල්ප බීජයද; බලු, ඒකාන්තයෙන්;

කස්සකස්ස, ගොවියාගේ; චිත්තං, සිත; තොසෙති, සතුටු කරයි.

23. එවං, මෙසේ; සො, හෙතෙම; අත්තනා, තමා විසින්; කතං, කරන ලද; කුසල කම්මං, කුශල කර්මය; පකාසෙසි, ප්‍රකාශ කෙළේ ය. භික්ඛූ, භික්ෂූහු; තස්ස, ඔහුගේ; කථං සුත්වා, කථාව අසා; ගත ගතට්ඨානෙ, ගිය ගිය තන්හි; දෙව පුත්තෙන, දිව්‍ය පුත්‍රයා විසින්; කත කම්මං, කරන ලද කර්මය; පකාසෙන්තා, ප්‍රකාශ කරමින්; බහු ජනෙ, බොහෝ ජනයා; දානාදිසු, දන්දීමේ ආදී වූ; දස කුසල කම්මෙසු, දශ කුශල කර්මයන්හි; නියොජෙසුං, යෙදවූවාහුය.

24. භො භො, පින්වත් පින්වත්නි එවං, මෙසේ; කුසල නිරතා කුසල්හි ඇලුනාහු; ඛෙත්තං, යහපත් පින් කෙතක්; ඔලොකයිත්වා, බලා; අණුම්පි, සවල්ප වූද; බීජං, වස්තු බීජය; දත්වා, දන් දී; අනප්ප භොගං, බොහෝ සම්පත්; ලබන්ති, ලබත්. භො, පින්වත්නි එකං කබලම්පි, එක කබලකුදු; ලද්ධාන, ලැබ; සුසීලෙ, යහපත් සිල්වතුන් කෙරෙහි; භත්ති නින්නා, භක්තියෙන් අවනත වූවාහු; දත්වා, දන් දී, දිබ්බ මනුජං, දිව්‍ය මනුෂ්‍ය වූ; භොගං, සම්පත් ද; සිවං ච, නිවන් සම්පත්තියට ද; භාගී අස්ස, හිමි වවි.

**සමණගාම වත්ථුං, ශ්‍රමණ ග්‍රාම කථාව; සත්තමං, සත්වැන්නයි.**

## 8. අභය ස්ථවිරයන්ගේ කථාව.

**(5) 8. අභයත්ථෙරස්ස වත්ථුං, අභය ස්ථවිරයන්ගේ කථා වස්තුවෙහි; අයං, මේ; ආනුපුබ්බී, පිළිවෙළ කථාවයි.**

1. ලඞ්කායං, ලඞ්කාවෙහි; පච්ඡිම පස්සෙ, (අනුරාධපුර නුවරට) බස්නාහිර පැත්තෙහි; පුප්ඵවාසං නාම, මල් වැස්ස නම්; රමණීයං, සිත් කළු; විහාරං අහොසි, විහාරයක් විය. තස්ස ආසන්නෙ, ඒ විහාරය ආසන්නයෙහි; දෙව ගාමෙ, දෙව නම් ගමේ; දෙවො නාම අමච්චො, දෙව නම් අමාත්‍යයෙක්; තස්ස, ඔහුගේ; ඉස්සරං, ප්‍රධානත්වය; වත්තෙති, පවත්වයි. අථ, ඉක්බිති; එකදා, එක දවසක් අමච්චො, ඇමතිතුමා; තත්‍ථ, එහි; ආහිණ්ඩිත්වා, ඇවිද; ගාමං, ගමට; ආගතා, පැමිණියේ; ජාතජ්ඣත්තො, සයින් පෙළුණු ශරීර ඇත්තේ; වෙය්‍යාවච්චකරෙ, වතාවත් කරන්නන්; ආමන්තෙත්වා, අමතා; භුඤ්ජිස්සාමි ඉති, අනුභව කරන්නෙමියි; ආහ. කීය. අථ, එකල්හි; අස්ස, ඔහුට; තෙ, වතාවත් කරන්නන්; භත්තං, කෑම, වඩ්ඩෙසුං, එළවූහ. තස්මිං ඛණෙ, එකෙණෙහි; එකො ජාත සුනඛො, බඩ සයින් පෙළුණු එක් බල්ලෙක්; ජිඝච්ඡාපිළිතො, බඩසයින් පෙළුණේ; කම්පමානො, වෙවුලන්නේ; භත්තං දිස්වා, බත් දැක; ඉතො, මෙයින්; කිඤ්චි, කිසිවක්; අපිනාම ලභෙය්‍යං ඉති, ලදිම් නම් මැනැවැයි; සො, ඒ

සුනඛ්‍යා; තස්ස, ඔහුගේ; සමීපං, ලඟට; උපසංකමි; පැමිණියේය.

තස්ස, ඔහුගේ; එකොවුල්ලුපට්ඨාකො, එක් සුළු සේවකයෙක්; සුනඛං, බල්ලා; පලාපෙස්සාමි ඉති, පලවා හරින්නෙමියි; මහන්තං දණ්ඩං, මහ පොල්ලක්; ආදය, ගෙන; උපධාවි, දිවීය. අමච්චො ඇමැතියා; තස්මිං, ඒ බල්ලා කෙරෙහි; කාරුඤ්ඤෙන, කරුණාවෙන්, හො, පින්වත; තං, ඌට; මා පහර ඉති, නොගසන්නැයි; නිවාරෙත්වා, වළක්වා; නා නා අග්ගරසෙන, නොයෙක් අග්‍ර රසයෙන් යුත්; මහන්තං භත්තපිණ්ඩං, මහා බත් පිඩක්; වට්ටෙත්වා, ගුලි කොට; අදසි, දුන්නේය. තතො, ඉක්බිති; සො සුනඛො, ඒ බල්ලා; භත්තං, බත්; භුඤ්ජිතුං, කන්ට; ආරභි, පටන් ගත්තේය. තං දිස්වා, ඒ දැක; අමච්චො, ඇමතියා; අත්තනා, තමා විසින්; දින්න දනෙ, දෙන ලද දනයෙහි; චිත්තං, සිත; පසාදෙසි. පැහැද විය. සො, හෙතෙම; එත්තකෙන එව පුඤ්ඤ කම්මෙන, මෙපමණ පින්කමින්ම; තතො චුතො, එම ආත්ම භාවයෙන් චුතව; තස්මිං එව ගාමෙ, එම ගමෙහිම; එකස්මිං කුලගෙහෙ, එක් කුල ගෙදරක; නිබ්බත්ති, උපන්නේය. සො, හෙතෙම; අනුක්කමෙන, පිළිවෙලින්; වුඩ්ඪිං අන්වාය, වැඩිවියට පැමිණ; දරාභරෙණන; අඹුවන් පොෂණය කොට; ගෙහං, ගෙදර; අවසිත්වා, නොවැස; මහල්ලක කාලෙ, මහළු කාලයෙහි; පුප්ඵවාස විහාරං ගන්ත්වා, මල් වැස්ස විහාරයට ගොස්; භික්ඛූනං, භික්ෂූන් වහන්සේගේ; සන්තිකෙ, සමීපයෙහි; පබ්බජිත්වා, පැවිදිව; පරියත්ති සද්ධම්මෙ, පයර්‍යාප්ති සද්ධර්මය; උග්ගහෙත්වා, ඉගෙන; මහා අභයත්ථෙරො ඉති, මහා අභය ස්ථවිර යයි; පාකටො අහොසි, ප්‍රසිද්ධ වී. තථාහි, ඒ එසේමැයි. චිත්තෙ පසන්නෙ සති, සිත පැහැදුණු කල්හි; තිරච්ඡාන ගතස්ස අපි දින්න දනං, තිරිසන්ගතයෙකුට පවා දුන් දනය; මහා විපාකං හොති, මහත් විපාකයක් වේ.

2. ඉධ, මේ ලෝකයෙහි; යො නරො, යම් මනුෂ්‍යයෙක් සද්ධං, ශ්‍රද්ධාව; පුරතො කත්වා, පෙරදැරි කොට; කපිලකං උපාදය, කුරා කුහුඹුවන් පටන් ගෙන; තිරච්ඡානගතස්සපි, තිරිසන් ගතයන් හට; දනං දෙති, දන් දේද;

තස්ස දනස්ස, ඒ දනයාගේ; විපාකං, විපාකය; දෙව මානුසිකං සුඛං, දිව්‍ය මනුෂ්‍ය සම්පත්; දත්වා, දී; අනෙත, කෙළවර; නිබ්බාන සම්පත්තිං, නිර්වාණ සම්පත්තිය; දෙති ඉති, දෙන්නේ යයි; නිච්ඡිතං, නිශ්චය කරන ලදි.

3. අථ, ඉක්බිති; අපරස්මිං සමයෙ, පසු කාලයක; ලඞ්කායං, ලංකාවෙහි; බ්‍රාහමණාතියං, බැමිණිතියා නම් වූ; චොර භයං, සොර බියක්; අහොසි, විය. තද, එකල්හි; ද්වාදය සංවච්ඡරං, අවුරුදු දෙළසක්; මෙඝො, වැස්සක්; සම්මා, මනා කොට; න පාවස්සි, නො වැස්සේය. දුබ්භික්ඛ භයං ච, දුර්භික්ෂ භයක් ද; චොර භයං ච, සොර බියක් ද; අහොසි, විය. තතො, එනිසා; විහාරාසන්නෙසු, විහාරය සමීපයෙහි;

මනුස්සා, මිනිස්සු; ජීවිතුං, ජීවත් වනට; අසක්කොන්තා, නොහැක්කාහු; අඤ්ඤත්‍ර ගන්ත්වා, අන් තැනකට ගොස්; ජීවිකං, ජීවිකාව; කප්පෙස්සාම ඉති, කරමුයි; ථෙරං උපසංකම්ම, තෙරුන් වහන්සේ වෙත පැමිණ; එවං, මෙසේ; ආහංසු, කීහ. භන්තෙ, ස්වාමීනි ජාතක භයං, දුර්භික්ෂ භයක්; උප්පන්නං, උපනී. එත්ථ වසන්තෙහි, මෙහි වසන්නවුන් විසින්; ජීවිතුං, ජීවත් වීමට; නසක්කමා, නොහැක්කෙමු. තුම්හෙ, ඔබ වහන්සේ ද; (අප සමග) ආගච්ඡථ ඉති, වඩින්නැයි; යාචිංසු, ආරාධනා කළහ. අථ, එකල්හි; ථෙරො, තෙරුන් වහන්සේ; තෙසං, ඔවුන්ට එවං, මෙසේ; ආහ, කීය. භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; ධාතුං, ධාතු; පතිට්ඨාපෙත්වා, නිධන් කොට; කත, කරන ලද; චෙතියං ච, චෛත්‍යය ද; බොධිං ච, බොධිය ද; ජීවමාන බුද්ධං විය, ජීවමාන බුදුන් මෙන්; පරිහරන්තො, රැක ගනිමින්; මානෙන්තො, බුහුමන් කරමින්; පූජෙන්තො, පුදමින්; නිච්චං, නිතර; පටිවසාමි, වාසය කරමි. මයා, මා විසින්; තං පහාය, ඒ වස්තූන් අත්හැර; ගන්තුං, යන්ට; න සක්කා, නොහැක. එත්ථ එව, මෙහිම; ආහං, මම; වසන්තො, වසමින්; ආපාණ කොටිං, දිවි කෙළවර තෙක්; තං, ඒවා; පටිජග්ගිස්සාමි, පිළිදැගුම් කරන්නෙමි. මං, මා සමග; ගමනාය, යාමට; මා උස්සහථ, උත්සාහ නො කරව්; තං සුත්වා, ඒ අසා; මනුස්සා, මිනිස්සු; තත්ථ තත්ථ, ඒ ඒ තැන්හි; පලායිංසු, පලා ගියහ. තතො, ඉක්බිති; ථෙරො, තෙරුන් වහන්සේ; අනාහාරො එව, ආහාර නොගෙනම; පඨම දිවසෙ, පළමු දවසෙහි; වත්ත පටිවත්තෙන එව, වත් පිළිවෙතින්ම; දිවසං, දවස; වීතිනාමෙසි, ගෙවීය. තථා දුතිය දිවසේ, දෙවැනි දවසෙහි ද එසේම විය. තතිය දිවසෙ පන, තුන්වැනි දිනයෙහි වනාහි; චෙතියබොධියඞ්ගනෙසු, සෑමළු බෝමළු ආදියෙහි; සම්මජ්ජනාදිනා, ඇමදීම් ආදියෙන්; කත්තබ්බ කම්මං කත්වා, කළ යුතු කම් කොට; ආගම්ම, අවුත්; විතක්ක මාලකෙ, විතකීන මළුවෙහි; අට්ඨාසි, සිටියේ ය.

අථ, එකල්හි; අස්ස, උන්වහන්සේගේ; ගුණ තෙජෙන, ගුණ තේජසින්; මාලක පරියන්තෙ, මළුව කෙළවරෙහි; ඨිත, සිටි; කරඤ්ජක රුක්ඛෙ, කරඳ ගසෙහි; අධිවුත්ථ, අධිගෘහිත; දෙවපුත්තො, දිව්‍ය පුත්‍ර තෙම; මිලාත සරීරං, මැලවුණු ශරීර ඇති; ථෙරං, තෙරුන්; ඔලොකෙත්වා, බලා; අත්තනා, තමාගේ; භරියං, භාර්‍යාව; ආමන්තෙත්වා, අමතා; සො අයං අභයත්ථෙරො, ඒ මේ අභය තෙරුන් වහන්සේ; චෙතියං ච, සෑයද; බොධිං ච, බෝධියද; පහාය, අත්හැර; අඤ්ඤත්ථ, අන් තැනෙක්හි; න ගච්ඡාමි ඉති, නොයමියි; කත පටිඤ්ඤො, කරන ලද ප්‍රතිඥා ඇත්තේ; එව රූපෙ, මෙබඳු; ජාතක භයෙ, දුර්භික්ෂ භයෙහි; කත්ථචි, කිසි තැනෙක්හි; ආගන්ත්වා, නොගොස්; පීනන්තහන්තො, සුන්බත්ව; වත්තපටිවත්තං, වත් පිළිවෙත්; කරොති, කරයි. තස්ස, උන් වහන්සේට; අඤ්ඤං, අනික්; භික්ඛාචාරට්ඨානං, භික්ෂාවෙහි හැසිරෙන්නට තැනක්; නත්ථි, නැත. යදි, ඉදින්; සො, උන්වහන්සේ; කාලං කරොති, කළුරිය කරයි ද; න එතං පතිරූපං, එය සුදුසු නොවේ. අජ්ජ, අද; එතස්ස; මුන්

වහන්සේට: භික්ඛං, භික්ෂාව; දස්සාම ඉති, දෙමුදැයි; පුච්ඡි, විචාළේ ය. අථ, එකල්හි; සා, ඕ තොමෝ; සාමි, හිමියනි ත්වං, ඔබ; ථෙරස්ස, තෙරුන්වහන්සේට: ආහාරං, ආහාර; දස්සාමි ඉති, දෙමියි; වදසි; කියහි. අස්ස, උන්වහන්සේ; පුබ්බෙ, පෙර කරන ලද; තං පුඤ්ඤ කම්මං, ඒ පුණ්‍ය කර්මය; මෙ, මට; පකාසෙහි ඉති, ප්‍රකාශ කරවයි; පුච්ඡන්තී, විචාරන්නී; ආහ, කීය.

4. එසො, මෙතෙම; සංසාර මහා විදුගෙග, සංසාර නමැති මහා දුර්ගයෙහි; භව භොගහෙතු, භව භොග සම්පත් ලැබීම පිණිස; කිංපුඤ්ඤං, කවර කුශලයක්; අකාසි, කෙළේ ද; තෙ, ඔබගේ; මනො, සිත; අස්ස, උන්වහන්සේට; දනෙ, දනක් දීමෙහි; කෙන, කවර කරුණක් නිසා; නිරතො, ඇළුනේ ද? දෙව, දේවතාවෙනි, තං, ඒ කාරණය; පුච්ඡාමි, විචාරමි. වියාකරොහි, ප්‍රකාශ කරනු මැනවි.

අථ, එකල්හි; අස්සා, ඇයට; ආචික්ඛනෙතා, කියන්නේ; දෙව පුතෙතා, දිව්‍ය පුත්‍ර තෙමේ; ආහ. මෙසේ කීය.

5. අයං යතීසො, මේ යතීශ්වරයන් වහන්සේ; දුතියත්ත භාවෙ, දෙවන ජාතියෙහි; නාමෙන, නමින්; දෙවො ඉති, දෙව යයි; විස්සුතො ආසි, ප්‍රසිද්ධ විය. තද, එකල්හි; භත්තං, බත්; භොක්තුං, අනුභව කරන්නට; උපට්ඨිතෙ, එළවූ කල්හි; සො, හෙතෙම; තසිතං, ත්‍රස්ත වූ; කිලන්තං, ක්ලාන්ත වූ; සොණං, බල්ලකු; අද්දක්ඛි, දුටුයේ ය.

6. තෙන එව, එහෙයින්ම; භත්තස්ස, බත් සම්බන්ධ වූ; මහන්තං පිණ්ඩං, මහත් බත් පිඩක්; වඩ්ඪෙත්වා, වඩා; බුභුක්ඛිතස්ස, බඩ ගින්නෙන් පෙළුනා වූ; තස්ස, ඒ බල්ලාට; අද, දුන්නේය. තෙන දනෙන, ඒ දනයෙන්; ඉධ අත්තභාවෙ, මේ ආත්මභාවයෙහි; අස්ස, උන් වහන්සේට; ඵලං, විපාකය; සාධු, මනාකොට; විපච්චිස්සති, විපාක දෙන්නේය. භද්දෙ, සොඳුර, දනං, දනය; අප්පං ඉති, ස්වල්පයයි, නහි චින්තනියං, නො සිතිය යුතුයි. පරිත්ත බීජෙන, ස්වල්ප බිජුවටින්; ජාතො, හටගත්තා වූ; වටො ඉව, නුග වෘක්ෂය මෙනි.

7. එවං ච පන වත්වා, මෙසේ ද කියා; දෙව පුතෙතා, දෙව් පුත් තෙමේ; අත්ත භාවං, ආත්ම භාවය; විජහිත්වා, අත්හැර; මනුස්ස වණ්ණෙන, මනුෂ්‍ය වේශයෙන්; ථෙරං, තෙරුන් වහන්සේ කරා; උපසංකම්ම, පැමිණ; වන්දිත්වා, වැඳ; පත්තං, පාත්‍රය; ගහෙත්වා, ගෙන; දිබ්බාහාරං දත්වා, දිව්‍යාහාර දී; ඒවං, මෙසේ; ආහ, කීය. භනෙත, ස්වාමිනි, යාවජීවං, ජීවිතාන්තය තෙක්; තුමහාකං, ඔබ වහන්සේට; භික්ඛාහාරං, පිණ්ඩාහාරය; දස්සාමි, දෙමි. තුමෙහ, ඔබ වහන්සේ; අප්පමත්තං භාවා, අප්‍රමාදව; සමණ ධම්මං, මහණ දම්; කරෙය්‍යාථ, කරනු මැනව; අයං කරඤ්ජ රුක්ඛොපන, මේ කරඳ ගස වනාහි; මම, මාගේ; විමානො, විමානයයි; නිච්චං, නිතර; තත්‍ථ, එහි; තයා, ඔබ වහන්සේ විසින්; ගන්තබ්බං ඉති, වැඩිය යුතු යයි; ආරාධෙත්වා, ආරාධනා

කොට; විමානං එව, විමානයටම; අගමාසි, ගියේය. තතො පට්ඨාය, එතැන් පටන්; ථෙරො, තෙරුන් වහන්සේ; රුක්ඛමූලං, ගස මුලට; උපසංකමති, පැමිණේ. දෙව පුත්තො, දිව්‍ය පුත්‍ර තෙමේ; නිච්චං, නිතර; දිබ්බාහාරං එව, දිව්‍යාහාරම; අදන්තො, දෙමින්; පටිවසති, වාසය කරයි.

අථ, එකල්හි; එක දිවසං, එක් දවසක්; ජාතකෙන, බඩ ගින්නෙන්; පීළිතා, පෙළුණු; මනුස්සා, මිනිස්සු මනුස්ස මංසා, මිනී මස්; ඛාදන්තා, කන්නෝ; තං විහාරං, ඒ විහාරයට; පත්වා, පැමිණ; දිබ්බාහරෙණ, දිව්‍යමය ආහාරයෙන්; වඩ්ඪිත, වැඩුණු; සරීරං, ශරීරය ඇති; ථෙරං, තෙරුන්; දිස්වා, දැක; ඉමං, මොහු; මාරෙත්වා, මරා; ඛාදිස්සාම ඉති, කමුයි; මන්තෙත්වා, සාකච්ඡා කොට; ථෙරං තෙරුන්; චෙතියඞ්ගනං, සෑ මළුව; සම්මජ්ජිත්වා, හැම ද; නික්ඛන්තකාලෙ, නික්මුණු කල්හි; මහා සද්දං කරොන්තා, මහ හඬ නගමින්; දණ්ඩමුග්ගරාදයො, දඬු මුගුරු ආදිය; පග්ගය්‍ය, ගෙන; සමන්තා, හාත්පසින්; පරිවාරයිංසු, වැටලූහ. ථෙරෙන කිර, තෙරුන් විසින් වනාහි; පුබ්බෙ, පෙර; අමච්චකාලෙ, අමාත්‍ය කාලයෙහි; සුනඛං, බල්ලාට; පහරණත්ථාය, ගැසීම පිණිස; මුග්ගරං, මුගුර; උක්ඛිපිත්වා, ඔසවා; උපගත, පැමිණ; පුරිසො, පුරුෂයා; නිවාරිතො හොති, වැළැක් වීය. අස්ස, උන්වහන්සේගේ; තෙන පුඤ්ඤකම්මෙන, ඒ පින්කමින්; විහාර මජ්ඣෙ, වෙහෙර මැද; මහන්තං පබ්බතං, මහා පර්වතයක්; උග්ගන්ත්වා, පැන නැඟී; විවරං අදසි. විවරයක් කොට දුන්නේය. තස්මිං ඛණෙ, එකෙණෙහි; ථෙරො, තෙරුන් වහන්සේ; පබ්බතන්තරං, පර්වත අන්තරයට; පාවිසි, පිවිසියේය. චොරා, සොරු; ආගන්ත්වා, අවුත්; ඉතො චිතො ඔලොකෙත්වා ච, ඔබමොබ බලාද; අපස්සන්තා, නොදක්නාහු; අයං, මෙතෙම; අරහන්ත සමණො, රහත් භික්ෂූන් වහන්සේ නමක්; භවිස්සති ඉති, වන්නේ යයි; චින්තෙත්වා, සිතා; පලායිංසු, පැන ගියහ.

යො, යමෙක්; අදණ්ඩස්ස, දඬුවමකට නුසුදුසු වූ; යස්ස, යමෙකුට; දණ්ඩෙති, දඬුවම් කෙරේ ද; සො, හෙතෙම; භවෙ භවෙසු,උපනුපන් ජාතියෙහි; දණ්ඩියො හොති, දඬුවම් ලබන්නෙක් වේ. යො, යමෙක්; කොධං, කෝපය; හන්ත්වා, නසා; දණ්ඩං, න කරොති, දඬුවම් නොකෙරේ. සනරාමරා, මිනිසුන් සහිත දෙවියෝ; තං, ඔහු; පරිපාලයන්ති, රක්‍ෂා කෙරෙත්.

9. ථෙරො පන, තෙරුන් වහන්සේ වනාහි; දෙව දින්නා, දෙවියන් විසින් දෙන ලද; සුධන්නං, සුධා භොජනය; පරිභුඤ්ජන්තො, අනුභව කරමින්; ද්වාදස සංවච්ඡරානි, දොළොස් අවුරුද්දක්; පුථුජ්ජනො, පෘථග්ජනයෙක්ව; විහාසි, වාසය කෙළේය, අථ, ඉක්බිති; පච්ඡා, පසුව; විපස්සනං, විදසුන්; වඩ්ඪෙත්වා, වඩා; අරහත්තං පත්වා, රහත් බවට පැමිණ; තථා එව, එසේම; ද්වාදස සංවච්ඡරානි, දොළොස් අවුරුද්දක්; වීතිනාමෙසි, කල් යැවීය. දෙව පුත්තො, දිව්‍ය පුත්‍ර තෙම; එවං, මෙසේ; චතුවීසති වස්සානි, අවුරුදු විසි හතරක්; දිබ්බ භොජනෙන, දිව්‍ය

ආහාරයෙන්: ථෙරං, තෙරුන් වහන්සේ: පටිජග්ගි, පොෂණය කෙළේය. ථෙරො කිර, තෙරුන්, වහන්සේ: වහන්සේ තසමිං එව විහාරෙ, එම විහාරයෙහිදීම: පරිනිබ්බායි, පිරිනිවන් පෑ සේක.

10. සො, ඒ තෙරුන් වහන්සේ: ජාතකස්ස, බඩසයින් පෙළුණු: එකසානො, එක් බල්ලෙකුට: එකං කබලං, එක් බත් පිඩක්: දත්වා, දී: අපි, නැවත: යතිනෙද, ඒ යතීන්‍ද්‍ර තෙමේ: දිබ්බාහාරං, දිව්‍ය ආහාර ද: අථ, නැවත: සීතිභූතං, සිසිල් වූ: සිවං, නිර්වාණය ද: ලභි, ලැබීය.

තුමෙහපි, තෙපි ද: එවං, එපරිද්දෙන්ම: යස්ස කස්ස අපි, යම් කිසිවෙක් හට ද: දෙය්‍යං, ආහාර දානය: සතතං, නිරතුරු: දදථ, දෙව්: තෙ, තොපට: තං, එය: වට්ටෙ, සංසාරයෙහි: සරණං භවති, පිහිට වේ. අනෙත, කෙළවර: නිබ්බානං, නිර්වාණය ද: හොති, වේ.

**අභයත්ථෙරස්ස වත්‍ථුං, අභය තෙරුන්ගේ කථාව: අට්ඨමං, අටවැන්නයි.**

## 9. නාගාවගේ කථාව.

**(5) 9. නාගාය වත්‍ථුං, නාගාවගේ කථා වස්තුවෙහි: අයං, මේ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. භගවති ධරමානෙ, භාග්‍යවතුන් වහන්සේ ජීවත්ව වැඩ සිටින කාලයෙහි: ලඞ්කායං, ලඞ්කාවෙහි: නාගදීපෙ, නාගදීපයෙහි: චූලොදර මහොදරො ඉති, චූලොදර මහොදර යන: ද්වෙ මාතුල භාගිනෙය්‍යා, මාමා - බෑණා යන දෙදෙනා අතර: මණි පලලඞ්කස්ස කාරණා මැණික් පුටුවක් හේතුකොට ගෙන: මහා සඞ්ගාමං, මහා යුද්ධයක්: පච්චුපට්ඨාපෙසුං, එළඹ සිටියහ.

තද කිර, එකල්හි වනාහි: භගවා, භාග්‍යවතුන් වහන්සේ: බොධිතො, බුද්ධත්වයෙන්: පඤ්චමෙ වස්සෙ, පස් වෙනි අවුරුද්දෙහි: ජෙතවනෙ, දෙව්රම් වෙහෙරෙහි: විහරන්තො, වැඩ වාසය කරන සේක්: පච්චූස සමයෙ, ඉතා අලුයම් කාලයෙහි: ලොකං, ලොව: ඔලොකෙන්තො, බලන්නේ: තෙ, ඒ නා රජුන්: දිස්වා, දැක: අජ්ජ, අද: මයා, මා විසින්: තත්‍ථ, එහි: ගන්ත්වා, ගොස්: කලහං, යුද්ධය: වූපසමෙතුං, සංසිඳුවන්ට: වට්ටති ඉති, වටී යයි: චින්තෙත්වා, සිතා: ඔලොකෙන්තො, බලන්නේ: සමිද්ධි සුමනං නාම, සමිද්ධි සුමන නම්: දෙවරාජං, දිව්‍ය රාජයා: අද්දස, දිටී. අයං දෙව රාජා, මේ දෙව් රජ: කොපන ඉති, කවරෙක් ද? සො කිර, හෙතෙම වනාහි: අනන්තර අත්තභාවෙ, මීට පෙර ආත්ම භාවයෙහි: නාග දීපෙ, නාග දීපයෙහි: අඤ්ඤතරො මනුස්සො අහොසි, එක්තරා මිනිසෙක් වී. තද, එකල්හි: ගන්ධමාදනෙ, ගන්ධමාදන පර්වතයෙහි, වසන්තො, වාසය කරන්නා වූ: එකො පච්චෙක බුද්ධො, එක් පසේ බුදු

නමක්: පිණ්ඩාය, පිඩු පිණිස; චරිත්වා, හැසිර; තස්මිං රාජායතනස්ස ඨිතට්ඨානෙ, ඒ රාජායතන නුග ගස තිබුණු තැනෙහි; නිසීදිත්වා, වැඩහිඳ; භත්ත කිච්චං, බත් කිස; කරොති, කරයි. සො, හෙතෙම; තං, එය; දිස්වා, දැක; තස්මිං ඛණෙ, එකෙණෙහි; චිත්තං, සිත; පසාදෙත්වා, පහදවා; පත්ත ධොවන සාඛං, පාත්‍රය සේදීමට කොළ අත්තක්; අදාසි, දුන්නේය. සො, හෙතෙම; තෙන පුඤ්ඤකම්මෙන, ඒ පින්කමින්; තතො චුතො, එයින් චුතව; දෙව ලොකෙ, දෙව් ලොවෙහි; නිබ්බත්තිත්වා, ඉපිද; අම්හාකං භගවතො කාලෙ, අපේ බුදුන් වහන්සේගේ කාලයෙහි; ජේතවනද්වාර කොට්ඨක පස්සෙ, දෙව්රම් දෙරටු කොටුව පසෙක්හි; රාජායතන රුක්ඛෙ, කිරිපලු ගසෙහි, දෙවතා හුත්වා, දෙවතාවෙක් වී; නිබ්බත්ති, උපන්නේය. භගවතා, භාග්‍යවතුන් වහන්සේ විසින්; තං දෙවරාජං, ඒ දිව්‍ය රාජයාට; ආමන්තෙත්වා, අමතා; මයා සද්ධිං, මා සමග; නාගදීපං, නාගදීපයට; එහි ඉති, එන්නැයි; ආහ, කීය. අථ, ඉක්බිති; අනෙන, ඔහු විසින්; අත්තනො, තමාගේ; භවන භූතං, විමානය වූ; රාජායතනං, කිරිපළු ගස; මූලා, මුලින්; උද්ධරිත්වා, උදුරා; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; මත්ථකෙ, හිස මුදුනට; ඡත්තං විය. කුඩයක් මෙන්; ධාරයං, දරමින්; අනෙන, මොහු සමග; භගවා, භාග්‍යවතුන් වහන්සේ; නාගදීපං, නාගදීපයට; අගමාසි, වැඩි සේක. තෙන, එහෙයින්; මහාවංසෙ, මහාවංශයෙහි; වුත්තං, කියන ලදී.

2. සම්බුද්ධො, බුදුන් වහන්සේ; චිත්තමාසස්ස, බක් මාසයේ; කාලපක්ඛෙ, කළුවර පක්ෂයෙහි වූ; උපොසථෙ, පොහෝ දිනයෙහි; පාතො එව, උදෑසනම; පවරං, උතුම් වූ; පත්ත චීවරං, පා සිවුරු; සමාදය, මනාව ගෙන; සහ රුක්ඛෙන සුමනෙන, කිරිපළු ගස රැගත් සුමන දිව්‍ය පුත්‍රයා සමග; ජලන්තො, බබලන්නාවූ; ජිනො, සර්වඥයන් වහන්සේ; නභසා, අහසින්; නාගානං, නාගයන්ට; අනුකම්පාය, අනුකම්පා පිණිස; නාගදීපං, නාගදීපයට; උපාගමි, වැඩි සේක.

3. තතො, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ද්වින්නං නාගරාජානං, නා රජුන් දෙදෙනාගේ; සඞ්ගාම මජ්ඣෙ, සංග්‍රාමය මැද; ආකාසෙ, අහසෙහි; නිසින්නො, වැඩ හුන්නේ; වුට්ඨි වාතන්ධ කාරෙහි, වැසි සුළං අන්ධකාරයන් කරණකොට; තෙසං, ඔවුන්ට; භයං සන්තාසං උප්පාදෙත්වා, බිය හා තැතිගැන්ම උපදවා; තතො, එයින්; ඝනතර තිමිර පටල පාටනං කත්වා, ඉතා ඝන අඳුරු පටල නැති කොට; උග්ගතො, පැන නැගී; දසසත කිරණො විය, හිරු මෙන්; ඡබ්බන්නරංසීහි, ෂඩ්වර්ණ රශ්මියෙන්; විරාජමානො, බබලමින්; ආකාසෙ, අහසෙහි; අත්තානං, තමන් වහන්සේ; දස්සෙත්වා, දක්වා; තෙ, ඔවුන්; සමස්සාසෙත්වා, අස්වසා; සබ්බං තං භයං, ඒ සියළු භය; වූපසමෙසි, සංසිඳවීය. අථ, එකල්හි; නාගා, නාගයෝ; ඡබ්බණ්ණරංසීහි, ෂඩ්වර්ණ රශ්මියෙන්; විරොචමානං, බබලන්නා වූ; භගවන්තං, භාග්‍යවතුන් වහන්සේ; දිස්වා, දැක; පසන්න මනසා, පහන් සිතින්; ගහිත ගහිතානි ආයුධානි, ගත් ගත්

ආයුධයන්; ජහෙත්වා, ඉවත දමා; භගවතො, බුදුන් වහන්සේගේ; පාදෙ, පාදයන්; සිරසා, හිසින්; වන්‍දිංසු, වැන්දහ. අථ, ඉක්බිති; භගවා, භාග්‍යවතුන් වහන්සේ; තෙසං, ඔවුන්ට; ධම්මං, දෙසෙසි, ධර්මය දේශනා කෙළේය. තත්‍ථ එව හි, මහාවංශයෙහිම; වුත්තං, කියන ලදී.

4. ජිනො, බුදුරජාණන් වහන්සේ; තෙසං, ඔවුන්ට; සාමග්ගි කරණං, සමගි කිරීමට සුදුසු; ධම්මං, ධර්මය; දෙසෙසි, දෙශනා කළ සේක. පතීතා, සතුටු වූ; තෙ උභොපි, ඒ දෙදෙනාම; තං පල්ලඞ්කං, ඒ මිණි පලඟ; මුනිනො, බුදුන්ට; අදුං, දුන්නාහුය.

5. භූමිගතො, බිමට වැඩියා වූ; සත්‍ථා, බුදුන් වහන්සේ; තත්‍ථ රතනාසනෙ, ඒ රතනාසනයෙහි; නිසීදි, වැඩ හුන් සේක. තෙහි නාගරාජෙහි, ඒ නාගරාජයන් විසින්; දිබ්බනන්න - පානෙහි, දිව්‍යමය ආහාර පානයෙන්; තප්පිතො, සංතර්පණය කරන ලදී.

6. නායකො, බුදුන් වහන්සේ; තෙ, ඒ සටනට එක්වූ; ජලට්ඨෙ, ජලයෙහි වූ ද; ථලට්ඨෙ, ගොඩබිමෙහි වූ ද; අසීති කොටියො, අසූ කෙළක් පමණ; භුජඞ්ගෙ, නාගයන්; සරණෙසු ච, සරණයෙහි ද; පතිට්ඨාපෙසි, පිහිට වූ සේක.

7. ලොකනාථො, බුදුන් වහන්සේ; තංචා පි රාජායතනං, ඒ කිරිපළු ගස ද; මහාරහං, මහාඝී වූ; පල්ලඞ්කංච, මිණි පළඟ ද; නාග රාජුනං, නා රජුන්ට; නමස්සිතුං, වඳින්ට; අදාසි, පිහිට වූයේය.

8. නාග රාජා, නා රජුනි; මය්හං, මගේ; පරිභොගෙ චෙතියෙ, පාරිභෝගික චෛත්‍යයන්ට; නමස්සථ, නමස්කාර කරව්; නාගා, නා රජුනි, තං, එය වො, තොපට; හිතාය සුඛාය, හිත සැප පිණිස; භවිස්සති, වන්නේය.

9. එවං ආදිනා, මේ ආදී ක්‍රමයෙන්; ධම්මං, ධර්මය; දෙසෙත්වා, දෙශනා කොට; තෙ, ඔවුන්; සමග්ගෙ කත්වා, සමගි කොට; සමිද්ධි සුමනං, සමිද්ධි සුමන දෙවියන්; රාජායතනෙ සද්ධිං, කිරිපළු ගසත් සමග; තත්‍ථ එව, එහිම; පතිට්ඨාපෙත්වා, සිටුවා; ජෙතවන විහාරං එව, දෙව්රම් වෙහෙරටම; අගමාසි, ගියේය. අථ, ඉක්බිති; නාගා, නාගයෝ; තත්‍ථ, එහි; චෙතියං කත්වා, චෛත්‍යයක් කොට; නිච්චං, නිතර; වන්‍දන්තා, වඳිමින්; පූජෙන්තා, පුදමින්; වසිංසු, විසූහ.

අථ, ඉක්බිති; භගවති පරිනිබ්බුතෙ, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවි කල්හි; තත්‍ථ, එහි; මනුස්සා, මිනිස්සු; චෙතියං, සෑයක්; අකංසු කළහ.

තං අජ්ජ අපි, අද ද එය; රාජායතන චෙතියං ඉති, රාජායතන චෛත්‍යයයි; පකටං අහොසි. ප්‍රකට විය. අයං, මේ; රාජායතන චෙතියස්ස, රාජායතන චෛත්‍යයාගේ; උප්පත්ති, උත්පත්තියයි.

10. එකස්මිං කිර සමයෙ, එක් කාලයෙක්හි වනාහි; ලඞ්කා දීපෙ,

ලඞ්කාදීපයෙහි; සට්ඨිමත්තා භික්ඛූ, සැට නමක් පමණ භික්ෂූහු; සමන්තකූට කල්‍යාණිකාදයො, සමන්කුළු, කැලණි ආදී; මහාවිහාරෙ, මහා විහාරයන්; වන්දන්තා, වඳිමින්; පූජෙන්තා, පුදමින්; ආහිණ්ඩන්ති, ඇවිදිත්; තතො, ඉක්බිති; තෙ, ඔවුහු; නාගදීපෙ, නාග දීපයෙහි; රාජායතන චෙතියං, රාජායතන සෑය; වන්දිතු කාමා හුත්වා, වඳිනු කැමතිව; අනුපුබ්බෙන, පිළිවෙලින්; තත්‍ථ ගන්ත්වා, එහි ගොස්; රාජායතන චෙතියං, රාජායතන චෛත්‍යය; වන්දිත්වා, වැඳ; පූජෙත්වා, පුද පභාතාය රත්තියා, රැය පහන් වූ කල්හි; තෙ, උන්වහන්සේලා; සුනිවත්‍ථා, මනාව හැඳ; සුපාරුතා, මනාව පොරවා; ගාමං, ගමට; පිණ්ඩාය, පිඬු පිණිස; පවිසිත්වා, පිවිස; සකලගාමෙ, මුළු ගමෙහි; චරන්තා, හැසිර; කිඤ්චි, කිසිවක්; අලභිත්වා, නොලැබ; යථා, යම් සේ; ධොත පත්තෙන එව, සේදූ පාත්‍රයෙන්ම; නික්ඛමිංසු, නිමුණාහ. තද, එකල්හි; තස්මිං ගාමෙ, ඒ ගමෙහි; සට්ඨි කහාපණස්ස, කහවනු සැටකට; දසී හුත්වා, දසියක් ව; එකස්මිං කුලෙ, එක ගෙදරක; වසමානා, වාසය කරන්නා වූ; නාගා නාම, නාගා නම්; එකා මාතු ගාමො, එක් ස්ත්‍රියක්; ඝටං, කළය; ආදය, ගෙන; උදකත්‍ථාය, දිය සඳහා; ගච්ඡන්තී, යන්නී; ගාමද්වාරෙ, ගම් දෙරෙහි; තෙ භික්ඛූ, ඒ භික්ෂූන්; දිස්වා, දැක; තෙසං, උන්වහන්සේලා; සන්තිකං, සමීපයට; ගන්ත්වා, ගොස්; වන්දිත්වා, වැඳ; අය්‍යා, ආයඝීයන් වහන්සේ; භික්ඛාචාරං, පිණ්ඩපාතය; ලභිංසු ඉති, ලැබුනාහුදැයි; පුච්ඡි, විචාළාය. භික්ඛූ, භික්ෂූහු; උපාසිකෙ, උපාසිකාවෙනි, තාව, තවම; අයං, මේ; පුරෙ භත්තං, එව, පෙර බත් කාලයම යයි; ආහංසු, කීවාහුය. සා, ඕතොමෝ; තෙසං, උන්වහන්සේලාට; කිඤ්චි, කිසිවක්; අලද්ධ භාවං, නොලැබුනු බව; ඤත්වා, දැන; දෙමනස්සා, දෙම්නස් වූවා; කෙනනු බොහුත්වා උපායෙන, කිනම් උපායකින්; අජ්ජ, අද; අය්‍යානං, ආයඝීයන්ට; දන දස්සාමි ඉති. දන් දෙමි දැයි; චින්තෙන්තී, සිතන්නී; පුබ්බෙ, පෙර; අහං, මම; සට්ඨි කහාපණං, කහවණු සැටක්; නිස්සාය, නිසා; පර කුලෙ, පර කුලයක; භතිං, බැල; කරොමි, කරමි. ඉදනි, දැන්; අහං, මම; අඤ්ඤතරස්ස රත්තිං, අනික් රාත්‍රියට; දසි හුත්වා පි, දසියක්ව; දනං දස්සාමි ඉති එව, දන් දෙමි යි; සන්නිට්ඨානං කත්වා, සනිටුහන් කොට; භික්ඛූ, භික්ෂූන් වෙත; උපසංකම්ම, පැමිණ; තෙසං, උන්වහන්සේලාගේ; අභිමුඛෙ, ඉදිරියෙහි; ඝටං, කළය; ඨපෙත්වා, තබා; භන්තෙ, ස්වාමීනි, ඉමං පාදරභා, මේ කළය රන් පාදයක් වටී. යාව, යම්තාක්; අහං, මම; ආගමිස්සාමි, එන්නෙම් ද; තාව, ඒ තාක්; ආගමෙථ ඉති, බලාපොරොත්තු වන්නැයි; වත්වා, කියා; තුරිත තුරිතා, වහ වහා; තං එව කුලං, එම ගෙදරටම; උපසංකම්ම, එළඹ; අය්‍යා, ආයඝීයෙනි, සට්ඨිකහාපණං,(තවත්) කහවණු හැටක්; මෙ, මට; දෙථ ඉති, දෙන්නැයි; ආහ. කීවාය. සො, හෙතෙම; තං සුත්වා, ඒ අසා; හොති, පින්වතිය, කිං, කිම; ත්වං, තී; පරකුලෙ, පර කුලයෙහි; දසී හුත්වා, දැස්සක් ව; පුරාණ ඉණතො, පරණ ණයෙන්; මුත්තිං, මිදුණු බවක්; න පස්සසි, නොපෙනෙන්නෙහි; අථ, එසේ කල්හි; ත්වං, තී; පුනප්පුනං, නැවත

නැවත: වඩ්ඪෙත්වා, වඩා: මෙ, මාගෙන්: ධනං, ධනය: ගණ්හාසි, ගත්තෙහි: කිං එතං ඉති, මේ කිමෙක් ද? අථ, එකල්හි: සා, ඕතොමෝ: සාමි, සවාමීනි, ධනත්‍ථාය, ධනය ගැන: මා චින්තෙසි, නොසිතුව මැනව: තුමහාකං ඝරෙ, ඔබගේ ගෙදර: රත්තිං දසි හුත්වා, රාත්‍රි දසියක්ව: කමමං, වැඩ: කරොනතී, කරන්නී: ඉණතො, ණයෙන්: මුඤ්චිස්සාමි, මිදෙන්නෙමි: මෙ, මට: සට්ඨි කහාපණං, කහවණු හැටක්: දෙථ, දෙනු මැනව: සො, හෙතෙම: සාධු ඉති, යහපතැයි: පණෙණ ලිඛිත්වා, ලිපියක් ලියා: කහාපණෙ, කහවණු: අදසි, දුන්නේය. අථ, ඉක්බිති: සා, ඕතොමෝ: තං, ඒ මුදල්: ගහෙත්වා, ගෙන: සකලගාමෙ, සියළු ගමෙහි: ආහිණ්ඩිත්වා, ඇවිද: එකෙකස්ස කුලස්ස, එක එක ගෙදරකට: එකෙකං, කහාපණං, එක එක කහවණුවක් බැගින්: දදනතී, දෙන්නී: සට්ඨි කහාපණෙ, කහවණු සැටක්: දත්වා, දී: හත්‍තං, බත්: සම්පාදෙත්වා, පිළියෙල කොට: පතෙතසු, පාත්‍රයන්හි: ආකිරිත්වා, විසුරුවා: (බෙද) පතිගණ්හාපෙත්වා, පිළිගන්නවා: අත්‍තනා, තමා විසින්: කතං වායාමං, කරන ලද වෑයම: භික්‍ඛුනං, භික්‍ෂූන්ට: කථෙන්තී, කියන්නී: ආහ. මෙසේ කීවාය

. 11. අයයානං, ආයර්‍ය්‍යයන් වහන්සේලාගේ: පාදෙ, පාදයන්: වන්දිය, වැඳ: පවක්‍ඛාමි, දන්වමි. මෙ, මා කියන්නක්: සුණාථ, අසනු මැනවි. කපණතෙන,දුගී භාවයෙන්: මෙ තාදිසී, මා සමාන: අඤ්ඤා, අනික් ස්ත්‍රියක්: භුතලෙ, පොළෝතලෙහි: නත්‍ථි, නැත.

12. අහං, මම: ඉණං, (පළමු ගත්) ණය: දතුං, දෙන්ට: අසක්කොනතී, නොහැකිවන්නී: ඉණදසී, ණය දසියක්: අහොසිං, වීමි. අබන්‍ධවා, නෑයන් නැත්තේ: අප්පභොගා, කිසි වස්තුවකුත් නැත්තේ: අනාළ්හිකා, සහල් නැළියක් පමණවත් නැත්තේ: විහරාමි, වාසය කරමි.

13. අජ්ජාපි, අද ද: දනං දදනතී: දන් දෙන්නී: රත්‍ති දසිත්‍තං, රාත්‍රි දසි බවට: ආගමිං, පැමිණියෙමි. අයයා, ආයර්‍ය්‍යයන්වහන්සේලා: මෙ, මාගේ: දුග්‍ගතජාහතං, දුප්පත් දනය: පරිභුඤ්ජනතු, වළඳත්වා,

14. ඉච්චාදිනා, මේ ආදී ක්‍රමයෙන්: අත්‍තනා, තමා විසින්: කතං, කරන ලද: සබ්බං අධිකාරං, සියළු වැඩ: වත්වා, කියා: වන්දිත්වා, වැඳ: ඝටං, කළය: ගහෙත්වා, ගෙන: අගමාසි, ගියාය. භික්‍ඛූ, භික්‍ෂූහු: තස්සා, ඇගේ: කථං, කථාව: සුත්වා, අසා: අහො අච්ඡරියං, ඉති, අහො පුදුමැයි, විම්හිත මානසා, විස්මිත සිතින්: හත්‍තං, බත්: ගහෙත්වා, ගෙන: මහානාමකෙ ඝරෙ, මහානාම නම් විල සමීපයෙහි: මුචලින්ද වනං, මිදෙල්ල වනයට: පවිසිත්වා, පිවිස: අට්ඨංසු, සිටියාහුය. අථ, අනතුරුව: තෙසු, ඔවුනතුරෙහි: සඞ්ඝත්‍ථෙරො, ප්‍රධාන තෙරුන් වහන්සේ: ආවුසො ති, ඇවැත්ති යි: භික්‍ඛූ, භික්‍ෂූන්: ආමනෙතත්වා, අමතා: ආයස්මනෙතා, ආයුෂ්මත්හු: එතිස්සා, මැයගේ: සද්ධා බීජස්ස, ශ්‍රද්ධා බීජයට: ඛෙත්‍තං, කෙත: සොධෙනතු, ශුද්ධ කෙරෙත්වා සරාගිනො, සරාගීව: ඉමං, මේ: දනය: මා භුඤ්ජනතු ඉති, නොවළඳත්වා යි: වත්වා, කියා: ආහ, මෙසේ කීය.

15. හමෙහා, එම්බා ඇවැත්නි. එසා, මෝ තොමෝ; නො, අපගේ; න මාතා, මෑණි කනෙක් නොවේ. අයං, මෝ තොමෝ; නො, අපගේ; භගිනී ච, නැගණියක් ද; න ච, නොවේ. නසස්සු, නැන්දකෙනෙක් ද නොවේ. එසා, මෝ තොමෝ; න සුණිසා, යෙහෙළියක් ද නොවේ. න ච සොහද, මිතුරියක් ද නොවේ.

16. ඉමෙ, යතයො, මේ යතීහු; සීලවන්තා, සීලවන්තයහ. ගුණවන්තා, ගුණවන්තයහ; සුඛිතා, මනා ව්‍රත ඇත්තෝ යි; එතෙසං, මුන්වහන්සේලාට; දින්නං, දෙන ලද්දවූ; අප්පමපි, ස්වල්ප දෙයක් නමුත් අනන්තඵලදංසියා, අපමණ විපාක දෙන්නේය.

17. ඉති, මෙසේ; මන්තෙවාන, සිතා; දීනා, බැගෑපත් වූ; දලිද්ද, දිළිඳු වූ; පාරකම්මිකා, අනුන්ගේ මෙහෙවරක කරන්නා වූ; සා, ඕ තොමෝ; අත්තානං, ආත්මය; වික්කිණිත්වාන,විකුණා; අජ්ජ, අද; නො, අපට; දනං, දන්; අද, දුන්නීය.

. 18. මහප්ඵලං, (ඒ උපාසිකාවට) මහත් විපාකය; ආකඩ්ඛන්තා, කැමැත්තමෝ නම්; අත්තානං, (අපගේ) ආත්මයන්; පරිසොධෙම, පිරිසිදු කරමු. සරාගා, සරාගීව; ආසවෙ, කාමාදී ආශ්‍රවයන්; අප්පහන්ත්වාන, නො නසා; තං, ඒ ආහාරය; න භුඤ්ජාම, අනුභව නොකරමු.

19. එවං, මෙසේ; වත්වාන, කියා; තෙ, උන්වහන්සේලා; මුචලින්ද වනෙ, මිදෙල්ල වනයෙහි; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; නිසින්නා, හුන්නාහු; විපස්සනං වඩ්ඪෙත්වා, විදශීනා වඩා; සහ පටිසම්භිදහි, සිවුපිළිසිඹියා සහිත වූ; අරහත්තං, රහත් බවට; පාපුණිංසු, පැමිණියහ. අථ, ඉක්බිති; තෙ, උන්වහන්සේලා; තස්මිං වනසණ්ඩෙ, එම වන ලැහැබෙහි; දෙවතාහි, දෙවතාවුන් විසින්; සාධුකාරං, සාධුකාර; පවත්තයමානා, පවත්වද්දී; ආගන්ත්වා, අවුත්; භත්තං, බත්; පරිභුඤ්ජිංසු, වැළඳූහ. අථ, ඉක්බිති; අස්සා ච, ඇගේ ද; භික්ඛූනං ච, භික්ෂූන්ගේ ද; පවත්තිං සුත්වා, ප්‍රවෘත්තිය දැන; දෙවතානං ච, දෙවතාවුන්ගේ ද; සාධුකාරං සුත්වා, සාධුකාරය අසා; රඤ්ඤො, රජතුමාගේ; සෙතච්ඡත්තෙ, සේසතෙහි; අධිවත්ථා, අධිගෘහිත; දෙවතා, දෙව්දුව; සන්තුට්ඨා, සතුටුව; සාධුකාරං, සාධුකාර; දදන්ති දෙන්නී.

20. මහා සද්දෙධ, මහා ශ්‍රද්ධාවන්තිය සාධු සධු, යහපත, යහපත; තයා, තී විසින්; කතං, කරන ලද්ද; සාධු සාධු ඉති, යහපත යහපත යයි; දනං, දන නමැති බිජුවට; ඛෙත්ත ගතං ආසි, සරු කෙත පිහිටියේය. අජ්ජ, අද; තෙ, තිට, සුලාභං, යහපත් ලාභයක්; අහු, වීය.

21. රාජා, රජතුමා; දෙවතාය, දෙව් දුවගේ; සාධුකාර සද්දං, සාධුකාර ශබ්දය; සුත්වා, අසා; රෙ දෙවතෙ, එම්බල දේවතාවීය, කිං, කිමෙක් ද; ත්වං, තී; අම්හාකං, අපගේ; දනස්ස, දනයට; සාධුකාරං, සාධුකාර; අදසි, දුන්නී ද; උදහු, නොහොත්; පරස්ස ඉති, අනිකකුට දැයි

ඇසීය. අථ, ඉක්බිති; අස්ස, ඔහුට; දෙවතා, දෙව්දුව; තව දනං, තොපගේ දනය; සන්ධාය, උදෙසා, න, නොවේ. සාධුකාරො, සාධු කාරය; නාගාය ඉති, නාගාවගේ දනය සඳහායි; වත්වා, කියා; ආහ. මෙසේ කීය.

22. යො තු, යම් කිසිවෙක් වනාහි; ජෙජ්ජ හෙජ්ජාදිනා, සිඳීම් බිඳීම් ආදියෙන්; පර පීළනං කත්වාන, අනුන්ට පීඩා කොට; මහායාගං, මහ දන්; පවත්තෙති, පවත්වයි ද; තං, එය; න මහප්ඵලං හොති, මහත් ඵල නොවේ.

23. යො, යමෙක්; අනාදරං, අනාදරය; පුරක්ඛත්වා, පෙරටු කොට; අස්සද්ධාය, ශ්‍රද්ධාවෙන් තොරව; අයොනිසො, අනුවණින් යුක්තව; අඛෙත්තෙ, නුසුදුසු කෙතෙහි; දනං, දනය; දදෙ, දෙන්නේ ද; තං, ඒ දනය; මහප්ඵලං න හොති, මහත් ඵල නොවේ.

24. දලද්දෙපි, දිළිඳු කෙනෙක් නමුත්; මහා සද්ධො, මහත් සැදැහැ ඇත්තේ; සාදරො, ආදර සහිත වූයේ; සුධ මානසො, පිරිසිඳු සිතැත්තේ; අප්පමපි, ස්වල්පයකුදු; දෙති, දේද; සො, ඒ දනය තෙමේ; සද, හැමකල්හි; අනන්ත ඵලදෙසියා, අප්‍රමාණ විපාක දෙන්නේය.

25. ආදිනා, යනාදීන්; දනෙ, දනයෙහි; මහප්ඵලතං, මහත් ඵල බව; වණ්ණෙත්වා, වර්ණනා කොට; මහාරාජ, මහ රජ නාගදීපෙ, නාග දීපයෙහි; නාගා නාම, නාගා නම්; එකා සට්ඨිකහාපණ දසි හුත්වාපි, කහවණු සැටකට දසියක්ව ද; භික්ඛූනං, භික්ෂූන් වහන්සේට; එවං ච එවං ච, මෙස් මෙසේ ද; දනං, දනක්; අදසි, දුන්නාය. භික්ඛූ ච, භික්ෂූහු ද; තස්සා, ඇගේ; දනං, දනය; නිස්සාය, නිසා; අරහත්තං, රහත් බවට; පත්තා, පැමිණියහ. අහං, මම; තස්සා, ඇයට; තුස්සිත්වා, සතුටුව; සාධුකාරං, සාධුකාර; අදසිං ඉති, දුනිමි යි; සබ්බං, සියල්ල; විත්ථාරෙන, විස්තර වශයෙන්; කථෙසි, කීයේය. රාජා, රජතුමා; තං සුත්වා, ඒ අසා; සොමනස්සො, සතුටු වූයේ; ඉණදයකං ච, ණය දුන් අය ද; තං ච, ඇය ද; ආනාපෙත්වා, ගෙන්වා ගෙන; කහාපණෙ, කහවණු; දදන්තො, දෙමින්; අදසිං කත්වා, දසි කමෙන් මුදවා; සබ්බං තං දීපං, ඒ සියළු දිවයින; බ්‍රහ්මදෙය්‍යං කත්වා, උතුම් දයාදය කොට; තස්සා එව, ඇයට ම; දත්වා, දී; මහා සම්පත්තිං, මහත් සම්පත් ද; අදසි, දුන්නේය. තතො පට්ඨාය කිර, එතැන් පටන් වනාහි; තං දීපං, ඒ දිවයින; නාගදිපං ඉති, නාගදීප යයි; පඤ්ඤායි, ප්‍රකට විය. සා, ඕ තොමෝ; තතො පට්ඨාය, එතැන් පටන්; බහුං, බොහෝ; පුඤ්ඤකම්මං, පින්කම්; කත්වා, කොට; ජීවිත පරියොසානෙ, ජීවිතයාගේ කෙළවර; දෙවලොකෙ, දෙව්ලොව; නිබ්බත්ති, උපන්නාය.

26. එවං, මෙසේ; පඤ්ඤාය, ප්‍රඥාවෙන්; උපගතමනො, එළඹ සිටි සිත් ඇත්තී; ආතුමං, තම ආත්මය; දසං කත්වා, දස කොට; දනං දත්වා, දන් දී; තිදිවං, දිව්‍ය ලොකයට; පයති, පැමිණියාය. පාසංසිකා ච හොති, ප්‍රශංසාවට සුදුසු තැනැත්තියක් ද විය. යස්මා, යම් හෙයකින්; දනං,

දනය; ඉච්ජිතත්‍ථප්පදනං, කැමැති කැමැති වස්තුව ප්‍රදනය කරන්නා වූ: සුරතරු සමං, දිව්‍ය කල්ප වෘක්‍ෂයක් සමාන ද; තස්මා, එහෙයින්: භවතා, පින්වත්ති, මච්ඡෙරාරිං, මසුරු මල නමැති සතුරා: හනථ, නසව්: දන මිත්‍තං, දන නැමති මිතුරා: භජ්වෙහා, භජනය කරව්.

**නාගාය වත්‍ථුං, නාගාවගේ කථාව: නවමං, නවවැන්නයි.**

## 10. වත්‍ථුල පර්වත කථාව.

**(5) 10. වත්‍ථුල පබ්බතස්‍ස, වත්ථුල පර්වතයාගේ: වත්ථුම්හි, කථා වස්තුවෙහි: අයං, මෝ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. එකස්මිං සමයෙ, එක් කාලයෙක්හි: සීහල දීපෙ, සිංහල රටෙහි: බ්‍රාහ්මණාතියං නාම, බැමිණිතියා සාය නම්: භයං, බියක්: අාදස සංවච්ඡරං, දෙළොස් අවුරුද්දක්: අට්ඨාසි, පැවැත්තේය. එත්‍තක, කාලං, එපමණ කලක්: ලංකාදීපෙ, ලක්දිවෙයි; දෙවො, වැස්ස: සම්මා, මනාව: න පාවස්සි, නො වැස්සේය: තස්මා, එහෙයින්: සස්සෙ, ධාන්‍යයන්: අසම්පජ්ජනෙත, මනාව නොවැඩුණු හෙයින්; ජාතක භයං, දුර්භික්‍ෂ භයක්; ජාතං, උපනි. දුබ්බොජනෙන, නරක ආහාරයෙන්: උපද්දුතානං, උවදුරට පත්; මනුස්සානං, මිනිසුන්ට; රොග භයං ච, රෝ බියක් ද; ජාතං, උපනි; ඉති, මෙසේ; අට්ඨී චම්මාවසෙසා, මනුස්සා, ඇට සම් ඉතිරි වූ මිනිස්සු; දුක්ඛිතා, දුකට පත් වූවෝ; අහෙසුං, වූහ. ඉත්‍ථියො, ස්ත්‍රීහු; ඝරෙ ඝරෙ, ගෙයි ගෙයි, යක්ඛිණියො විය, යකින්නන් වැනියහ: පුරිසා, පුරුෂයෝ; පෙත පිසවා විය, ප්‍රේත පිසාචයන් මෙන්; අහෙසුං, වූහ. තෙසු තෙසු කිර ද්වාරෙසු, ඒ ඒ ගෙදෙරවල් හි; අවමඞ්ගල, අවමගුල් කොලාහල සද්දෙන ච, කොලාහල හඬින් ද; පරොදන්තානං, හඬන්නන්ගේ; විලාපසද්දෙන ච, විලාප ශබ්දයෙන්ද; එක කොලාහලං අහොසි, එකතින් කෝලාහල විය. තත්‍ථ තත්‍ථ, ඒ ඒ තන්හි; මත මතානං, මළ මළවුන්ගේ; කුණපගන්ධෙන, කුණප ගඳින්; සන්නිපතිතානං, රැස් වූ; අමනුස්සානං, අමනුෂ්‍යයන්ගේ; වසෙන, වසයෙන්; මහබ්භයං අහොසි, මහත් බියක් විය. එවං, මෙසේ; අනෙකෙහි භයෙහි, නොයෙක් බියවලින්; උපද්දුතා, උපද්‍රැත වූ; ලඞ්කාදීප වාසිනො, ලක්දිව වැසියෝ; පබ්බත නදී සොබ්භාදිසු. පර්වත ගංගා ගුහාවන්හි; යත්‍ථ කත්‍ථ චි, යම් කිසි තැනෙක්හි; ගන්ත්වා, ගොස්; ජීවන්ති, ජීවත් වෙති. තද, එකල්හි; වත්‍ථුල පබ්බත සමීපෙ, වත්ථුල පර්වත සමීපයෙහි; මනුස්සා, මිනිස්සු; තං පබ්බතං, ඒ පර්වතය; සරණං කත්වා, පිහිට කොට; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; පබ්බත පාදෙ, පර්වත පාදයෙහි; වසන්ති, වාසය කරති. තද, එකල්හි; පබ්බත පාදගාම වාසිකො, පර්වත පාද ගමෙහි වැසි; එකො, එක් මිනිසෙක්; අත්‍තනො, තමාගේ; මාතුගාමෙන සද්ධිං, භාර්‍යාව සමග; ජීවනොපායං, ජීවත් වීමට

උපායක්; පරියෙසන්තො, සොයන්නේ; පබ්බතං, පර්වතයට; ආරුහිත්වා, නැග; ආහිණ්ඩන්තො, ඇවිදින්නේ; පබ්බත මත්ථකෙ, පර්වතය මුදුනෙහි; එකං කාර රුක්ඛං, එක් කරගසක්; දිස්වා, දැක; තත්ථ එව, එහිම; වසිස්සාමි ඉති, වාසය කරන්නෙමි යි; රුක්ඛං උපනිස්සාය, ගස ඇසුරුකොට; ගෙහං කත්වා, ගෙයක් කොට; වසති, වාසය කරයි. තස්මිං පන කාර රුක්ඛෙ, ඒ කර ගසෙහි; තිස්සො සඛායො, අතු තුනක්; අහෙසුං,වූහ. සො, හෙතෙම; තාසු සාඛාසු, ඒ අතුවල; එකාය, එකකින්; ආගන්තුක සක්කාරං, ආගන්තුක සත්කාර; කරිස්සාම, කරන්නෙමු. එකාය, එකකින්; දනං, දන්; දස්සාම, දෙන්නෙමු. එකං, එකක්; අම්හාකං, අපගේ; පරිභොගත්ථාය, පරිභොගය පිණිස; භවිස්සති ඉති, වන්නේ යයි; විකප්පෙත්වා, කල්පනා කොට; අත්තනා, තමන්ට; නියමිත සාඛාය, නියම අත්තෙහි; පණ්ණං, කොළ; පරිභුඤ්ජන්තා, අනුභව කරමින්; තත්ථ, එහි; වසන්ති, වසත්.

2. අථ, එකල්හි; එක දිවසං, එක් දවසක්; එකො භික්ඛු, එක් භික්ෂුවක්; භික්ඛාචාරට්ඨානං, භික්ෂාචාරස්ථානයක්; ගවෙසන්තො, සොයන්නේ; තෙසං ගෙහෙ, ඔවුන්ගේ ගෙයි; ධූමං දිස්වා, දුම් දැක; ධූම සඤ්ඤාය, දුම් සලකුණෙන්; තස්ස, ඔහුගේ; ගෙහං, ගෙදරට; අගමාසි, ගියේය. අථ, ඉක්බිති; සො පුරිසො, ඒ පුරුෂ තෙම; තං, උන්වහන්සේ; දිස්වා, දැක; සොමනස්සප්පත්තො, සොම්නසට පැමිණියේ; අහො; පුදුමයි; වත, ඒකාන්තයෙන්; මයං, අපි; ඉමෙ පණ්ණෙ නිස්සාය, මේ කර කොළ නිසා; මහන්තං පුඤ්ඤකම්මං, මහත් පින්කම්; පසවාම, රැස්කරමු. චිරදිට්ඨො ච අය්‍යො, බොහෝ කලකින් දක්නා ලද ආය්‍ර්‍යයන් වහන්සේ; අභිවාදනං ච, වැඳීම ද; කරිස්සාමි ඉති, කරන්නෙමි යි; ගන්ත්වා, ගොස්; ථෙරස්ස, තෙරුන් වහන්සේගේ; හත්ථතො, අතින්; පත්තං, පාත්‍රය; ගහෙත්වා, ගෙන; ඵාසුකට්ඨානෙ, පහසු තැනෙක්හ; තං උන්වහන්සේ; නිසීදපෙත්වා, වඩා හිඳුවා; පණ්ණං, කොළ; ආහරිස්සාමි ඉති, ගෙන එන්නෙමි යි; කාර රුක්ඛ සමීපං, කර ගස ළඟට; අගමාසි, ගියේය. තද, එකල්හි; රත්තිභාගෙ, රාත්‍රි භාගයෙහි; තස්ස රුක්ඛස්ස, ඒ ගසේ; පණ්ණං ආදිං කත්වා, කොළ ආදි කොට; අනන්තමසො, යටත් පිරිසෙන්; ජල්ලිං, උපාදය, පතුරු පටන්; පාණකා, පණුවෝ; ඛාදිංසු, කෑහ. සො, හෙතෙම; තං රුක්ඛං, ඒ කරගස; දිස්වා, දැක; දුක්ඛී, දුකැත්තේ; දුම්මනො, නො සතුටු සිතැත්තේ; නිවත්තිත්වා, ආපසු හැරී; ගෙහං එව, ගෙදරටම; අගමාසි, ගියේය. අථ, එකල්හි; අස්ස, ඔහුගේ; භරියා, භාය්‍ර්‍යාව; තුච්ඡ හත්ථෙන, හිස් අතින්; ආගච්ඡන්තං, එන්නා වූ; තං, ඔහු; දිස්වා, දැක; අජ්ජ, අද; අය්‍යා, හිමියනි තුච්ඡහත්ථෙන, හිස් අතින් ආගතො, ආයේ; කිං ඉති, කිම දැයි; පුච්ඡි, විචාළාය. අථ, එකල්හි; සො, හෙතෙම; අචික්ඛන්තො, දන්වන්නේ; එවං, මෙසේ; ආහ, කීයේය.

3. චින්තිතං, සිතන ලද; යං, යමෙක්; සමිද්ධානං, සමෘද්ධ වූ; පුඤ්ඤවතං, පුණ්‍යවන්තයන්ට; සමිජ්ඣති. සමෘද්ධ වේ. ඊහන්තානං අපි,

උත්සාහ කරන්නා වූ ද; අප්ප පුඤ්ඤානං, අල්ප පින් ඇත්තවුන්ට; තථා එපරිද්දෙන්; න සිජ්ඣති, සිද්ධ නොවන්නේය.

4. චිර දිට්ඨස්ස, බොහෝ කලකින් දුටුවා වූ; අයාස්ස, ආයර්‍යයන් වහන්සේට; අජ්ජතනාය අපි, අද දවසට පවා; දතුං, දනක් දෙන්ට; පණ්ණමත්තං, අපි, කර කොළ පමණකුත්; නො ලද්ධං, නො ලද්දෙමි. නො, අපගේ; මන්ද පුඤ්ඤතා, මද පින් ඇති බව; අහො, වෙදයකි.

5. එවං ච පන වත්වා, මෙසේ ද කියා; හද්දෙ, සොඳුර කාර රුක්ඛෙ, කර ගසෙහි; පණ්ණං පි, කොළයකුදු; ජලිංපී, පතුරුද; උපාදය, පටන්; සබ්බං, සියල්ල; පාණකා, පණුවෝ; ඛාදිංසු ඉති, කෑහයි; ආහ, කීය. සා, ඕ තොමෝ; තං සුත්වා, ඒ අසා; තස්ස, ඔහුට; එවං, මෙසේ; ආහ, කීවාය.

6. ලොකස්මිං, ලොකයෙහි; එතං, මෙය; සභාවං, ස්වභාව ධර්‍මයකි. කත පුඤ්ඤස්ස, කරන ලද පින් ඇති; ජන්තුනො, සත්වයන් වෙතට; මුත්තා වෙළුරියාදයො, මුතු මැණික්:වෛඩූර්‍ය්‍ය ආදී රත්නයෝ; සයං, එව, තෙමේම සමායන්ති, පැමිණෙත්.

7. අලක්ඛිතා, භාග්‍යය නැත්තා වූ; අධඤ්ඤෙන, පින් නැත්තාවූ; දුබ්භගෙන; දුක්ඛිතයා විසින්; ඉධ මානුසෙ, මේ මනුෂ්‍ය ලොකයෙහි; පරක්කමේන, බොහෝ උත්සාහයෙන්; සඤ්චිතං, රැස් කරන ලද; යං ච, යම් වස්තුවක් ඇද්ද; (එය) තත්‍ථ, එහි; හනිස්සති'ති නැසෙන්නේ යයි.

8. වත්වා, කියා; ඉදනි, දැන්; කිං, කුමක්; කරිස්සාම, කරන්නෙමුද; ථෙරං, තෙරුන් වහන්සේ; නිසීදපෙත්වා, වැඩ හිඳුවා, අප්පමත්තකං අපි ස්වල්ප දෙයක් නමුත්; අදතුං, නොදීම; අයුත්තං ඉති, නුසුදුසු යයි; වදන්ති, කියන්නී; අත්තනො, තමාගේ; සරීර මංසා, සිරුරෙහි මස්; පචිත්වා, පිස; ථෙරං, තෙරුන් වහන්සේට; අජානාපෙත්වා, නොහඟවා; දස්සාමි ඉති, දෙමියි; චින්තෙත්වා සිතා; තා, ඇය; ලෙඛන සත්‍ථං, ලියන ආයුධයක්; ගහෙත්වා, ගෙන; අත්තනො, තමාගේ; ඌරු මංසං, කලවා මස්; උක්කන්තිතුකාමා, උපුටනු කැමැත්තී; ගබ්භං, කාමරයට; පාවිසි; පිවිසියාය. අථ, එකල්හි; අස්සා, ඇයගේ; සාමිකො'පි, සැමියා ද; තථා එව, එසේම, අත්තනො, තමාගේ; මංසං, මස් ථෙරස්ස, තෙරුන්ට; දස්සාමි ඉති, දෙමියි; මංසං, මස්; උක්කන්තිතුකාමා, උපුටනු කැමැත්තේ; තං එව, ඒ කාමරයට ම; පවිට්ඨො, පිවිසියේ; හරියං, භාර්‍යාව; තථා, එසේ කරොන්තිං, කරන්නී; දිස්වා, දැක; කිං, කුමක්; කරොසි ඉති, කරහිදැයි; පුච්ඡි, විචාළේය. සා, ඕ තොමෝ; අය්‍යා, හිමියනි, මම, මාගේ; සරීර මංසං, ශරීර මාංසය; පචිත්වා, පිස; ථෙරස්ස, තෙරුන්ට; දස්සාමි ඉති, දෙමියි; ආහ, කීවාය. තං සුත්වා, ඒ අසා; සාමිකොපි, සැමියා ද; අත්තනො, තමාගේ; සරීර මංසං, සිරුරු මස්; දතුකාමො, දෙනු කැමැත්තේ හද්දෙ, සොඳුර මාතුගාමා නාම, ස්ත්‍රීහු නම්; අප්ප බුද්ධිනො, ස්වල්ප නුවණැත්තෝ ය; දුක්ඛං, දුක්; සහිතුං, ඉවසන්ට අසක්කොන්ති,

නොහැකි වෙත්. මම, මගේ: සරීර මංසං, ශරීරයෙහි මස්: දස්සාමි ඉති, දෙමියි: ආහ, කීවේය. අථ, එකල්හි: අස්ස, ඔහුගේ: භරියා, භාර්‍ය්‍යාව: අත්තනො, තමාගේ: මංසං, මස්: දතුං, දෙන්ට: ඉච්ඡති, කැමැති වේ. සාමිකොපි, සැමියාද: තථා එව, එසේමය: තෙසං, ඔවුන්ගේ: දනෙ, දන් දීමෙහි: මහජ්ඣාසයතා, මහත් කැමැති බව: අහො, පුදුමයි. වුත්තං, හි, කියන ලද මැයි.

9. එවං, මෙසේ: දනපතීනං තු, දනපතීව දන් දෙන්නවුන්ගේ වනාහි: මනො, සිත: දනෙ එව, දනයෙහිම: රමතෙ, ඇලේ. අජ්ඣත්තිකං දනං, ආධ්‍යාත්මික ශරීර මස් දනය: දෙනෙන එව, දෙන කල්හිම: බාහිරෙසු, බාහිර වස්තු දනයෙහි: කථාවකා, කියනුම කවරේද?

10. එවං, මෙසේ: උභොජනෙ, දෙදෙනාම: අහං අහං, මම මම: පදස්සං ඉති, දෙන්නෙමියි: මන්තෙන්තෙ, මන්ත්‍රණය කරන කල්හි: තෙසං, ඔවුන් කරා: සම්බලහත්ථෙන, මාගෝපකරණ ගත් අතින් යුක්තව: සක්කො, ශක්‍රයා: තහිං, එහි: පාතුරහු, පහළ විය.

11. කථං, ඒ කෙසේ ද යත්? එවං, මෙසේ: තෙහි, ඔවුන් දෙදෙනා විසින්: මංස දනස්ස උස්සහන්තෙන, මස් දීමෙහි උත්සාහ කරන කල: තෙසං, ඔවුන්ගේ: සද්ධා බලෙන, ශ්‍රද්ධා බලයෙන්: සක්කස්ස, ශක්‍රයාගේ: පණ්ඩුකම්බල සිලාසනං, පණ්ඩුකම්බල ශිලාසනය: උණ්හාකාරං දස්සෙසි, උණුසුම් ආකාරයක් දැක් විය. සො, ඒ සක් දෙව් රජ: ඔලොකෙන්තො: බලන්නේ: තෙසං ජයම්පති කානං, ඒ අඹු සැමි දෙදෙනාගේ: පරිසුද්ධ, පිරිසිදු: අජ්ඣත්තික දනජ්ඣාසයං, ආධ්‍යාත්මික දන අධ්‍යාසය: ඤත්වා, දැන: එතෙ, මේ: බොධිසත්තස්ස එව, බෝසතුන්ගේ ම: අජ්ඣාසයා ඉති, අදහස් ම යයි: තුට්ඨමානසො, සතුටු සිත් ඇත්තේ: සාලි, ඇල්වී: තණ්ඩුලානං, සහල්: දෙණං ච, තිඹක් ද: මිගසත්තිකං ච, මුව මස් කලවයක් ද: දධි ඝටං ච, දී කළයක් ද: තෙල ඝටං ච, තෙල් කළයක්ද: ආදය, ගෙන: මුහුත්තෙන, මොහොතකින්: ගන්ත්වා, ගොස්: අඤ්ඤතර මනුස්සො විය, එක්තරා මිනිසෙක් මෙන්: තෙසං, ඔවුන්ගේ: සරද්වාරෙ, ගෙදෙර: ඨත්වා, සිට: තෙසං, ඒ ගේ: අනුපරියන්තො, වටේ යමින්: ඉමස්මිං ගෙහෙ, මේ ගෙදර: මනුස්සා, මිනිස්සු: කත්ථ, කොහි: ගතා ඉති, ගියාහු දැයි: පුච්ඡිතෙ, විචාළ කල්හි: තං සුත්වා, ඒ අසා: ජයම්පතිකා, අඹු සැමි දෙදෙනා: ගෙහෙ ඉති, ගේ තුල යැයි: වත්වා, කියා: ගෙහා, ගෙයින්: නික්ඛමිංසු, පිටවූවාහු ය. අථ, ඉක්බිති: තෙසං, ඔවුන්ට: සක්කො, ශක්‍රයා: හොන්තා, පින්වත්නි: ඉමස්ස අය්‍යස්ස, මේ ආර්‍ය්‍යයන් වහන්සේට: කිඤ්චි, කිසියම්: දෙය්‍යං, දිය යුත්තක්: අත්ථීති, ඇද්දැයි: පුච්ඡිතො, විචාල කල්හි: අය්‍යා, සවාමීනි දුග්ගතා, දුප්පත් වූ: මයං, අපි: අය්‍යස්ස, ආර්‍ය්‍යයන් වහන්සේට: දෙය්‍ය ධම්මං, දිය යුතු දෙයක්: කුතො, කොහෙන්: ලභිස්සාම, ලබන්නෙමු ද: අන්තමසො, යටත් පිරිසෙයින්: පණ්ණමත්තං අපි, කොළයක් පමණවත්: නත්ථීති, නැතැයි: සබ්බං, සියල්ල: අවොචුං, කීහ.

තතො, ඉක්බිති: සකෙකා, ශක්‍රයා: තෙනහි, එසේ වී නම්: ඉමිනා තණ්ඩුලෙන, මේ සහලින්: භත්තං පචිත්වා, බත් පිස: ඉමිනා උපකරණෙන සද්ධිං, මේ උපකරණත් සමග: ථෙරං, තෙරුන්: භොජෙය්‍යාථ, වළඳවව්. යදි, ඉදින්: අහං, මම: චිරායාමි, ප්‍රමාදවෙම් නම්: මං, මා: අනොලොකෙත්වා, නොබලා: තුමෙහපි, නුඹලාත්: භුඤ්ජථ, අනුභව කරව්. යථා පච්චයං, ඉතිරි ආහාර කැමැති පරිද්දක්: කරොථ ඉති, කරවු යැයි: වත්වා, කියා: තං, ඒ ආහාර: අක්ඛයං, අඩු නොවන සේ: අධිට්ඨානං, අධිෂ්ඨාන: කත්වා, කොට: දෙව ලොකං එව, දෙව් ලොවටම: අගමාසි, ගියේය.

තතො, ඉක්බිති: තෙ, ඔවුහු: භත්තං, බත්: සම්පාදෙත්වා, සම්පාදනය කොට: ථෙරං, තෙරුන්: පරිවිසිත්වා, වළඳවා: තං, ඔහු: ආගමයමානා, බලාපොරොත්තු වන්නෝ: අනාගච්ඡන්තෙ, නොපැමිණි කල්හි: සයං, අපි, ඔව්හු ද: පරිභුංජිංසු, අනුභව කළහ. උක්ඛලියා පන, හැළියෙහි වනාහි: එකකටච්ඡු, එක් හැන්දක්: ගහිතමත්තට්ඨානං එව, ගත් පමණක් ම: පඤ්ඤායි, පෙනේ. උපකාරණානි අපි, උපකරණ ද: තථා එව, එසේමය: අථ, ඉක්බිති: තෙ, ඔහු: තං අච්ඡරියං දිස්වා, ඒ පුදුමය දැක: සොමනස්සා, සතුටු සිත් ඇත්තෝ වූහ. තතො පට්ඨාය, එතැන් පටන්: මහන්තං භික්ඛු සඞ්ඝං, බොහෝ භික්ෂු සඞ්ඝයා, සන්නිපාතාපෙත්වා, රැස් කරවා: සක්කරොන්තා, සත්කාර කරමින්: ගරුකරොන්තා, ගරු කරමින්: මානෙන්තා, බුහුමන් කරමින්: පූජෙන්තා, පුදමින්: පබ්බත පාදෙ, පර්වත පාදයෙහි: මනුස්සෙ ච, මිනිසුන් ද: අනෙක කපණද්ධික වණිබ්බකාදයො ච, නොයෙක් දුගී මගී යාචකාදීන්ට ද: දිබ්බාහාරෙන එව, දිව්‍යමය ආහාරයෙන්ම, සන්තප්පෙන්තා, සන්තර්පණය කරමින්: සීලං, රක්ඛන්තා, සිල් රකිමින්: උපොසථ කම්මං, කරොන්තා, පෙහෙවස් රකිමින්: ධම්මෙන සමෙන, දැහැමින් සෙමෙන්: යාව ජීවං වසිත්වා, දිවි ඇති තෙක් වැස: ආයු පරියොසානෙ, දිවි කෙළවර: දෙවලොකෙ, දෙව් ලොවෙහි: නිබ්බත්තිංසු, උපන්නාහුය.

12. භො, පින්වත්නි ජයම්පතී, ඒ අඹුසැමි දෙදෙනාගේ: සද්ධා බලං, ශ්‍රද්ධා බලය: පස්සථ, බලව්: සමංස දානෙපි, ශරීර මාංශ දීමෙනුදු: දාන මානසං, දාන චේතනාව: පූරෙත්වා, පුරා: තෙ, ඔහු තුමූ: දානස්ස, දානයාගේ: ඵලං, විපාකය: ලභිංසු: ලැබූහ. තුමෙහපි, තෙපි ද: සද්ධා ධුරං, ශ්‍රද්ධා ධුරය: සෙවථ, සේවනය කරව,

**වතුල්ල පබ්බතස්ස වත්ථුං වත්ථුල පර්වත කථාව: දසමං, දශ වැන්නයි.**

**මිගපොතකවග්ගො පඤ්චමො - පස්වැනි මිගපොතක වර්ගයයි.**

# උත්තරොලිය වග්ගො ජට්ඨො
# 1. උත්තරොලිය කථාව.

**(6) 1 උත්තරොලිය වත්ථුං, උත්තරොලිය කථා වස්තුවෙහි, අයං , මෝ, ආනුපුබ්බී කථා, පිළිවෙල කථාවයි.**

1. සීහල දීපෙ කිර, සිංහල ද්වීපයෙහි වනාහි; භගවතො, භාග්‍යවතුන් වහන්සේගේ; සාසනෙ, ශාසනය; පතිට්ඨිතෙ, පිහිටි කල්හි; තත්ථ තත්ථ, ඒ ඒ තන්හි; විභූතෙ, පතළ වූ; ධම්ම විනයෙ, ධර්මය හා විනය ඇති; රාජරට්ඨෙ, රජරට; උත්තරොලියං නාම, උතුරාලු නම්; එකං මහන්තං ගාමං, එක් විශාල ගමක්; අහොසි විය. තස්ස ඛො පන ගාමස්ස ආසන්නෙ, ඒ ගම සමීපයෙහි වනාහි; ගොපාල ගාමකෙ, ගොපලු ගමෙහි; එකො ගොපාල චෙටකො, එක් ගොපලු කොල්ලෙක්; රජොජල්ල පරිකිණ්ණ ගත්තො. රජසින් ගැවසී ගත් ශරීර ඇතිව; කුචෙලො, කිලිටි රෙද්දක් ඇඳ; පාදදම දණ්ඩ හත්‍ථො, පාදමයක් හා කෙවිටක් ගත් අත් ඇතිව; පාතොව, උදෑසනම; යාගුං පිවිත්වා, කැඳ බී; ගාවො, ගවයන්; පාලෙතුං, රක්නා පිණිස; වනං, කැලයට; ගච්ඡති, යයි.

අථ, ඉක්බිති; අස්ස, ඔහුගේ; මාතු මහල්ලිකා, මහළු මවුතොමෝ; පුත්ත, පුත තව සන්තිකං, තොප සමීපයට; ගච්ඡන්තා, යන්නෝ; නත්ථි, නැත. අරඤ්ඤෙ, කැලයෙහි දී; ඉමං, මෙය; ඛාදථ ඉති, කන්නැයි; පාරිවාසිකං, පිළුණු; එකං ආලුව ඛණ්ඩං, කටු අල කැල්ලක්; අදාසි, දුන්නේය. සො, හෙතෙම; තං අදය, එය රගෙන; ගච්ඡන්තො, යන්නේ; අන්තරාපථෙ, අතර මගදී; එකං පිණ්ඩ පාතිකත්ථෙරං, එක් පිණ්ඩපාතික තෙර නමක්; දිස්වා, දැක; වන්දිත්වා, වැඳ; ආලුව ඛණ්ඩං, කටු අල කැල්ල; පත්තෙ, පාත්‍රයෙහි; පතිට්ඨාපෙසි, තැබීය. ථෙරො, තෙරුන් වහන්සේ; තං, එය; පටිග්ගහෙත්වා, පිළිගෙන; එවං, මෙසේ; සලලක්ඛෙසි, සැලකීය. අයං දරකො, මේ දරුවා; අතීව දුක්ඛිතො, ඉතාම දුක්‍ෂිත. තස්ස, ඔහුගේ; එතං දෙය්‍යධම්මං, මේ දන වස්තුව; සඵලං කරිස්සාමි ඉති, සඵල කරන්නෙමියි; තත්ථ එව, එහිම; ඨිතො, සිටියේ; විපස්සනං, විදසුන් වඩ්ඪෙත්වා, වඩා; අරහත්තං, රහත් බවට; පත්වා, පැමිණ; පරිභුඤ්ජී, වැළඳීය. බුද්ධපුත්තානං, බුඩ් පුත්‍රයන්ගේ; කරුණා මහන්තතා, කරුණා මහත්වය; අහො, පුදුමයි.

2. සාධූනං, සත්පුරුෂයන්ගේ; කරුණා නාම, කරුණාව නම්; ඊදිසෙසු, මෙබන්දන් කෙරෙහි; පවත්තති. පවතින්නේය. එසො ජිනත්‍රජො, මේ සර්වඥපුත්‍රතෙම; පිලලකං, බැගෑපත්වූ; අතීව දුක්ඛිතා, ඉතා දුක්ඛිතයා; දිස්වා, දැක;

අසඞ්ඛතං, සකස් නොකරන ලද්ද වූ; පරිවාසං, පිළුණු වූ; නිද්ධොතං, ශුද්ධ නොකරන ලද; කරසා'හත, අතින් ගෙන එන ලද; ආලුව ඛණ්ඩං, කටුවල අල කෑල්ල; භුත්වා, අනුභව කොට; තං, ඒ ගොපලු දරුවා; යතිස්සරො, බුද්ධ පුත්‍රයන් වහන්සේ; සුඛාපෙති, සුවපත් කළ සේක.

3. තතො, ඉක්බිති; සො, දරකො, ඒ ගොපලු දරුවා; ආයුපරියොසානෙ, ආයු කෙළවර; කාලං කත්වා, කලුරිය කොට; තස්මිං එව ගාමෙ, එම ගමෙහිම; අඤ්ඤතරස්ස මාතුගාමස්ස, එක්තරා ස්ත්‍රියකගේ; කුච්ඡිම්හි, කුසෙහි; පටිසන්ධිං ගණ්හි, පිළිසිඳ ගත්තේය. තදා, එකල්හි; තස්ස ආලුවඛණ්ඩානුභාවෙන, ඔහුට කටුවල අලය දුන් ආනුභාවයෙන්; එකො නිධි කුම්භො, එක් නිධානයෙක්; නිබ්බත්ති, උපන්නේය. සො, ඒ නිධානය; සබ්බසං, සියල්ලන්ට; දිස්සමානො, එව, පෙනෙමින්ම; උත්තරොලිය වාපියං, උතුරාලු වැවෙහි; ඉතොචිතොච, ඔබිනොබ; පවට්ටමානො, පෙරළෙමින්; සංසරති, හැසිරේ. තදා, එකල්හි; එකා පන ඉත්ථී, එක් ස්ත්‍රියක් වනාහි; පවට්ටමානං, පෙරළෙන; තං නිධිකුම්භං, ඒ නිධානය; දිස්වා, දැක; වෙගෙන, වේගයෙන්; ගන්ත්වා, ගොස්; තං, එය; අග්ගහෙසි, අල්වා ගත්තේය. තතො, ඉක්බිති; තත්ථ, එහි; පරිග්ගහිතා දෙවතා, අධිගෘහිත දෙවතාවා; තස්සා, ඇගේ; හත්ථං, අත; මොචෙසි, මිදවිය. අථ, එකල්හි; සා, ඕතොමෝ; එකං මුත්තෙන, එක් අතක් ගැලවුණු කල්හි; එකෙන, එක් අතකින්; ගණ්හාති, අල්වා ගනී. තතො, ඉක්බිති; දෙවතා, දෙවතාවා; තස්සා, ඇගේ; එකං, හත්ථං, එක් අතක්; තස්මි එව, ඒ නිධානයෙහිම; අල්ලියාපෙසි, ඇලවීය. සා, ඕ තොමෝ; තං හත්ථං, ඒ අත ආකඩ්ඪිතුං, ඇදගන්ට; අසක්කොන්ති, නොහැක්කී; නිවත්ථ, හැඳි; වත්ථාදිං කත්වා, වස්ත්‍රාදිය කොට ඇති; සබ්බං, සියළු; පසාධන භණ්ඩං, ආභරණ බඩු; කුම්භියං එව, නිධානයටම; පක්ඛිපිත්වා, දමා; දෙවතාරාධනං කත්වා, දෙවියන් යැදීම කොට; මුත්ත හත්ථා, මිදුණු අත් ඇත්තී; පුන, නැවත; නිධිං, නිධානය; ඔලොකෙතුම්පි, බැලීමට ද; අවිසහි, නොහැකි විය. අථ, ඉක්බිති; තස්ස, ඇයගේ; හත්ථතො, අතින්; මුත්තමත්තෙන එව, මිදුනු ඇසිල්ලෙහිම; සො, ඒ නිධානය; ගන්ත්වා, ගොස්; පථවිං, පොළොවට; පාවිසි, පිවිසියේය. අථ, ඉක්බිති; සා ඉත්ථී, ඒ ස්ත්‍රී තොමෝ; ගන්ත්වා, ගොස්; තං පවත්තිං, ඒ පුවත; මනුස්සානං, මිනිසුන්ට; ආරොචෙසි, දැනුම් දුන්නාය. ගාමවාසිනො, ගම් වැසි; මනුස්සා, මිනිස්සු; නිධිං, නිධානය; දස්සනත්ථාය, දැකිම පිණිස; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; වාපිං, වැවට; අගමංසු, ගියහ.

4. තතො, ඉක්බිති; ආලුව ඛණ්ඩ දින්න, කටු අලය දුන්; කුමාරස්සාපි මාතා, කුමාරයාගේ මව ද; තං, ඔහු; කුච්ඡිනා පරිහරන්ති, කුසින් දරන්නී; අඤ්ඤං පුත්තං, අනික් පුතා; අඞ්කෙ, ඇකයෙහි; නිසීදපෙත්වා, හිඳුවා ගෙන; වාපිං එව, වැවටම; අගමාසි, ගියේය. තදාපි, එකල්හි ද; සො නිධිකුම්භො, ඒ නිධානය; පථවි තලතො, පොළෝ තලයෙන්; උග්ගම්ම, උඩට අවුත්; උදක පිට්ඨෙ, දිය පිට; අපරාපරං, ඔබ

මොබ; සඤ්චරි, හැසුරුණේය. තදා, එකල්හි; මනුස්සා, මිනිස්සු; අම්හාකං, සන්තිකං, අපගේ සමීපයට; ආගච්ඡන්ති, ඒවායි; ආසිං සන්තා, බලාපොරොත්තු වෙමින්; අට්ඨංසු, සිටියහ. අථ, එකල්හි; සා කුමාරමාතාපි, ඒ කුමාරයාගේ මවු තොමෝ ද; තථා එව, එසේම; වත්වා කියා; අට්ඨාසි, සිටියේ ය. නිධිකුම්භො, නිධානය; ථොකං, ටිකක්; ආගම්ම, අවුත්; තස්සා, ඇගේ; අභිමුඛට්ඨානෙ, ඉදිරියෙහි; අට්ඨාසි, සිටියේය. පුන, නැවත; සා, ඕ තොමෝ; මම අඞ්ක පුත්තස්ස, මගේ ඇකයේ සිටින පුතාගේ; ආනුභාවෙන, ආනුභාවයෙන්; ආගච්ඡතූති, ඒවායි; ආහ, කීය; න ආගච්ඡති එව, නො ආවේමය; තතො, ඉක්බිති; සා, ඕ තොමෝ; මම, මාගේ; කුච්ඡිගතස්ස, කුසෙහි වූ; පුත්තස්ස, පුතාගේ; පුඤ්ඤානුභාවෙන, පුණ්‍යානුභාවයෙන්; ආගච්ඡතූ'ති, ඒවායි, ආහ. කීවාය. තාය වුත්තමත්තෙ එව, එය කියන ලද කල්හිම; නිධිකුම්භො, නිධානය; සීසං, ආගම්ම, වහා අවුත්; තස්සා, ඇයගේ; පුරතො, ඉදිරියෙහි; සමීපෙ, සමීපයෙහි; අට්ඨාසි, සිටියේය. අථ, අනතුරුව; සා, ඕ තොමෝ; නිධිකුම්භස්ස, නිධානයට; තව, තොපට; යුත්තට්ඨානං, සුදුසු තැන; ත්වං, එව, ඔබම; ජානාහි, දනුව; තස්සා, ඇයගේ; වචන සමනන්තරං එව, කීමට අනතුරුවම; සො, ඒ නිධානය; පඨවියං, පොළොවෙහි; පරිවත්තමානා, පෙරළෙමින්; ගන්ත්වා, ගොස්; තස්සා, ඇයගේ; ගෙහෙ, ගෙහි; යුත්තට්ඨානෙ, සුදුසු තැනෙක්හි; අට්ඨාසි, සිටියේය. කුමාරස්ස, කුමාරයාට; කත්තබ්බ වය කරණං, කළ යුතු වැය කරණය; ඨපෙත්වා, හැර; අඤ්ඤං, අනිකක්; කාතුං, කරන්ට; නිධිකුම්භො, නිධානය; න දෙති, නොදෙයි; අථ, ඉක්බිති; අපරභාගෙ, මෑත කාලයෙහි; කුමාරො, කුමාරයා; මාතුකුච්ඡිතො, මවු කුසින්; නික්ඛමිත්වා, නික්මී; කමෙන, ක්‍රමයෙන්; සික්ඛාගහණ කාලෙ, ශිල්ප ඉගෙන ගන්නා කාලය; සම්පාපුණි, පැමිණියේය. තදා කිර, එකල්හි වනාහි; දීපවාසිනො, දිවයිනෙහි වැසි මිනිස්සු; පඤ්චවස්සිකං, පස් හැවිරිදි; කුමාරං, කුමාරයා; විභවානුරූපාභරණෙහි; සම්පත් අනුරූප වූ ආභරණයන්ගෙන්; අලඞ්කරිත්වා, සරසා; මඞ්ගලෙන, උත්සවයෙන්; සික්ඛාපදං, ඉගැන්වීම; ගණ්හාපෙන්ති, කරවති. තදා, එකල්හි; තස්ස, ඔහුගේ; මාතා, මෑණියෝ; සික්ඛාගහණ මඞ්ගලෙසු, අකුරු කියවීමේ මංගලයන්හි හා; නාමකරණ මඞ්ගලෙසු, නම් තබන මංගලයන්හි; පුත්තං, පුතා; පසාදෙන්ති, සරසන්නී; නිධිකුම්භතො, නිධානයෙන්; තදා, එදා; ඉත්ථියා, ස්ත්‍රිය; විසින්; පක්ඛිත්ත වත්ථං, දැමූ වස්ත්‍රය; ගහෙත්වා, ගෙන; නිවාසෙසි, ඇන්දවූවාය. තතො, ඉක්බිති; වත්ථසාමිකා, වස්ත්‍රය අයිතිකාරිය; තස්ස, ඔහුගේ; ගෙහං, ගෙදරට; ආගතා, ආවා; වත්ථං වස්ත්‍රය; සඤ්ජානිත්වා, හැඳින; ඉමං, මෙය; මම වත්ථං, ඉති, මගේ වස්ත්‍රයයි; අග්ගහෙසි, අල්වා ගත්තේය. කුමාරස්ස, කුමාරයාගේ; මාතා, මව; තං දිස්වා, ඒ දැක; වත්ථස්ස ආගමනං, වස්ත්‍රයේ පැමිණීම පිළිබඳ සබඛං, සියල්ල; කථෙසි, කීවාය. සා, ඕ තොමෝ; තං නිධිං ලභිත්වා, ඒ නිධානය ලැබී; ගොපෙත්වා, සඟවාගෙන; පරිභුඤ්ජි, පරිභොග කරන්නෙහිය. නිධයො නාම, නිධාන නම්; රඤ්ඤො සන්තක

භාවං, රජුට අයිති බව; න ජානාසි, නොදන්නෙහිද; කිං කිම? ත්වං, තී; හලාහල විසතො අධිකං, හලාහල විෂයටත් වඩා අධික් වූ; නිධිං, නිධානය; පරිභුඤ්ජසී'ති පරිභොග කරන්නෙහි දැයි; වත්වා, කියා; ආහ, මෙසේ කීය.

5. විස, සර්ප දෂ්ට විෂ ආදී විෂය; න විසං ඉති, විෂ නොවේ යයි; අක්ඛාතං, කියන ලදී. රාජස්සං, රජුන්ගේ ධන සංඛ්‍යාත විෂය; විසං ඉති, විෂ යයි; උච්චතෙ, කියනු ලැබේ. විසං, සර්පාදීන්ගේ විෂය; එකං'ව කෑ එක තැනැත්තේ ම; නාසෙති, නසන්නේය රාජස්වං, රජුන්ගේ ධන සංඛ්‍යාත විෂය; කෙවලං කුලං, සියළු කුලයම නසන්නේය.

6. කානනෙ, වනයෙහි; දහනා, ලැව් ගින්නෙන්; දඩ්ඪා, දවන ලද; පාදපා, වෘක්ෂයෝ; නූන, ඒකාන්තයෙන්; තිට්ඨන්ති, (සමහරක් ඉතිරිව) සිටිත් රාජ කොපා නලා, රජුගේ කෝප නැමැති ගින්නෙන්; දඩ්ඪා, දවන ලද; නරා, මනුෂ්‍ය නමැති වනයෙහි කිසිවක්හු; තථා, එපරිද්දෙන්; න තිට්ඨන්ති, නො සිටිත්.

7. කාලො වා, මරහු හෝ; රඤ්ඤො, රජුට වඩා; කාරණං, වඩනේ ද; (බලවත් ද) රාජා වා, රජ හෝ; කාල කාරණං, මරහට වඩන්නේ ද; තෙ, තිට; සංසයොතු සැකය වනාහි; මා හොතු, නොවේවා; රාජා වා, රජ දරුවෝ වනාහි; කාලකාරණො'ති, මරුට වඩා බලවත්මය.

එවං, මෙසේ; වදන්ති, කියමින්; තං, ඇයට; සන්තජ්ජෙසි, තර්ජනය කළාය. තතො, ඉක්බිති; කුමාරමාතා, කුමාරයාගේ මව; ආහ. මෙසේ කීවාය.

8. යෙන, යමෙකු විසින්; යං විත්තං, යම් වස්තුවක්; අනයෙන, අයුක්තියෙන්; ලද්ධං, ලබන ලදද; තස්ස, ඔහුට; තං, එය; රාජාදි භයං හි, රාජාදීන්ගෙන් වන්නාවූ භය; දෙති, දෙයි යො, යමෙක්; නයෙන, යුක්තියෙන්; මහාධනං, මහා ධනයකට; පප්පොති, පැමිණියේ ද; (ඒ ධනය) නාසං, නසන්ට; දෙවතාහි, දේවතාවන් විසිනුත්; නහි සක්කොන්ති, නොහැකි වෙත්.

9. එවං, මෙසේ; තාසං, ඇලා, වත්ථස්ස, වස්ත්‍රය නිසා ඇතිවූ කලහ මූලෙන, කලහය මුල් කරගෙන වූ; සා කථා මෝ කථා තොමෝ; රඤ්ඤො, රජුගේ; සන්තිකං, සමීපයට; අගමාසි; ගියේය. රාජා, රජතුමා; තං සුත්වා, ඒ අසා; ධනාහරණත්ථාය, ධනය ගෙන ඊම පිණිස; රාජපුරිසෙ, රාජ පුරුෂයන්; පෙසෙසි, යැවීය. මනුස්සා, මිනිස්සු; ධන සාමිකස්ස සන්තිකං, ධන හිමියා ළඟට; ගන්ත්වා, ගොස්; නිධී කුම්භං, නිධානය; පරාමසිංසු, ඇල්ලූහ. අථ, එකල්හි; සො, ඒ නිධානය; භයානක සද්දං, භය ජනක ශබ්දයක්; පවත්තෙන්තො, පවත්වමින්; ඉතො චිතොව, ඔබනොබ; අපසරන්තො, පෙරලෙමින්; පසාරිත හත්ථෙ, දිගු කළ අත්; තත්ථ එව, එහිම; අලලියා, පෙනෙන්තා, ඇලෙමින්; ගහෙතුං, ගන්ට; න අදසි,

නුදුන්නේය. රාජපුරිසා, රාජපුරුෂයෝ; තං පවත්තිං, ඒ පුවත; රඤ්ඤො, රජුට; පෙසෙසුං, යැවූහ. රාජා, රජතුමා; තං සුත්වා, ඒ අසා; විම්හිතො, පුදුම වූයේ; තථා සති, එසේ ඇති කල්හි; ධන සාමිකං, ධන හිමියා; ධනෙන සද්ධිං ධනය සමග; ආනෙතු ඉති, ගෙන ඒවායි; පෙසෙසි, යැවීය. තෙ, ඔවුහු කුම්භිනා සද්ධිං, නිධානයත් සමග; ධන සාමිකං, ධන හිමියා; නෙත්වා, ගෙන ගොස්; රඤ්ඤො, රජුට; දස්සෙසුං, දැක්වූහ. රාජා, රජතුමා; කුම්භිතො, නිධානයෙහි; අච්ඡරියං, දිස්වා, පුදුමය දැක; ධන සාමිනො, ධන හිමියාට; එවං, මෙසේ; ආහ, කීය. හො, පින්වත තව, ඔබගේ කුම්භිතො, නිධානයෙන්; අම්හාකම්පි, අපට ද; ධනං, ධනය; දෙහි, දෙන්න. තතො, ඉක්බිති; උදකං ගහෙත්වා, දිය ගෙන; නිධිකුම්භිං, නිධානයට; අභිසිඤ්චි, ඉස්සේය. තං ඛණං එව, එකෙණෙහිම; කුම්භි මුඛතො, නිධාන කටින්; උග්ගම්ම, උඩට ආ; මහාධන රාසි, මහාධන රාශියක්; අහොසි, විය. රාජා, රජතුමා; තං දිස්වා, එය දැක; අතිවිය විම්හිත මානසො, ඉතා පුදුමයට පත් සිතැත්තේ; නිධිකුම්භිනා සද්ධිං, නිධානය සමග; තස්ස, ඔහුට; මහන්තං, මහත් වූ; භොගක්ඛන්ධං, භොග සමූහයක්; දත්වා, දී; තං ජනපදං, ඒ ජනපදය; තස්ස එව, ඔහුටම; දත්වා, දී; මහා පරිවාරෙන, මහා පිරිවරින්; පෙසෙසි, යැවී.

සො, හෙතෙම; තතො පට්ඨාය, එතැන් පටන්; දනාදිහි පුඤ්ඤානි, දන් දීම් ආදී පින්; කත්වා, කොට; ආයුපරියොසානෙ, ආයුෂයාගේ කෙළවර; සපුත්තදරකො, අඹුදරුවන් සහිතව; ගන්ත්වා, ගොස්; දෙව ලොකෙ; දිව්‍ය ලොකයෙහි; නිබ්බත්ති, උපන්නේය.

10. යො, යමෙක්; වෙ, ඒකාන්තයෙන්; ගුණාධාර, ගුණධර්මයන්ට ආධාර වූ; ජිනපුත්තානං, බුද්ධ පුත්‍රයන්ට; අප්පං අපි, ස්වල්පමාත්‍රයකුදු; දෙය්‍යං, දනයක්; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; දදති, දෙයිද; සො, හෙතෙම; පෙච්ච, පරලොව; සංසාර මහා විද්දුගෙග, සසර නැමැති මහා සාගරයෙහි; සම්පත්ති නාවා; දිව්‍ය මනුෂ්‍ය සම්පත්ති නැමැති නෞකාවෙන්; පතිට්ඨං, ප්‍රතිෂ්ඨාවට; එති, පැමිණේ.

**උත්තරොලිය වත්ථුං, උත්තරොලිය කථාව; පඨමං, පළමු වැන්නයි.**

## 2. තම්බසුමන තෙරුන්ගේ කථාව.

**(6) 2. තම්බ සුමනත්ථෙරස්ස වත්ථුං, තම්බසුමන තෙරුන්ගේ කථාවස්තු වෙහි; අයං, මෝ; ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. එකස්මිං කිර සමයෙ, එක් කාලයෙක්හි; ලඞ්කායං, ලඞ්කාවෙහි;සද්ධා තිස්සො නාමරාජා, සද්ධා තිස්ස නම් රජතුමා; රජ්ජං කාරෙති, රාජ්‍යය කරවයි. තද, එකල්හි; එකො රාජපුරිසො, එක් රාජ පුරුෂයෙක්; රඤ්ඤා, රජතුමා විසින්; පෙසිතො, පිටත් කරන ලදින්;

කොට්ඨසාලං, කොටහල් නම් දනව්වට; අගමාසි, ගියේය.

රාජ කිච්ච පසුතො, රාජකායර්‍යයෙහි යෙදුණු; තස්ස, ඔහුට; තස්මිං ගාමෙ, ඒ ගමෙහි; මනුස්සා, මිනිස්සු; ආගන්තුක සක්කාරං, ආගන්තුක සත්කාරය; කරොන්තා, කරන්නාහු; සසතං, ගිතෙල් සහිත; සව්‍යඤ්ජනං, ව්‍යඤ්ජන සහිත; භොජනං, ආහාර; සම්පාදෙත්වා, සම්පාදනය කොට; කාලං, කල්; ආරොචෙසුං, දැන්වූහ. තතො, ඉක්බිති; තං, ඔහු; භොජනත්ථාය, ආහාර පිණිස; නිසින්න කාලෙ, හුන් කල්හි; එකො භික්ඛු, එක් භික්‍ෂුවක්; භික්ඛං චරමානො, පිඬු පිණිස හැසිරෙන්නේ; අනුක්කමෙන, අනුක්‍රමයෙන්; තං ඨානං, එතැනට; සම්පාපුණි, පැමිණියේය. සො, හෙතෙම; ථෙරං, තෙරුන්; දිස්වා, දැක; පසන්නො, පැහැදුනේ; තං, උන්වහන්සේ කරා; උපසංකමිත්වා, එළඹ; පත්තං, පාත්‍රය; ගහෙත්වා, ගෙන; සත සහිත භත්තං, ගිතෙල් සහිත බත්; ථෙරස්ස, තෙරුන්ට; අදාසි, දුන්නේය. ථෙරො, තෙරුන්වහන්සේ; භත්තං, බත්; භුඤ්ජිත්වා, වළඳ; සතං, ගිතෙල්; භෙසජ්ජත්ථාය; බෙහෙත් පිණිස; උපනෙසි, ලඟ තබා ගත්තේ.

සො, හෙතෙම; එත්තකං පුඤ්ඤකම්මං, කත්වා, මෙපමණ පින්කමක් කොට; ආයුපරියොසානෙ, ආයු කෙළවරෙහි; කාලකතො, කළුරිය කොට; ඉමස්මිං, එව දීපෙ, මේ ලඞ්කා දීපයෙහිම; 'වල්ලව' ගාමෙ, 'වල්ලව' ගමෙහි; අඤ්ඤතරස්මිං කුලෙ, එක්තරා පවුලක; නිබ්බත්ති, උපන්නේය. අථ, ඉක්බිති; අස්ස, ඔහුගේ; මාතා පිතරො, මවුපියෝ; සුමනොති, සුමන යයි; වොහරිංසු, ව්‍යවහාර කළහ. සො, හෙතෙම; කමෙන, ක්‍රමයෙන්; වුඩ්ඪිං අන්වාය, වැඩී විය පැමිණ; දරපරිග්ගහං කත්වා, ආවාහ වී; ගෙහං, ගෙදර; අජ්ඣාවසන්තො, වාසය කරනනේ; ඝරාවාසෙ, ගිහිගෙයි; ආදීනවං, ආදීනව ද; පබ්බජ්ජාය, පැවිදි වීමෙහි; ආනිසංසං ච, ආනිසංස ද; ඤත්වා, දැන; සම්පත්තිං, සම්පත්; පහාය, හැර; බ්‍රාහ්මණාරාම විහාරං, බ්‍රාහ්මණාරාම විහාරයට; ගන්ත්වා, ගොස්; පබ්බජිත්වා, පැවිදිව; ආරද්ධ විරියො, පටන් ගත් වීර්‍ය්‍ය ඇත්තේ; පහිතත්තො, නිවන් කරා මෙහෙයවන ලද සිත් ඇත්තේ; වත්ත පටිවත්ත සම්පන්නො, වත් පිළිවෙතින් යුක්ත වූයේ; නචිරෙන එව කාලෙන, නොබෝ කලකින්ම; විපස්සනං, විදසුන්; වඩ්ඪෙත්වා, වඩා; අරහත්තං, රහත් බවට; පත්වා, පැමිණ; තම්බ සුමනත්ථෙරොති, තම්බ සුමන තෙරුන් වහන්සේ යයි; පාකටො අහොසි, ප්‍රකට විය.

අථ, ඉක්බිති; අස්ස, උන්වහන්සේගේ; පුඤ්ඤානුභාවෙන, පුණ්‍යානුභාවයෙන්; තස්මිං එව විහාරෙ, එම වෙහෙරෙහිම; තිම්බර රුක්ඛෙ, තිඹිරි ගසෙහි; අධිවත්ථා දෙවපුත්තො, අධිගෘහිත දිව්‍ය පුත්‍රයා; ථෙරං, තෙරුන් වහන්සේ; නිබද්ධං, නිතොර; දිබ්බාහාරෙන, දිව්‍යමය ආහාරයෙන්; උපට්ඨෙති, උපස්ථාන කරයි. තස්ස පන ථෙරස්ස, ඒ තෙරුන් වහන්සේගේ; ඡාදය වස්සකාලෙ, දෙළොස්වන වස්කාලයෙහි; ලඞ්කායං, ලඞ්කාවෙහි; බ්‍රාහ්මණියං නාම, බැමිණියා නම්; ජාතකං අහොසි,

දුර්භික්ෂයක් විය.. තද පන, එකල්හි වනාහි; දුබ්භික්ඛභයෙහි, දුර්භික්ෂ භයෙන්; ජනෙසු පිළියමානෙසු, මිනිසුන් පෙළෙන කල්හි; ථෙරො, තෙරුන් වහන්සේ; පඤ්චසතෙ භික්ඛු, පන්සියයක් භික්ෂූන් වහන්සේ; ආහාරෙන, ආහාරයෙන්; කිලමමානෙ දිස්වා, ක්ලාන්ත වන්නවුන් දැක; තෙ, උන්වහන්සේලා; ආමන්තෙත්වා, අමතා; ආවුසො, ඇවැත්නි මයං, අපි; කත්ථ, කොහි; ගන්ත්වා, ගොස්; ජීවිස්සාම ඉති, ජීවත් වෙමු දැයි; මන්තෙත්වා, සාකච්ඡා කොට; තෙහි සබ්බෙහි, ඒ සියල්ලන් විසින්; ජම්බු දීපෙ, දඹදිවට; ගන්ත්වා, ගොස්; ජීවිස්සාම ඉති, ජීවත් වෙමුයි; වත්වා, කියා; එකජ්ඣාසයෙ ජාතෙ, එක අදහසක් ඇති වූ කල්හි; ථෙරො, තෙරුන් වහන්සේ; ගමන සජ්ජො අහොසි, ගමනට පිළියෙල විය. දෙවපුත්තො, දිව්‍ය පුත්‍රයා; තං දිස්වා, ඒ දැක; භණෙන, සච්චාමිනි කිං, කිම; ගමනා කාරං, ගමනාකාරයක්; පඤ්ඤායති, පෙනේ. කුහිං, කොහි; ගච්ඡථ ඉතී, වඩිනා සේක්දැයි; ආහ. විචාළේය. තං සුත්වා, ඒ අසා; ථෙරො, තෙරුන් වහන්සේ; දෙවපුත්තස්ස, දිව්‍ය පුත්‍රයාට; එවං, මෙසේ; ආහ, කීය.

2. දෙව, එම්බා දිව්‍ය පුත්‍රය! ඉදනි, දැන්; අයං ලඞ්කා, මේ ලඞ්කාදීපය; කෙවලා, හුදෙක්; දුබ්භික්ඛා අසි, දුර්භික්ෂා විය. තලාක රහද දයො, වැව් පොකුණු ආදිය; සුස්සිත්වා, වියලී; එලිත ආසුං, පැලී ගියාහුය.

3. ජලජා, දියෙහි උපන්නා වූ ප්‍රාණීහු; (මත්ස්‍යයෝ) විනාස ගතා, විනාශයට ගියාහුය. පිපාසා, පිපාසිත වූ; මිග සූකරා, මුවෝ හා ඌරෝ; ආරාව, දුර පෙනෙන; මරීචිං, මිරිඟුව; දිස්වා, දැක; තොය සඤ්ඤිනො, ජලය යන හැඟීම් ඇත්තාහු; ධාවන්ති; දුවත්.

4. වනා, වනයෝ; සීන පණ්ණා ආසුං, කොළ ගිළිහී ගියාහුය. භූජාතාව, බිම්හි හට ගත්තා වූ; තිණොසධා, තෘණ ඖෂධ පැළැටි වර්ගද; භුසංච, බොල්ච; චණ්ඩා නිල සමාගතා, චණ්ඩ මාරුතය හා එක් වූවාහු; විකිරියිංසු, විසිර ගියාහුය.

5. දීපස්මිං, දිවයිනෙහි; දුබ්භොජනෙන, නරක ආහාර හේතුකොට ගෙන; පීළිතා, පීඩිත වූ; මානුසා පන, මනුෂ්‍යයෝ වනාහි; ඛීණ ලොහිත මංසකා, ලේ මස් ක්ෂය වූවාහු; අට්ඨිචම්මං, ඇට සම් පමණක් ම; අවසෙසා'සුං, ඉතිරි වූවාහුය.

6. දෙව, දිව්‍ය පුත්‍රයෙනි; ජීවිතාසා, ජීවිතයෙහි අසා ඇති; නරා, මනුෂ්‍යයෝ; පුත්ත දරකෙ, අඹුදරුවන්; ගහෙත්වා, ගෙන; යත්ථ, යම් තැනෙක්හි; ජීවිතුං, ජීවත්වන්ට; සක්කොන්ති, හැකි වෙත් ද; තත්ථ, තත්ථ ඒ ඒ තන්හි; ගත ආසුං, ගියාහුය.

7. මහා දෙව, මහා දිව්‍ය පුත්‍රය! යස්මා, යම් හෙයකින්; ඉධ සීහලෙ, මේ සිංහල රටෙහි; ජීවිතුං, ජීවත්වන්ට; න සක්කොමි, නොහැක්කෙම් ද; තස්මා, එහෙයින්; ජම්බුදීපස්ස, දඹදිවට; ඉදනි, දැන්; යාම ඉති,

යන්නෙමුයි; අබ්‍රැවී, වදළ සේක.

8. තං සුත්වා, ඒ අසා; දෙවපුත්තො, දිව්‍ය පුත්‍රයා; තස්ස, ඔහුගේ; අතීත කම්මං, අතීත කර්‍මය; පකාසෙත්වා, ප්‍රකාශ කොට; ගමන චිත්තං, ගමන් සිත; පටිබාහෙන්තො, වළක්වමින්; එවං, මෙසේ; ආහ, කීය.

9. භන්තෙ, ස්වාමීනි තුවං, නුඹ වහන්සේ; අතීතම්හි, අතීතයෙහි; සද්දහන්තො, කම්පල අදහන්නේ; එකස්ස භික්ඛුනො, එක් භික්‍ෂු නමකට; ඝතෙන සහ, ගිතෙල් සමග; පිණ්ඩපාත, භොජනං, පිණ්ඩපාත භොජනයක්; අදසි, දුන්නේය

10. තස්ස පුඤ්ඤකම්මස්ස, ඒ පුණ්‍යකර්‍මයාගේ; වාහසා, හේතුවෙන්; තුවං, නුඹ වහන්සේ; තතො චුතො, එයින් චුත වූයේ; එතස්මිං දුතියත්තභාවෙ, මේ දෙවන ජාතියෙහි; ජායිත්වා, ඉපිද; සුඛෙ, සැපයෙහි; ඨිතො, පිහිටියේය.

11. මාතා පිතරො, මවුපිය දෙදෙනද; සහිරඤ්ඤං, අමු රන් සහිත වූ; සකංඝරං, ස්වකීය ගෙදර ද; පහාය, හැර; සම්බුද්ධසාසනෙ, බුදු සසුන්හි; බද්ධ මානසො, ඇලුණු සිත් ඇත්තේ; පබ්බජිත්වාන, පැවිදිව;

12. පටිපත්ති පරො හුත්වා, ප්‍රතිපත්ති සාරව; තිලක්ඛණං, තිලකුණු; භාවෙත්වා, වඩා; සො ත්වං, ඒ නුඹ වහන්සේ; ඛීණාසවෙ ආසි, රහත්වූයෙහිය. තදා, එකල්හි; තෙ, නුඹ වහන්සේගේ; දාන ඵලං, ඒ දානයාගේ ඵලය; තං, එය වන්නේය.

13. අථ, නැවත; භන්තෙ, ස්වාමීනි! මෙ, මාගේ; අපරම්පි, අනිකුදු; සුභං, යහපත් වූ; වචනං, වචනයක්; සුණථ, ඇසුව මැනව; මයා, මා විසින්; දීයමානං, දෙනු ලබන්නාවූ; යං තං දිබ්බන්නං, යම් ඒ දිව්‍ය ආහාරයක්; පරිභුඤ්ජසි, වළඳන්නෙහිද; ඉදම්පි, මේ දෙන ලද්ද; තදා, එකල්හි; දින්න, දෙන ලද; දානස්ස එව, දානයාගේම, තං ඵලං සියා; ඒ විපාකය වන්නේය.

14. යාව, යම්තාක්; එත්ථ සීහලෙ, මේ සිංහල දීපයෙහි; දුබ්භික්ඛ භයං, දුර්භික්‍ෂ භය; වූප සම්මතී, සංසිද්දේද; තාව, ඒතාක්; එත්ථ එව, මෙහිම; සසිස්සෙහි, ශිෂ්‍යයන් සමග; මෙ, මට; කරුණාය, කරුණාවෙන්; වත්ථබ්බං, වැඩ සිටිය මැනව.

15. චීවරං, සිවුරු ද; පිණ්ඩපාතං ච, පිණ්ඩපාතය ද; භෙසජ්ජං, බෙහෙත් ද; සයනාසනං, සෙනසුන් ද යන; තං, ඒ සිවුපසය; තව, නුඹවහන්සේගේ; පුඤ්ඤානුභාවෙන, කුශලානු භාවයෙන්; සදා, හැම කල්හි; විපුලං හොති, මහත්කොට වේ.

16. හො භදන්තා, පින්වත් ස්වාමීන් වහන්සේලා; ජම්බුදීපං, දඹදිවට; කදාචිපි, කිසි කලෙකත්; මා ගච්ඡන්තු, නොවඩින සේක්වා; තෙ, නුඹ වහන්සේලා; සකිච්ච පසුතා හුත්වා, ස්වකීය භාවනාදී කටයුතුවල

යෙදී; දුක්ඛස්ස, සංසාර ...ඛයාගේ; අන්තං, කෙළවර; කරොන්තු, කෙරෙත්වා!

17. එවං ච පන වත්වා, මෙසේ ද කියා; දෙව පුත්තො, දිව්‍ය පුත්‍රයා; ජම්බුදීප ගමනං, දඹදිව ගමන; නිවාරෙත්වා, වළක්වා; තතො පට්ඨාය, එතැන් පටන්; ථෙරං, තෙරුන්ට; දිබ්බමයෙහි, දිව්‍යමය වූ; චීවර පිණ්ඩපාත සෙනාසනෙහි, සිවුරු පිණ්ඩපාත සේනාසනයන්ගෙන්; උපට්ඨහති, උපස්ථාන කෙරේ. තං, එය; පඤ්චන්නං, භික්ඛු සතානං, පන්සියයක් භික්‍ෂූන් වහන්සේට; යාවදත්ථං, ඇති පමණ; පහොති, සෑහේ. එවං. මෙසේ; දෙවරාජා, දිව්‍ය රාජයා; ද්වාදස සංවච්ඡරං, දෙළොස් අවුරුද්දක්; උපට්ඨහි,උපස්ථාන කෙළේය. තතො, ඉක්බිති; දුබ්භික්ඛ භයෙ, දුර්භික්‍ෂ භය; වූපසන්තෙ, සංසිඳුණු කල්හි; ථෙරො, තෙරුන් වහන්සේ; දෙව පුත්තං, දිව්‍ය පුත්‍රයා; ආමන්තෙත්වා, අමතා; චාරිකං චරමානො, චාරිකාවෙහි හැසිරෙන්නේ; පඤ්චසතෙහි භික්ඛුහි සද්ධිං, පන්සියයක් භික්‍ෂූන් සමග; අනුක්කමෙන, පිළිවෙලින්; රාජරට්ඨෙ, රජරට; කණ්ඩරාජිකං නාම, කඩරොද්ද නම්; මහාගාමං, මහගමට; පත්වා, පැමිණ; භික්ඛං චරිත්වා, පිඬු පිණිස හැසිර; එකස්මිං ඨානෙ, එක් තැනෙක; නිසීදිත්වා, හිඳ; පරිභුඤ්ජිතුං, වළඳන්නට; ආරභි, පටන් ගත්තේය.

භික්ඛු සඞ්ඝොපි, භික්‍ෂු සඞ්ඝයා ද; තදා, එදින; මෙඝ පටලච්ඡන්නෙ, වැසි වලාකුල් ගැවසී ගත් කල්හි; සූරියාලොකං, සූර්‍ය්‍යා ලෝකය; න දස්සෙසි, නොදැක්කේය, අථ, එකල්හි; එකච්චෙ භික්ඛු, ඇතැම් භික්‍ෂූහු; කුක්කුච්චායන්තා, කුකුස් කරන්නාහු; න පරිභුඤ්ජිංසු නොවැළඳූහ. තතො, ඉක්බිති; ථෙරො, තෙරුන් වහන්සේ; තෙසං, උන්වහන්සේලාගේ; කුක්කුච්ච විනොදනත්ථං, සැකය නැති කිරීම පිණිස; එකං සක්ඛර පාසාණං, එක් ගල් කැටයක්; ගහෙත්වා, ගෙන; නබගෙන, නිය අගින්; ආකාසෙ, අහසට; ඛිපි දැම්මේය. සො, ඒ ගල; ආකාසං, අහසට; උග්ගන්ත්වා, නැගී; සූරියො විය, හිරුමෙන්; ජලමානො, දිලිසෙමින්; අට්ඨාසි, සිටියේය. අථ, ඉක්බිති; තෙ භික්ඛු, ඒ භික්‍ෂූහු; නික්කඞ්ඛාහුත්වා, සැක නැත්තෝව; පරිභුඤ්ජිංසු, වැළඳූහ. තස්මා, එහෙයින්; තං ඨානං, එතැන; තතො පට්ඨාය,. එතැන් පටන්; මණිසූරියං ඉති නාමෙන, මිණිසූරිය යන නාමයෙන්; පාකටං අහොසි, ප්‍රකට විය. තතො, ඉක්බිති; ථෙරො, තෙරුන් වහන්සේ; නික්ඛමිත්වා, නික්මී; ගඞ්ගාසනෙන, ගඟ අසල; චූලලතවාල ගාමෙ, සුළු වැසර ගම; භික්ඛං චරිත්වා, පිඬු පිණිස හැසිර; ගඞ්ගා තීරෙ, නිසීදිත්වා, ගං ඉවුරෙහි හිඳ; භුඤ්ජන්තො, වළඳන්නේ; තෙ භික්ඛු, ඒ භික්‍ෂූන්; අප්පසූපෙන, ව්‍යඤ්ජන මඳව; ලූඛභත්තා, රූක්‍ෂ බත්; භුඤ්ජන්තෙ දිස්වා, වළඳන්නවුන් දැක; ආවුසො, ඇවැත්නි! මාලූඛං භත්තං, භුඤ්ජථ, රළුබත් නොවළඳව; සුගන්ධසප්පි, සුවඳ ගිතෙල්; මම පුඤ්ඤෙන, මගේ පිනෙන්; නිබ්බත්තිස්සති, උපන්නෙහි; තෙන සද්ධිං, ඒ සමග; භුඤ්ජථ ඉති, වළඳන්නැයි; ආහ, කීය. තං සුත්වා, ඒ අසා; භික්ඛු, භික්‍ෂූහු; තුණ්හීභාවෙන, නිශ්ශබ්ද වීමෙන්; අධිවාසෙසුං, ඉවසූහ. ථෙරොපි,

තෙරුන් වහන්සේ ද; තදා, එකල්හි; අත්තනා, තමා විසින්; පුරිමත්තභාවෙ, පෙර ආත්මභාවයෙහි; එකස්ස භික්ඛුනො, එක භික්‍ෂුවකට; දින්න, දෙන ලද; පරිත්තසතං, ගිතෙල් ස්වල්පය; ආවජ්ජිත්වා, ආවර්ජනා කොට; ඉදං ගඞ්ගොදකං, මේ ගඟ දිය සප්පි හොතු ඉති, ගිතෙල් වේවායි; අධිට්ඨාසි, අධිෂ්ඨාන කෙළේය. තතො, ඉක්බිති; වාලගාම විහාර තිස්සතොයාව, සුළු වැසර විහාර තොට පටන්; භුත්තක තිත්ථන්තරෙ, බත් බුන්නා තොට දක්වා; දියොජන මත්තෙ උදකං, යොදුන් දෙකක් පමණ ජලය; පරිවත්තිත්වා, වෙනස්ව; සුගන්ධ සප්පි අහොසි, සුවඳ ගිතෙල් විය. භික්ඛු, භික්‍ෂූහු; යාවදත්ථං, හැකිතාක්; පරිභුඤ්ජිංසු, වැළඳූහ. භාසතීච, කියන ලදී.

18. පරිත්ත, ස්වල්ප වූ; සත මත්තස්ස, ගිතෙල් මාත්‍රයක්හුගේ; දනෙන, දීමෙන්; ඵලං, විපාකය; ඊදිසං, මෙබඳුය. යො, යමෙක්; බහු භෙසජ්ජං, බොහෝ බෙහෙත්; දෙති, දෙයි ද; තස්ස, ඒ දනයාගේ; ඵලං, විපාකය; කො, කවරෙක්; භාසති, කියයි ද;

19. තතො, ඉක්බිති; ගඞ්ගායං, ගංගාවේ; උභතො පස්සෙ, දෙපසෙහි; ගාමවාසිනො, ගම් වැසියෝ; තං සුත්වා, ඒ අසා; සට කොලම්බාදයො, කළ කොතල ආදිය; පූරෙත්වා, පුරවා; සක සක ගෙහෙ, තම තම ගෙවල්හි; සන්නිධිං අකංසු, එක් රැස් කළහ.

20. එකස්ස භික්ඛුස්ස අපි, එකම භික්ෂුවකට; එක වාරං, එකම වරක්; දින්නස්ස, දෙන ලද; දනස්ස, දනයාගේ; ඵලං, විපාකය; ඉදං ඉති, මෙසේ යයි; මන්ත්වා, දැන; භවන්තා, පින්වත්ති! දෙය්‍යධම්මෙ, දිය යුතු දන වස්තුවක්; සති, ඇති කල්හි; විවෙය්‍ය, සිල්වතුන් සොයා; සද්ධාය, ශ්‍රද්ධාවෙන්; දනං, දනය; දදථ, දෙව්.

**තම්බ සුමනත්ථෙරස්ස වත්ථුං, තම්බ සුමන තෙරුන්ගේ කථාව; දුතියං, දෙවැන්නයි.**

## 3. පූර්‍ව පර්‍වතවැසි තිස්ස තෙරුන්ගේ කථාව.

**(6) 3. පුබ්බ පබ්බතවාසීතිස්ස තෙරස්ස වත්ථුම්හි, පූර්‍ව පර්‍වතවාසී තිස්ස තෙරුන්ගේ වස්තුවෙහි; අයං, මේ; ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. අම්හාකං, අපගේ; භගවතො, ගෞතම භාග්‍යවතුන් වහන්සේට; පුබ්බෙ, පෙර; ලොකං, ලෝ වැස්සන්; ධම්මාමත රස පානෙන, ධර්මාමෘත රස පානයෙන්; නිබ්බාන මහා නගරෙ, නිවන් මහා නගරය; පරිපූරයන්තො, පුරවමින්; කස්සපො නාම, කාශ්‍යප නම්; භගවා, භාග්‍යවතුන් වහන්සේ; ලොකෙ, ලෝකයෙහි; උදපාදි, පහළ විය.

තදා, එකල්හි: එකො ජානපදිකො, එක් දනව් වැසියෙක්: වාණිජ කම්මෙන, වෙළඳමෙන්: ජීවමානො, ජීවත් වෙමින්: පටිවසති, වාසය කරයි. අථ, ඉක්බිති: අපර භාගෙ, පසු කාලයෙක්හි: සො, හෙතෙම: මනොසිලා චුණ්ණං, හිරියල් සුණු: වික්කිණන්තො, විකුණමින්: ගාම නිගම ජනපදෙසු, ගම් නියම් ගම් ජනපදයන්හි: විචරති, හැසිරෙයි.

තදා, එකල්හි: එකස්මිං ගාමෙ, එක් ගමෙක්හි: යොබ්බනිත්ථිං, යොවුන් ස්ත්‍රියක්: තං, ඔහු: දිස්වා, දැක: පක්කොසාපෙත්වා, කැඳවා: මූලෙන, මුදලින්: මනොසිලා චුණ්ණං, හිරියල් සුණු: ගණ්හි, ගත්තේය. තතො, ඉක්බිති: වාණිජෙන, වෙළෙන්ද විසින්: අම්ම, මැණියෙනි, ජාතො අම්හි ඉති, බඩගිනි ඇත්තෙමි යි: වුත්තෙ, කී කල්හි: සා, ඕ තොමෝ: තස්ස, ඔහුට: මයුර මංස රසෙන ච, මොනර මස් රසයෙන්: සුගන්ධ සප්පිනා සද්ධිං, සුවඳ ගිතෙල් සමග: සාලි භත්තං, ඇල්හාලේ බත්: වඩ්ඩෙසි, පිළිගැන්වීය.

තස්මිං ඛණෙ, එකෙණෙහි: එකො සුනඛො, එක් බල්ලෙක්: පවෙධමාන ගත්තො, වෙව්ලන ශරීර ඇත්තේ: ඛුධාභිභූතො, බඩසයින් යුක්ත වූයේ: පරිගිලන්ත බෙලා, කෙළ ගිලිමින්: තස්ස, ඔහුගේ: අභිමුඛං, ඉදිරියට: ආගඤ්ඡි, ආයේය. අථ, ඉක්බිති: සො, හෙතෙම: තං දුක්ඛිතං, ඒ දුක් ස්වභාවය: දිස්වා, දැක: කරුණාය, කරුණාවෙන්: කම්පමාන හදයො, කම්පා වූ සිත් ඇත්තේ: මයුර මංස රසෙන ච, මොනර මස් රසයෙන් හා: තෙලෙන ච, තෙලෙන් ද: මිස්සෙත්වා, මිශ්‍ර කොට: මහන්තං භත්ත පිණ්ඩං, මහත් බත් පිඩක්: අදාසි, දුන්නේය. සො, ඒ බල්ලා: භත්තං, බත්: භුත්වා, කා: සොමනස්සො, සතුටු වූයේ: නඞ්ගුට්ඨං, වලිගය: චාලෙන්තො, සොලවමින්: තස්ස, ඔහුගේ: අභිමුඛෙ, ඉදිරියෙහි: අට්ඨාසි, සිටියේය. වාණිජොපි, වෙළෙන්ද ද: තං දිස්වා, ඒ දැක: සන්තුට්ඨො, සතුටු වූයේ: එවං, මෙසේ: පත්ථනා, ප්‍රාර්ථනාවක්: ඨපෙසි, තැබීය.

2. අනෙන පුඤ්ඤෙන, මේ පින්කම කරණකොට ගෙන: අහං, මම: භවෙ භවෙ, භවයක් භවයක් පාසා: සතෙන මිස්සං, සුවඳ ගිතෙලින් මිශ්‍ර වූ: මයුරමංසෙන, මොනර මසින් යුක්ත වූ: අග්ගං, අග්‍ර වූ: සුචි, පවිත්‍ර වූ: සාලි භත්තං, ඇල් හාලේ බත්: ලභෙය්‍ය, ලබම්වා: අනෙනතු, කෙළවර වනාහි: නිබ්බාන පුරං, නිර්වාණ පුරය: භජෙය්‍යං, භජනය කරම්වා!

3. සො පන වාණිජො, ඒ වෙළෙන්ද: එත්තකං පුඤ්ඤකම්මං කත්වා, මෙපමණ පින්කමක් කොට: ජීවිත පරියොසානෙ, ජීවිතයෙහි කෙළවර: දෙව ලොකෙ, දෙව් ලොව: නිබ්බත්තිත්වා, ඉපිද: බුද්ධන්තරං, බුද්ධාන්තරයක්: මහන්තං දිබ්බසම්පත්තිං, මහා දිව්‍ය සම්පත්: අනුභවිත්වා, අනුභව කොට: තතො චුතො, එයින් චුත වූයේ: මනුස්ස ලොකෙ, මිනිස් ලොව: පඤ්ච ජාති සතං, ජාති පන්සියයක්: නිබ්බත්තිත්වා, ඉපිද: මයුර මංසෙන, මොනර මස්: සප්පිනා සද්ධිං, ගිතෙල් සමග: සාලි භත්තං එව, ඇල් හාලේ බත්ම: ලභි, ලැබීය. තතො, එයින් චුතව: ඉමස්මිං බුද්ධුප්පාදෙ, මේ

බුද්ධොත්පාද කාලයෙහි: භගවති පරිනිබ්බුතෙ, බුදුන් පිරිනිවා කල්හි: සීහල දීපෙ, සිංහල දීපයෙහි: ගංගාතීරෙ, මහවැලි ගං ඉවුරෙහි: පූචගල්ල ගාමෙ, පූගල්ලු නම් ගමෙහි: අඤ්ඤතරස්මිං කුලෙ, එක්තරා කුල ගෙයක: පටිසන්ධිං ගහෙත්වා, පිළිසඳ ගෙන: අනුක්කමෙන, පිළිවෙලින්: ගබ්භ පරිපාක මන්වාය, ගැබ මෝරා: මාතු කුච්ඡිතො, මවු කුසින්: නික්ඛමි, නික්මියේය. තස්ස, ඔහුට: මාතාපිතරො, මවුපියෝ: තිස්සො ඉති, තිස්ස යයි: නාමං අකංසු, නම් කළහ. සො, හෙතෙම: වයප්පත්තො, වැඩිවියට පැමිණියේ: ඝරාවාසෙ, ගිහිගෙයි: ආදීනව, ආදීනව ද: පබ්බජ්ජාය, පැවිද්දෙහි: ආනිසංසංච, ආනිසංස ද: සුත්වා, අසා: සබ්බං විභව ජාතං පහාය, සියළු සම්පත් අත්හැර: පූචගල්ල විහාරං, පූගල්ලු විහාරයට: උපසංකමිත්වා, එළඹ: පබ්බජ්ජං, පැවිද්ද: යාචි, ඉල්ලීය. භික්ඛු, භික්ෂූහු: තං, ඔහු: පබ්බාජෙත්වා, පැවිදි කොට: උපසම්පාදෙසුං, උපසම්පද කළහ. සො, හෙතෙම: නචිරෙන කාලෙන, නොබෝ කලකින්ම, ඝටෙන්තො, උත්සාහ කරන්නේ: වායමන්තො, වෑයම් කරන්නේ: අග්ගඵලං, අග්‍ර ඵලය වූ: අරහත්තං, රහත් බවට: පාපුණි, පැමිණියේ: පුඤ්ඤවා, පින්වතෙක්: පඤ්ඤවා, නැණවතෙක්: අහොසි විය. පරියත්ති ආගමො, ත්‍රිපිටක ධර්මය උගත්: තිස්සත්ථෙරො ඉති. තිස්ස තෙරණුවෝ යයි: සකල සීහලෙ, මුළු සිංහල රටෙහි: පාකටො අහොසි, ප්‍රසිද්ධ විය. තස්ස පන ථෙරස්ස, ඒ තෙරුන්ගේ: පත්තං,පාත්‍රය: යො කොචි, යම් කිසි: අඩ්ඪො වා, ඉසුරුමත් කෙනෙක් හෝ: ගණ්හාති, ගනී ද: දලිද්දෙ වා, දිළින්දෙක් හෝ: ගණ්හාති, ගනීද: සො පන, හෙතෙම වනාහි: අස්ස, උන්වහන්සේට: කාමං, කැමැති පරිදි: මයූර මංස රසෙන ච, මොනර මසින් ද: සුගන්ධ සප්පිනා සද්ධිං, සුවඳ ගිතෙල් සමග: සාලි භත්තෙන, ඇල් හාලේ බතින්: පූරෙත්වා ච, පුරවාම: දෙති, දෙයි. ඉමිනා නියාමෙන, මේ ක්‍රමයෙන්: අස්ස, උන්වහන්සේට: සට්ඨි සංවච්ඡරානි, අවුරුදු හැටක්: අතික්කමිංසු, ඉක්ම ගියහ.

4. අථ, ඉක්බිති: අපරභාගෙ, මෑත කාලයෙහි: එකො අමච්ච පුත්තො, එක් ඇමති පුතෙක්: එවං, මෙසේ: චින්තෙ, සිතීය, ඉමස්සා කිර ථෙරස්ස, මේ තෙරුන් වහන්සේට: නිබද්ධං, නිතොර: මයූර මංස රසෙනච, මොනර මස් ද: සුගන්ධ සප්පිනා සද්ධිං, සුවඳ ගිතෙල් සමග: සාලි භත්තං එව, ඇල් හාලේ බත්ම: උප්පජ්ජතී'ති, උපදී යයි: අනෙකා, බොහෝ දෙනා: කථයන්ති, කියත්. මයා, මා විසින්: ඉමං කාරණං පන, මේ කරුණ වනාහි, උප පරික්ඛිතුං, පරීක්‍ෂා කිරීමට: වට්ටති ඉති, වටී යයි: එවංච පන චින්තෙත්වා, මෙසේ ද සිතා: ගෙහං ගන්ත්වා, ගෙදරට ගොස්: රත්තිභාගෙ, රාත්‍රියෙහි: භරියාය, භාර්‍ය්‍යාවට: එවං, මෙසේ: ආහ, කීය. භද්දෙ, සොඳුර! පූච පබ්බත විහාරවාසී, පූගල්ලු විහාරයෙහි වැසි: තිස්සත්ථෙරස්ස, තිස්ස තෙරුන්ට: අජ්ජ, අද: අහං, මම: දනං, දනක්: දතුකාමො, දෙනු කැමැත්තෙමි. ථෙරස්ස, තෙරුන්ට: ඉධ ආගත කාලෙ, මෙහි පැමිණි කල්හි: මිස්සක තණ්ඩුලෙන, නිවුඩු සාලෙන්: කුණ්ඩ යාගුං, කුඩු මුසු කැඳ: පචිත්වා, පිස: භොජෙත්වා, වළඳවා: උපකට්ඨාය වෙලාය,

වේලාව සමීප වූ කල්හි: පණ්ණ සූපෙන, පලා ව්‍යඤ්ජනයකින් ද: බිලඞ්ග දුතියෙන, කාඩි ඇඹුල් දෙවැනි කොට ඇති: මිස්සක භත්තං එව, නිවුඩු හාල් බත්ම: දෙහි ඉති, දෙන්නැයි: වත්වා, කියා: පභාතාය රත්තියා, රැය පහන් වූ කල්හි: සයං, තෙමේම: විහාරං, විහාරයට: ගන්ත්වා, ගොස්: ථෙරං, තෙරුන්: වන්දිත්වා, වැඳ: භන්තෙ, ස්වාමිනී! අජ්ජ, අද: අම්හාකං, අපට: අනුග්ගහං කරොථ ඉති, අනුග්‍රහ කරන්නැයි: නිමන්තෙත්වා, ආරාධනා කොට: සයං, තෙමේ: අඤ්ඤත්ථ, අන් තැනෙක: අගමාසි, ගියේය. අථ, ඉක්බිති: අස්ස, ඔහුගේ: ගෙහෙ, ගෙදර: අධිවත්ථ දෙවතා, අධිගෘහිත දෙවියා: රත්ති භාගෙ, රාත්‍රි කාලයෙහි: භරියාය සද්ධිං භාර්‍යාව සමග: මන්තෙන්තස්ස, සාකච්ඡා කරන: තං වචනං සුත්වා, ඒ වචනය අසා: ඉමිනා ථෙරෙන, මේ තෙරුන් විසින්: පුබ්බෙ, පෙර: කතං, කරන ලද: පුඤ්ඤකම්ම විපාකස්ස, පුණ්‍ය කර්‍ම විපාකය: කෙනචි, කිසිවකු විසින්: අනිවත්තිය භාවං, නො වැලැක්විය හැකි බව: අයං, මෙතෙම: නූන, ඒකාන්තයෙන්: න ජානාති ඉති, නො දනී යයි: චින්තෙත්වා, සීතා: තස්ස ගෙහෙ, ඒ ගෙයි: මහල්ලක පුරිසො විය. මහලු මිනිසෙකු මෙන්: සාලි තණ්ඩුලං එව ච, ඇල් සහල් ද: මයූර මංසං ච, මොනර මස් ද: සත කුම්භං ච, ගිතෙල් කලයක් ද: ගහෙත්වා, ගෙන: ගෙහං, ගෙට: ආගම්ම, අවුත්: තස්ස භරියාය, ඔහුගේ භාර්‍යාවට: අදසි, දුන්නේය. තාය, ඈ විසින්: කුතො, කොහෙන්: අයං ආනීතං ඉති, මේවා ගෙන එන ලද්දේ දැයි: වුත්තෙ, විචාල කල්හී: දෙවතා, දෙවතාවා: එවං, මෙසේ: ආහ, කීය. අම්ම, මැණියෙනි! අමච්ච පුත්තො, අමාත්‍ය පුත්‍ර තෙම: මං දිස්වා, මං දැක: හො, පින්වත! මයා, මා විසින්: අජ්ජ, අද: පුව්පබ්බතවාසී තිස්සත්ථෙරෙ, පුව පර්‍වත වැසි තිස්ස තෙරුන් වහන්සේට: නිමන්තිතො, දැනට ආරාධනා කරන ලදි. ත්වං, තෝ: ඉමං, උපකරණං, මේ උපකරණ: ගහෙත්වා, ගෙන: ගෙහං ගන්ත්වා, ගෙට ගොස්: ඝරණිං, ගෘහණියට: දත්වා, දී: එවං, මෙසේ: වදෙය්‍යාසි, කියව: ඉමිනා, මෙයින්: භත්තං සම්පාදෙත්වා, බත් සම්පාදනය කොට: සව්‍යඤ්ජනං, ව්‍යඤ්ජන සහිතව: ථෙරං, තෙරුන් වහන්සේ: භොජෙතු, වළඳවන්ට: වදෙය්‍යාසි ඉති, කියවයි: මං, මට: අවො ච ඉති, කීවේ යයි: වත්වා, කියා: අන්තරධායි, අතුරුදහන් විය.

5. සා පි, ඕ තොමෝ ද: තස්ස, ඔහුගේ: කථං, කථාව: සුත්වා, අසා: සමංස භත්තං, මස් සහිත බත්: සම්පාදෙත්වා, පිළියෙල කොට: ථෙරස්ස, තෙරුන් වහන්සේ: ආගත කාලෙ, පැමිණි කල්හි: පත්තං ගහෙත්වා, පාත්‍රය ගෙන: නිසීදපෙත්වා, වැඩ හිඳුවා: සව්‍යඤ්ජනෙන භත්තෙන, ව්‍යාඤ්ජන සහිත බත්: පරිවිසි, වැළඳ විය.

ථෙරො, තෙරුන් වහන්සේ: කත භත්ත කිච්චො, කරන ලද බත් කිස ඇත්තේ: විහාරං එව, විහාරයට ම: අගමාසි, ගියේය. තතො, ඉක්බිති: අමච්චො, ඇමතියා: ආගන්ත්වා, අවුත්: භරියං, භාර්‍යාවගෙන්: තයා, තී විසින්: ථෙරස්ස, තෙරුන් වහන්සේට: භත්තං, බත්: දින්නං ඉති,

දෙන ලද දැයි; ආහ, විචාළේය. සා පී, ඕ තොමෝ ද; තව, ඔබ විසින්; පෙසිතෙන උපකරණෙන, එවන ලද උපකරණ වලින්; භත්තං සම්පාදෙත්වා, බත් පිළියෙල කොට; ථෙරං, තෙරුන් වහන්සේ; පරිවිසිං ඉති, වැළඳවීමියි කීය. අමච්චා, අමාත්‍යයා; භද්දෙ, සොඳුර; මයා, මා විසින්; න එතං පෙසිතං, ඒ උපකරණයෙක් නො එවන ලදි. කෙන, කා විසින්; එතං, ඒ උපකරණ; ආනීතං ඉති, ගෙන එන ලද දැයි; පුච්ඡි, විචාළේය. තාය, ඇය විසින්; අඤ්ඤකෙන මහල්ලකෙන ඉති, අසවල් මහල්ලා විසිනැයි; වුත්තෙ, කී කල්හි; තම්පි, ඔහුද; පුච්ඡිත්වා, විචාරා; තෙන පි, ඔහු විසින් ද; මයා, මා විසින්; ඊදිසං, මෙවැන්නක්; න ආනීත පුබ්බං ඉති, ගෙනාවේ නැතැයි; වුත්තෙ, කී කල්හි; සො, හෙතෙම; ථෙරස්ස, තෙරුන්ගේ; ආනුභාවෙන, ආනුභාවයෙන්; එතං, මෙය; දෙවතානං, දෙවතාවන්ගේ; කම්මං ඉති, වැඩක් යයි; ඤත්වා, දැන; කත පුඤ්ඤස්ස, කළ පින් ඇත්තහුගේ; කුසල විපාකං, කුසල විපාකය; නිවාරෙතුං, වලක්වන්නට; න සක්කා ඉති, නො හැකි යයි; වත්වා, කියා; බුද්ධ සාසනෙ, බුදු සසුන්හි; පසන්නො, පැහැදුනේ; දනපති, දනපතියෙක්; අහොසි විය. තතො අපර භාගෙ, ඊට මෑත භාගයෙහි; ථෙරො, තෙරුන් වහන්සේ; පරිනිබ්බාන මඤ්චෙ, පිරිනිවන් මඤ්චකයෙහි; නිපන්නො, වැදහොත්තේ; විහාරෙ, විහාරයෙහි; භෙරිං, බෙර; චරාපෙත්වා, හසුරුවා; භික්ඛූ, භික්ෂූන්; සන්නිපාතෙත්වා, රැස් කරවා; අත්තනො, තමන්; පරිනිබ්බාන භාවං, පිරිනිවන්පාන බව; පකාසෙසි. ප්‍රකාශ කෙළේය. තතො, ඉක්බිති; භික්ඛූ, භික්ෂූහු; තුම්හෙ, තුඹ වහන්සේ; මහා පුඤ්ඤාසි, මහා පිනැත්තේ වෙහි; තුම්හාකං, ඔබ වහන්සේ ගේ; පුඤ්ඤවන්තතං, පින්වත් බව; සකල ලඞ්කායං, මුළු ලඞ්කාවෙහි; පාකටං ජාතං, ප්‍රකට විය. අතීතෙ, අතීතයෙහි; කිස්ස කම්මස්ස, කවර කර්මයක; නිස්සන්දෙන, විපාකයකින්; අයං විපාකො ඉති, මේ විපාකය වීදැයි; තෙ, ඕවුහු; පුච්ඡිංසු, විචාළහ. තං සුත්වා, ඒ අසා; ථෙරො, තෙරුන්වහන්සේ; අත්තනා, තමා විසින්; අතීතෙ, අතීතයෙහි; කත කම්මං, කරන ලද කර්‍මය; පකාසෙන්තො, ප්‍රකාශ කරමින්; එවං, මෙසේ; ආහ, කීය.

6. ඉමස්මිං භද්දකෙ කප්පෙ, මේ මහා භද්‍ර කල්පයෙහි; ලොක නයනො, ලෝකයාට ඇසක් වැනි වූ; සබ්බ සත්ත, සියළු සත්වයන්ගේ; හිතෙරතො, හිත සැපතෙහි ඇළුනා වූ; කස්සපො නාම, කාශ්‍යප නම් වූ; නායකො, බුදුරජ තෙම; උප්පජ්ජි, උපන්නේය.

7. තදා, එකල්හි; අහං, මම; මනොසිලා වික්කයිකො, රන් හිරියල් සුණු විකුණන්නාවූ; වානිජො අහොසිං, වෙළෙන්දෙක් වීමි. තහිං, තහිං, ඒ ඒ තැන; ආහිණ්ඩන්තො, ඇවිදින්නේ; තෙන කම්මෙන, ඒ වෙළඳම් කර්‍මයෙන්; ජීවාමි, ජීවත් වෙමි.

8. අථ, ඉක්බිති; අහං, මම; එකදා, එක දවසක්; වණිජ්ජත්ථං, වෙළඳම පිණිස; ජනපදං, ජනපදයකට; අගමිං, ගියෙමි. තදා, එකල්හි;

තත්‍ථ, එහි: එකස්මිං කුලෙ, එක් කුලයක: ජාතා, උපන්නා වූ: කුල දරිකා, කුල දැරියක්: මං, මා: දිස්වා, දැක:-

9 මයා, මාගෙන්: භාණ්ඩං ගහෙත්වාන, බඩු ගෙන: ජාතජ්ඝත්තං, ක්ෂුධාවෙන් පිඩිත වූ: මං, මා: අද්දස, දුටුවාය. තතො, ඉක්බිත්තෙන්: සා, ඕ තොමෝ: මොරමංසෙන, මොනර මස් හා: ගන්ධකෙන සතෙනච, සුවඳ ගිතෙලින් යුක්ත වූ:-

10. සාලිභත්තං, ඇල්හාල් බත්: මෙ, මට: භුඤ්ජිතුං, අනුභව කරන්නට: කරුණාය: කරුණාවෙන්: උපඩ්ඪෙසි, එළවූවාය. තතො, ඉක්බිති: තද, එකල්හි: අහං. මම: බුභුක්ඛං, බඩගිනි වූ: භන්තං, භ්‍රාන්ත වූ: සුනඛං, බල්ලෙක්: දිස්වාන, දැක:-

11. සසතෙන, ගිතෙල් සහිත වූ: හත්ත පිණ්ඩෙන, බත් පිඩකින්: සන්තප්පෙත්වාන, සන්තර්පනය කොට: පත්‍ථයිං, ප්‍රාර්ථනාවක් කෙළෙමි. අයං, මම; තෙන පුඤ්ඤ කම්මෙන, ඒ කුශල කර්මයෙන්: දෙව සහව්‍යතං, දෙවියන් හා ඒකී භාවයට: ගතො, ගියේ වෙමි.

12. තත්‍ථ, එහි: රතනාමයෙ, රුවන්මය වූ: පාසාදෙ, ප්‍රසාදයෙහි: දෙවෙහි, දෙවියන් සමග: රමන්තො, සිත් අලවන්නේ: මධුරෙහි: මිහිරි වූ: නච්චෙහි, නෘත්‍යයෙන් ද: ගීතෙහි, ගීතයෙන් ද: වාදිතෙහි ච, වාද්‍යයෙන්ද: මොදිතො, සතුටු වූයේ වීමි.

13. දෙවච්ඡරා, දිව්‍යප්සරාවන් විසින්: පරිවුතො, පිරිවරන ලද්දේ: දෙවසෙනා, දිව්‍ය සේනාව විසින්: පුරක්ඛතො, වට කරන ලද්දේ: දීඝං අද්ධානං, බොහෝ කාලයක් මුළුල්ලෙහි: අබ්භුතං, අද්භූත වූ: දිබ්බ සම්පත්තිං, දිව්‍ය සම්පත්: භුත්වාන, අනුභව කොට:-

14. තතො චුතො, එයින් චුත වූයේ: මනුස්සෙසු, මනුෂ්‍ය ලොකයෙහි: අහං, මම; පඤ්ච ජාති සතෙ, පන්සියයක් ජාතියෙහි: මහද්ධනො, මහා ධනවතෙක් වීමි. මහාභොගො, මහත් භොග ඇත්තෙක් වීමි. විසාලො, විශාල වූයේ: ලොක සම්මතො, ලොක සම්මත වීමි

15. උදිතෙ කුලෙ, උතුම් කුලයෙහි; ජාතො, උපන්නා වූ: අහං, මම: ඤාති සඞ්ඝෙහි, ඤාති සමූහයා විසින්: පූජිතො, පුදන ලද්දෙක් විමි. මම, මාගේ: කම්මානුච්ඡවියං, කර්මයට සුදුසු වූ පරිද්දෙන්: සම්පත්තිං, සම්පත්: අනුභුඤ්ජාමි, අනුභව කෙරෙමි.

16. පඤ්චජාති සතෙ, පන්සියයක් ජාතියෙහි: භොජනං, ආහාරය: සහ සබ්බ මොර මංසෙන, ගිතෙල් සමග මොනර මසින් යුක්ත වූ: සාලි තණ්ඩුලකොදනං, ඇල් සාලේ බත්ම; නිච්චං, නිරතුරු; මම, මට; ලභෙති, ලැබීම වීය.

17. ඉදනි, දැන්: මෙ, මාගේ: චරිමෙ භාවෙ, අන්තිම ආත්ම භාවයෙහි: තාදිසං භොජනං, එබඳු භොජනය: සද, හැම කල්හි: ලභාමි,

ලබමි. මම, මාගේ; එක පිණ්ඩස්ස, එක පිණ්ඩයාගේ; ඵලං, විපාකය; හො, පින්වත්නි; පස්සථ, බලව්.

18. පුඤ්ඤවතො, පිනැත්තහුගේ; පුඤ්ඤඵලං, කුශල විපාකය; මාරොපි, මාරතෙමේ ද; පටිසෙධිතුං, වලක්වන්ට; න සක්කොති, නොහැක්කේය. ඉධ ලොකස්මිං, මේ ලොකයෙහි; අඤ්ඤාකො, අන් කවරෙක් තෙම; තං, ඒ කුශල විපාකය; නිසෙධයෙ, වලක් වන්නේ ද?

19. හො, පින්වත්නි! යො, යමෙක්; තිරච්ඡාන ගතස්සා'පි තිරිසන්ගතයක් හට ද; දනං, දනය; පදස්සති, ප්‍රදනය කරන්නේද; සො, හෙතෙම; මං ව, මා සේම; සබ්බෙසු, සියළු භවයන්හි; තිසම්පදං, ත්‍රිවිධ සම්පත්තිය; විඳතෙ, විඳින්නේය.

20. එවං, මෙසේ; සො, උන්වහන්සේ; භික්ඛු සඞ්ඝ මජ්ඣෙ, භික්ෂු සඞ්ඝයා මැද; අත්තනා, තමා විසින්; කත කම්මං, කරන ලද කුශල කර්මය; පකාසෙත්වා, ප්‍රකාශ කොට; ඔවදිත්වා, අවවාද කොට; පරිනිබ්බායි, පිරිනිවන් පෑයේය.

ථෙරස්ස, තෙරුන් වහන්සේගේ; වචනං සුත්වා, වචනය අසා; මහාජනා, මහජනයා; දනාදීනි පුඤ්ඤානි කත්වා, දනාදී පින්කම් කොට; මත මතා, මළ මළහු; යෙභුයෙයන, බොහෝ සෙයින්; දෙවලොකෙ, දිව්‍ය ලොකයෙහි; නිබ්බත්තිංසු, උපන්නාහ.

21. එවං, මෙසේ; අප්පෙව දන විධිනාපි, ස්වල්ප දන විධියෙන් පවා; ජනො පන, ජන තෙම වනාහි; අචෙඡරමබ්භුතතරං, ඉතා ආශ්චර්‍ය්‍ය අද්භූත වූ; විපාකං, විපාකය; ලභතෙ, ලබයි. දනපතිනොපි, දනපතීවද; සුචිරම්පි, බොහෝ කාලයක් මුළුල්ලෙහිම; බහුප්පදස්ස, බොහෝ කොට දුන්නා වූ; දනස්ස, දනයාගේ; ඵලං, විපාකය; අබුද්ධො, බුදු නොවූ; කොවා, කවරෙක් නම්; වදෙය්‍ය, කියන්නේද;

**පූව පබ්බතවාසී, පූව පර්වත වැසි, තිස්සත්ථෙරස්ස, තිස්ස තෙරුන්ගේ, වත්ථුං, කථාව; තතියං, තෙවැන්නයි.**

## 4. චූලතිස්ස කථාව.

**(6) 4. චූලතිස්ස වත්ථුම්හි, චූලතිස්ස වස්තුවෙහි; අයං, මේ; ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. එකස්මිං කිර සමයෙ, එක් කාලයෙක්හි; ලඞ්කාය, ලඞ්කාවෙහි; දුට්ඨගාමිණී අභයො නාම රාජා, දුටුගැමුණු අභය නම් රජතුමා; රජ්ජං කාරෙසි, රාජ්‍යය කරවීය. තද, එකල්හි; තස්ස, ඒ රජතුමාට; තිස්සොනාම, තිස්ස නම් වූ; එකො චූලුපට්ඨාකො, එක් පුළු සේවකයෙක්; අබ්භන්තරියකො

හුත්වා, අභ්‍යන්තරව සිට: රාජ කම්මං, රාජ්‍ය කටයුතු: කරොති, කරයි. තද, එකල්හි: රඤ්ඤො, රජුගේ: කණ්ඩුලො නාම, කණ්ඩුල නම්: වාරණො, ඇතා: නිගලංච, පාබැඳි දම්වැල් ද: ආලානං ච, කණුව ද: භින්දිත්වා, බිඳ: පාචීන පක්ඛං ගන්ත්වා, නැගෙනහිර දිශාවට ගොස්: වනං පවිසිත්වා, කැලයට වැදී: සලලකි වල පත්තාදයො, සල් ඇසතු බෝගස් කොළ ආදිය: ජින්දිත්වා, සිඳ: භින්දිත්වා, බිඳ: ඛාදෙන්තො, කමින්: අනුක්කමෙන, ක්‍රමයෙන්: මහානිජ්ඣර විහාරං, මහ නදුරු නම් විහාරයට: ගන්ත්වා, ගොස්: තෙසු තෙසු ඨානෙසු, ඒ ඒ තන්හි: රුක්ඛමූලික සුඤ්ඤාගාරිකාදයො, රුක් මුල්, ශුන්‍යාගාර ආදී වූ තැන්වල: යුත්ත යොගෙ, ධ්‍යාන භාවනාවෙහි යෙදුනු: ඣානඞ්ගධරෙ, ධ්‍යානාඞ්ගධර: භික්ඛු, භික්ෂූන්: දිස්වා, දැක: පසන්නමානසො, පහන් සිත් ඇත්තේ: තෙසං, උන්වහන්සේලාට: ඵලාපලාදයො, පලාපල ආදිය: ආහරිත්වා, ගෙනවුත්: උපට්ඨානං කරොන්තො, උපස්ථාන කරන්නේ: තත්‍ථ එව, එහිම: විහාසි, වාසය කෙළේය. රාජා පන, රජතුමා වනාහි: තං හත්‍ථිනං, ඒ ඇතා: ගතට්ඨානං, ගිය තැන්: උප පරික්ඛාපෙන්තො, පරීක්ෂා කරවන්නේ: අදිස්වා, නොදැක: චත්තාරො අමච්චෙ, අමාත්‍යයන් සතර දෙනෙක්: චතුද්දිසං, සතර දිශාවට: පෙසෙන්තො, යවන්නේ: චූලූ පට්ඨාක තිස්ස අමච්චං, සුළු සේවක තිස්ස අමාත්‍යයා: පාචීන පක්ඛං, නැගෙනහිර දිශාවට: පෙසෙසි, යැවී. සෙස දිසාසු ගතා, සෙසු දිශාවන්හි ගියාහු: හත්‍ථිං, ඇතා: න පස්සිංසු, නො දැක්කාහුය. සො පන එසො අමච්චො, ඒ මේ ඇමැතියා වනාහි: ගාම නිගම පරම්පරාය, ගම් නියම් ගම් පිළිවෙළින්: විචරන්තො, හැසිරෙන්නේ: අනුක්කමෙන, ක්‍රමයෙන්: තං එව විහාරං, ඒ විහාරයටම: සම්පාපුණි, පැමිණියේය. සො පන, හෙතෙම වනාහි: යං විහාරං, යම් විහාරයකට: සම්පාපුණි, පැමිණියේද: තස්මිං, විහාරෙ, එම විහාරයෙහි:-

2. සුභෙ, යහපත් වූ: යත්‍ථ විහාරො පවනෙ, යම් විහාරයකට සමීප වනයෙහි රුක්ඛමූලී, රුක්ඛමූලිකාඞ්ග රක්නා වූ: තහිං තහිං රුක්ඛමූලෙ, ඒ ඒ ගස් මුල්හි: නිසින්නා, වැඩ හුන්නාහු: භාවනං, භාවනාව: භාවෙන්ති, වඩත්.

3. අබ්භොකාසික භික්ඛවො, අබ්භොකාසිකාඞ්ගය රක්නා භික්ෂූහු: විහාරස්මිං, විහාරයෙහි: තස්මිං තස්මිං, ඒ ඒ තන්හි: සුඤ්ඤාගාරෙ, ශුන්‍යාගාරයෙහි: (වැඩ හිඳ) සුභං, යහපත් වූ: භාවනං, භාවනාව: ගහෙත්වා, ගෙන: අභිරමන්ති, සිත් අලවා වෙසෙත්.

4. පාංශුකූලිකා, පාංශුකූලිකාඞ්ගය රක්නා භික්ෂූන් වහන්සේලා: මණිවම්මෙන, මාණික්‍ය සන්නාහයෙන්: වම්මිතා, සැරසුනාවූ: එක වාරිකහත්‍ථී ඉව, එක වාරික ගජ හස්ති රාජයන් සේ: කසිණාදයො: නීලපීතාදි කිසුණු භාවනාවන්: විභාවෙන්තා, වඩන්නාහු: රමන්තිං සිත් අලවා වෙසෙත්.

5. යත්‍ථ, යම් විහාරයෙක් හි: සොසානිකා භික්‍ඛූ සොසානිකාඞ්ගය රක්නා භික්‍ෂූන්වහන්සේලා: සුසානෙ, සොහොනෙහි: අභිරමන්‍ති, සිත් අලවා වෙසෙත්: බුද්‍ධපුත්‍තා, බුද්‍ධ පුත්‍රවූ: මහානාගා, මහා ශ්‍රෙෂ්ඨ වූ: තෙ, උන්වහන්සේ: නිච්චං, නිතර: මරණසඤ්ඤිනො, මරණානුස්මෘති භාවනා ඇත්තාහුය.

6. යත්‍ථ, යම් විහාරයෙක්හි: සම්බුද්‍ධ සාවකා, සර්‍වඥ පුත්‍රයෝ: පිණ්‍ඩපාතිකා, පිණ්‍ඩපාතිකාඞ්ගය රක්නා වූ: මෙත්‍තා, මෛත්‍රිය: කරුණා, කරුණාව: මුදිතා, මොලොක් බව: භාවෙන්‍තා, වඩන්නාහු: තෙ, උන්වහන්සේලා: විහාරස්මිං, විහාරයෙහි: රමන්‍ති, සිත් අලවා වාසය කෙරෙත්.

7. යහිං, යම් විහාරයෙක් හි: නෙසජ්ජිකා, නෙසජ්ජිකාඞ්ගධාරීවූද: එකාසනිකා, එකාසනිකාඞ්ගධාරී වූ ද භික්‍ෂූන් වහන්සේලා: තහිං තහිං, ඒ ඒ තන්හි: නිසීදිත්‍වා, වැඩහිඳ: නිච්චං, නිරන්‍තරයෙන්: බුද්‍ධානුස්සති ආදිකං, බුද්‍ධානුස්මෘති ආදිය: විභාවෙන්‍ති, මෙනෙහි කරත්.

8. සීලවන්‍තා, සිල්වත් වූ: ගුණවන්‍තා, ගුණවත් වූ: බුද්‍ධසාසන කාරකා, බුද්‍ධශාසන මාමක වූ භික්‍ෂූහු: යහං, යම් විහාරයෙක් හි: නිවසන්‍ති, වෙසෙත් ද: තත්‍ථ, එතන්හි: චූලතිස්සකො, චූල තිස්ස ඇමැතිතෙමේ: සම්පත්‍තො, පැමිණියේය.

9. සො පන අමච්චො, ඒ අමාත්‍යතෙමේ: විහාරං ගන්‍ත්‍වා, විහාරයට ගොස්: භික්‍ඛු සඞ්ඝං වන්‍දිත්‍වා, භික්‍ෂු සඞ්ඝයා වැඳ: එකමන්‍තං, එකත් පසෙක: අට්ඨාසි, සිටියේය. තතො, ඉක්බිති: කණ්‍ඩුලො නාම වාරණරාජා, කණ්ඩුල නම් ඇත් රජා: තද, එකල්හි: පූපක්‍කං, මනාව පැසුණු: කාර ඵල සහිතං, කර ගෙඩි සහිත: කාර සාඛං, කර අත්තක්: භින්‍දිත්‍වා, කඩා: භික්‍ඛූනං, භික්‍ෂූන් වහන්සේලාට: පතිගණ්හාපෙසි, පිළිගැන්විය. අමච්චො, ඇමැතියා: තං දිස්‍වා, එය දැක: එවරූපා කිර, මෙබඳු වූ: කක්ඛළා, කැකුළු: ඵරුෂා, ඵරුෂ: මනුස්සමාරකා, මිනිසුන් මරණ: තිරච්ඡානා'පි, තිරිසන්නු ද: ගුණවන්‍තානං, ගුණවන්‍තයන්ගේ: ගුණෙ, ගුණයෙහි: පසන්‍නා, පැහැදුනාහු: වෙය්‍යාවච්චං, වතාවත්: කරොන්‍ති, කරත්. ඉමෙ ච පන භික්‍ඛූ, මේ භික්‍ෂූහු ද: නා නා වත්‍තෙහි, නොයෙක් ව්‍රතයන් කරණකොටගෙන: සමණ කිච්චං, මහණකම: මත්‍ථකං පාපෙත්‍වා, මුදුන් පමුණුවා: පච්චයදායකානං ච, ප්‍රත්‍යදායකයන්ටද: අත්‍තනො ච, තමන්ට ද: පච්චයා හොන්‍ති, ප්‍රත්‍යය වෙත්. අහො, පුදුමයි. සම්මා සම්බුද්‍ධස්ස, සම්බුදුන් වහන්සේගේ: ගුණානුභාවො, ගුණානුභාවය: අචින්‍තනීයො ඉති, නොසිතිය හැකියයි: විම්හිතො අහොසි, පුදුම විය. තථාහි, ඒ එසේමැයි:-

10. අප්පිච්ඡ, අල්පෙච්ඡ වූ: සන්‍තුට්ඨ, ලද දෙයින් සතුටුවන්නා වූ: විවෙක කාමිනං, විවේකකාමී වූ: තපොධනානං, තපස්ධන කොට ඇති:

පරිසුද්ධසීලිනං, පිරිසිදු සිල්වතුන් වහන්සේලාගේ; පූතං, වත් පිළිවෙත්හි පවිත්‍ර වූ; මධුරං සභාව, උත්තම ස්වභාවය; දිස්වා, දැක; කස්ස, කවර නම් සත්වයෙකුගේ; චිත්තස්ස, සිතට; පීතිං, ප්‍රීතිය; න කරොති, නොකෙරේද.

11. තතො, ඉක්බිති; අමච්චො, ඇමැතියා; භික්ඛු සඞ්ඝං, භික්‍ෂු සඞ්ඝයා වහන්සේට; වන්දිත්වා, වැඳ; රඤ්ඤො, රජුගේ; සමීපං, සමීපයට; ගන්ත්වා, ගොස්; දෙව, දෙවයන් වහන්ස! තිස්ධර විහාරෙ, මහ කඳුරු විහාරයෙහි; භික්ඛූනං, භික්ෂූන් වහන්සේට; වෙය්‍යාවච්චං, වතාවත්; කරොන්තො, කරන්නා වූ; හත්ථිනාගෙ, කණ්ඩුල ඇතා; මයා, මා විසින්; දිට්ඨො ඉති, දක්නා ලදැයි; කථෙසි, කීය. තං සුත්වා, ඒ අසා; රාජා, රජතුමා; භණෙ, කොල; ත්වං එව, තාම; තං හත්ථිං, ඒ ඇතා; ගහෙත්වා, අල්වා ගෙන; ආගච්ඡ ඉති, එන්නැයි; නියොජෙසි, යෙදවීය. තතො, ඉක්බිති; සො, හෙතෙම; සාධු ඉති, මැනැවැයි; සම්පටිච්ඡිත්වා, පිළිගෙන; සඞ්ඝස්ස, සංඝයා වහන්සේට; බහු සක්ඛරානි, බොහෝ උක් සකුරු; ගාහාපෙත්වා, ගෙන්වාගෙන; විහාරං ගන්ත්වා, විහාරයට ගොස්; සූපක්කං, කාරපක්කං, මනාව ඉදුණු කරගෙඩි; ආහරාපෙත්වා, ගෙන්වා ගෙන; සක්ඛරාහි සද්ධිං, හකුරු සමග; මද්දිත්වා, මිරිකා; පානීයං කත්වා, පැන් කොට; භික්ඛූ, භික්ෂූන්; භොජෙත්වා, වළඳවා; පසන්න මානසො, පැහැදුණු සිත් ඇත්තේ; හත්ථිං ගහෙත්වා, ඇතා ගෙන; නගරං එව, නගරයටම, අගමාසි, ගියේය.

සො පන, හෙතෙම වනාභි, එත්තකං එව, මෙපමණම; පුඤ්ඤකම්මං කත්වා, පින්කමක් කොට; තතො චුතො, එයින් චුතව; ඉමස්මිං එව ලඞ්කාදීපෙ, මේ ලක්දිව ම; උත්තරපස්සෙ, උතුරෙහි; අම්බවිට්ඨි නාම ගාමෙ, අඹවිටි නම් ගමෙහි; එකස්මිං කුලගෙහෙ, එක් කුල ගෙයක් හි; නිබ්බත්ති, උපන්නේ ය. මාතා පිතරො, මව්පියෝ; අස්ස පන, ඔහුට වනාභි; තිස්සො, ඉති එව, තිස්ස යයි; නාම අකංසු, නම් කළහ. සො, හෙතෙම; වුද්ධිං අන්වාය, වැඩි වියට පැමිණ; පතිරූපිකාය කුමාරිකාය සද්ධිං, සුදුසු කුමාරිකාවක් සමග; සංවසන්තො, එක්ව වාසය කරන්නේ; න චිරෙන එව, නොබෝ කලකින්ම; ඝරාවාසෙ, ගිහිගෙහි; උක්කණ්ඨිතො, කළකිරුනේ; විහාරං ගන්ත්වා, විහාරයට ගොස්; භික්ඛූනං, භික්ෂූන් වහන්සේගේ; චිත්තං සමාරාධෙත්වා, සිත් සතුටුකොට; පබ්බජිත්වා, පැවිදිව; තිසෙසා ඉතී, තිස්ස තෙරුන් වහන්සේ යයි; පාකටො, ප්‍රකටව; පටියත්තිසාරො, ප්‍රතිපත්තිගරුකයෙක්ව; පටිවසති, වාසය කරයි. තතො, ඉක්බිති; සො, හෙතෙම; අපරභාගෙ, මෑත භාගයෙහි; ජයමහා බොධිං වන්දනත්ථාය, ජයමග බෝධිය වඳිනු පිණිස; ගච්ඡන්තෙහි, යන්නාවූ භික්ඛූහි ච උපාසක උපාසිකා ජනෙහි සද්ධිං, භික්ෂූන් වහන්සේ හා උපාසක උපාසිකාවන් සමග; නාවං, නැවට; අභිරුහි, නැංගේය. තතො, ඉක්බිති; තෙසං නාවාය ගච්ඡන්තානං, ඒ නැවෙන් යන්නවුන්ගේ; උදකං, ජලය; පරික්ඛයං, අගමාසි, නිමාවට ගියේය. තද, එකල්හි; සො

භික්ඛු, ඒ භික්ෂුව: පිපාසිතො, පවස ඇත්තේ: පානීයං, පැන්: පරියෙසිත්වා, සොයා: අලභන්තො, නොබලන්නේ: පිපාසං, පිපාසය: අධිවාසෙතුං, ඉවසන්ට: අසක්කොන්තො, නොහැක්කේ: පත්තං, පාත්‍රය: ඔතාරෙත්වා, බහා: සමුද්දෙදකං, මුහුදු ජලය, ගහෙත්වා, ගෙන: පාතුං, බොන්ට: ආරභි, පටන්ගත්තේය. තස්මිං එව ඛණෙ, එකෙණෙහිම: තං බාරොදකං, ඒ කරදිය: පරිවත්තෙත්වා, වෙනස් වී: තස්ස පුඤ්ඤානුභාවෙන: උන්වහන්සේගේ පුණ්‍යානුභාවයෙන්: මධුරරසං, මිහිරි රසැති: සක්ඛරොදකං, හකුරු පානක් මෙන්: අහොසි විය. එත්‍ථ, මෙහි: හොනතිව, කියන ලද මැයි:-

12. අප්පස්ස, ඤල්ප වූ: පුඤ්ඤකම්මස්ස, කුශල කර්‍මයාගේ: ආනුභාව මහන්තතා, ආනුභාව මහත්තත්වය: අහො, පුදුමයි: එතං, මෙය: අච්ඡරියං, ආශ්චර්‍ය්‍යයකි. අබ්භුතං, අද්භුතයකි. ලොමහංසනං, ලොමු දැහැගැන්ම කරන්නේය.

අතීතෙ , අතීතයෙහි, භික්ඛු සඞ්ඝස්ස, භික්ෂු සංඝයාට, සක්ඛරොදකං, හකුරු පැන් පමණක්, දත්වා, දන් දී, සො, හෙතෙම, පරිවත්තිතං , පරිවර්තනය වූ, මධුරං, ඉතා මිහිරි වූ, උදධිපානීයං, සමුද්‍ර ජලයක්, ලදෙධා, ලැබුයේය.

13. තතො, ඉක්බිති: සො භික්ඛු, ඒ භික්ෂුව, පානීයං, පැන්, පිවිත්වා, බි, නාවාය, නැවේ, සබ්බෙසං, සියළු දෙනාටද, අදසි, දුන්නේය. තං, එය, රසවන්තං රසවත්, ඔජවන්තං, ඕජවත්, අක්ඛයං, ක්‍ෂය නොවන, දිබ්බපානීය සදිසං, දිව්‍ය පානයක් සේ, අහොසි, විය. සබ්බෙ හි බො තෙ මහජනා, ඒ සියළුම මහජනයා, මහාබොධිං, මහ බෝ, වන්දිතුං, වැඳුමට, ගමන කාලෙ අපි, යන කල්හිද, ආගමන කාලෙ අපි, එන කල්හිද; තං එව පානීයං, ඒ පැන්ම: පිවිංසු, පානය කළහ.

. තතො, ඉක්බිති: යාවතා යුකං, ආයු ඇති තෙක්: පුඤ්ඤානි කත්වා, පින් කොට: කාලකතො, කලුරිය කොට: දෙව ලොකෙ, දිව්‍ය ලෝකයෙහි: ද්වාදස යොජනිකෙ කණක විමානෙ, දෙළොස් යොදුන් රන් විමනෙක්හි: නිබ්බත්තිත්වා, ඉපිද: අච්ඡරා සහස්ස පරිවුතො, අප්සරාවන් දහසක් දෙනා විසින් පිරිවරණ ලද්දේ: මහන්තං දිබ්බසම්පත්තිං, මහත් දිව්‍ය සම්පත්: අනුභවි, කෙළේය. තස්ස පන, ඔහුට වනාහි: සක්ඛරොදකං, සකුරු පැන්: දෙව මනුස්ස ලොකෙපි, දිව්‍ය-මනුෂ්‍යලොකවල ද: නිච්චං, නිතර: අවිජහිතං එව, අත් නොහැරම: උප්පජ්ජි, උපදියි. තස්මා, එහෙයින්: දෙවලොකෙ'පි, දිව්‍ය ලෝකයෙහි ද: තෙසු තෙසු ඨානෙසු, ඒ ඒ තන්හි: දිබ්බ පානීයං චාටියො, දිව්‍යමය පැන් සැළි: පුරා හුත්වා, පිරී: තිට්ඨන්ති, සිටිත්. ආගතාගතාදෙවා, පැමිණි පැමිණි දෙවියෝ: තතො, ඉන්: පානීයං, පැන්: පිවිත්වා, බී: නච්චන්තා, නටමින්: ගායන්තා, ගයමින්: කීළන්තා, කෙළිමින්: අත්තනො අත්තනො, තම තමන්ගේ: භවනංපි, ගෙවලට ද: පානීයං, පැන්: නෙන්ති, ගෙනයති. එවරූපං, මෙබඳු: ආනුභාව සම්පන්නං, ආනුභාව සම්පන්න: පානීයං, අහොසි, පැනක් විය.

14. එවං, මෙසේ: ලොකෙ, ලොකයෙහි: කෙචි, කිසිවෙක්: පානීයමත්තෙන'පි, පැන් ටිකක් දීමෙන් පවා: මහන්තං, මහත් වූ: විභවං, විභව සම්පත්: ලභන්ති, ලබත්: ලොකෙ, ලොකයෙහි: බහුප්පදනස්ස, බොහෝ කොට දුන්නාවූ: නරස්ස, මනුෂ්‍යයාට: මහා විපාකං, මහත් කුසල විපාකය: කො නාම වදෙය්‍ය, කවරෙක් නම් කියන්නේ ද.

**චූලතිස්ස වත්ථුං, චූලතිස්ස කථාව: චතුත්ථං, සිවු වැන්නයි.**

## 5. තිස්සාවගේ කථාව.

**(6) 5. තිස්සාය වත්ථුම්හි, තිස්සාවගේ වස්තුවෙහි: අයං, මේ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. සද්ධාතිස්ස මහාරාජස්ස කාලෙ, සද්ධාතිස්ස මහරජතුමාගේ කාලයෙහි: රොහණ ජනපදෙ, රුහුණු දනව්වෙහි: තිස්සමහ තිත්ථ නාම ගාමෙ, තිස්සමහතොට නම් ගමෙහි: මුද්ධගුත්තො නාම, මුද්ධ ගුත්ත නම්: එකො දුග්ගතො අහොසි, එක් දුක්පත් මිනිසෙක් විය. අස්ස, ඔහුගේ: භරියා'පි, භාර්‍ය්‍යාව ද: තිස්සා නාම, තිස්සා නම්. සා'පි, ඕතොමෝ ද: තාදිසිකාය එව, එබඳුමය: තෙ, ඔවුහු: දුක්ඛෙන, දුකින්: කසිරෙන, අමාරුවෙන්: තත්ථ, එහි: ජීවන්තා, ජීවත්වන්නෝ: පරතො, අනුන්ගේ: සට්ඨිකහාපණ මත්තං, කහවණු හැටක් පමණ: ඉණං ගහෙත්වා, ණයට ගෙන: තං, එය: දාතුං, දෙන්ට: අසක්කොන්තා, නොහැක්කාහු: යාවතා ඉණතො මුත්ති, ණයෙන් මිදෙන තෙක්: තාව, ඒතාක්: තස්ස, ඔහුගේ: ගෙහෙ, ගෙදර: දාස කම්මං, දාසකම්: කරොන්තො, කරන්නාහු: වීතිනාමෙන්ති, කල්ගෙවත්: තස්මිං සමයෙ, ඒ සමයෙහි: ගාමවාසිකා: ගම්වැසියෝ: බහු සඞ්ඝ, බොහෝ සඞ්ඝයා වහන්සේට: නිමන්තෙත්වා, ආරාධනා කොට: දානං දෙන්තා, දන් දෙමින්: සීලං රක්ඛන්තා, සිල් රකිමින්: පුඤ්ඤකම්ම නිරතා, පින්කම්හි නිරතව: විහරන්ති, වසත්. අථ, ඉක්බිති: තෙ ජයම්පතිකාපි, ඒ අඹු සැමි දෙදෙනා ද: සබ්බෙ, සියල්ලෝ: දානං, දන්: දෙන්ති. දෙතී: කෙවලං, හුදෙක්: මයං, අපි: දුග්ගතත්තා, එව, දුප්පත්ම නිසා: දානං දාතුං, දන් දෙන්ට: න සක්කොම, නොහැකි වෙමු. පුබ්බෙ, පෙර: කිඤ්චි, කිසිවක්: අකතත්තා, නොකළ බැවින්: ඉදානි, දන්: මහාදුග්ගතා ජාතා, මහ දුප්පත්තු වූහ. ඉදානි පි, දැනුදු: කිඤ්චි, කිසිවක්: අකත්වා නො කොට: අනාගතෙපි, අනාගතයෙහි ද: එවරූපා, මෙසේ වූවෝ: භවිස්සාම, වන්නෙමු: යෙන කෙනචි උපායෙන, යම් කිසි උපායකින්: දානං දාතු, දන් දෙන්ට: වට්ටතීති, වටියයි: මන්තෙත්වා, සාකච්ඡා කළහ. අථ, ඉක්බිති: අස්සා, ඇයගේ: සාමිකො, සැමියා: භද්දෙ, සොඳුර! ගාමවාසිකා, ගම්වැසියෝ: අනෙක සූපව්‍යඤ්ජනෙන, නොයෙක් සූප ව්‍යඤ්ජනයන් ගෙන්: ගො රසෙන ච සද්ධිං, පස්ගෝ රස ද සමග: දානං,

දන්: දෙන්ති, දෙති: මයං, අපි, කථං, කෙසේ: දෙම ඉති, දෙමු දැයි: වත්වා, කියා: ඔහීසි, පසු බැස්සේය. සා, ඕ තොමෝ: මරණං, මරණය: අජ්ජ, අද ද: සෙඩ ඉති, හෙට දැයි: න පස්සාදායති, නො පෙණේ. ලූඛං වා, රළු හෝ, පණීතං වා ප්‍රණීත හෝ: යං, යමක්: දින්නං හොති, දුන්නේ වේද: තං එව, එයම: වර තරං ඉති, ඉතා උතුමැයි: වදන්ති, කියත්. එවං ආහ, මෙසේ කීය.

2. ආතප්පං, වීර්‍ය්‍යය: අජ්ජ එව, අදම: කිච්චං, කටයුතුයි: (කිච්චං, කෘත්‍යය: අජ්ජ එව, අදම: ආතප්පං, කළ යුතුයි.) සුවෙ, හෙට: මරණං, මරණය: (වනු නොවනු) කො, කවරෙක්: ජඤ්ඤා, දනීද: මහා සෙනෙන, මහ සෙනග ඇති: තෙන මච්චුනා, ඒ මරහු හා: නො, අපගේ: සංගරං, විශ්වාසයක්: නහි, නැත්තේය.

3. තස්මා, එහෙයින්: සාමි, සවාමිනි! ලද්ධකං, ලබන ලද: තං, එය: ලූඛං වා, රූක්ෂ හෝ වේවා: පණීතංවා, ප්‍රණීත හෝ වේවා: (දෙයින්) සඩ්ඝස්ස, සඩ්ඝයාට: දනං, දනයක්: දදම, දෙමු. ඛණෙ, ක්ෂණ සම්පත්තිය: වෙ, ඒකාන්තයෙන්: මා උපච්චගා, ඉක්ම නොයාවා.

4. එවං, මෙසේ: වත්වා, කියා: පුන දිවසෙ, දෙවැනි දවසෙහි: අත්තානං, තමන්ගේ: කපණත්තා, දිළිඳුකම නිසා: මිස්සක තණ්ඩුල හත්තෙන, නිවුඩු හාල් බත්: සෙදිතමත්ත කාරපණ්ණෙව සද්ධිං, තැම්බූ කර කොළ සමග: එකං පත්තං පූරෙත්වා, එක භාජනයක් පුරවා සීසෙන, හිසින්: වහන්තී, උසුළන්නී: ආසන සාලං, ආසන ශාලාවට: ගන්ත්වා, ගොස්: ඨීතා, සිටියා: මහල්ලකකාලෙ, මහළු කාලයෙහි: පබ්බජිතං, පැවිදිවූ: එකං බුඩ්ඪ පබ්බජිතං, එක් මහළු පැවිද්දෙක්: වස්සග්ගෙන, වසහින් වාරය: ලභිත්වා, ලැබ: තස්ස භික්ඛුනො, ඒ භික්ෂුවගේ: පත්තෙ, පාත්‍රයෙහි: පතිට්ඨාපෙසි, පිහිටවීය. සොපි මහල්ලකො, ඒ මහළු වහන්සේ ද: හත්තං දිස්වා ච, බත් දැකම: දෙමනස්සො, දෙම්නස්ව: කුජ්ඣිත්වා, කිපී: තං හත්තං, ඒ බත: ගහෙත්වා, ගෙන: සුනඛ දෙණියං, බල්ලන්ට බත් දෙන පෝරුවෙහි: පක්ඛිපි, දැම්මේය. මොහස්ස, මෝහයාගේ: ඵලං, විපාකය: අහො, පුදුමයි: තථාහි, ඒ එසේමැයි.

5. මොහිතා, මෝහයෙන් මුළා වූවෝ: එතං, මෙය: උචිතං, සුදුසුය. නොචිතං, නුසුදුසු යයි ද: තථා, එසේම: කාතබ්බඤ්ච, කළ යුතු දෙයද: න කාතබ්බං, නොකළ යුතු දෙය ද: කාරණ ආකාරණං, කරනු නොකරනු ද: නෙව ජානන්ති, නොදනිත්.

6. තෙ, ඔවුහු: ඉහ ලොකං, මෙලොව පමණක්: පස්සන්ති, බලති. තෙ, ඔවුහු: ආයතිං, පරලොව: න පස්සන්ති, නො බලත්. තථා, එපරිද්දෙන්: න පස්සන්තා, (පරලොව) නොබලන්නා වූ: මොහා, මෝහී සත්ත්වයෝ: ගරහා, නින්දවෙන්: න මුච්චරෙ, නො මිදෙන්නාහුය.

7. එවං, මෙසේ: අනත්ථදෙ, අනර්ථදයක වූ: සද, සැම කල්හි:

අනිට්ඨඵලදෙ, අනිෂ්ට ඵල දෙන්නාවූ; මොහො, මෝහය; සබ්බසං සත්තානං පන, සියළු සත්වයන්ගේ වනාහි; මනස්මිං, සිත්හි; නෙව වත්තතු, නොපවතීවා.

8. තතො, ඉක්බිති; සා උපාසිකා, ඒ උපාසිකා තොමෝ; තං දිස්වා, එය දැක; දොමනස්සප්පත්තා, දෙම්නසට පැමිණියේ; ගෙහං ගන්ත්වා, ගෙදර ගොස්; සොචන්ති, ශොක කරමින්; නිපජ්ජි, වැදහොත්තීය. අථ, එකල්හි; අස්සා, ඇගේ; සාමිකො, සැමියා; අරඤ්ඤතො, කැලයෙන්; ආගන්ත්වා, අවුත්; තං දිස්වා, ඒ දැක; භද්දෙ, සොඳුර! කිං අඵාසුකං ඉති, අපහසු කිම්දැයි; පුච්ඡි, විචාළේය. සා, ඕ තොමෝ; සාමිකස්ස, සැමියාට; අනිච්ඡාය, නොකැමැත්තෙන්; දනං, දන්; දින්නත්තා, දුන් බැවින්; පටිවචනං, පිළිවදන්; නාදසි, නොදුන්නීය. අථ, ඉක්බිති; සා, ඕ තොමෝ; සාමිකෙන, සැමියා විසින්; නිබන්ධිත්වා, ඇවිටිලිකර; පුච්ඡිතා, විචාරන, ලද නිසා; සබ්බං තං කාරණං, ඒ සියළුම කරුණු; කථෙසි, කීවාය. තං සුත්වා, ඒ අසා; සො, හෙතෙම; අනත්ත මනො, නො සතුටු සිත් ඇත්තේ; භද්දෙ, සොඳුර! කිං කරිස්සාම, කුමක් කරමුද? අම්හාකං, එව එස දෙසො, මෙය අපගේම වරදයි; යදි, ඉදින්; ඉමිනා ඛණ සමවායෙන, මේ බුද්ධොත්පාද කාලයෙහි; නො, අපට; පතිට්ඨං, පිහිටක්; න කරිස්සාම, නො කරගත්තෙමු නම්; අම්හාකං එව, අපගේම; පරිහානි හොති, පිරිහීම වේ. තස්මා, එනිසා; දනං, දන්; දාතබ්බං එව ඉති වත්වා, දිය යුතුම යැයි කියා; තෙ උභොපි, ඔවුහු දෙදෙනාම; එකං ඉස්සර කුලං, එක් පොහොසත් ගෙදරකට; ගන්ත්වා, ගොස්; අත්තනො පුත්තං, තමන්ගේ පුතා; අග්ඝාපෙත්වා, මිල කොට; තස්ස කුලස්ස දත්වා, ඒ ගෙදරට දී; අට්ඨ කහාපණග්ඝනිකං, කහවනු අටක් වටිනා; එකං ධෙනුං, එළදෙනක්; අග්ගහෙසුං, ගත්හ. සා, ඒ එළදෙන; තං දිවසං එව, එ දවසම; එකං වච්ඡං, එක් වස්සකු; විජායි, වැදූවාය. පුන දිවසෙ, දෙවැනි දවස් හි; සා, ඕතොමෝ; තෙසං ධෙනුයා, ඒ දෙනගේ; ඛීරං, කිරි; දුහන කාලෙ, දෙවනා කාලයෙහි; දනජ්ඣාසයානුභාවමාගම්ම, දන්දීමේ අදහස ආනුභාවයට පැමිණ; ද්වෙනාලී මත්තං, නැලි දෙකක් පමණ; තෙලං එව, ගිතෙල්මං අදසි, දුන්නේය.

අථ, ඉක්බිති; තෙ, ඔවුහු; තෙලං ගහෙත්වා, ගිතෙල් ගෙන; දනං සම්පාදෙත්වා, දන් පිළියෙල කොට; භික්ඛූනං, භික්ෂූන්ට; දනං, අදංසු, දන් දුන්හ. තතො, ඉක්බිති; සා, ඕ තොමෝ; දුතිය දිවසතොපට්ඨාය, දෙවැනි දින පටන්; පුරෙභත්තං, පෙර බත් කාලයෙහි; චත්තාරි, සතරක් ද; පච්ඡා භත්තෙ, පසු බත් කාලයෙහි; චත්තාරි ඉති, සතරක් දැයි; නිච්චං, නිත්‍යයෙන්; අට්ඨනාලි මත්තං,නැලි අටක් පමණ; සුගන්ධ සප්පිං එව, සුවඳ ගිතෙල්ම; දෙති; දෙන්නීය. තතො, එයින්; තෙ ජයම්පතිකා, ඒ දෙමහල්ලෝ; පුරෙ භත්තෙ, පෙර බත් කාලයෙහි; ලද්ධ ලබන ලද; චතස්සො නාලියො ගහෙත්වා, නැලි සතර ගෙන; භික්ඛූනං, භික්ෂූන්ට; සප්පි භත්තං, ගිතෙල් බත්; දෙන්ති, දෙති. පච්ඡා භත්තෙ, සවස් කාලයෙහි;

ලද්ධෙන, ලද ගිතෙලින්: දීප පූජං, පහන් පූජා: කරොන්ති, කරත්, භික්ඛූනං, භික්ෂූන්ට: භෙසජ්ජත්ථාය අපි, බෙහෙත් පිණිස ද: දෙන්ති, දෙති. එවං, මෙසේ: කාලෙ ගච්ඡන්තෙ, කල් යන කල්හි: තස්මිං කිරගාමෙ, ඒ ගමෙහි: වසන්තො, වාසය කරන: එකො රාජපුරිසො: එක් රාජ පුරුෂයෙක්: තෙසං, ඔවුන්ට: සප්පි ලාභං සුත්වා, ගිතෙල් ලැබීමේ පුවත අසා: මය්හංපි, මටත්: භණෙ, කොල! සප්පිං, ගිතෙල්: ආහරථ ඉති, ගෙන එව් යැයි: මනුස්සෙ, මිනිසුන්: පෙසෙසි, යැවීය. තෙ, ඔවුහු: තං මනුස්සානං, ඒ මිනිසුන්ගේ: කථං සුත්වා, කථාව අසා: එවං, මෙසේ: ආහංසු, කීහ. භොන්තො, පින්වත්නි! මයංපි, අපි ද: සප්පිං, ගිතෙල්: න පරිභුඤ්ජාම, පරි භොග නොකරමු. ලද්ධ නියාමෙන, ලද ආකාරයෙන්: භික්ඛු සඞ්ඝස්ස, භික්ෂු සඞ්ඝයා වහන්සේට: දනං දෙම, දන් දෙමු. දීප පූජාදිං, පහන් පූජා ආදිය: කරොම ඉති, කරමු යි: (කියා) තතො, එයින්: කිඤ්චි, කිසිවක්: න අදංසු නුදුන්හ. තතො, ඉක්බිති: සො රාජ පුරිසො, ඒ රාජ පුරුෂයා: පෙසිත පුරිසානං සන්තිකා: යවන ලද මිනිසුන් වෙතින්: තං කථං සුත්වා, ඒ කථාව අසා: අරෙ, බොලව්: ඉදනි, දැන්: තුම්හෙ, තෙපි: රාජරහං, රජුන්ට සුදුසු: ගොරසං, ගවරසය: සංගොපෙත්වා, සඟවාගෙන: පරිභුඤ්ජථ, වළඳව්: රඤ්ඤො, රජුට: කථෙත්වා, කියා: සප්පිං, ගිතෙල්: තුම්හෙ, තෙපිට: බාදපෙස්සාමි ඉති, කවන්නෙමියි: තජ්ජෙන්තො, තර්ජනය කරන්නේ: භයාපෙසි, බිය ගැන්වීය.

තතො, ඉක්බිති: මුණ්ඩගුත්තො, මුණ්ඩ ගුප්ත: භරියං, භාර්‍ය්‍යාවට: ආහ, මෙසේ කීය. භද්දෙ, සොඳුර! මනුස්සානං, මිනිසුන්ට: යං කිඤ්චි භයං, යම්කිසි භයක්: උප්පජ්ජමානං, උපදින්නේ: අසප්පුරිසෙ එව නිස්සාය, අසත්පුරුෂයකු නිසාම: උප්පජ්ජතී'ති, උපදී යයි: එසො මොඝ පුරිසො, මේ හිස් මිනිසා: රඤ්ඤො, රජුට: වත්වා, කියා: අම්භාකං, අපගේ: දනස්ස, දනයට: අන්තරායං, අනතුරු: කරෙය්‍ය, කරන්නේය. එතං, මෙය: න පතිරූපං, සුදුසු නොවේ. තස්ස, ඔහුට: අඩ්ඪ නාලි මත්තං, නැලි බාගයක් පමණ: තෙලං, තෙල්: දෙම ඉති, දෙමුයි: වත්වා, කියා: නිච්චං, නිතර: අඩ්ඪනාලි මත්තං, නැලි බාගයක් පමණ: තෙලං, තෙල්: දෙන්ති, දෙති.

අථ, ඉක්බිති: අපරභාගෙ, පසු කාලයෙක් හි: සො රාජ පුරිසො, ඒ රාජ පුරුෂයා: රාජුපට්ඨානං, රජුගේ උපස්ථානයට: අගමාසි ගියේය. තස්ස ගත භාවං ඤත්වා, ඔහු ගිය බව දැන: තෙ, ඔවුහු: තස්ස, ඔහුට, තෙලං, තෙල්: න අදංසු, නුදුන්හ. අථ, ඉක්බිති, සො, හෙතෙම: රාජුපට්ඨානං, රජුගේ උපස්ථානය කොට: ආගන්ත්වා, අවුත්: භත්තං, බත්: භුඤ්ජන්තො, අනුභව කරන්නේ: සප්පිං, ගිතෙල්: ආහරාපෙසි, ගෙන්වීය. අස්ස, ඔහුගේ: භරියා, බිරිය: සාමි, හිමියනි! තුම්හෙ, නුඹ වහන්සේ: ගත කාලතො පට්ඨාය,ගිය කාලයෙහි පටන්: සප්පිං, ගිතෙල්: න අදංසු ඉති, නුදුන්හයි: ආහ, කීවාය. තං සුත්වා, ඒ අසා: දණ්ඩෙන පහට, දණ්ඩෙන් පහර ලත්: ආසිවිසො විය, සර්පයකු සේ: කුජ්ඣි, කිපුණේය. තථාහි,

ඒ එසේ මැයි; අසප්පුරිසො, අසත්පුරුෂයෝ; අටඨානෙ එව, නොතැන්හිම; කුජ්ඣන්ති, කිපෙත්. තෙන, එහෙයින්; වුත්තං, කියන ලදී.

9. භීම භුජගා, භයානක නාගරාජයෝ තුමූ; හෙතුමහි, කිපෙන්නට නිසි වූ; කාරණෙ, කරුණක්; සති, ඇති කල්හි; කුජ්ඣන්ති, කිපෙත්. නරාධම භුජඞ්ගමා, මනුෂ්‍ය අධමයන් නැමැති සර්පයෝ; අසනෙත පි ච, කාරණයක් නැති කල්හිද; කුජ්ඣන්ති, කිපෙත්.

රජතුමාට සුදුසු වූ; භාණ්ඩං, භාණ්ඩයක්; එකො, එකෙක්; සඬ්ගාපෙත්වා, සඟවාගෙන; සයං, තෙමේ; වලඤ්ජතී'ති, වළඳයි යයි; ආහ, කීවේය. රාජා, රජතුමා; අසප්පුරිස වචනෙන, අසත්පුරුෂයාගේ වචනයෙන්; තස්ස එව මග්ගං, එම මගට; පටිපජ්ජෙන්තො, පිළිපන්නේ; තෙනහි, එසේ නම්; භණෙ, කාල, එකං එව තං ධෙනුං, එකම ඒ එළදෙන; ආනෙතං, ගෙනර්ම; අයුත්තං, අයුතුය. ත්වං එව, තොපම; තාය සද්ධිං, ඒ එළදෙන සමග; කපිල ගාවීනං සතං, දුඹුරු පැහැති එළදෙනුන් සියයක්; ආනෙහි ඉති, ගෙනෙවයි; නියොජෙසි, නියොග කෙළේය. සොපි, හෙතෙමේ ද; ගාම නිගම ජනපදෙසු, ගම් නියම්ගම් ජනපදයන්හි; ආහිණ්ඩන්තො, ඇවිදින්නේ; තාය ධෙනුයා සද්ධිං, ඒ එළ දෙනත් සමග; ධෙනු සතං, දෙනුන් සියයක්; ගහෙත්වා, ගෙන; රඤ්ඤො, රජුට; දස්සෙසි, දැක්වීය. අථ, ඉක්බිති; ධෙනු සාමිකොපි, දෙනගේ අයිතිකරු ද; සභරියො, භාර්‍ය්‍යාව සහිතව; ධෙනුයා සද්ධිං එව, දෙන සමගම; අගමාසි, ගියේය. රාජා, රජතුමා; තං ධෙනුං, ඒ දෙන; ආනාපෙත්වා, ගෙන්වාගෙන; අත්තනො, තමාගේ; දෙවිං, දේවිය; සබ්බාලඞ්කාරෙහි, සියළු ආභරණයෙන්; අලඞ්කරිත්වා, සරසා; තෙලං, තෙල්; ධොවා'ති, දෙවයි; ආහ, කීය. දෙවියා, දේවිය විසින්; ධොවන කාලෙ, දෙවනා කාලයෙහි; එක තෙල බින්දු මත්තම්පි, එක තෙල් බින්දුවක්වත්; ථනතො තනයෙන්; නාගඤ්ඡි, නො ආයේය. අථ, ඉක්බිති; රාජා, රජතුමා; ධෙනු සාමිනිං, දෙනගේ අයිතිකාරිය; පක්කොසථ ඉති, කැඳවව් යයි; පක්කොසාපෙත්වා, කැඳවා; තම්පි, ඇයද; සබ්බාලඞ්කාරෙහි, සර්වාභරණයෙන්; අලඞ්කාරිත්වා, සරසා; තෙලං, තෙල්; ධොවා'ති, දෙවයි; ආහ, කීයේය. සාපි, ඕ තොමෝ ද; සාධු දෙව ඉති, යහපති දෙවයන් වහන්සැයි; වත්වා, කියා; ධෙනුයා, දෙනගෙන්; අධොත දිවසානි, නොදෙව් දවස්; බහූ හොන්ති, බොහෝ වෙත්; දෙව තයො කොළම්බෙ, සැලි දෙක තුනක්; ආහරා පෙථ ඉති, ගෙන එන්නැයි; ආහරාපෙත්වා, ගෙන්වා ගෙන; අත්තනො, තමාගේ; සද්ධං, ශ්‍රද්ධාව; ආවජ්ජෙත්වා, ආවර්ජනය කොට; ධෙනුයා, දෙනගේ; ථනෙ, පියයුරු; අග්ගහෙසි, ගත්තේය. අථ, ඉක්බිති; අස්සා, ඇගේ; හත්ථෙන, අතින්; පහට මත්තා ථනා, ස්පර්ශ කළ මාත්‍රයෙන් තනින්; සයමෙව, තෙමේම; තෙලං, තෙල්; පග්ඝරිංසු, වැගිරවූහ. සා, ඕ තොමෝ; චාටිපූරං තෙලං, සැළි පිරෙවූ ගිතෙල්; රඤ්ඤො, රජුට; දස්සෙසි, දැක්වීය. රාජා, රජතුමා; තෙලං, ගිතෙල්; ඔලොකෙත්වා, බලා; එත්තකං කාලං, මෙතෙක් කල්; ඉමිනා සප්පිනා, මේ ගිතෙලින්; කිං, කුමක්; අකාසි ඉති,

කෙළෙහිදැයි: (ඇසී) සා, ඕ තොමෝ: අත්තනො, තමන්ට: ධෙනුලාභඤ්ච, දෙන ලැබුනු සැටිද: තෙලං, ගිතෙල්: භික්ඛු සඞ්ඝස්ස, භික්ෂු සඞ්ඝයා පිණිස: දනං ච, දීම ද: ධෙනුයා, දෙන: ආනීත කාරණඤ්ච, ගෙන ආ කාරණය ද යන: සබ්බං, සියල්ල: කථෙසි, කීවාය. තං සුත්වා, ඒ අසා: රාජා, රජතුමා: එවං සති, මෙසේ ඇති කල්හි: ඉමං සප්පිං, මේ ගිතෙල්: අම්හෙ හි, අප විසින්: වලඤ්ජිතුං, පරිභොග කිරීමට: න සක්කා ඉති වත්වා, නොහැකියයි කියා: නගරෙච, නගරයෙහිද: පඤ්චමහාවාසෙ, පස් මහ ආවාසයන්හි: භික්ඛු සඞ්ඝංච, භික්ෂු සංඝයාද: සන්නිපාතාපෙත්වා, රැස් කරවා: තස්සා, ඇයගේ: සද්ධා බලං, ශ්‍රද්ධා බලය: පකාසෙත්වා, ප්‍රකාශ කොට: සප්පිං, ගිතෙල්: සඞ්ඝස්ස, සංඝයා වහන්සේට: දපෙසි, දෙවවීය. තතො, ඉක්බිති: ධෙනු සාමිනිං, දෙනගේ අයිතිකාරිය: පක්කොසාපෙත්වා, කැඳවා: තං ජනපදං, ඒ ජනපදය: තස්සා එව දත්වා, ඇයටම දී: හෙද කාරකම්පි රාජපුරිසං, හෙදකාරී රාජපුරුෂයා: තස්සා එව, ඇයටම: දසං කත්වා, මෙහෙකාරයකු කොට: අදසි, දුන්නේය.

තතො, ඉක්බිති: තෙ, ජයම්පතිකා, ඒ අඹු සැමියෝ: තස්මිං එව ජනපදෙ, එම ජනපදයෙහිම: වසන්තා, වසමින්: යාවජීවං, දිවිතෙක්: කුසල කම්මං කත්වා, කුශල කර්ම කොට: දෙව ලොකං එව, දෙව් ලොවටම: අගමංසු, ගියාහුය.

11. එවං, මෙසේ: අප්පධනා, ස්වල්ප වස්තුව ඇති: දිළිද්‍ද, දිළිඳු වූ: නරා, මනුෂ්‍යයෝ: රතනත්තයම්හි, රත්නත්‍රයෙහි: සද්ධං, ශ්‍රද්ධාව: වඩ්ඪෙත්වා, වඩා: අනූනං, අනූන වූ: අග්ගං, අග්‍රවූ: සම්පත්තිං, සම්පත්: ලභන්ති, ලබත්. තස්මා එහෙයින්: රතනෙසු, තුනුරුවන් කෙරෙහි: සද්ධං, ශ්‍රද්ධාව, වඩ්ඪෙති, වඩව්.

**තිස්සාය වත්ථුං, තිස්සාවගේ කථාව: පඤ්චමං, පස්වැන්නයි.**

## 6. අරියගාල තිස්ස කථාව.

**(6) 6. අරියගාල තිස්සස්ස, අරියගාල තිස්සගේ: වත්ථුම්හි, කථා වස්තුවෙහි: අයං, මෝ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. සො කිර, හෙතෙම වනාහි: අතීතෙ, අතීතයෙහි: රොහණ ජනපදෙ, රුහුණු දනව්වෙහි: ජගාම ද්වාරෙ, සගම් දෙරෙහි: අඤ්ඤතරස්මිං කුල ගෙහෙ, එක්තරා කුලගෙයක: නිබ්බත්තිත්වා, ඉපිද: වයප්පත්තො අහොසි, වැඩිවිය පැමිණියේ විය. සො කිර, හෙතෙම: එකදා, එක් දිනක්: ජගාම බොධියඞ්ගණං ගන්ත්වා, සගම් විහාර බෝමලුවට ගොස්: බොධිඤ්ච, බෝධිය ද: භික්ඛු සඞ්ඝඤ්ච, භික්ෂු සංඝයා ද: වන්දිත්වා, වැඳ: තතො පට්ඨාය, එතැන් පටන්: නිච්චං, එව, නිතරම: බොධියඞ්ගණෙ, බෝ

මලුවෙහි; වාලුකං, වැලි; ඔකිරනෙතා, විසුරුවමින්; මාලකෙ, මලුවෙහි; මත්තිකා කම්මං, මැටිකම්; කරොනෙතා, කරමින්; පුප්ඵ පූජං, මල් පූජා; කරොනෙතා, කරමින්; බොධිං, බෝධිය; ගන්ධ පානීයෙන, සුවඳ පැනින්; සඤ්චනෙතා, ඉසිමින්; ගන්ධ පඤ්චඞ්ගුලිකං කරොනෙතා, සුවඳ පසැඟිලි කරමින්; දනං දදනෙතා, දන් දෙමින්; බහූනි පුඤ්ඤකම්මානි, බොහෝ පින්කම්; උපචිනිත්වා, රැස් කොට; තතො චුතො, එයින් චුතව; තස්මිං එව රොහණෙ, එම රුහුණු දනව්වෙහිම; මහාගාමෙ, මහාගම; මඞ්ගල වීථියා, මඟුල් වීථියෙහි; මහාධන දෙවං නාම, මහාධන දේව නම්; ඉස්සරං පටිච්ච, ප්‍රධානියකු නිසා; තස්ස භරියාය, ඔහුගේ භාර්‍ය්‍යාවගේ; කුච්ඡිම්හි, කුසෙහි; පටිසන්ධිං ගණ්හි, පිළිසිඳ ගත්තේය. සො, හෙතෙම; ගබ්භපරිපාකං අන්වාය, ගැබ මේරීමට පැමිණ; මාතු කුච්ඡිතො, මවු කුසින්; නික්ඛමි, නික්මියේය. මාතා පිතරො පන, මවුපියෝ; අස්ස, ඔහුට; තිස්සො'ති, තිසස යයි, නාමං අකංසු, නම් කළහ. අථ, ඉක්බිති; අපරභාගෙ; මෑත කාලයෙහි; තං, ඔහුට; චතු පඤ්චවස්සික කාලෙ, සතර පස් හැවිරිදි කාලයෙහි; කීළන සීලතාය, කෙළිලොල් බැවින්; අස්ස, ඔහුට; කෙළිය තිස්සොති, කේළිය තිස්ස යයි; වොහරිංසු, ව්‍යවහාර කළහ. තතො, ඉක්බිති; සො, හෙතෙම; අපරභාගෙ; මෑත කාලයෙහි; බුද්ධ සාසනෙ, බුද්ධශාසනයෙහි; පසනෙතා, පැහැදුනේ; භික්ඛූනං, භික්ෂූන් වහන්සේ සන්තිකෙ, සමීපයෙහි; පබ්බජිත්වා, පැවිදිව; පටිපත්තිං, පිළිවෙත්; පූරෙනෙතා, පුරන්නේ; පඤ්චවස්සානි, පස් වසක්; වසි, විසීය. තතො, ඉක්බිති; සො, හෙතෙම; සාසන පටිපත්තිං, ශාසන ප්‍රතිපත්තිය; පූරෙතුං, පූරන්ට; අසක්කොනෙතා, නොහැකි වූයේ; විබ්භමතුකාමො අහොසි, සිවුරු හැර යනු කැමැත්තේ විය. එත්ථ, මෙහි; භවන්ති, එසේ වෙත්මැයි.

2. සද්ධෙන, ශ්‍රද්ධාව ඇත්තාවූ; කුල පුත්තෙන, කුල පුත්‍රයා විසින්; සාසනෙ, බුදු සස්නෙහි; පබ්බජිත්වාන, පැවිදිව; පාතිමොක්ඛංච සංවරං, ප්‍රාතිමොක්ෂ සංවර ශීලය; අසෙසෙන, නිරවශෙෂයෙන්ම; පාලෙතබ්බං, පාලනය කළ යුතුයි.

3. රූප සද්දදි, රූප ශබ්දදිය; ගොචරෙ, ගොචර කොට ඇති; චක්ඛුසොතාදි, චක්ෂු ශ්‍රොතාදි වූ; ද්වාරානි, ද්වාරයන්; ද්වාරෙතබ්බං, වැලැක්විය යුතුයි. හෙවත් වැසිය යුතුයි. සදා, හැම කල්හි; තෙන, ඔහු විසින්; සද්ධෙනං, ශ්‍රද්ධාවෙන්; ඉන්ද්‍රිය සංවරං, ඉන්ද්‍රිය සංවර ශීලය රක්ෂා කළ යුතුයි.

4. අනෙසනං, එක්විසි අනෙසනයන්; පහත්වාන, දුරුකොට; සුද්ධාජීවෙන, පිරිසිදු ආජීවයෙන්; අත්තනො, තමන්ගේ; ජීවිතං විය, ජීවිතය මෙන්; සබ්බදා, හැම කල්හි; ආජීව සීලං, ආජීව පාරිශුද්ධි ශීලය; පාතබ්බං, රැකිය යුතුයි.

5. සදා, සියළු කල්හි; චත්තාරො පච්චයෙ, සිවුපසය; නිච්චං, නිතර; යොනිසො, නුවණින්; සෙවමානෙන, සේවනය කරන්නාහු විසින්;

ආදරා, ආදරයෙන්; පච්චය සන්නිස්සිතං සීලං, ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය; පාලෙතබ්බං, රැකිය යුතුයි.

6 .එතං චතුබ්බිධංසීලං, මේ සතරවැදෑරුම් ශීලය; පූරයනෙතා, පුරන්නාවූ; ජිනපුත්තො, බුද්ධපුත්‍රතෙම; සග්ගාපවග්ග සම්පත්තිං, ස්වර්ගාපවර්ග සම්පත්තිය; අවස්සං, අවශ්‍යයෙන්; අනුභොස්සති, අනුභව කරන්නේය.

7. යො, යම් මහණෙක් තෙම; රාග දෙස මොහෙහි, රාග ද්වේෂ මෝහයන්ගෙන්; ආපූරෙනෙතා, සම්පූර්ණ කරන්නේ; සීලෙසු, ශීලයෙහි; ආලසිකො හුත්වා, අලසයෙක්ව; අනාදරො, ආදර නැත්තේ ද; සො, හෙතෙම; නිරයං, නරකයෙහි; උප්පජ්ජති, උපදින්නේය.

8. සො, හෙතෙම; දයකෙ, දයකයන්; න තොසෙති, සංතොෂ නොකරන්නේය. සයං වා, තෙමේ හෝ; න තුස්සති, සතුටු නොවන්නේය. සො, හෙතෙම; ජවාලාත, සෙහොන් පෙනෙල්ලක්; සමො හොති, සමාන වේ. විඤ්ඤූනා, නුවණැත්තවුන් විසින්; නින්දිතො හොති, නින්ද කරන ලද්දෙක් වේ.

9. තස්මා, එහෙයින්; තං, ඒ ශිලය; පරිපූරෙතුං, රකින්ට; අසක්කොනෙතන, නොහැක්කාවූ; භික්ඛුනා, භික්ෂුව විසින්; මිළෙහන, (දුශ්චරිත නැමැති) අශුචියෙන්; සත්ථු සාසනං, බුද්ධ ශාසනයන ආලිම්පිත්වාන, ආලේප කිරීම නොකොට; ගනතබ්බං, (උපැවිදි බවට) යා යුතුයි.

10. සො, හෙතෙම; එවං ච පන චිනෙතත්වා, මෙසේ ද සිතා; සෙනාසනං, සෙනසුන; සංසාමෙත්වා, තැන්පත්කොට තබා; චීවරානි, සිවුරු; ධොවිත්වා, සෝද; පතෙතන සහ සංවිධාය ඨපෙත්වා, පාත්‍රය සමග පිළියෙල කොට තබා; නිරවජ්ජ සාටකස්ස අභාවෙන, නිවැරදි සළුවක් නොමැති හෙයින්; නග්ගො හුත්වා, නග්නව; උදක පටිච්ඡනෙතන, ජලයෙහි සැහවෙමින්; ගඞ්ගාය, ගඟට පතිත්වා, වැටී; ගච්ඡනෙතා, යන්නේ; උදකෙන, ජලයෙන්; වූයහමානං, පාවී යන; දරුක්ඛන්ධං, දරකඩක්; උරෙ කත්වා, පපුවට තබාගෙන; තරනෙතා, එතරවන්නේ; අධො ගඞ්ගං, යටි ගං බලා; ගච්ඡති, යයි.

තද, එකල්හි; දෙව මාතුගාමො, ස්ත්‍රීන් දෙදෙනෙක්; හෙට්ඨා ගඞ්ගා තිත්ථෙ, යටි ගං තොට; නහායනතා, නහන්නෝ; ගඞ්ගාසොතෙන, ගඟ දියෙන්; වුයහමානං, පාවී යන; තං දරුක්ඛන්ධං, ඒ දරකඩ; දූරතො ආගච්ඡනතං දිස්වා, දුරදීම එනු දැක; තාසු, ඔවුන් අතුරෙහි; එකා, එකියක්; එතං දරුක්ඛන්ධං, තෙල දරකඩ; මයහං ඉති, මගේ යයි; ආහ, කීවාය. අපරා, අනික් තැණැත්තිය; යං, යමෙක්; තස්මිං, එහි; විජ්ජති, විද්‍යමාන වේද; තං, එය; මයහං, ඉති, මගේ යයි; ආහ, කීවාය. තතො, ඉක්බිති; තං, එය; සමීපමුපගතං, සමීපයට පැමිණියේ; දෙවපි ජනා, දෙදෙනාම; තරනතා, පීනා ගොස්; ගහෙත්වා, අල්ලාගෙන; තං

දරුකඛන්‍ධෙන සද්ධිං, ඒ දරකඩ සමග: තීරං, ඉවුරට: පාපෙසුං, පැමිණවූවාහුය. අථ, ඉක්බිති: තාසු, ඇලා අතුරෙහි: තස්මිං, එහි: විජ්ජමානං, ඇති දෙය: මය්හං, ඉති වුත්තා, මගේ යයි කී තැනැත්තී: තං නග්ගං, දිස්වා, වස්ත්‍ර නැති ඔහු දැක: අස්ස, ඔහුට: සාටකං, සළුවක්: ආහරිස්සාමි ඉති, ගෙන එන්නෙමියි: වත්වා, කියා: අත්තනො, තමන්ගේ: ගෙහං, ගෙදරට: අගමාසි, ගියාය. තස්සා, ඈ: ගත කාලෙ, ගිය කල්හි: ඉතරා, අනික් තැනැත්තී: අත්තනා, නිවත්‍ථ වත්‍ථං, තමන් හැඳි වස්ත්‍රය: මජ්ඣෙන, මැදින්: භින්දිත්වා, කඩා: තං, ඔහු: නිවාසාපෙත්වා, හඳවා: මාතා පිතුන්නං, මවුපියන්ගේ: ගෙහං, ගෙදරට: නෙසි, ගෙන ගියාය. අස්සා, ඇගේ: මාතා පිතරො, මවුපියෝ: තස්ස, ඔහුගේ: කුලවංසං පුච්ඡිත්වා, කුලවංශය විචාරා: තස්සා එව, ඇයටම: භාර මකංසු, භාර කළහ. සා පන, ඕ තොමෝ වනාහි: නාමෙන, නමින්: සුමනා නාම අහොසි, සුමනා නම් වූවාය: ගාමවාසිනො, ගම් වැස්සෝ: තං, ඔහු: ගණ්ඩාතිස්ස යයි: නාමං, නමක්: අකංසු, කළහ. අයං පන ගණ්ඩාතිස්සො, මේ ගණ්ඩාතිස්ස: ගෙහං, ගෙදර: ආවසන්තො, වාසය කරන්නේ: කසිවණිජ්ජාදිසු, කෘෂි වණික් ආදී: යං කිඤ්චි කම්මං, යම් කිසි වැඩක්: අකරොන්තො, නොකරන්නෝ: තත්‍ථ තත්‍ථ, ඒ ඒ තන්හි: විචරති, හැසිරේ. තස්මා, ඒ නිසා: අස්ස, ඔහුගේ: අකම්මසීලත්තා, වැඩක් නො කරන ස්වාභාව ඇති බැවින්: නික්කම්ම තිස්සො ඉති, නිකම් තිස්ස යයි: ආලපන්ති, කථා කරති. අථ, ඉක්බිති: සුමනාය, සුමනාවගේ: භාතු භගිනි ආදයො, සහොදර සහොදරී ආදීහු: සඞ්ගම්ම, එක් රැස්වී: මාතා පිතුන්නං, මවුපියන්ට: එවං, මෙසේ: ආහංසු කීහ. සුමනාය, සුමනාගේ: සාමිකො, සැමියා: නික්කම්ම සීලො, අලසකමින් යුක්තව: ගෙහෙ එව, ගෙදරම: නිසීදති, හිඳියි. මයං, අපි: තස්ස, ඔහුට: කිං කම්මං කරිස්සාම ඉති, කිනම් වැඩක් කරමු දැයි: අථ, ඉක්බිති: තෙ, ඔවුහු: පුත්තානං, පුත්‍රයන්ට: සක්ඛපනත්‍ථං, දැන්වීම පිණිස: තිස්සස්ස, තිස්සයා: බහිගත කාලෙ, පිට ගිය වේලෙහි: සුමනං, සුමනා: පක්කොසාපෙත්වා, කැඳවා: එවං, මෙසේ: ආහංසු, කීහ.

11. තව, තොපගේ: සාමිකො, සැමියා: නික්කම්මසීලකො, නිකම් තිස්සතෙම, කසිං වා, සී සෑමක් හෝ: අථ, නැවත: වණිජ්ජං වා, වෙළඳමක් හෝ: අකත්වා, නොකොට: කථං, කෙසේ: කුලවංසං, කුලවංශය: පතිට්ඨෙති, පිහිටුවන්නේ ද:

12. පුත්තදාරෙහි, අඹුදරුවන් සහිත වූ: ඤාතීහි, නෑයන් සමග: කුලං, කුලය: වඩ්ඪෙතුං, වර්ධනය කරන්ට: ඉච්ඡතා, කැමැත්තාහු විසින්: සබ්බදා, සැම කල්හි: සබ්බ කම්මසු, සියළු කර්මාන්තයන්හි: න අලසො හුත්වා, අලස නොවේ: වත්‍තබ්බං, විසිය යුතුයි.

13. ඛෙත්තවත්‍ථුසු, කෙත්වත්හි ද: දසෙසු, දසයන් කෙරෙහි ද: ගොමහිස, ගව මහීසාදීන් කෙරෙහි ද: වනෙසු ච, වනයෙහි ද: (යන මේ සියල්ලෙහි) න අලසො, අලස නොවූ: සො, හෙතෙම: සජෙත, ස්වකීය

ජනයන් මධ්‍යයෙහි ද: පරජනෙ, අන්‍ය ජනයන් මධ්‍යයෙහි ද: හි, ඒකාන්තයෙන්: පූජිතො හොති, පූජිත වේ.

14. සීතුණ්හාදී, සීත උෂ්ණාදිය: අචින්තෙන්තො, නොසිතන්නේ: කායිකං දුක්ඛං, කායික දුක්: සහන්තො, ඉවසන්නේ: කාලාකාලං, කල් නොකල්: සමෙක්ඛාය, මනාව දැන: සද, සැම කල්හි: විරියං, වීර්‍ය්‍යය: කාතබ්බං, කළ යුතුයි.

15 තථා, එපරිද්දෙන්ම: වණිජ්ජ කම්මෙපි, වෙළඳම් කර්මයෙහිද: සිප්පුග්ගහණ ධාරණෙ, ශිල්ප ඉගෙණීමෙහි හා දැරීමෙහි ද: අතන්දිතෙන, මැලි නොවීමෙන්: අමරන්තොව, නොමියෙන කෙනෙක් මෙන්: සද, සැමකල්හි: කත්තබ්බං, උත්සාහ කළ යුතුයි.

16. එවං ච පන වත්වා, මෙසේ ද කියා: තස්සා, ඇයට: නාලිමත්තං, නැළියක් පමණ: තණ්ඩුලං ච, සහල් ද: එකං භාජනං ච, එක භාජනයක්ද, දත්වා, දී: අජ්ජ ආදිං කත්වා, අද පටන් කොට: තුම්හෙ, තෙපි: විසුං, වෙනම: වසථ, වසව්: අම්හාකං ගෙහෙ, අපේ ගෙයි: න වසථ ඉති, නොවසව් යයි: වත්වා, කියා: පෙසෙසුං, යැවූහ. තථාහි, ඒ එසේමැයි.

17. මාතා පිතා ච, මවුපියෝ ද: ඤාතකා, නෑයෝ ද: දලිද්දං, දිළිඳු තැනැත්තේ: නෙව කාමෙන්ති, කැමැති නොවෙත්. ලොකෙසු, ලෝකයෙහි: ධම්මතා, ධර්මතාවය: එවං, මෙසේය.

18. සො, හෙතෙම: වෙ, ඉදින්: අකුලීනොපි, කුල නැත්තේද: අථ, යලිත්: සො, හෙතෙම: ධනවා, ධන ඇත්තේ වේද: භොගී, භොග සම්පත් ඇත්තේ ද: පහූ, අධිපති වූයේ ද: තං ඒ ධනවත් තැනැත්තේ: වෙ, ඒකාන්තයෙන්: සබ්බෙ, සියල්ලෝම: උපාසන්ති, භජනය කෙරෙත්. ලොකෙසු, ලෝකයෙහි: ධම්මතා, ස්වභාවය: එවං, මෙසේය.

19. තතො, ඉක්බිති: සුමනා, සුමනා: තං ගහෙත්වා, ඒවා රැගෙන: නිම්මානුසකෙ එකස්මිං ගෙහෙ, පාලු ගෙදරක: අස්සූනී, කඳුලු: පවස්සයමානා, සල සලා: රොදන්ති, හඬමින්: නිසීදි, හුන්නීය. තතො, ඉක්බිති: නික්ඛම්ම තිස්සො, නිකම් තිස්ස: අත්තනො, තමන්: ගතට්ඨානතො, ගිය තැනින්: ආගන්ත්වා, අවුත්: රොදමානං භරියං දිස්වා, හඬන භාර්‍ය්‍යාව දැක: භද්දෙ, සොඳුර! කිං රොදසි ඉති, කුමක් නිසා හඬන්නෙහිදැයි: පුච්ඡි, විචාළේය.

සා, ඕ තොමෝ: මාතාපිතූහි. මවුපියන් විසින්: වුත්තං, කියඋ ලද: සබ්බං, සියල්ල: වත්වා, කියා: වියොජිත භාවං, වෙන් කළ බව: කථෙසි, කීවාය. තං සුත්වා, ඒ අසා: අම්හාකං විසුං කරොන්තා, අප වෙන් කරන්නාහු: කිං දත්වා, කුමක් දී: අකංසු ඉති, (එසේ) කළාහු ද? එකං තණ්ඩුලනාළිං ච, එක සහල් නැලියක් ද: පචන භාජනඤ්ච, පිසන බඳුනක්ද: අදංසු ඉති, දුන්හයි: වුත්තෙ, කී කල්හි: සො, හෙතෙම: තං සුත්වා, ඒ අසා: භද්දෙ, සොඳුර, ත්වං, තී: මා චින්තෙසි, කිසිවක් නොසිතව:

මයං, අපි; යෙන කෙනචි උපායෙන, යම් කිසි උපායකින්; ජීවිස්සාම, ජීවත්වෙමු. අපි ච, තවද; භදෙද, සොඳුර; මයං, අපි, විසුං ජාත කාලතො පට්ඨාය, වෙන් වූ කාලයෙහි පටන්; භික්ඛු සඞ්ඝස්ස, භික්ෂු සංඝයා වහන්සේට; කිඤ්චිපි අදත්වා, කිසිවක් නොදී; න පරිභුඤ්ජිස්සාම ඉති, අනුභව නොකරන්නෙමුයි; වත්වා, කියා; සයං, තෙමේ; මහා විහාරං, මහා විහාරයට; ගන්ත්වා, ගොස්; එකං සලාකං, එක් සලාකයක්; ඡින්දාපෙත්වා, වෙන් කරවා ගෙන; ආගන්ත්වා, අවුත්; භරියං, භාර්‍ය්‍යාව; ආමන්තෙත්වා, අමතා, භදෙද, සොඳුර! යාව, යම්තාක්; අහං, මම; ආගච්ඡාමි, එම්ද; තාව, ඒ තාක්; ඉණං ගහෙත්වාපි, ණයක් ගෙන හෝ; යෙන කෙනචි උපායෙන, යම් කිසි උපායකින්; අප්පමත්තා හුත්වා, අප්‍රමාදව; අය්‍යානං, ආර්‍ය්‍යයන් වහන්සේලාට; දනං, දන්; දදෙය්‍යාසි ඉති, දෙන්නෙහි යයි; වත්වා, කියා; සයං, තෙමේ; භතියා කම්මං, කුලී වැඩක්; ගවෙසනෙතා, සොයමින්; අගමාසි, ගියේය.

තද, එකල්හි; අස්ස, ඔහුගේ; පිතුනො, පියා වූ; මහා ධන දෙවස්ස, මහාධනදෙවගේ; සහායො, යහළු; චන්දසූරියො නාම, චන්දසූරිය නම්; එකො රට්ඨික පුත්තො, එක් ජනපද නායක පුත්‍රයෙක්; චිත්තසර ඛෙත්තතො, චිත්තසර කෙතෙන්; පඤ්චසත කරිස මත්තං ලභිත්වා, පන්සිය කිරියක් පමණ ලැබ; සස්සං, ගොයම්; කාරෙසි, කරවීය. තද, එකල්හි; තං, එය; පක්කං, පැසුනේ විය. තික්කම්ම තිස්සො, තිකම් තිස්ස තෙමේ; භතියා කම්ම, කුලී වැඩක්; ගවෙසනෙතා, සොයමින්; තස්ස රට්ඨිකස්ස, ඒ රාෂ්ට්‍රිකයාගේ; ගෙහං, ගෙදරට; ගන්ත්වා, ගොස්; තං, ඔහු; අද්දස්ස, දුටුවේය. රට්ඨිකො, රැටියා; තං දිස්වා, ඔහු දැක; කිමත්ථාය, කුමක් සඳහා; ආගතොසි ඉති, ආවෙහිදැයි; පුච්ඡි, විචාළේය. භතියා, කුලියට; ලාවන කම්මං, ගොයම් කැපීමේ වැඩක්; පරියෙමානො, සොයමින්; ආගතොම්හි ඉති, ආවෙමියි; වුත්තෙ, කී කල්හි; රට්ඨිකො, රැටියා; තං, ඔහු දෙස; ඔලොකෙත්වා, බලා; තාත, දරුව! ත්වං, ඔබ; සහජෝන, සිය අතින්; කම්මං, වැඩ; අකත පුබ්බො, නොකළ විරූය. කිං, කිම? ත්වං, තොපට; ලායිතුං සක්ඛිස්සසි ඉති, ගොයම් කපන්ට හැකි දැයි; ආහ, කීය. තෙන, එහෙයින්; ලභිස්සාමි ඉති, ගොයම් කපන්නෙමියි; වුත්තෙ, කී කල්හි; තව විරියං, තොපගේ වීර්‍ය්‍යය; න ජානාමි ඉති, නොදැනිමියි; න සම්පටිච්ඡි, පිළි නොගත්තේය. අථ, එකල්හි; තිස්සො, තිස්ස තෙමේ; තෙනහි, එසේ නම්; මම විරියං, මගේ වීර්‍ය්‍යය; පස්සථ ඉති, බලවයි; ලාවනං, දෑකැත්ත; ගහෙත්වා, ගෙන; ඛෙත්තං, කුඹුරට; ඔතරිත්වා, බැස; පුරෙභත්තං එව, පෙරවරු කාලයෙහිම; තං පඤ්චසතකරීස මත්තං, ඒ පන්සියයක් පමණ කිරිය; ලායි, කැපීය. තං දිස්වා, ඒ දැක; රට්ඨිකො, රැටියා; අච්ඡරියපත්තො, පුදුමයට පැමිණියේ; තස්ස, ඔහුට; තුස්සිත්වා, සතුටු වී, අත්තනො, තමන්ට; ආහත භත්ත භාජනානි ච, ගෙන ආ බත් භාජන ද; දස දසියොච, දැසි දස්සන්ද; අදසි දුන්නේය. තතො, ඉක්බිති; තිස්සො, තිස්ස තෙමේ; සබ්බං තං ඛෙත්තං, ඒ සියළු කුඹුර; සයං එව තෙමේම; රාසිං කත්වා, ගොඩ ගසා; මද්දිත්වා, මැඩ; පලාලං, පිදුරු;

උඩරිත්වා, ඉවත්කොට; සයං එව, තෙමේම; පොයේත්වා, පොළා; මහන්තං වීහි රාසිං, මහා වී ගොඩක්; අකාසි, කෙළේය. තතො, ඉක්බිති; රට්ඨිකො, රාෂ්ටික තෙමේ; තස්ස පුරිසස්ස, ඒ පුරුෂයාගේ; විරියාකාරං, වීර්‍ය්‍ය; පස්සිත්වා, දැක; අතිප්පසන්නො, ඉතාම පැහැදී; තස්මිං ඛෙත්තෙ, ඒ කෙතෙහි; සබ්බං තං ධඤ්ඤං, සියළු ඒ ධාන්‍ය; තස්ස එව, ඔහුටම; අදාසි, දුන්නේය.

20. තිස්සො, තිස්ස තෙමේ; තතො පට්ඨාය, එතැන් පටන්; භික්ඛූනං, භික්ෂූන්ට; අට්ඨ සලාක භත්තං, සලාක බත් අටක්; දෙති, දෙයි. දදමානො පන, දෙන්නේ වනාහි; උදක ලොණ මත්තෙන, දියලුණු මාත්‍රයෙන්; අසප්පායං, සප්පාය නොවන සේ; දෙති, දෙයි. තස්මා, එහෙයින්; අස්ස, ඔහුට; භික්ඛූ, භික්ෂූහු; උදක ලොණ තිස්සො ඉති, උදක ලොණ තිස්ස යයි; වොහරිංසු, ව්‍යවහාර කළහ. තෙසං පන භික්ඛූනං, ඒ භික්ෂූන් අතර වූ; මහල්ලකා, මහළු කළ පැවිදි වූ; බුඩ්ඪපබ්බජිතා, බුඩ්ඪපබ්බජිත භික්ෂූහු; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; තං භත්තං, ඒ බත්; ගහෙත්වා, ගෙන; සුනබදෙණියෙ එව, බල්ලන්ට බත්ලන පෝරුවෙහිම; පක්ඛි පන්ති, බහාලති. තතො, ඉක්බිති; උදකලොණ තිස්සො, උදකලොණ තිස්ස තෙමේ; භික්ඛූනං, භික්ෂූන්ගේ; තං කිරියං දිස්වා, ඒ ක්‍රියාව දැක; තතො පට්ඨාය, එතැන් පටන්; සොළස ඛීර සලාක භත්තං, කිරි හා සමග සලාක බත් සොළසක්; පට්ඨපෙසි, පිහිටු විය. තස්මා, එහෙයින්; අස්ස, ඔහුට; භික්ඛූ-භික්ෂූහු; ඛීරභත්ත තිස්සො ඉති, කිරිබත් තිස්ස යයි; නාමං අකංසු, නම් කළහ. තතො, ඉක්බිති; තෙසං, භික්ඛූනං, ඒ භික්ෂූන්ට; චිරකාලං, බොහෝ කාලයක්; ඛීරභත්තං එව, කිරිබත්ම; භුඤ්ජන්තානං, අනුභව කරන්නවුන්ට; අරුචි උප්පජ්ජි. අරුචියක් උපන්නේය. තෙන ඛීරභත්තෙන, ඒ කිරිබතින්; චිත්තං, සිත; න පසාදෙති, නො පහදියි.

අථ, ඉක්බිති; ඛීරභත්ත තිස්සො,කිරිබත් තිස්ස තෙමේ; තං කාරණං ඤත්වා, ඒ කරුණ දැන; ධෙනුසතං ලභිත්වා, දෙනුන් සියයක් ලැබ; අත්තනො, සද්ධං, තමාගේ ශ්‍රද්ධාව; ආවජ්ජෙත්වා, ආවර්ජනා කොට; ථනෙ, තන; අග්ගහෙසි, ඇල්ලීය. සුගන්ධ සප්පිං එව, සුවඳ ගිතෙල්ම; පග්ඝරි, වැගිරිණ; සො, හෙතෙම; තතො පට්ඨාය, එතැන් පටන්; සොළසන්නං භික්ඛූනං, භික්ෂූන් දහසය නමකට; තෙලුලොපකං නාම භත්තං, ගිතෙල් මිශ්‍ර කොට සැදූ බතක්; අදාසි, දුන්නේය. තතො, ඉක්බිති; තස්ස, ඔහුට; කල්‍යාණභත්ත තිස්සො, ඉති, කල්‍යාණභත්ත තිස්ස යයි; නාමං අහොසි, නම් විය. තතො, ඉක්බිති; කල්‍යාණ භත්ත තිස්සො, කල්‍යාණ භත්ත තිස්ස තෙමේ; අනුපුබ්බෙන, පිළිවෙලින්; දනං, දනය; වඩ්ඩෙන්තො, දියුණු කරමින්; පඤ්චන්නං, භික්ඛුසතානං, පන්සියයක් භික්ෂූන් වහන්සේට; නිබද්ධං එව, නිතරම; තෙලුලොපක දනං, සුවඳ ගිතෙල් උපුල්වා දන්; දෙති, දෙයි.

සො පන, හෙතෙම වනාහි; එක දිවසං, එක දවසක්; භික්ඛු සඞ්ඝස්ස,

භික්ඛු සංඝයාට: මයා, මා විසින්: කන්‍දමූලදනං, අල මුල් දනයක්: අදින්නපුබ්බං ඉති, නුදුන් විරූයයි: චින්තෙත්වා, සිතා: බහු මනුස්සෙ ගහෙත්වා, බොහෝ මිනිසුන් ගෙන: කුම්බුල පබ්බතං, කුඹල් පව්වට: ආරුය්හ, නැග: කන්‍ද මූලං, අල මුල්: ඛණන්තො, සාරන්නේ: සට්ඨි නිධිකුම්භියො, නිදන් කළ හැටක්: දිස්වා දැක: සකගෙහෙ, තම ගෙයි: නිධාපෙත්වා, නිදන් කරවා: තතො පරං, එයින් පසු: අතිරේක තරං, වැඩිපුර: දනං, දන්: දෙන්තො, දෙමින්: පටිවසති, වාසය කරයි.

තස්මිං සමයෙ, එසමයෙහි: අනුරාධපුරතො, අනුරාධපුරයෙන්: පඤ්චසත භික්ඛූ, පන්සියයක් භික්ෂූහු: තත්‍ථ තත්‍ථ, ඒ ඒ තන්හි: බොධි පටිමාදයො, බෝ පිළිම ආදිය: වන්‍දන්තා, වදිමින්: අනුක්කමෙන, පිළිවෙළින්: මහාගාමං, මාගමට: අගමංසු: ගියාහුය. තතො, ඉක්බිති: කල්‍යාණහත්‍ථ තිස්සො, කල්‍යාණ හත්‍ථ තිස්ස තෙමේ: තෙ, උන් වහන්සේලා: දිස්වා, දැක: සොමනස්සප්පත්තො, සතුටට පැමිණියේ: නිමන්තෙත්වා, ආරාධනා කොට: මහාදනං, දත්වා, මහ දන් දී: භුත්තානු මොදනාවසානෙ, අනුමෙවෙනි බණ අවසානයෙහි: අය්‍යා, ආය්‍යීයන්වහන්සේලා: කුතො, කොහි සිට: ආගතත්‍ථ ඉති, වැඩියෙහිදැයි: පුච්ඡි, විචාළේය. තෙ, උන්වහන්සේලා: උපාසකා, උපාසකවරුනි, අනුරාධපුරතො, අනුරාධපුරයේ සිට: ආගතම්හ ඉති, ආවෙමුයි: වදිංසු, කීවාහුය. සො, හෙතෙම: භන්තෙ, ස්වාමීනි! එතරහි, දැන්: කතරස්මිං ඨානෙ, කවරතැනෙක්හි: බහු භික්ඛූ, බොහෝ භික්ෂූහු : උපවසන්ති ඉති, වෙසෙත්දැයි: පුච්ඡි, විචාළේය. අථ බො, ඉක්බිති: තෙ, ඒ භික්ෂූහු: මාරිස, නිදුකාණෙනි! ඉදනි, දැන්: ලඞ්කාදීපෙ: ලඞ්කාද්වීපයෙහි: චෙතියම්බ විහාරෙ, චෙතියම්බ විහාරයෙහි ද: අනුරාධපුරෙ, අනුරාධපුරයෙහි ද: නාගදීපෙ ච ඉති, නාගදීපයෙහි දැයි: ඉමෙසු තීසු ඨානෙසු, මේ තුන් තන්හි: අනෙකසත භික්ඛූ, නොයෙක් සිය ගණන් භික්ෂූහු: උපවසන්ති ඉති, වාසය කරති යි: ආහංසු, කීවාහුය. තෙසං, උන්වහන්සේලාගේ: තං, ඒ කථාව: සුත්වා, අසා: සොමනස්සො, සතුටට පත් වූයේ: තත්‍ථ, එහි: ගන්ත්වා, ගොස්: මයා, මා විසින්: දනං, දතුං, දන් දෙන්ට: වට්ටතීති, වටී යයි: චින්තෙත්වා, සිතා: පඨමං, පළමුකොට: චෙතියම්බ විහාරං, චෙතියම්බ විහාරයට: ගන්ත්වා, ගොස්: තත්‍ථ, එහි: භික්ඛූන, භික්ෂූන්ට: දනං දත්වා, දන් දී: තතො, ඉක්බිති: අනුරාධපුරෙ, අනුරාධපුරයෙහි: පඤ්චමහාවාසෙ, පඤ්චමහා ආවාසයන්හි: අනෙක සහස්සානං භික්ඛූනං, නොයෙක් දහස් ගණන් භික්ෂූන්ට: දනං දත්වා, දන් දී: රඤ්ඤො ච, රජතුමාට ද: පණ්ණාකාරං දත්වා, පඬුරු දී: තෙන, ඔහු විසින්: අනුග්ගහිතො, අනුග්‍රහ කරන ලදුව: නාගදීපං ගන්ත්වා, නාගදීපයට ගොස්: තත්‍ථ, එහි: භික්ඛූ, භික්ෂූන්ට: මහාදනං, දත්වා, මහ දන් දී: තතො නික්ඛමම, එතැනින් නික්මා: අරියගාල තිත්‍ථෙ, අරියගාල තීර්ථයෙහි: පටිවසති, වාසය කරයි.

21. තද, එකල්හි: සො, හෙතෙම: අත්තනො, තමාගේ: මාතුගාමං,

හායයීාව: ආමන්තෙත්වා, අමතා: භදෙද, සොඳුර! භිකඛු සඞ්ඝස්ස, භික්ෂු සඞ්ඝයාට: දන වට්ටං, දන් වැට: අනුපච්ඡින්දන්තී, කඩ නොකර: දෙහි, දෙව: අහං, මම: ගඞ්ගාය, ගඞ්ගාවෙහි: ඉතොචිතො, ඔබිනොබ: ඔරිම පාරිම තිරං, මෙතෙර සිට එතෙර ගොඩට: පාපෙන්තො, (මිනිසුන්) එගොඩ මෙගොඩ කරමින්: පුඤ්ඤං, පින්: පසවාමි ඉති, රැස් කරමියි: ඔවදිත්වා, අවවාද කොට: සයං, තෙමේ: මනුස්සෙ, මිනිසුන්: නාවාය, නැවෙන්: තීරං, එතෙරට: පාපෙන්තො, පමුණුවමින්: දිවසං, දවස: වීතිනාමෙති, ගෙවයි. තං අරියගාල තිත්ථෙ, ඒ අරියගාල තීර්ථයෙහි: නියුත්තත්තා, නියුක්ත බැවින්: තස්ස, ඔහුට: අරියගාල තිස්සො ඉති, අරියගාල තිස්ස යයි: නාමං අකංසු, නම් කළහ. එවං, මෙසේ: තං, ඔහු: තෙන පුඤ්ඤකම්මෙන, ඒ පින්කමින්: වීතිනාමෙන්තෙ, කල් යවන කල්හි: සක්කො, ශක්‍ර තෙමේ: තස්ස, ඔහුගේ: සද්ධාබලං, ශ්‍රද්ධාබලය: ජානන්තොපි, දන්නේ නමුදු: තං, ඔහු: විමංසිතු කාමො, විමසනු කැමැත්තේ: මහල්ලක බ්‍රාහ්මණ වණ්ණෙන, මහළු බමුණුවෙසකින්: ආගන්ත්වා, අවුත්: නාවාය, නැවෙහි: නිසීදි, හුන්නේය. අරියගාල තිස්සො, අරියගාල තිස්ස තෙමේ: තං ගහෙත්වා, ඔහු ගෙන: පාජෙන්තො, පදින්නේ: පරතීර සමීපං, පරතෙර සමීපයට: පාපුණි, පැමිණියේය. අථ, එකල්හි: බ්‍රාහ්මණො, බමුණා: භො, පින්වත! කත්තර යට්ඨිං, සැරයටිය: න සරිං ඉති, අමතකවීමියි: ආහ, කීයේය. සො, හෙතෙම: පුන, නැවත: පාජෙත්වා, පදවා, තං, එය: ගහෙත්වා, ගෙන: ආගඤ්ඡි, ආවේය. පුන, නැවත: පාදබ්භඤ්ජන තෙලනාලිං, පයෙහි ගාන තෙල් ගුලාව: න සරිං ඉති, අමතකවීමියි. වුත්තෙ, කී කල්හි: පුන, නැවත: ගන්ත්වා, ගොස්: තම්පි, එයද: ආනෙසි, ගෙනාවේය. එවං, මෙසේ: සො, හෙතෙම: යංයං වදති, යමක් යමක් කියයිද: තං තං ආහරන්තො, ඒ ඒ දේ ගෙන එමින්: මනං, සිත: නප්පදූසිත්වා, දූෂණය නොකොට: අපරාපරං, ඔබිනොබ: සංසරන්තො, සැරිසරන්නේ: සක්කො, ශක්‍ර තෙම: එවං, මෙසේ: තං, ඔහු: විමංසිත්වා, විමසා: තස්ස, ඔහුගේ: සද්ධාය, ශ්‍රද්ධාවගේ: නිච්චල භාවං, නිශ්චල බව: ඤත්වා, දැන: සන්තුට්ඨො, සතුටට පැමිණියේ: අත්තානං, ඒ ආත්මය: විජහිත්වා, අත්හැර: ආකාසෙ, අහසෙහි: අත්තනො, තමාගේ: සක්ක විලාසෙන, ශක්‍ර විලාසයෙන්: ඨත්වා, සිට: ඔවදිත්වා, අවවාද කොට: අරියගාල සමීපෙ, අරියගාල සමීපයෙහි: එකස්මිං සරෙ, එක් විලෙක්හි: බහු, බොහෝ: සයඤ්ජාත සාලි වීහයො, ස්වයං ජාත ඇල් වී මාපෙත්වා, මවා: සත්තරතනෙහි: සත්රුවනින්: තස්ස, ඔහුගේ: ඝරං, ගෙය: පූරෙත්වා, පුරවා: අප්පමාදෙන, ප්‍රමාද නොවන සේ: ඔවදිත්වා, අවවාද කොට: දෙව ලොකං එව, දෙව් ලොවටම: අගමාසි, ගියේය.

තතො, ඉක්බිති: අරියගාල තිස්සො, අරියගාල තිස්ස තෙමේ: හිරඤ්ඤ සුවණ්ණං, රන් අමු රන් ආදීය: ඝරං, ගෙට: ආවහන්තො, ගෙන එන්නේ: අනෙකවිධං, අනෙකවිධ වූ: දනාදි පුඤ්ඤං, දනාදි පින්කම්: කරොන්තො, කරමින්: තත්ථ, එව, එහිම: පටිවසති. වාසය කරයි.

අථ, ඉක්බිති; අපරභාගෙ, මෑත කාලයෙහි; පියඞ්ගු දීපවාසී, පියඟු දිවයින් වැසි; භික්ඛු සඞ්ඝා, භික්ෂු සංඝයා වහන්සේ; එකද, එක් කලෙක; එකතො සන්නිපතිත්වා, එක තැනකට රැස්ව; නිසින්නා, හුන්නාහු; එවං, මෙසේ; කථං, කථාවක්; සමුට්ඨාපෙසුං, ඉපිද වූහ. ඉදනි, දන්; දසයොජන සහස්සෙසු ජම්බුදීපෙසු, දස දහසක් යොදුන් දඹදිවෙහි; කත්‍ථ බො මනුස්සා, කවර තැනෙක්හි මනුෂ්‍යයෝ, සද්ධාවන්තා ඉති, ශ්‍රද්ධාවන්තයෝ ද? අථ, එකල්හි; තෙසං භික්ඛූනං අන්තරෙ, ඒ භික්ෂූන් අතරෙහි වූ; සති සම්බොධිත්‍ථෙරො, සති සම්බොධි ස්ථවිර තෙම; එතරහි, මේ කාලයෙහි; සීහලදීප වාසිනො, සිංහල ද්වීප වාසීහු; සද්ධා සම්පන්නා ඉති, ශ්‍රද්ධා සම්පන්නයෝ යයි; ආහ, කීය. යොනකරාජපුත්තො, යොනක රාජ පුත්‍රවූ; මහා බුද්ධරක්ඛිතත්‍ථෙරො, මහාබුද්ධරක්ඛිත ස්ථවිර තෙමේ; යොනක රට්ඨවාසිනො, යොන් රට වැස්සෝ; සද්ධාවන්තා ඉති, ශ්‍රද්ධාවන්තයෝ යයි; ආහ, කීය. තං සුත්වා, ඒ අසා; භික්ඛු සඞ්ඝා, භික්ෂු සඞ්ඝයා වහන්සේ; අජ්ජ එව, අද ම; තං කාරණං, ඒ කරුණ; විමංසිස්සාම ඉති, විමසන්නෙමුයි; තෙ ථෙරෙ එව, ඒ දෙදෙනා වහන්සේම; තං තං රට්ඨං, ඒ ඒ රටට; පෙසෙසුං; යැවූහ. තෙසු, ඔවුන් අතුරෙන්; බුද්ධරක්ඛිතත්‍ථෙරො, බුද්ධරක්ඛිත ස්ථවිරයන් වහන්සේ; උපකට්ඨාය වෙලාය, වේලාව සමීප වූ කල්හි; යොනක ලොකං, යොනක රටට; අගමාසි, ගියේය. සති සම්බොධිත්‍ථෙරො පන, සතිසම්බොධි ස්ථවිරයන් වහන්සේ වනාහි; ලඞ්කායං, ලඞ්කාවෙහි; අරියගාල තිස්සස්ස, අරියගාල තිස්සගේ; ගෙහද්වාරං, ගෙදෙරට; සම්පාපුණි, පැමිණියේය. තද කිර, එකල්හි වනාහි; අරියගාල තිස්සස්ස, අරියගාල තිස්සගේ; සුමනා නාම භරියා; සුමනා නම් භාර්‍යාව; සා, ඕ තොමෝ; ද්වාදසන්නං, භික්ඛු සහස්සානං, දෙළොස් දහසක් භික්ෂූන් වහන්සේට; දසසු වාරෙසු, දශ වාරයෙක් හි; දානං දත්වා, දන් දී; අත්තනො, තමන්ගේ; දානං, දානය ආවජ්ජමානා, සිහි කරන්නී; චූලල මඤ්චකෙ, කුඩා ඇඳක; නිසීදි, හුන්නීය.

22. මෙ, මා විසින්; අජ්ජ, අද; සුඛුමං, ඉතා සියුම් වූ; චීවරාදිකං, සිවුරු ආදිය ද; තථා, එසේම; සුඛ සම්ඵස්සං, ශරීරයට සුව පහසු දෙන; මඤ්චපීඨාදිකං, ඇඳ පුටු ආදිය ද යන; ඉදඤ්චිදඤ්ච බො; මේ මේ දෙය වනාහි; දින්නං, දෙන ලද්දේය.

23. මධුරෙහි, මිහිරි වූ; අන්න පානෙහි, ආහාර පානයන් ද; ඛජ්ජ භොජ්ජෙහි, ඛාද්‍ය භොජ්‍යයන් ද; මුඛවාසාදි, කට සුවඳ කරවන; තාම්බූල, බුලත් ආදීකොට ඇති; භෙසජ්ජෙහි ච, බෙහෙත් ද; සාධුකං මනා කොට; තප්පිතො, සන්තර්පණය කරන ලදි.

24. අහං, මම; සෙව, හෙට; ඉතො අධිකං, මීට වඩා; කථං, කෙසේ; (දනයක්) සම්පාදෙත්වාන, සම්පාදනය කොට ගෙන; සාධුකං, මනාකොට; දස්සාමි ඉති, දෙන්නෙමි දැයි; සා, ඕ තොමෝ; දසි ගණෙහි, දසි සමූහයා සමග; විචාරෙන්ති, කථා කරන්නී; අවජි, උන්නීය.

25. එවං, මෙසේ: නිසින්නා, හුන්නේ: සම්පත්තං, පැමිණි: ථෙරං, තෙරුන්: දිස්වා, දැක: කාලං ඔලොකෙත්වා, කල් බලා: ඉදනි: දැන්: භත්තං, බත්: පචිත්වා, පිස: දතුං, දෙන්ට: න සක්කා ඉති, නො හැකි යයි: තුරිත තුරිතා, වහ වහා: තෙල කපාලකං, තෙල් ඇතිලියක්: උඩානා, උදුනට: ආරොපෙත්වා, නගා: සුගන්ධ සප්පිං, සුවඳ ගිතෙල්: පක්කිපිත්වා, පහා: බිලඞ්ග භාජනෙ, කැඳ බත් භාජනයෙහි: සිත්ථං, බත් උළු: පරිස්සාවෙත්වා, පෙරා: ධොවිත්වා, සෝද: සප්පිහි හජ්ජිත්වා, ගිතෙලින් බැද: තත්ථ, එහි: චතුමධුරං, චතුමධුර: පක්කිපිත්වා, බහා: දිබ්බ භොජනං ඉව, දිව්‍යභොජනයක් මෙන්: පත්තං, පූරෙත්වා, පාත්‍රය පුරවා: වත්ථුචුම්බටකෙ, වස්ත්‍ර සුඹුලුවක් මත: ඨපෙත්වා, තබා: ථෙරස්ස, තෙරුන් වහන්සේට: උපනාමෙසි, පිළිගැන්වීය. ථෙරො, තෙරුන් වහන්සේ: තස්සා, ඇගේ: පසාද සංවඩ්ඪනත්ථාය, ප්‍රසාදය වැඩීම සඳහා: භගිනී, නැගණියනි! පත්තං, පාත්‍රය: ආකාසෙ, අහසෙහි: විස්සජ්ජෙහි ඉති, අත්හරින්නැයි; ආහ, කීය. සා, ඕතොමෝ: භයෙන, බියෙන්: න විස්සජ්ජෙසි, අත නො හැරියේය. ථෙරෙන, තෙරුන් වහන්සේ විසින්: තව, තොපගේ: සද්ධාගුණං, ශ්‍රද්ධා ගුණය: ආවජ්ජෙත්වා, ආවර්ජනා කොට: විස්සජ්ජෙහි ඉති, අත හරින්නැයි: වුත්තෙ, කී කල්හි: සා ඕ තොමෝ: තථා කත්වා, එසේ කොට; ආකාසෙ, අහසෙහි: පත්තං, පාත්‍රය, විස්සජ්ජෙසි, අතහැරියේය. ථෙරො, තෙරුන් වහන්සේ: ඉමං භත්තං, මේ බත: පරිභුඤ්ජනෙත භික්ඛූ, වළඳන භික්‍ෂූන් වහන්සේ: එසා, මෝ තොමෝ: පස්සතු'ති: දකීවායි: අධිට්ඨාය, අධිෂ්ඨාන කොට: බුද්ධරක්ඛිත ථෙරෙ, බුද්ධරක්ඛිත තෙරුන්: අනාගතෙ එව, නොපැමිණියදීම: පඨමං, පළමු කොට: ගන්ත්වා, ගොස්: භික්ඛූනං, භික්‍ෂූන්වහන්සේලාගේ: පත්තෙ, පාත්‍රයන්හි: පිණ්ඩපාතං දත්වා, පිණ්ඩපාතය දී: භොජෙසි, වැළඳවීය. සා, ඕ තොමෝ: භුඤ්ජනෙත, භික්ඛූ, වළඳන භික්‍ෂූන්: දිස්වා, දැක: උප්පන්න සොමනස්සා, හටගත් ප්‍රීතිය ඇත්තී: සාධුකාරං දෙන්ති, සාධුකාර දෙමින්: ගෙහං ගන්ත්වා, ගෙදරට ගොස්, සාමිකෙ ආගතෙ, සැමියා පැමිණි කල්හි: තස්ස, ඔහුට: අත්තනාව, තමා විසින් ද: ථෙරෙන ච, තෙරුන් විසින් ද: කතං, කරන ලද: සබ්බං, සියල්ල: කථෙසි, කීවේය. සො, හෙතෙම: තං සුත්වා, ඒ අසා: අතීව පසන්නො අහොසි, ඉතාම පැහැදුනේ විය. එවං, මෙසේ: අච්ඡරියාව හං, පුදුම එළවන: පුඤ්ඤ කම්මං, පින්කම්: උපචිනන්තො, රැස් කරමින්: අපරභාගෙ, මෑත භාගයෙහි: මරණ මඤ්චපරායනො අහොසි, මරණ මඤ්ච පරායන විය. තථාහි, ඒ එසේ මැයි: පුඤ්ඤවන්තානං, පින්වතුන්ට: මරණ වේදනා, මරණ වේදනාවක්: න හොති, නොවේ. සුත්තප්පබුද්ධො විය, නිඳ පිබිදියෙකු මෙන්: ඉච්ඡිතට්ඨානෙ, කැමැති තැනෙක්හි: නිබ්බත්තන්ති, උපදියි. තෙන, එහෙයින්: පොරාණා, පැරැණියෝ: ආහු, කීහ.

26. කත පුඤ්ඤො පන, කරන ලද පින් ඇති සත්වතෙම වනාහි: යදා, යම් කලෙක්හි: මච්චුවෙගෙන, මරණ වේගයෙන්: අද්දිතො, පෙළෙන්නේ: එජනෙත, සැලෙන්නේ: මාරණන්තිකෙ, මරණාසන්න කාලයෙහි: සයනෙ, (මරණ) මඤ්චකයෙහි: සයිතො හොති, හොත්තේ: වේද;

27. අස්ස, ඔහු විසින්: තම්හි සමයෙ, එසමයෙහි: යානි කල්‍යාණී, යම් කුශල ධර්මයක්: කතානි, කරන ලද්දේ ද: තානි හි, ඒ කුශල කර්මයෝ වනාහි: තම්හි සමයෙ, එසමයෙහි: අස්ස, ඔහුගේ: මානසං, සිත, අජෙඣා, ලම්බන්ති, එල්බ ගෙන සිටිත්.

28. තද, එකල්හි: සග්ගගාමිස්ස ජන්තුනො, ස්වර්ගගාමී සත්වයාට: අග්ග, අග්‍ර වූ: යාන, දිව්‍ය යහන් ද: විමානාදි, දිව්‍ය විමාන ආදිය ද: අනුකූලානි, ඊට අනුකූල වූ: ඉට්ඨ නිමිත්තානි, ඉෂ්ට නිමිති, දිස්සරෙ, දක්නා ලැබෙත්.

29. අච්ඡරාගණ, දිව්‍ය අප්සරා සමූහයා විසින්: සංඝුට්ඨෙ, නෘත්‍ය ගීතා දී ඝොෂා පවත්වන ලද; අච්ඡරාසත, සිය ගණන් දිව්‍ය අප්සරාවන් ගෙන්: මණ්ඩිතො, යුක්ත වූ: විමානෙ යානෙ, දිව්‍ය විමාන, දිව්‍ය යහන් (ආදිය); දිස්වාන, දැක: තස්ස, ඔහුට: උදග්ගතා, ඔදවැඩි බව හෙවත් සන්තෝෂය: හොති, වෙයි.

30. සො දයකො නරො, ඒ දයක මනුෂ්‍යතෙම: ජිණ්ණකං සාලං, දිරූ ශාලාවක්: වජිත්වා, හැර දමා: පාසාද, මහා ප්‍රාසාදයකට: ආරොහණෙ විය, නැගෙන කලක් මෙන්: පරමං, උතුම් වූ: අස්සාදං, සැනසීම: ලභතෙ, ලබන්නේය.

31. වත, ඒකාන්තයෙන්: මයා, මා විසින්: කල්‍යාණං, කුශලය: සුකතං, මනාව කරන ලදී. භීරුත්තාණං, මරණයට නොබනා තරම් අභයස්ථානයක්: කතං, කරන ලදී. සග්ගෙ, දිව්‍ය ලොකයෙහි: කුසලජං, කුශලයෙන් උපන්නා වූ: උළාරං, මහත් වූ: ඵලං, විපාකය: අනුභොස්සාමි, අනුභව කරන්නෙමි.

32. ඉති, මෙසේ: සො, ඒ කුශල් කළ සත්ව තෙම: සකෙන පුඤ්ඤකම්මෙන, ස්වකීය පුණ්‍ය කර්මයෙන්: සම්පහට්ඨොව, තුටු පහටුවන ලද්දේම; අභීතො, භය නොවූයේ: සම්පමොදිතො, මනාව ප්‍රමුදිත වූයේ: අච්ජන්තං, අතිශයින්ම: උපලාළිතො, තලවන ලද්දේය.

33. පණ්ඩිතො, පණ්ඩිත තෙම: පුඤ්ඤකම්මරතාවාසං, පින් කිරීමෙහි ඇළුනවුන්ට වාසස්ථාන වූ: සග්ගං, දිව්‍ය ලොකයට: නීය්‍යාති, පමුණුවයි. අමූළ්හ, මුළා නොවූ: මරණං, මරණය ද: පුඤ්ඤකම්මිනො, කුසල් කළා වූ: තස්ස, ඔහුට නියතං, ඒකාන්තය.

34. එවං, මෙසේ: නිපතනස්ස, හොත්තා වූ: තස්ස, ඔහුට: දෙවතා පි, දෙවියෝ ද: ඡදෙව ලොකතො, සදෙව් ලොවින්: ඡ රථෙ, රිය සයක්: අනෙත්වා, ගෙනවුත්: අත්තනො අත්තනො දෙවලොකං, තම තමන්ගේ දිව්‍ය ලෝකය: වණ්ණෙසුං, වර්ණනා කළහ. සො, හෙතෙම: තං සුත්වා, ඒ අසා, සද්ධම්මස්ස සුත පුබ්බත්තා, බණින් ඇසූ පිරූ බැවින් තුසිත පුරතො, තුසිත දිව්‍ය ලෝකයෙන්: ආහට, ගෙන ආ: රථං, රිය: ඨපෙත්වා, තබා: ඉතරෙ, සෙසු රිය: ගහෙත්වා, ගෙන: ගච්ඡථ ඉති, යව් යයි: ආහ,

කීවේය. තං සුත්වා, ඒ අසා: තස්ස, ඔහුගේ: ආසනෙන, සමීපයෙහි: ඨිතා, සිටියාවූ: සුමනා, සුමනා තොමෝ: සාමි, ස්වාමීනි! කිං, කිමෙක්ද: එත්තකං, මෙපමණ: කුසලං කත්වා, කුසල් කොට: ඉති, මෙසේ: මරණාසනෙන, මරණාසන්න කාලයෙහි: විලාපං, විලාප: කරොහි, කරහිද: තිස්සො, තිස්සතෙමේ: තං සුත්වා, ඒ අසා: භද්දෙ, සොඳුර! අහං, මම: විලාපංන කරොමි, විලාපනොකරමි: දෙවලොකෙ, දිව්‍ය ලෝකයෙහි: දෙවතා, දෙවතාවෝ: ඡරථෙ, රියසයක්: ආනෙසුං, ගෙන ආහ. අහං, මම: තෙහි සද්ධිං, ඔවුන් සමග: සල්ලපාමීති, කථා කෙළෙමියි: ආහ, කීවේය. සුමනං, සුමනා: තං සුත්වා, ඒ අසා: අහං, මම: තං, ඒ රිය: නපස්සාමි, නො දකිමි: කුහි ඉති, කොහිදැයි: පුච්ඡිතො, විචාරන ලද්දී: පුප්ඵදමං, මල් දමක්: ආහරා පෙත්වා, ගෙන්වාගෙන: ආකාසෙ, අහසට: ඛිපාපෙසි, දැම්ම වීය. තං ගන්ත්වා, ඒ මල් දම ගොස්: රථ සීසෙ, රිය හිසෙහි: ඔලම්බි, එල්බුණේය. තං දිස්වා: ඒ දැක: සුමනා, සුමනා තොමෝ: සයං, තමා: ගබ්භං, කාමරයට: පවිසිත්වා, පිවිස: සයනගතා, ශයනගතව: නාසිකා වාතං, නාසික වාතය: සන්නිරුම්භිත්වා, හිර කොට: කාලකතා, කළුරිය කොට: සාමිකස්ස, සැමියාට: පඨමතරං, ගන්ත්වා, පළමුව ගොස්: රථෙ, රියෙහි: පාතුරහොසි, පහළ වූවාය. සා, ඕ තොමෝ: තප්ඨිතා, එහිසිට: සාමිකස්ස, සැමියාට: සාසනං, හසුනක්: පෙසෙන්ති, එවන්නී: එවං, මෙසේ: ආහ, කීවාය.

35. කිං, කුමක් නිසා: චිරායසි, කල් යවන්නෙහිද: කිමි කුලාලයං, පණුවන්ට වාසස්ථාන වූ: අසුචිං, අපිරිසිදු වූ: පූති දෙහං, කුණු ශරීරය: නිස්සාරෙ, නිසරු වූ: තත්‍ථ එව මානුසෙ භාවෙ, ඒ මනුෂ්‍ය භවයම: ජහිත්වා, හැරපියා:-

එත්‍ථ, මෙහි: ආසු, වහා: ආගච්ඡථ, එනු මැනව: වරං, උතුම් වූ: ඉදං දෙව සිරිං, මේ දිව්‍ය ඓශ්වර්‍ය්‍යය: පස්ස, බැලුව මැනව: අහං, මම: පුරෙයෙව, පළමු කොටම: ආගතා, ආයේ වෙමි: හො, පින්වත් හිමියනි: ඉදනි, දැන්: තුසිතං, තුසිත දිව්‍ය ලොකයට: යාම (එක්ව) යමු.

36. තං සුත්වා, ඒ අසා: සො'පි, තෙමේ ද: කාල කිරියං කත්වා, කළුරිය කොට: තස්මිං එව රථෙ, එම රියෙහිම: නිබ්බත්ති, උපන්නේය. තෙ උභො'පි, ඔවුහු දෙදෙනාම: සමග්ගා, සමගිව: සමොමොදමානා, සතුටු සිත් ඇත්තාහු: දෙව පරිසාය, දිව්‍ය පිරිස විසින්: පරිවුතා, පිරිවරන ලද්දේ: මහාජනෙ, මහජනයා: ඔලොකෙන්තෙ එව, බලා සිටිද්දීම: තුසිත පුරං, තුසිත දිව්‍ය ලොකයට: අගමංසු, ගියාහුය.

37. ධීමතානං, නුවණැත්තන්ගේ: පරමං, උතුම් වූ: එතං චරිතං, මේ චරිත: විදිත්වා, දැනගෙන: දිවි මනුජ සුඛං වා, දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා: නිබ්බුතිං, නිර්වාණ සම්පත්තියද: පත්‍ථයන්තා, ප්‍රාර්ථනා කරන්නාහු: විමල සීලෙ, පිරිසිදු සිල් ඇති: බුද්ධ පුත්තෙසු, බුද්ධ පුත්‍රයන් කෙරෙහි: දනං, දනය: දදථ, දෙව්: හො, පින්වත්නි! සුරතරු සදිසං, දිව්‍යකල්ප වෘක්ෂයක්

සමාන වූ: (ඒ දනය) ආ භවගගං, භවාග්‍රය දක්වා: කාම දං ඉති, කැමැති සම්පත් සාද දෙන්නේය.

**අරියගාල තිස්සස්ස වත්ථුං, අරියගාල තිස්සගේ කථාව: ජටඨං, සවැන්නයි.**

## 7. ගම් දැරියගේ කථාව.

**(6) 7 ගාමදරිකාය, ගම් දැරියගේ: වත්ථුම්හි, වස්තුවෙහි: අයං, මෝ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

ලඞ්කායං කිර, ලංකාවෙහි වනාහි: දක්ඛිණ පසෙස, (අනුරාධපුරයට) දකුණු දිග්භාගයෙහි: බ්‍රහම චොලං නාම ගාමං, බ්‍රහ්මචොල නම් ගමක්: අහොසි, විය. තත්‍ථ, එහි: මනුස්සා, මිනිස්සු: මහන්තං වත්‍ථුං, විසාල බිම් පෙදෙසක්: කසිත්වා, හාලා, තත්‍ථ, එහි: මාසෙ, මෑ ඇට: වපිංසු, වැපුරූහ. තතො, ඉක්බිති: තෙ, ඔවුහු: මාසෙ, මෑ: පක්ක කාලෙ, පැසුණු කල්හි: මසෙ, මෑ: ලුඤ්චිස්සාම ඉති, උදුරමු යි: පානීයං, පැන්: ගහෙත්වා, ගෙන:මහා නිදසෙ වත්තමානෙ, මහා ග්‍රීෂ්මය පවතින කල්හි: තත්‍ථ, එහි: අගමංසු, ගියාහුය. තස්මිං සමයෙ, ඒ කාලයෙහි: එකොගාම වාසික භික්ඛු, එක් ගම් වැසි භික්ෂුවක්: පිපාසාභිභූතො, පිපාසයෙන් මඩනා ලද්දේ: මනුස්සානං, මිනිසුන්ගේ: සන්තිකං, සමීපයට: අගමාසි, ගියේය. එත්‍ථ, මෙහිදී: පානීයං, පැන්: ලභිස්සාමි ඉති, ලබන්නෙමි: යනුයි. තද, එකල්හි: එකාගාම දරිකා, එක් ගම් දැරියක්: කිලන්තින්ද්‍රියං, ක්ලාන්ත ඉන්ද්‍රිය ඇති: පිපාසාභිභූතං, පිපාසයෙන් මඩනා ලද: භික්ඛුං, භික්ෂුව: දිස්වා, දැක: උපපන්න සද්ධා: උපන් සැදැහැත්තී: මනුස්සානං, මිනිසුන්ට: අජානාපෙත්වා, නොදන්වා: ඝටෙ, කළයෙහි: ඨපිතං, තුබූ: පානීයං, පැන්: ගහෙත්වා, ගෙන: තස්ස, භික්ඛුනො, ඒ භික්ෂුවට: දත්වා, දී: තත්‍ථ, එහි: අත්තමනා, සතුටින්: චිත්තං, පසාදෙත්වා, සිත පහදවා: ගවජනතං ථෙරං, යන තෙරුන්: වන්දමානා, වදිමින්: අට්ඨාසි, සිටියේය. අථ, අනතුරුව: මාසෙ ලුඤ්චන්තා, මෑ උදුරන්නෝ: ආගමම, අවුත්: ඝටෙ, කළයෙහි: පානීයං, පැන්: අදිස්වා, නොදැක: පානීයං, පැන්: කෙන, කවරෙකු විසින්: ගහිතං ඉති, ගන්නා ලදදැයි: පුච්ඡිංසු, විචාළහ. සා, ඕ තොමෝ: සාමි, ස්වාමීනි! මයා, මා විසින්: ගහෙත්වා, ගෙන: පිපාසිතස්ස, පිපාසිත වූ: එකස්ස භික්ඛුනො, එක් භික්ෂුවකට: දින්නං ඉති, දෙන ලදැයි: ආහ, කීවාය. තද, එකල්හි: මනුස්සා, මිනිස්සු: තං සුත්වා, ඒ අසා: පිපාසිතානං, පිපාසිත වූ: නො, අපට: පාතුං, බොන්ට: ආනීතං, ගෙන එන ලද: පානීයං, පැන්: අමෙහ, අපට: අජානාපෙත්වා, නොදන්වා: භික්ඛු සඞ්ඝස්ස, භික්ෂු සඞ්ඝයා වහන්සේට: සයං, තමා: අදසි, දුන්නාය. එතිස්සා සද්ධා, මැගේ ශ්‍රද්ධාව: අහො, පුදුමයි: පරිභවිත්වා, අපහාස කොට: කුද්ධා,

කිපියාහු: මයං, අපි: වාතාතපෙහි, සුළඟින් අව්වෙන්: සුසසනතා, වෙළෙන්නමෝ: මාසෙ, මෑ: ලුඤඣනතා, උදුරන්නාහු: පිපාසිතමහ, පිපාසිත වෙමු. සීසං, වහා: නො, අපට: පානීයං, පැන්: ආහර ඉති, ගෙන එවයි: තාය සද්ධිං, ඇය සමග: කලහං, කලහ: අකංසු, කළහ. අථ, එකල්හි: සා, ඕ තොමෝ: තෙසං, ඔවුන්: අක්කොසන්තෙපි, ආක්‍රොශ කරද්දී ද: පරිභාසන්තෙපි, පරිභව කරද්දී ද: අසංකුද්ධා, නොකිපෙන්නී: දාන සොමනස්සං, දන් දීමෙන් ඇති වූ සතුට: මනසිකරොනති, මෙනෙහි කරන්නී: ඝටං ගහෙත්වා, කළය ගෙන: තෙසං, ඔවුන්ට: පානීයං, පැන්: ආහරිස්සාමි ඉති, ගෙන එන්නෙමියි: ධීතා, සිට: අත්තනො, තමාගේ: සඞ්ං, ශ්‍රද්ධාව: ආවජ්ජෙත්වා, සිහි කොට: මාසකෙඛත්තං, මෑ කෙත දෙස: ඔලොකෙසි, බැලීය. තස්සා, ඇගේ: සද්ධා බලං ආගමම, ශ්‍රද්ධා බල හේතුවෙන්: මහා පඨවිං, මහ පොළොව: භින්දිත්වා, බිඳ ගෙන: මණි වණ්ණං, මැණික් වැනි: මහනතං, උදක බුබ්බුලං, මහා දිය බුබුලක්: උට්ඨාය, නැග: පඨවියං, පොළොවෙහි: පත්ථරිත්වා, පැතිරී: පවත්ති, පැවතුනේය. තස්සා, ඇගේ: සඩ්ා මහනතතා, ශ්‍රද්ධාවේ මහත් බව: අහො, පුදුමයි: භිකඛුස්ස, භික්ෂුවකට: පානීය මත්තං, පැන් ටිකක්: දත්වා, දී: තදහ එව, එදිනම: අකඛයං, ක්ෂය නොවන්නාවූ: පානීයං, පැන්: ලභි, ලැබීය. භවනෙතාථ, එහෙයින් කියන ලදි.

2. දානස්ස, දන් දීමට: සඩ්ා, ශ්‍රද්ධාවම: මූලං, මුල්වේ. තිසමපදං, ත්‍රිවිධ සමපත්තියට: සඩා මූලා, ශ්‍රද්ධාවම මුල් වන්නීය. සධෙන, ශ්‍රද්ධාව කරණකොට ගෙන: කතං, කරන ලද: අප්පම්පි, ස්වල්පවූ ද: දානං, දානය: අකාලිකං හොති, කල් නොයවා විපාක දෙන්නේය.

3. දානං, දානය: සගගස්ස, ස්වර්ගයට: නිදානං, හේතුවයි. අනුගාමිකං, අනුගාමීක වූ: නිධානං, නිධානයකි. සබ්බලොකවසීකරණං, සියළු ලෝකය වසී කරන්නා වූ: මනතං, මන්ත්‍රයකි. තං, ඒ දානය: පරමොසධං, උතුම් ඖෂධයක් සමාන වේ.

4. තං, ඒ දානය: ආපදාසු, විපතක් පැමිණි කල්හි: සහායො, මිත්‍රයෙකු හා සමානය. කාමදෙ, කැමති වස්තුව දෙන්නා වූ: උත්තමොමණි, උතුම් සිතුමිණි රුවනකි. දානං, දානය: කාමං, ඒකාන්තයෙන්: සුරපාදපො, දිව්‍ය කල්ප වෘක්ෂයක් වැනිය.

5. එසා කුමාරිකා, මේ ගම් දැරිය: සඩ්ාය, ශ්‍රද්ධාවෙන්: පානීය මත්තං, පැන් මාත්‍රයක්: දත්වාන, දී: සා, ඕ තොමෝ: මුහුත්තෙන එව, එම ඇසිල්ලෙහිම: අකඛයං, ක්ෂය නොවන්නාවූ: සීතලොදකං, සිසිල් දිය: අලත්ථ, ලද්දීය.

6. උත්තමාධම මජ්ඣිමෙ, උත්තම, අධම, මධ්‍යම යන සියල්ලන් කෙරෙහි: සදා, සෑම කල්හි: දානං, දානය: දාතබ්බංහි, දිය යුත්තේය: ආදී මජ්ඣාව සානමහි, ආදි, මධ්‍ය අවසානයෙහි: සඞ්ංව, ශ්‍රද්ධාවම: පුරතො කරෙ, පෙරදැරි කරන්නේය.

7. තතො, ඉක්බිති: සා කුමාරිකා, ඒ කුමාරිකා තොමෝ: සන්දමාන උදකං දිස්වා: ගලන දිය දැක: තුට්ඨමානසා, සතුටු සිත් ඇත්තී: යථා කාමං, කැමැති පරිදි: නහාත්වා, නා: පානීයං, පැන්: පිවිත්වා, බී: එකං පානීය ඝටං ආදය, එක වතුර කළයක් ගෙන: පිපාසිතානං මනුස්සානං, පිපාසිත මිනිසුන්ට: පානීයං, පැන්: අදසි: දුන්නීය. තම්පන, එය ද: තථාවිධම්පි උදකක්ඛන්ධං, එබඳු වූ ද දිය කඳක්: අඤ්ඤෙ, අන්‍යයෝ: න පස්සන්ති, නොදකිති. එසා එව, ඕ තොමෝම: පස්සති, දකියි. තස්මා, එහෙයින්: සා, ඕ තොමෝ: පුනප්පුනං, නැවත නැවත: තත්‍ථ, එහි: ගන්ත්වා, ගොස්: නහායති, නාන්නීය, පානීයං, පැන්: පිබති. බොන්නීය. ඝටෙන, කළයෙන්: උදකං ආහරිත්වා, දිය ගෙනවුත්: මනුස්සානං, මිනිසුන්ට: දෙති, දෙන්නීය.

තං දිස්වා, ඒ දැක: මනුස්සා, මිනිස්සු: නො, අපි: පුබ්බෙ, පෙර: එත්‍ථ, මෙහි: පානීයං, පැන්: න දිට්ඨං, නොදුටුම්හ. අම්ම, මැණියනි: කුතො, කොහෙන්: ත්වං, තී: සිනාන පානං, නා පැන් බීම: කරොසි, කරහි ද: අම්හාකංපි, අපටත්: තං, එය: දස්සෙහි ඉති, දක්වවයි. යාචිංසු, යාඥා කළහ. සා, ඕ තොමෝ: තෙසං, ඔවුන්ගේ: තං කථං සුත්වා, ඒ කථාව අසා: මුදිත මනා, සතුටු සිතැත්තී: සචෙ, ඉදින්: ඉමං උදකං, මේ ජලය: මම පුඤ්ඤානුභාවෙන, මගේ පුණ්‍යානුභාවයෙන්: නිබ්බත්තං, උපන්නේය. තං, එය: සබ්බෙසං මනුස්සානං ච, සියළු මිනිසුන්ගේ ද: මිගසූකර විහඞ්ග ආදිනඤ්ච, මුව, ඌරු කුරුළු ආදීන්ගේ ද: පරිභොග යුත්තං හුත්වා, පරිභොගයට සුදුසුවී: පඤ්ඤායතු ඉති, පෙනේවායි, අධිට්ඨාසි, අධිෂ්ඨාන කළාය. තං ඛණෙ එව, එකෙණෙහිම: අස්සා, ඇයගේ: සද්ධාබලෙන, ශ්‍රද්ධාබලයෙන්: තං, එය: වූයහමාන ඵෙනාවලී, පාවෙන පෙන සමූහයෙන් ද: හඞ්ගමාන තුඞ්ග තරඞ්ගමාලා, බිඳී බිඳී නැගෙන තරඞ්ගමාලාවෙන් ද: විකිණ්ණ ජල කණිකා කිණ්ණ, විසිර පවත්නා ජලකර්ණාවෙන් ආකීර්ණ වූ: සමභින්න ජලවෙග ජනිත, බිඳි බිඳි යන ජල වේගයෙන් හටගත්: නිග්ඝොස ඝොසිතං, මහා ඝොෂාවෙන් ඝොෂිත වූ: සන්දමානං, ගලාබසින්නාවූ: මහන්තං, උදකක්ඛන්ධං, මහදිය කඳ: දිස්වා, දැක: අච්ඡරියබ්භූත චිත්තා, ආශ්චර්‍ය්‍ය අද්භූත සිත් ඇත්තාහු: ඉමිස්සා පන දනානිසංසා, මැයගේ දනානිශංසය වනාහි: අහො, පුදුමයි; එසා, මැය: සක්කච්චං, සකසා: සීලවන්තෙසු, සිල්වතුන් කෙරෙහි: පතිට්ඨාපෙසි ඉති, පිහිටුවී යයි: තං, ඇයට: පසංසන්තා, ප්‍රශංසා කරන්නාහු: නහාත්වා, නා: පානීයං පිවිත්වා, පැන් බී: අගමංසු ගියහ.

අථ, ඉක්බිති: අපරභාගෙ, මෑත භාගයෙහි: තත්‍ථ, එහි: මනුස්සා, මිනිස්සු: ගාමං, ගමක්: නිවෙසෙසුං, පිහිටුවා ගත්හ. තස්ස, එයට: මාස පිට්ඨිගාමං ඉති, මාපිටිගම යයි: නාමං අහොසි, නම් වීය. පච්ඡා, පසුව: තං එව උදකං නිස්සාය, ඒ ජලයම ආශ්‍රය කරගෙන: තත්‍ථ, එහි: මහන්තං විහාරං, මහා විහාරයක්: කාරෙසුං, කරවූහ.

සා පන කුමාරිකා, ඒ කුමාරිකා තොමෝ වනාහි: යාවතායුකං

ඨත්වා, ආයු ඇතිතාක් සිට: පුඤ්ඤකම්මං කත්වා, පින්කම් කොට: දෙවලොකෙ, දෙව්ලොව: නිබ්බත්ති, උපන්නීය. තත්‍ථ, එහිදී: සා, ඕතොමෝ: නානාතරු සණ්ඩ මණ්ඩිත, නොයෙක් ගස් සමූහයෙන් සැරසුණු: උය්‍යානං ච, උයන් ද: විභූසිත, බබළන: පඤ්චවණ්ණ, පස්පැ: පදුම සඤ්ජන්නං, පියුමෙන් යුක්ත වූ: මධුරොදක සම්පුණ්ණං, මිහිරි දියෙන් පිරී ගිය: ජලාලය සමාකුලං, ජලාසයන්ගෙන් ගැවසුණු: නෙකච්ඡරා සහස්‍ස, නොයෙක් අප්සරා දහසක් විසින්: සංපවාදිත, මනාව වාදනය කරන ලද: භෙරි තුරියනාද සමාකුලං, බෙර තුර්යනාදයන්ගෙන් ගැවසී ගත්: නච්චන්තා, නටන්නා වූ: අනන්ත දෙව නාටිකා කිණ්ණං, නොයෙක් දිව්‍ය නාටිකාඞ්ගනාවන්ගෙන් ගැවසුණු: ද්වාදසයොජනිකං, දෙළොස් යොදුන්: දෙව විමානං, දෙව් විමනක්: නිබ්බත්ති, උපන්නේය. තස්සා, ඇගේ: පුඤ්ඤං, පින: පකාසනත්‍ථං, ප්‍රකාශ කරනු පිණිස: දිබ්බොදක පරිපුණ්ණං, දිව පැනින් පිරි: එකං, සුවණ්ණ ඝටං, එක් රන් කළයක්: තත්‍ථ එව, එහිම: නිබ්බත්ති, පහළ විය. තං පන, එය වනාහි: අස්සා, ඇය: ගත ගතට්ඨානං, යන යන තැනට: ගච්ඡති, යයි. ද්වීසු පි දෙව ලොකෙසු, දෙදෙව් ලොවෙහි: දෙවතානං, දෙවියන්: පරිභුඤ්ජනෙසු, පරිභොග කරන කල්හි ද: අක්ඛයං අහොසි, ක්‍ෂය නොවීය.

8. එවං, මෙසේ: සුජනා, සත්පුරුෂ ජනයෝ: ආපදනං, පැන්දීම: සද්ධාය, ශ්‍රද්ධාවෙන්: දත්වාන දී: මහා විභූතිං, මහත් ශ්‍රී විභූතිය: විඳන්ති, විඳිත්. බහු දයකස්‍ස, බොහෝ කොට දෙන්නහුගේ: (සම්පත්තිය) අබුද්ධ, බුදු නොවූ: කො සත්තො, කවර සත්වයෙක්: අසෙසයිත්වා, නිරවශෙෂ කොට: වත්තුං, කියන්ට: සක්කොති, හැකි වන්නේද? (නොහැක්කේමැයි).

**ගාමදාරිකාය වත්‍ථුං, ගම්දැරියගේ කථාව: සත්තමං, සත්වැන්නයි.**

## 8. ධම්මාවගේ කථාව.

**(6) 8. ධම්මාය වත්‍ථුම්හි, ධම්මාවගේ වස්තුවෙහි: අයං, මෝ: ආනුපුබ්බී කථා, පිළිවෙළ කථාවයි.**

1. සීහල දීපෙ, සිංහල දීපයෙහි: ලජ්ජිතිස්ස මහරාජෙ, ලජ්ජිතිස්ස මහ රජතුමා: රජ්ජං කාරෙන්තෙ, රාජ්‍යය කරවන කල්හි: රොහණ ජනපදෙ; රුහුණු ජනපදයෙහි: ගිරිතිම්බිල තිස්ස පබ්බත මහා විහාරවාසීනං, ගිරිතිම්බිල තිස්ස පර්වත මහාවිහාරවාසී භික්‍ෂූන් වහන්සේ: භික්ඛාචාරට්ඨානෙ, පිඩු පිණිස හැසිරෙන තැන: සිවං නාම ගාමං අහොසි, ශිව නම් ගමක් විය. තත්‍ථ එහි: එකා කපණා ධම්මානාම මාතුගාමො, එක් දිළිඳු ධම්මා නම් ස්ත්‍රියක්: පරෙසං, අනුන්ට: දරුපණ්ණාදකාදිනි, දරකොළ පැන් ආදිය: ආහරන්තී, ගෙනෙමින්, වීහයො, වී: කොටෙන්ති, කොටමින්: පලාලං, පිදුරු: වාලෙන්තී, සලමින්: බලං පුනන්ති, ගොයම් පාගන තැන්

පිරිසිදු කරමින්; කිච්ඡෙන කසිරෙන, ඉතා දුකින්; ජීවිකං, ජීවිකාව; කප්පෙනති, කරමින්; පටිවසති, වාසය කරයි. සා, ඕ තොමෝ; අපරභාගෙ, මෑත භාගයෙහි; හතියා කම්මං, කත්වා, බැලමෙහෙ කොට; දුක්ඛෙන, දුකසේ; එකං වත්ථං, එක වස්ත්‍රයක්; උප්පාදෙත්වා, උපදවා; එවං, මෙසේ; චින්තෙසි, සිතී, තථාහි, ඒ එසේමැයි:-

2. රාගා නලෙන, රාග නැමැති ගින්නෙන්; සංදඩ්ඪා, දවන ලද්දී; දෙස රක්ඛස, ද්වෙෂ නැමැති රාක්ෂයා විසින්; පීළිතා, පීඩා කරනු ලබන්නී; මොහෙන, මෝහයෙන්; මුච්ජිතා හුත්වා, මූඪව; චිරං, බොහෝ කාලයක් මුළුල්ලෙහි; සංසාරෙ, සංසාරයෙහි; සංසරිං, සැරිසැරුයෙමි.

3. ආයතිකා රණං, මතු සැප ලැබීමට කාරණ වූ; කිඤ්චි පුඤ්ඤං, කිසි පිනක්; පුරෙ, පෙර; නාකතංනු, නොකෙළෙම් දෝ; මයා, මා විසින්; අප්පභොගස්ස කාරණං, අල්ප භොගයට කාරණ වූ; පාපං, පවක්; නූන, ඒකාන්තයෙන්; කතං, කරන ලදි.

4. තස්මා, එහෙයින්; අහං, මම; පරගෙහෙසු, අනුන්ගේ ගෙවල්හි; හතිං කත්වාන, බැල මෙහෙකොට; කිච්ඡතො, දුකින්; ජීවිස්සාමි, ජීවත්වන්නෙමි. මය්හං, මට; සුඛං, සැපයක් නම්; නහතො, අහසින්; පඨවි, පොළොව; යථා, යම්සේ ද එමෙනි.

5. ඉදානි, දැන්; අයං, මේ; බුද්ධුප්පාදෙ, බුද්ධොත්පාද කාලය වේ. ධම්මො, ධර්මය; ලොකෙ, ලෝකයෙහි; සුදිප්පති, මනාව බබලයි. ලොකස්මිං, ලොකයෙහි; ගුණ සාගරා, ගුණ සාගර වූ; බුද්ධ පුත්තාච, බුද්ධපුත්‍රයෝ ද; වත්තනති, පවතිත්.

මයා, මා විසින්; කාමං, ඒකාන්තයෙන්; ඛණෙ, ක්ෂණ සම්පත්තිය; ලද්ධො, ලබන ලදි. ඉදානි, දැන්; අත්තං, මගේ ආත්මය; න උද්ධරෙ, ගොඩනගා ගත නොහැකි වූයේ නම්, සංසාරෙසු, සංසාර නැමති මහා සාගරයෙහි; නිමුග්ගා, ගැළුනා වූ; අහං, මම; කද, කවර කලෙක්හි; සීසං, හිස; සමුක්ඛිපෙ, ඔසවාගතහෙම් ද;

7. දුක්ඛෙන, දුකින්; උප්පාදිතං, උපදවා ගන්නා ලද; මම, මාගේ; එකං සාටකං, එක් වස්ත්‍රයක්; විජ්ජති, ඇත්තේය. භව සාගරෙ, සංසාර නැමැති සාගරයෙහි; පතිට්ඨං, පිහිට; තෙන, ඒ වස්ත්‍රය කරණකොට ගෙන; ඉදානි, දැන්; කරිස්සාමි, කරන්නෙමි.

8. සා ධම්මා, ඒ ධර්‍මා තොමෝ; ඉති චින්තිය, මෙසේ සිතා; දානස්ස, දානයාගේ; මහප්ඵලං, මහත් විපාකය; සද්දහන්තී, අදහන්නී; සද්ධාය, සැදැහැයෙන්; සඞ්ඝං උද්දිස්ස, සඞ්ඝයා උදෙසා; තද, එකල්හි තං, ඒ වස්ත්‍රය; අද, දුන්නීය.

9. තද, එකල්හි; ගිරිතිම්බිල තිස්ස පබ්බත විහාරෙ, ගිරිතිම්බිල තිස්ස පර්වත විහාරයෙහි; පඤ්චසතා භික්ඛු, පන්සියයක් භික්ෂූහු; වස්සං,

උපගමිංසු, එළඹුනහ. තතො, එතැන් සිට; භික්ඛූ, භික්ෂූහු; සිවගාමං, ශිව ගමට; භික්ඛාචාරත්ථාය, පිඬු පිණිස; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; උපගච්ඡන්ති, එළඹෙත්. තදා, එකල්හි; සා, ඕතොමෝ; උප්පන්න සද්ධං, උපන් ශ්‍රද්ධාව; අහාපෙත්වා, නොපිරිහෙළා; වත්ථං, වස්ත්‍රය; ගහෙත්වා, ගෙන; ආසන සාලං ගන්ත්වා, ආසන ශාලාවට ගොස්; එකස්ස භික්ඛුස්ස, එක් භික්ෂුවකට; එවං, මෙසේ; ආහ, කීවාය. භන්තෙ, ස්වාමීනි! ඉමං වත්ථං, මේ වස්ත්‍රය; එකස්මිං විහාරෙ, එක විහාරයක; භික්ඛූනං, භික්ෂූන් වහන්සේට; වස්සා වාසිකං, කත්වා, වස් වාසික කොට; දස්සාමි, දෙන්නෙමි. තුම්හෙ, ඔබ වහන්සේ; තත්ථ, එහි; ගන්ත්වා, ගොස්; මම දුග්ගත භාවං ච, මගේ දුප්පත්කමත්; ඉදං ච සාටකං, මේ සළුව ද; දුක්ඛෙන, දුකින්; උප්පාදිත භාවං ච, උපදවා ගත් බව ද; භික්ඛූනං, භික්ෂූන්ට; වත්වා, කියා; දෙථ, ඉති, දෙන්නැයි; තස්ස, උන්වහන්සේට; වත්ථං, වස්ත්‍රය; දත්වා, දී; පරිපුණ්ණ සොමනස්සා, සොම්නසින් පින පිනා; අගමාසි, ගියාය. තතො, ඉක්බිති; සො, උන්වහන්සේ; තං, වත්ථං, ඒ වස්ත්‍රය; ගහෙත්වා, ගෙන; විහාරං ගන්ත්වා, විහාරයට ගොස්; සන්නිපතිතාන භික්ඛූනං, රැස් වූ භික්ෂූන් වහන්සේට; තාය, ඇය විසින්; වුත්ත වචනං, කියූ වචනය; වත්වා, කියා; භන්තෙ, ස්වාමීනි! ඉමං වත්ථං, වස්ත්‍රය; අදාසි, දුන්නේය. තං සුත්වා, ඒ අසා; තෙසං අන්තරෙ, ඒ භික්ෂූන් අතරින්; එකො භික්ඛු, එක් භික්ෂුවක්; භන්තෙ, ස්වාමීනි! මය්හං, මට; තිණ්ණං මාසානං, තුන් මසකට; දෙථ, දෙන්න; අහං, මම; තං, එය; පරිදහිස්සාමි ඉති, අඳින්නෙමියි; ආහ, කීවේය. තං සුත්වා, ඒ අසා; අපරො, අනික් භික්ෂුවක්; මය්හං, මට; ද්වින්නං, මාසානං, මාස දෙකකට; දෙථ, දෙනු මැනව; එකො, එක් භික්ෂුවක්; මය්හං, මට; මාසස්ස, මසකට; පක්ඛස්ස, පසළොස් දවසකට; දසාහස්ස, දස දවසකට; පඤ්චාහස්ස ඉති, පස් දවසකට යයි; එවං, මෙසේ; කාලං හාපෙත්වා, කාලය අඩුකොට; කමෙන, ක්‍රමයෙන්; එකො, එක් භික්ෂුවක්; භන්තෙ, ස්වාමීනි! මය්හං, මට; එකාහස්ස, එක දවසකට; දෙථ, දෙනු මැනව; අහං, මම; තං, එය; පරිදහිස්සාමි ඉති, අඳින්නෙමියි; ආහ, කීවේය. තතො, ඉක්බිති; භික්ඛූ, භික්ෂූහු; තස්ස, ඔහුට; තං සාටකං, ඒ සළුව; අදංසු, දුන්හ. සො, හෙතෙම; තං වත්ථං ගහෙවො, ඒ වස්ත්‍රය ගෙන; දසා ඡින්දිත්වා, දහවලු කපා, සිබ්බිත්වා, මසා; කප්ප බින්දුං දත්වා, කප් බින්දු තබා; චීවරං, සිවුර; පාරුපිත්වා, පොරවා; චඞ්කමං, සක්මනට; ආරුය්හ, නැග; සත්තපදං, පියවර සතක්; වීතිහාරෙන්තො, ගමන් කරමින්; ගන්ත්වා, ගොස්; අවසානෙ, අවසානයෙහි; කිලෙස සත්තුං, කෙලෙස් සතුරා; ජිනෙන්තො, දිනමින්; අරහත්තං, පත්වා, රහත් බවට පැමිණ; තං චීවරං, ඒ සිවුර; ධොවිත්වා, සෝදා; දුතිය දිවසෙ, දෙවැනි දවසෙහි; භික්ඛූනං, භික්ෂූන්ට; අදාසි, දුන්නේය. අපරො'පි, භික්ඛු, අනික් භික්ෂුවක් ද; තං ගහෙත්වා, ඒ සිවුර ලබා ගෙන; තථා එව, එපරිදිම; අරහා අහොසි, රහත් වීය. එතෙන එව උපායෙන, මේ ක්‍රමයෙන්; තං එව චීවරං නිස්සාය, ඒ සිවුර නිසාම; අන්තො වස්සෙ එව, ඇතුල් වසම; පඤ්චසතා භික්ඛූ, පන්සීයයක්

භික්ෂූහු; අරහත්තං, රහත් බවට; පාපුණිංසු, පැමිණියහ.

10. තතො, ඉක්බිති; ලජ්ජිතිස්ස මහා රාජා, ලජ්ජිතිස්ස මහරජතුමා; මහා පවාරණ දිවසෙ, මහා පවාරණ දවසෙහි; රාජගෙහතො, රජ ගෙදරින්; නානාවිරාග වත්‍ථානි, නොයෙක් පාට වස්ත්‍රයන්; ගාහාපෙත්වා, ගෙන්වා ගෙන; විතානෙ වියන්; බන්‍ධථ, බඳිව්. තොරණෙ, තොරන්; උස්සාපෙථ, ඔසවව්; ධජ පතාකාදයො, ධජ පතාකා; බන්‍ධථ, බඳිව්; විහාරං, විහාරය; අලඞ්කරොථ ඉති, අලඞ්කාර කරව් යයි; මනුස්සෙ, මිනිස්සු; නියොජෙසි, යෙදවීය. තතො, ඉක්බිති; තෙ, ඔවුහු; විහාරං, විහාරය; අඞකරිංසු, අලංකාර කළහ. භික්ඛූපි, භික්ෂූහුද; විහාරං, විහාරය; අලඞ්කරොන්‍තා, අලංකාර කරන්නාහු; තං චීවරං ගහෙත්වා, ඒ සිවුර ගෙන; අයං, මේ සිවුර; බහුන්‍නං භික්ඛූනං, බොහෝ භික්ෂූන් වහන්සේට; කිලෙස විඬංසනාය, කෙලෙස් නැති කිරීම සඳහා; පච්චයො ජාතො ඉති, හේතු වී යයි; මාලකද්වාරෙ, මළු දෙර; ධජං කත්වා, කොඩියක් කොට; උස්සාපෙසුං, එසවූහ. අථ, ඉක්බිති; රාජා, රජතුමා; විහාරං, විහාරයට; ගන්ත්වා, ගොස්; මාලකද්වාරෙ, මළු දෙර; උස්සාපිතං, ඔසවන ලද; තං අරහඬජං, ඒ සිවුරු කොඩිය; දිස්වා, දැක; මයා, මා විසින්; නානා වණ්ණානි, නොයෙක් පාට වස්ත්‍ර; පෙසිතානි, එවන ලදී. තානි, ඒවා; යත්‍ථ කත්‍ථචි බන්ධිත්වා, යම් කිසි තැනෙක්හි බැඳ; කස්මා, කුමක් නිසා; ඉමං නත්‍තකං, මේ රෙදිකඩ; අභිමුඛෙ, ඉදිරිපිට; බන්ධිංසු ඉති, බැන්දහු දැයි; ආරාමිකෙ, ආරාමිකයන් ගෙන්; පුච්ඡිතෙ, විචාළ කල්හි; මහාරාජ, මහරජ; අය්‍යා, ආයර්‍යයන් වහන්සේලා; අත්‍තානං, තමන්ට; අයං, මෙය; උපකාරකො ඉති, උපකාර වී යයි; බන්ධිංසු ඉති, බැන්දහයි; ආහංසු, කීවාහු ය. රඤ්ඤා, රජු විසින්; තෙසං, උන්වහන්සේලාට; ඉමිනා, මෙයින්; කො උපකාරකො ඉති, කවර උපකාරයක් කළේ දැයි; වුත්‍තෙ, විචාළ කල්හි; දෙව, දේවයන් වහන්ස; මයං, අපි; න ජානාම, නොදනිමු. අය්‍යා එව, ආයර්‍යයන් වහන්සේලාම; ජානන්‍තීති, දනිත් යයි; ආහංසු, කීවාහුය. අථ, ඉක්බිති; රාජා, රජතුමා; භික්ඛු සඞ්ඝං උපසඞ්කමිත්වා, භික්ෂු සඞ්ඝයා වෙත එළඹ; වන්දිත්වා, වැඳ; එකමන්‍තං, එකත්පසක; නිසින්‍නො, හුන්නේ; භන්‍තෙ, ස්‍වාමීනි, ඉමං වත්‍ථං, මේ වස්ත්‍රය; සඞ්ඝස්ස, සංඝයාට; බහු උපකාරං ඉති, බොහෝ උපකාර යයි; වදන්‍ති, කියති. අස්ස, ඊට; කිං කාරණං ඉති, හේතු කිමදැයි; පුච්ඡි, විචාළේය. භික්ඛු සඞ්ඝො, භික්ෂු සංඝතෙමේ; මහාරාජ, මහරජ! එතං වත්‍ථං, මේ වස්ත්‍රය; නිස්සාය, නිසා; ඉමස්මිං අන්‍තො වස්සෙ, මේ ඇතුල් වසෙහි; පඤ්චසතා භික්ඛු, පන්සියයක් භික්ෂූහු; අරහත්තං, රහත් බවට; පත්‍තා, පැමිණියාහුය. තස්මා, එහෙයින්; භික්ඛූනං, භික්ෂූන්ට; තං, එය; බහු උපකාරං ඉති, බොහෝ උපකාර වී යයි; චීවරෙ, සිවුරෙහි; ගුණං, ගුණය; වදන්‍තො, කියමින්; ආහ, මෙසේ කීයේය. තෙන එත්‍ථ, එසේ හෙයින් මෙසේ කියන ලදී.

11. මල මුත්‍තෙහි, මලමූත්‍රයෙන්; මක්ඛිතං, තැවරුණු; අපවිද්ධං,

අපවිත්‍ර වූ; පිලොතිකං, කඩ රෙද්දක් වූ; ඉසිද්ධජං, අරහත් ධජයක්; යත්‍ථ, යම් තැනෙක්හි; දිස්‍වා, දැක; අනාදරො, අනාදරය; න කරණීයො, නොකළ යුතු වේ.

12. තං, ඒ වස්ත්‍රය; වන්දමානෙන, වඳිනු ලබන්නා වූ; ජන්තුනා, සත්‍වයා විසින්; ඛෙමං, නිර්භය ස්ථානයකට; පාපෙත්‍වා පන, පමුණුවාද; තං, අරහද්ධජං, ඒ අර්හත් ධ්වජයට; ආදරො එව, ආදරයම; කත්තබ්බො හොති, කළ යුතු වේ.

13. රාජ, මහරජ! යො අයං නන්තකො, යම් මේ දළකඩක් තෙම; උස්සිතො, ඔසවන ලද්දේ වේද; සො අරහද්ධජො, ඒ අරහත් ධජයතෙම; අරහන්තෙහි, රහතුන් විසින්; පරිභුත්තො, පරිභොග කරන ලද්දේය. තස්මා, එහෙයින්; සො, ඒ වස්ත්‍රය තෙම; පූජාරහො, පූජා සත්කාරයට සුදුසුය.

14. එවං ආදිනා, මේ ආදී ක්‍රමයෙන්; ධම්මං, දෙසෙසි, ධර්මදෙශනා කරන ලදි. තං සුත්‍වා, ඒ අසා; රාජා, රජතුමා; සොමනස්සො, සතුටට පත්වූයේ; කෙන, කවරෙකු විසින්; එතං වත්‍ථං, මේ වස්ත්‍රය; දින්නං ඉති, දෙන ලදදැයි; පුච්ඡි, විචාළේය. තං සුත්‍වා, ඒ අසා; භික්ඛු, භික්ෂූහු; මහාරාජ, මහරජ, සිවගාමෙ, ශිව ගමෙහි; දිලිද්දං, දිළිඳු; එකා ධම්මානාම මාතුගාමො, එක් ධර්මානම් ස්ත්‍රියක්; අත්‍ථි, ඇත. තාය, ඇය විසින්; එතං දින්නං ඉති, මෙය දෙන ලදැයි; ආහංසු, කීහ. රාජා, රජතුමා; තං සුත්‍වා, ඒ අසා; තං, ඈ; පක්කොසාපෙත්‍වා, කැඳවා; තස්සා, ඇයට; බහුං සාපතෙය්‍යං, බොහෝ වස්තුව; දත්‍වා, දී; සිවගාමං, ශිවගම; තස්ස, ඇට; භත්ත ගාමං කත්‍වා, බත්ගම්කොට; අදසි, දුන්නේය. තතො පට්ඨාය, එතැන් පටන්; සො ගාමො, ඒ ගම; ධම්මසිව ගාමො නාම අහොසි, ධම්මසිව ගාම නම් වී. රාජා'යි, රජතුමා ද; තං, ඇය; අත්තනො, තමාගේ; ධීතුට්ඨානෙ, දූ තනතුරෙහි; ඨපෙත්‍වා, තබා; මහන්තං යසං අදසි, මහත් වූ; සම්පත් දුන්නේය. සා, ඕතොමෝ; තතො පට්ඨාය, එතැන් පටන්; දානං දත්‍වා, දන් දී; සීලං රක්ඛිත්‍වා, සිල් රැක; ආයුපරියොසානෙ, ආයු කෙළවරෙහි; ගන්ත්‍වා, ගොස්; දෙවලොකෙ, දිව්‍ය ලොකයෙහි; නිබ්බත්ති, උපන්නීය.

15. ඉති, මෙසේ; සුපෙසලස්ස, සිල්වත්; සඞ්ඝස්ස, සංඝයා වහන්සේට; කපණාය, දුක්පත් ගැහැණියක විසින්; දින්න, දෙන ලද; වත්‍ථස්ස, වස්ත්‍රයාගේ; ආනුභාවං, ආනුභාවය; අහො, පුදුමයි; ධම්මා, ඒ ධර්මතොමෝ ද; භව භොග සම්පදං, භව භොග සම්පත්තිය; ලද්ධා අසි, ලබන ලද්දීය. භික්ඛූ'පි, භික්ෂූන් වහන්සේලාද; (එම වස්ත්‍රය නිසා) ඛීණාසවත්තං, ක්ෂය කරන ලද කාමාදී ආශ්‍රවයන් ඇති බවට; ගතා ආසුං, ගියාහුය.

**ධම්මාය වත්ථුං, ධර්මාවගේ කථාව; අට්ඨමං, අටවැන්නයි.**

# 9. කිඤ්චි සංඝාවගේ කථාව,

**(6) 9. කිඤ්චි සඞ්ඝාය, කිඤ්චි සංඝාවගේ; වත්ථුම්හි, වස්තුවෙහි; අයං, මේ; ආනුපුබ්බී කථා, පිළිවෙල කථාවයි.**

1. ලඞ්කායං කිර, ලක්දිව වනාහි; කාකවණ්ණ තිස්ස මහාරාජිනි, කාවන්තිස්ස මහරජතුමා; රජ්ජං, රාජ්‍යය; කාරෙන්තො, කරවන කල්හි; අනුරාධපුරෙ, අනුරාධපුරයෙහි; සඞ්ඝො නාම, සඞ්ඝ නම්; මහාමෙච්චො, මහා අමාත්‍යයෙක්; අහොසි, විය. රාජා, රජතුමා; තස්ස, ඔහුට; රොහණෙ, රුහුණෙහි; මහාගාමං, මහගම; භත්තගාමං කත්වා, බත්ගම් කොට; අදාසි, දුන්නේය. සො පන, හෙතෙම වනාහි; අත්තනො, තමාගේ; චූලසඞ්ඝං නාම, චූල සඞ්ඝ නම්; කණිට්ඨං, කණිටු සොහොයුරා; ආමන්තෙත්වා, අමතා; ත්වං, තෝ; රඤ්ඤො, රජුගේ; පාදමූලිකො හුත්වා, මෙහෙකරුවෙකු වී; උපට්ඨානං, උවටැන් කරොහි ඉති, කරවයි; රඤ්ඤො සන්තිකෙ, රජු සමීපයෙහි; නිවත්තෙත්වා, නවතා; සයං, තෙමේ; මහාගාමං, මාගමට; ගන්ත්වා, ගොස්; පටිවසති, වාසය කරයි.

තද, එකල; අස්ස, ඔහුට; එකා ධීතා, එක දුවක්; අහොසි, වූවාය. නාමෙන, නමින්; කිඤ්චි සඞ්ඝානාම, කිඤ්චිසංඝා නමී; උත්තම රූපධරා, උතුම් රූ ඇත්තී; දෙවච්ඡර පටිභාගා, දෙවඟනක් වැන්නීය. මාතා පිතරො, මවුපියෝ; තාය කිර, ඇයට; සූප සත්ථං, සූප ශාස්ත්‍රය; උග්ගණ්හාපෙත්වා, උගන්වා; පචන කම්මං, පිසීමට; උග්ගණ්හාපෙසුං, ඉගැන්වූහ. අථ, ඉක්බිති; තෙ, ඔවුහු; තාය, ඇය විසින්; පඨමං, පළමුකොට; පක්කොපකරණං, පිසූ උපකරණ; භික්ඛු සඞ්ඝස්ස , භික්ෂු සංඝයාට; අදංසු, දුන්හ. සා, ඕතොමෝ; තතො පට්ඨාය, එතැන් පටන්; යෙභුය්‍යෙන, බොහෝ සෙයින්; සඞ්ඝස්ස, සංඝයා වහන්සේට; භත්ත බ්‍යංජනානි, බත් හා ව්‍යඤ්ජන; පචිත්වා, පිස; උපට්ඨෙති, උපස්ථාන කරයි. තෙන, එහෙයින්; අස්සා, ඇයට; සඞ්ඝ උපට්ඨායිකා ඉති අපි, සංඝ උපස්ථායිකාව යයි ද; වොහරන්ති, ව්‍යවහාර කරති.

2. අපරභාගෙ, මෑත කාලයෙහි; සඞ්ඝාමච්චො, සංඝාමාත්‍ය තෙමේ; ජනපදං, ජනපදය; පීළෙන්තො, පෙළමින්; විලොපං ඛාදන්තො, කොල්ලකමින්; උල්ලොලං කරොති, කලබල කරයි. මනුස්සා, මිනිස්සු; ගන්ත්වා, ගොස්; තං පවත්තිං, ඒ ප්‍රවෘත්තිය; රඤ්ඤො, රජුට; කථෙසුං, කීහ. රාජා, රජතුමා; තං සුත්වා, ඒ අසා; තස්ස, ඔහුගේ; කණිට්ඨං, මලණුවන්; පක්කොසාපෙත්වා, කැඳවා; භාතිකො කිර, සහෝදරයා වනාහි; ජනපදං, ජනපදය; සංගණ්හනත්ථාය, සංග්‍රහ කිරීම පිණිස; පෙසිතො, යවන ලදි. ඉදානි, දැන්; ජනපදං, ජනපදය; පීළෙත්වා, පෙළා; උල්ලොලං කරොති, කලබල කරයි. එතං අත්ථං, මේ කරුණ ගැන; තව භාතු, තොපගේ සහෝදරයාට; සාසනං, ලිපියක්; පෙසෙත්වා, යවා;

වාරෙහි ඉති, වළක්වවයි; ආහ, කීය. සො, හෙතෙම; තං සුත්වා, ඒ අසා; භාතු සන්තිකං, සහෝදරයා සමීපයට; සාසනං, ලිපියක්; පෙසෙන්තො, යවමින්; එවං ආහ, මෙසේ කීය.

3. මෙ, මාගේ; භාතුනො, සහෝදරයාට; අභිවාදෙත්වා, වැඳ; ඉධ, මෙහි; පත්ථටං, පැතිරී ඇති; පවත්තිං, ප්‍රවෘත්තිය; කථෙමි, කියමි. භාතා, සහෝදරය; අවඤ්චයා, වංචාවක් නැතිව; රාජානො, රජදරුවෝ තුමූ; සෙවිතබ්බා, සේවනය කළ යුත්තාහුය.

4. යම, යම රජුය; ආදිච්ච, සූර්‍ය්‍යයාය; ඉන්දු, චන්ද්‍රයාය; මච්චු, මාරයාය; කුවෙර, වෛශ්‍රවණයාය; දහනෙහි ච, ගින්දර ද යන; ජහි, මේ සයදෙනා එකට එක් කිරීම් විසින්; නිම්මිතා විය, මවාලූ රූපයන් මෙන්; රාජානො, රජදරුවෝ; භූතලෙ, පොළොවෙහි; චරන්ති, හැසිරෙත්.

5 යාමො, යමරජතෙම; සත්තෙ, සත්වයන්; පුඤ්ඤාපුඤ්ඤානුරූපෙන, කුසලා කුසලයනට අනුරූප පරිද්දෙන්; සග්ගා පායං, සවර්ගයට හා අපායට; යථා, යම් සේ; පාපෙති, පමුණුවාද; රාජාපි, රජ තෙමේ ද; තථෙව, එපරිද්දෙන්ම; (දුක සැප දෙකට මිනිසුන් පමුණුවන හෙයින්) යම සාදිසො, යමයා හා සමානය.

6. භානු, සූර්‍ය්‍යයා; ලොකං, මුළු ලොව; ආලොකයෙ, ආලොක කරන්නේය. බොධෙතබ්බෙ, ප්‍රබොධ කළ මනා පියුම්; පබොධෙති, ප්‍රබොධ කරන්නේය. සොසානරහෙ, වියළීමට සුදුසු දෙය; සොසෙති, වියලවන්නේය. රාජා'පි, රජතුමා ද; (පුරවැසියන් තවන පෙළන හෙයින්) භානු සදිසො, හිරු හා සමානය.

7. සීතංසු, චන්ද්‍රයා; ගහාලි පරිවාරිතො, ග්‍රහ තාරකා සමූහයා විසින් පිරිවරණ ලද්දේ; දිසි, දස දික්හි; සීතාංසු, අති සිසිල් රශ්මි කදම්බයන්; පත්ථරං, පතුරුවමින්; ලොකං, ලෝකය; තොසෙති, සතුටු කරවයි. භූපති, රජතෙමේ ද; භුවි, පෘථුවියෙහි; (සිසිල් ගුණයෙන් ලෝවැසියන් සතුටු කරවන හෙයින්) චන්දෙ ඉව, චන්ද්‍රයා හා සමානය.

8. යථා, යම් සේ; මච්චු, මාර තෙම; අදයාපරො, දයා රහිතව; මාරෙ තබ්බං, මැරිය යුත්තා, මාරෙති, මරා ද; (එමෙන්) ජගතිපාලො, ජගත් පාලතෙමේ ද; අසාධුනං, (අපරාධ කළ) අසත් පුරුෂයන්ට; නිග්ගහෙසු, නිග්‍රහ කිරීමෙහි; මච්චු ඉව, මාරයා වැනිය.

9. සදා, සැම කල්හි; මිත්තෙ, මිත්‍රයන්; ධන දනෙන, ධනය දීමෙන්; තොසෙති, සතුටු කරවයි. අමිත්තෙ, අමිත්‍රයන්; තං, ඔහු සතු වස්තුව; අච්ඡින්දනෙන, පැහැර ගැනීම් කරණකොට ගෙන; සොසෙති, වියලවයි. එවං, මෙසේ; (හෙයින්) භූපති, රජතෙමේ; කුවෙරො එව, කුවේරයා මෙනි.

10. යථා, යම්සේ; පාවකො, ගින්න; ලොකස්මිං, ලෝකයෙහි; සබ්බභූතානි, සියළු භූතයන්; දහති, දවයි; රාජා, රජතෙමේ; අග්ගි ඉව,

ගින්න මෙන්; පදුට්ඨං, ඉතා දුෂ්ට වූ; (අපරාධ කළ) සකලං පජං, සියළු ප්‍රජාව; දහතෙ, දවන්නේය.

11. සො අග්ගි, ඒ ගින්න තෙම; දුරුපායිතං, වරදවා සේවනය කළාවූ; එකං එව නරං, එකම මනුෂ්‍යයෙක්ම; දහති, දවයි. රාජග්ගි, රාජ නැමැති ගින්න; සචරාචරං, ජඞ්ගම ස්ථාවර සහිත වූ ද; සබන්ධුං, නෑයන් සහිත වූ ද; කුලං, සියළු කුලය; දහති, දවයි.

12. දහනා දඩ්ඪා, ලැව් ගින්නෙන් දන ලද; කානනෙ, වනයෙහි; කෙචි තරවො, සමහර ගස්; තිට්ඨන්ති, සිටිත්; රාජ කොප, රජුගේ කෝප නැමැති; අනලා, ගින්නෙන්; දඩ්ඪා, දවන ලද්ද වූ; (මනුෂ්‍ය නැමැති වනයෙහි) අපරාධිනො, අපරාධ කළ කිසිවෙක්; න තිට්ඨන්ති, නොසිටිත්. (ඉතුරු නොවෙත්)

13. රාජානො, රජදරුවෝ තුමූ; දූරෙති, දුරයයි; නාවමන්තබ්බා, නොසිතිය යුත්තාහ. දීඝ බාහුකා, දීර්ඝ බාහු ඇත්තාවූ ඔවුහු; ලොකොප පීලිතං, ලෝකය පෙළන්නා වූ; දිසං, සතුරා; සහසා, වහා; දළ්හං, දැඩි කොට; ගණ්හන්ති. අල්වා ගනිත්.

14. පච්චත්තං, පිටිසර පෙදෙස; මා නිපීළෙථ, පීඩා නොකළ මැනව; ගාමිකෙ, ගම් වැසියන්; මා විලුම්පථ, පෙළීම නොකළ මැනව; පරස්ස, අනුන් සතු (ධනය); මා හරෝ හොථ, පැහැර නොගත මැනව; අත්තනො, තමන්ගේ; මූලං, මූලස්ථානය; මා ඛණථ, නොසිඳුව මැනව;

15. රාජානො, රජ දරුවෝ තුමූ; පක්ඛපාතං ච, පක්ෂපාත වූ ද; සපෙම්මං, ප්‍රේම සහිත වූ; උපකාරං, (තමන්ට) උපකාර වූ; හිතාවහං, හිතවත් වූ; නරං, මනුෂ්‍යයාට; යස දනාදිනා, යසශ්‍රී දීම් ආදියෙන්; අභිවඩ්ඪන්ති, මනාව වර්ධනය කරත්.

16. එවං ච පන වත්වා, මෙසේ ද කියා; කිං, කිම? අම්හෙ'පි, අපත්; නඹලොකෙථ, නොබලහුද? අප්පමත්තො හුත්වා අප්‍රමාද වී; ජනං, ජනයාට; සංගණ්හන්තා, සංග්‍රහ කරමින්; වසථ ඉති, වසව් යයි; සාසනං, ලිපියක්; පෙසෙසි, යැවීය. සො, හෙතෙම; තං, ඒ සන්දේශය; සුත්වා, අසා; මම කණිට්ඨො, මගේ මල්ලී; රඤ්ඤො, රජුගේ; අජ්ඣාසයං, අදහස; ඤත්වා, දැන; සාසනං, ලිපියක්; පෙසෙසි, යැවීය. රඤ්ඤො, රජුගේ; කුද්ධ කාලතො පට්ඨාය, කිපි කල පටන්; අම්හෙහි, අප විසින්; ඉධ, මෙහි; වසිතුං, වාසය කරන්ට; න සක්කා ඉති, නො හැකි යයි; සධීතරං හරියං ච, දුව සහ භාර්‍ය්‍යාව ද; හත්ථසාරෙ ච, හස්තසාර වස්තුව ද; ගහෙත්වා, ගෙන; පලායන්තො, පලායන්නේ; අනුපුබ්බෙන, පිළිවෙලින්; නිග්‍රොධ සාල ඛණ්ඩං, නිග්‍රොධ සාල ඛණ්ඩයට; (නුගහල් කඩුවට) පාපුණි, පැමිණියේය. තත්ථ, එහි දී; සො, හෙතෙම; එවං, මෙසේ; චින්තෙසි; සිතීය. අහං පන, මම වනාහි; රඤ්ඤො භයෙන, රජුට බියෙන්; පලායිස්සාමි, පැන යන්නෙමි. පුන, නැවත; තං, ඔහු; දට්ඨුං, දකින්ට; න සක්කා, නොහැක.

අනුරාධපුරං, අනුරාධපුරයට; ආගන්ත්වා, නොගොස්; මලයං, මලය රටට; ගන්ත්වා, ගොස්; කත්ථචි, කිසියම් තැනක; වසිත්වා, වාසය කොට; ජීවිස්සාමි ඉති, ජීවත්වන්නෙමියි; එතං අත්ථං, මේ කරුණ; අත්තනො, තමාගේ; භරියං, භායර්‍යාවට; වත්වා, කියා; තාය, ඇය විසින්; සම්පටිච්ඡිතෙ, පිළිගත් කල්හි; අත්තනො, තමන්ගේ; ධීතුයා, දූවණියගේ; රූප සම්පදං සල්ලක්ඛෙත්වා, රූප සම්පත්තිය ගැන සලකා; යදි, ඉදින්; නො, අපට; භයං, බියක්; උප්පජ්ජති, උපදී නම්; ඉමං නිස්සා එව, මැය නිසාම; උප්පජ්ජති, උපදී යයි; චින්තෙත්වා, සිතා; භද්දෙ, සොඳුර! කිසාවච්ච සංසං නිස්සාය, කිසාවච්ච සංසාව නිසා; උපරි, මත්තෙහි; නො, අපට; භයං, බියක්; උප්පජ්ජති, උපදියි; යදි, ඉදින්; තෙ, තොපට; රුච්චති, රුචි වී නම්; තං, ඇය; පහාය, අත්හැර; ගමිස්සාම ඉති, යම්හයි; ආහ, කීය. තං සුත්වා, ඒ අසා; සා, ඕතොමෝ; තුම්හෙ, ඔබට; යං, යමක්; ඉච්ඡථ, කැමැත්තෙහි නම්; තං, එය; කරොථ, කරව්; අහං, මම; තෙ, නුඹගේ; මනං, සිත; න භින්දිස්සාමි ඉති, නොබිඳින්නෙමියි; ආහ, කීවාය. අථ, ඉක්බිති; සො, හෙතෙම; ධීතරං, දූව; ආමන්තෙත්වා, අමතා; අම්ම, දූවණියෙනි! මයං, අපි; අන්තොගාමං, ඇතුළු ගමට; ගන්ත්වා, ගොස්; ආහාරං, ආහාර; පරියෙසිත්වා, සොයා; යාව ආගච්ඡාම, යම්තාක් එම් ද; තාව, එතාක්; එත්ථ, මෙහි; අච්ඡ ඉති, පලා ගියහ. අහො, පුදුමයි! භයප්පත්තානං සත්තානං, බියට පත් සත්වයන්ට; ලොකෙ, ලොකයෙහි; පෙමනීයෙසු, ප්‍රේමණීය අය කෙරෙහි; පෙමං වා, ප්‍රේමයක් හෝ; ලොභනීයෙසුවා, ලොභ කටයුතු වස්තුවෙහි හෝ; ලොභං වා, ලොභයක් හෝ; පරික්ඛායං, ගච්ඡති, ක්‍ෂය වීමට යයි; තථාහි, ඒ එසේමැයි.

17. ඉමෙ ජනා, මේ ජනයා; තථා විධෙසු, එබඳු වූ; දුක්ඛෙසු උප්පන්නෙසු, දුකක් උපන් කල්හි; පුත්තානං, දරුවන්ට ඇත්තාවූ; පෙමං, ප්‍රේමය; ජහන්ති, අත්හරිත්. (ඒ කෙසේද යත්) නක්කං, (තමන්ගේ දරුවන් කන) කිඹුලන් හා; කච්ඡප සාදිසා, කැස්බන් මෙනි.

18. තතො, ඉක්බිති; තත්ථ, එහි; ඨිතං, සිටි; කුමාරිකං, කුමාරිකාව; ගච්ඡන්තාච, ආගච්ඡන්තාච, මග යන එන්නෝ; දිස්වා, දැක; අයං කුමාරිකා, මේ කුමාරිකා, තොමෝ; අභිරූපා, අභිරූපය; සුකුමාලා, සිවුමැලිය; කිං අත්ථාය, කුමක් සඳහා; එත්ථ, මෙහි; ඨිතා ඉති, සිටින්නී දැයි; විම්භිතා, පුදුමව; උපසඞ්කමිත්වා, සමීපයට පැමිණ; අම්හෙහි සද්ධිං, අප හා සමග; ආගච්ඡ, එන්න; අම්මා ඉති, නැගණියෙනියි; වදන්ති, කියත්. සා, ඕතොමෝ; තෙසං, ඔවුන්ගේ; කථං සුත්වා, කථාව අසා; මම මාතා පිතුන්නං, මගේ මවුපියන්ගේ; වචනං, කීම; න භින්දිස්සාමි ඉති, නොබිඳින්නෙමියි; චින්තෙත්වා, සිතා; තුණ්හී භූත්වා, නිශ්ශබ්දව; තස්මිං එව, එහිම; අට්ඨාසි,සිටියේය. එවං මෙසේ; ඨානං කප්පෙන්තියා තස්සා, එතැන කල් ගෙවන්නා වූ ඇයට; සත්ත දිවසානි, දින හතක්; අතික්කන්තානි, ඉක්මිණි. එත්තකං, කාලං, එපමණ කලක්; නිරාහාරංච, නිරාහාරව; අට්ඨාසි, සිටියේය. තද, එකල්හි; සක්කො, සක් දෙව්

රජතෙමේ; දෙව මනුස්සෙසු, දෙව් මිනිස් ලොවෙහි; චාරිකං චරන්තො, සැරිසරන්නේ; තථා ඨිතං, එසේ සිටි; තං දිස්වා, ඇය දැක; අයං කුමාරිකා, මේ කුමාරිකා තොමෝ; මහාගුණා, මහා ගුණවත්‍ය; නං, ඇය; විමංසිස්සාමි ඉති, විමසන්නෙමියි; චින්තෙත්වා, සිතා; අභිරූපං, සිත් කළු; මානවක වණ්ණං, තරුණ වේශයක්; නිම්මිණිත්වා, මවාගෙන; තස්සා, ඇගේ; සන්තිකං, සමීපයට; උපගම්ම, පැමිණ; තාය සද්ධිං, ඇය සමග; සල්ලපන්තො, කථා කරන්නේ; එවං, මෙසේ; ආහ, කීයේය.

19. නීල, තිල් පැහැ වූ; වෙල්ලිත, නැමී වක්වී ගිය; ධම්මිල්ලා, කේස කලාපයක් ඇති; ඵුල්ල, පිපුණු; පඞ්කජක, පියුමක් බඳුවූ; ආනනා, මුහුණක් ඇති; නීල, තිල් පැහැ වූ; ආයත, දික් වූ; විසාල, පුළුල් වූ; අක්ඛා, ඇස් ඇති; ත්වං, තී; නයනුස්සවා, ඇසට උත්සවයක්; ආසි, වීය.

20. හද්දෙ, සොඳුර, ලීලාය, ලීලාවෙන්; හෙමවල්ලී ඉව, රන්ලියක් බඳුය; නන්දනෙ, නඳුන් වනයෙහි; දෙව කඤ්ඤා ඉව, දිව්‍යාඞ්ගනාවක් මෙනි, ආකාසෙ, අහසෙහි; චන්දලෙඛා ඉව, චන්ද්‍ර ලෙඛාවක් මෙන්; ත්වං, තී; ඉධ, මෙහි; තිට්ඨසි, සිටින්නෙහිය.

21. මනොරමෙ, සිත්කළු තැනැත්තිය, ත්වං, තී; කා වා, කවර ස්ත්‍රියක් ද; කස්ස, කවරෙකුගේ; ධීතා වා, දියණියක් හෝ වේ ද; ත්වං, තී; කුතො, කොතැන සිට; ඉධ, මෙහි; ආගතා, ආවාද; කිමත්ථාය, කුමක් පිණිස; එත්ථ, මෙහි; අට්ඨාසි, සිටින්නෙහිද; තෙ, තිගේ; භත්තා, ස්වාමිපුරුෂයා; කො, කවරෙක් ද?

22. යුවො, තරුණයෙක්; යුවතිං, තරුණියක්ම; කාමෙති, කැමැති වෙයි. යුවතී, තරුණියක්; යුවානං, තරුණයෙකු; කාමෙති, කැමැති වෙයි. තථා, එසේම; හද්දෙ, සොඳුර; ඉධ, මෙතැන්හි; ත්වං ච, තී ද; අහං ච, මම ද; සමානවයෙ, සමාන වයසෙහි; ඨිතා අම්හි, සිටියෝ වෙමි.

23. තුවං, තී; අජ්ජතනා, අද පටන්; සදා, සැම කල්හි; හරියත්තෙන, භාර්‍ය්‍යා භාවයෙන්; පොසෙමි, පොෂණය කරමි. තෙ, තිට; අහං, මම; පතිහෙස්සාමි, ස්වාමියා වෙමි. ත්වං, තී; මෙ, මට; හරියං භව ඉති, භාර්‍ය්‍යා වෙවයි. (කීයේය)

තං සුත්වා, ඒ අසා; කුමාරිකා, කුමාරිකාව; එවං, මෙසේ; ආහ, කීවාය.

24. සම්ම, යහළුව; ත්වං, ඔබ; මෙ, මට; යං, යම් කාරණයක්; භණසි, කියන්නෙහිද; (එය) කාරණං විය, කරුණක් මෙන්; දිස්සති, දක්නා ලැබේ. ලොකෙ, මේ ලෝකයෙහි; පුරිසාභරණං විනා, පුරුෂ නැමැති ආභරණයෙන් තොරව; ඉත්ථියො, ස්ත්‍රීහු; න සොභන්ති, නොහොබිත්.

25 .යස්සා, යම් තැනැත්තියකට; ධවො, ස්වාමිපුරුෂයෙක්; නත්ථි, නැත්තේ ද; සා තු, ඕතොමෝ වනාහි; විධවා ඉති, වැන්දඹු තැනැත්ති

යයි: පවුච්චති, කියනු ලැබේ. විධවා, වැන්දඹු තැනැත්තිය: සබ්බදුක්ඛස්ස, සියළු දුකට; සබ්බද, සැම කල්හි: භාගී භවති හිමිවන්නීය.

26. මය්හං, මගේ; මාතා පිතා, මවු පිය දෙදෙනා; අසී, ඇත්තාහුය. තෙ, ඔවුන්; මෙ, මට; එවං, මෙසේ; අනුසාසයුං, අනුශාසනා කළාහුය. පුත්ති, දුවණියෙ; මයං, අපි; යාව, යම්තාක්; ආයාම, එන්නෙමු ද; තාව, ඒ තාක්; එත්ථ එව, මෙහිම; හොහීති, සිටුව යනුයි.

27. ඉධ, මේ ලොකයෙහි; මාතා පිතුන්නං, මවුපියන්ගේ; වචනං, වචනය; න කරොන්තා, නොකරන්නාවූ; නරා, මනුෂ්‍යයෝ; ඉධ, මේ ලොකයෙහි; විනාසං, විනාශයට ද; පෙච්ච, පරලොව; දුග්ගති, අපි, දුගතියට ද; යන්ති. පැමිණෙත්.

28. මානව, තරුණය! යදි, ඉදින්; මය්හං, මාගේ; මාතා පිතා, මවුපියෝ; අනුජානන්ති, අනු දනිත් නම්; තථා, එසේම; තෙ, තොප සමග; සඞ්ගමො හොති, සංගමය වේ. වෙ, ඉදින්; (අනුනොදන්නාහු නම්) සඞ්ගමො, එකතුවීම; නො භවති ඉති, නොවේ යනුයි.

29. අථ, එකල්හි; සක්කො, ශක්‍රතෙමේ; තස්සා, ඇගේ; කථං, කථාව; සුත්වා, අසා; තෙනහි, එසේ නම්; හොති, පින්වතිය! ත්වං, තී; අතිවිය, ඉතාම; ජාතාසි, බඩගිනි ඇත්තෙහිය; ඉමං, භත්තං, මේ බත්; භුඤ්ජ ඉති, අනුභව කරවයි; එකං, භත්තපුටං, එක් බත් මුලක්; තස්සා, ඇට; දත්වා, දී; අගමාසි, ගියේය.

සා, ඕ තොමෝ; භත්තං ගහෙත්වා, බත් ගෙන; කාලං, ඔලොකෙත්වා, කල් බලා; තාව, තවම; පුරෙ භත්තං ආයාති, පෙරවරුවේ යයි; ඤත්වා, දැන; දන්තං දත්වා, දත් දී; භුඤ්ජිස්සාමි ඉති, අනුභව කරන්නෙමියි; කාලං සොසෙසි, කාලඝෝෂා කෙළේය. තතො, එයින්; තතිය සද්දවසානෙ, තුන්වැනි ශබ්දය අවසානයෙහි; චිත්තල පබ්බත විහාරෙ, සිතුල් පව් වෙහෙරෙහි; වසන්තො, වාසය කරන්නා වූ; එකො ඛීණාසාවො, එක් රහතන් වහන්සේ නමක්; තං සුත්වා, ඒ කාලඝෝෂා ශබ්දය අසා; ආකාසෙන, අහසින්; ආගන්ත්වා, අවුත්; තස්සා, ඇයගේ; අභිමුඛෙ, ඉදිරියෙහි; පාතුරහොසි, පහළ විය. සා, ඕතොමෝ; ථෙරං දිස්වා, තෙරුන් දැක; තුට්ඨ මානසා, සතුටු සිතැතිව; පඤ්චපතිට්ඨිතෙන, පසඟ පිහිටුවා; වන්දිත්වා, වැඳ; පත්තං ගහෙත්වා, පාත්‍රය ගෙන; භත්තස්ස, බතින්; පූරෙත්වා, පුරවා; ථෙරස්ස, තෙරුන් වහන්සේට; දත්වා, දී; ථොකං, ටිකක්; තිට්ඨ භන්තෙ ඉති, සිටින්න ස්වාමීනියි; වත්වා, කියා; තුරිත තුරිතා, වහා වහා; ගච්ඡන්තරං,ගස් අතරට; පවිසිත්වා, පිවිස; සාඛා භඞ්ගං, කොළ අතු කඩා; නිවාසෙත්වා, හැඳගෙන; වල්ලියා, වැලකින්; බන්ධිත්වා, බැඳගෙන; නිවත්ථ වත්ථකං, හැඳිවත; ධොවිත්වා, සොද; චුම්බටකං කත්වා, දරණුවක් කොට; ථෙරස්ස, තෙරුන් වහන්සේට; අදසි, දුන්නේය. ථෙරො, තෙරුන් වහන්සේ; තං පත්තං, ඒ පාත්‍රය; චුම්බටකෙ ඨපෙත්වා, දරණුව උඩ තබා; අයං, මෝ; මං, මා; පස්සතු ඉති, දකීවා යි; අධිට්ඨාය, අධිෂ්ඨාන

කොට; අස්සා, ඈ; පඤ්ඤත්තියාව, දකින්දීම; ආකාංස, අහසට; උග්ගන්ත්වා, නැග; විහාරං එව, විහාරයටම; අගමාසි, ගියේය. සා, ඕ තොමෝ; තං දිස්වා, එය දැක; පසන්න මනසා හුත්වා, පහන් සිත් ඇතිව; දනාවසෙසං, දන් දී ඉතිරි වූ දෙය; භුත්වා, අනුභව කොට; අත්තනො, ත්මාගේ දනං, දනය; ආවජ්ජෙත්වා, සිත සිතා; ගච්ඡන්තරෙ, ගස් අතරෙහි; පටිච්ඡන්නා, සැඟවී; නිසීදි, සිටියාය.

තද, එකල්හි; රඤ්ඤො, රජුගේ; ජනෙන, සේසනෙහි; අධිවත්වා දෙවධීතා, අධිගෘහිත දෙව් දූ තොමෝ; තස්සා, ඇයගේ; දනෙ, දනයෙහි; සොමනස්සා හුත්වා, සතුටුව; ජන්න පිණ්ඩ විවරතො, සේසත්පිඩු විවරයෙන්; නික්ඛමම, නික්ම; සාධුකාරං, සාධුකාර; කරොන්තී, කරන්නී; එවං, මෙසේ; ආහ, කීවාය.

30. කුමාරිකෙ, පින්වත් කුමරිය! සාධු සාධු, යහපත යහපත; ධම්මජීවිනී, ධාර්මික ජීවිකා ඇත්තිය! සද්ධාසි, ශ්‍රද්ධා ඇත්තෙහිය; ත්වං, තී; සාධු දනං, යහපත් දනයක්; අදසි, දුන්නීය. සද, හැම කල්හි; සාධු පූජා හව ඉති, බුද්ධාදී සත්පුරුෂයන්ට පූජා ඇත්තියක් වෙවයි කී.

31 රාජා, රජතුමා; තං සුත්වා, එය අසා; හො, පින්වතිය; කස්ස, කවරෙකුට; සාධුකාරං, සාධුකාර; අදසි, ඉති, දුන්නෙහි දැයි; පුච්ඡි විචාළේය. සා, ඕ තොමෝ; මහාරාජ, මහරජ! මහාගාමෙ, මාගමෙහි; සංඝා මච්චස්ස, සංඝමාත්‍යයාගේ; කිඤ්චි සංඝා නාම ධීතා, කිඤ්චි සංඝා නම් දුව; නිග්‍රොධසාල ඛණ්ඩම්හි, නුග හල්කඩදී; දනං, දනයක්; අදසි, දුන්නීය. තස්සා, ඇයට; අහං, මම; සාධුකාරං, සාදුකාර; අදසිං ඉති, දුනිමියි; ආහ, කීවාය. රාජා, රජතුමා; තං සුත්වා, ඒ අසා; අමච්චෙ, ඇමතියන්; ආණාපෙසි, ඇණවීය. හො, පින්වත්නි! සීඝං, වහා; තත්‍ථ, එහි; ගන්ත්වා, ගොස්; තං, ඇය; සකට යොගෙ නිසීදපෙත්වා, සුදුසු රථයක වඩා හිඳුවා; අලංකාරිත්වා, සරසා; ආනෙථ ඉති, ගෙන එව යයි; ආහ, කීය. තෙ, ඔවුහු; ගන්ත්වා, ගොස්; ගච්ඡන්තරෙ, ලැහැලෙහි; නිසින්නං, හුන්; කුමාරිකං, කුමරිය; දිස්වා, දැක; අම්ම, මැණියෙනි! අම්හාකං රාජා, අපේ රජතුමා; තං, ඔබ; ආනෙතුං, ගෙන ඊම පිණිස; අම්හෙ, අප; පෙසෙසි, පිටත් කර එවීය. එහි ගච්ඡාම ඉති, එන්න යමුයි; යාචිංසු ඉල්ලූහ.

අථ, එකල්හි; සා, ඕතොමෝ; මම මාතා පිතුන්නං, මගේ මවුපියන්; ආනාගච්ඡන්තානං, නො එන්නේ; සත්තාහං ජාතං, දින හතක් විය. ඉදනි, දැන්; මං පහාය, මා අතහැර; ගතෙහි වා, ගියෙහි හෝ; මතෙහි වා, මළෙහි හෝ; භවිතබ්බන්ති, විය යුතු යයි; චින්තෙත්වා, සිතා; තෙසං, ඔවුන්ගේ; වචනං, වචනය; සාධු ඉති, මැනවයි; සම්පටිච්ඡි, පිළිගත්තාය.

අථ, ඉක්බිති; අමච්චෙහි, ඇමැතියන් විසින්; උස්සාහිතා, උත්සාහවත් කරන ලද්දී, උදකං, දියට; පවිසිත්වා, බැසඃනහාත්වා, නා; සාඛා හඞ්ගං, කොළ අතු; උදකෙ, ජලයෙහි; පහාය, දමා; නිවාසනත්‍ථාය, ඇඳීම පිණිස;

වත්ථානි, වස්ත්‍ර: ආහරථ ඉති, ගෙන එවයි; හත්ථං, අත: පසාරෙසි, දික් කළාය. අමච්චා, අමාත්‍යවරු: රඤ්ඤා, රජතුමා විසින්: පහිතං, යවන ලද: සාටකං, සළුව; නීහරිත්වා, බැහැර කොට: තස්සා, ඇගේ: හත්ථෙ, අතෙහි: ඨපෙසුං, තැබූහ. සා, ඕතොමෝ: තං දිස්වා, එය දැක: හොන්තො, පින්වත්නි! ඉදං ථූලං, මේ වස්ත්‍රය රළුය; අමනාපං, ප්‍රිය නොවේ. අඤ්ඤං, අනික් වස්ත්‍රයක්: ආහරථ ඉති, ගෙන එව්යයි: ආහ, කීවාය. අථ, එකල්හි: එකච්චෙ, ඇතැම් කෙනෙක්: තං සුත්වා, එය අසා: සාඛා නිවාසෙත්වා, නිසින්නාය, අතු හැඳ සිටි තැනැත්තියට: තෙ සාඛතො, ඒ අතුවලට වඩා: ඉමං අමනාපං ඉති, මේ වස්ත්‍රයට ප්‍රිය නොවේ යයි: වත්වා, කියා: මනුස්ස ලොකෙ, මිනිස් ලොව: ඉතො සුඛුමතරං වත්ථං, මීට වඩා සියුම් වස්ත්‍රයක්: නත්‍ථි ඉති, නැතැයි; ආහංසු, කීවාහුය.

32. තස්මිං ඛණෙ, එකෙණෙහි: සක්කො, සක්දෙව් රජ: තස්සා, ඇගේ: පුඤ්ඤානුභාවෙන, කුසලානුභාවයෙන්: දිබ්බමයෙ, දිව්‍යමය: පඤ්ච සාටකෙ, සළු පහක්: අක්ඛයං කත්වා තිට්ඨන්තථාය, ක්‍ෂය නොවී සිටින සේ: අධිට්ඨාය, අධිෂ්ඨාන කොට: පෙසෙසි, යැවීය. සා, ඕතොමෝ: තතො, එයින්: එකං සාටකං ගහෙත්වා, එක් සළුවක් ගෙන: නිවාසෙත්වා, හැඳ: යොග්ගං, වාහනයට: ආරුය්හ, නැග: මහියඞ්ගන විහාරං, මහියඞ්ගන විහාරයට: ගන්ත්වා, ගොස්: තත්ථ, එහි: බහුන්නං භික්ඛූනං, බොහෝ භික්‍ෂූන් වහන්සේට: චීවරත්ථාය, සිවුරු පිණිස: වත්ථානි, වස්ත්‍ර: දත්වා, දී: අත්තනො, තමාගේ: පරිවාරස්ස, පිරිවර ජනයාට ද: දිබ්බ වත්ථං එව, දිව්‍යසළුම: අදාසි: දුන්නාය. අස්සා, ඇය විසින්: පෙළාය, පැසින්: සාටකෙ, සළු: ගහිත ගහිතං, ගත් ගත් තැන: ඌනං, අඩුව: පරිපූරෙසි, පිරීයේ.

අථ, ඉක්බිති: සා, ඕ තොමෝ: අනුපුබ්බෙන, පිළිවෙළින්: අනුරාධපුරං, අනුරාධපුරයට, ගන්ත්වා, ගොස්: රාජානං, රජතුමන්: පස්සි, දැක්කාය. රාජාපි, රජතුමා ද: තං දිස්වා, ඇය දැක: සොමනස්සො, සතුටු වූයේ: තස්සා, ඇයට: මහන්තං සම්පත්තිං, මහා සම්පත්: අදසි, දුන්නේය. සා පි, ඕ තොමෝ ද: තත්ථ, එහි: සකලස්ස භික්ඛු භික්ඛුණී සඞ්ඝස්ස ච, සියළු භික්‍ෂු භික්‍ෂුණී සඞ්ඝයාට ද: රාජානං ආදිං කත්වා, රජතුමන් ආදිකොට: සබ්බ රාජ පරිසායච, සියළු රජ පිරිසට ද: නගරවාසීනං ච, නගරවැසියන්ට ද: දිබ්බවත්ථානි එව, දිව්‍ය වස්ත්‍රයෝම: අදසි, දුන්නාය. රාජා, රජතුමා: තං ඇය: එකස්ස පුත්තස්ස, එක පුතෙකුට: දත්වා, පාවා දී: තස්සා, ඇයට: සකල රොහණ ජනපදං, සියළු රොහණ ජනපදය: භත්තගාමං, කත්වා, බත්ගම් කොට: අදසි, දුන්නේය. සා, ඕතොමෝ: තතො පට්ඨාය, එතැන් පටන්: තත්ථ, එහි: වසමානා වාසය කරන්නී: දනාදිනි බහූනි පුඤ්ඤකම්මානි, දනාදී වූ බොහෝ පින්කම්: කත්වා, කොට: ආයුපරියොසානෙ, ආයු කෙළවර: සපරිසා, පිරිස සමග: දෙව ලොකෙ: දෙව් ලොව: නිබ්බත්ති, උපන්නීය.

33. සත්තා, සත්වයෝ: දනෙන, දනය කරණකොට ගෙන: තිදිවං,

දිව්‍ය ලොකයට; වජන්ති, යෙත්. දනෙන, දීමෙන්; නරෙසු, මනුෂ්‍ය ලොකයෙහි; සිරිං, සම්පත්; වින්දන්ති, විඳිත්. දනෙන, දනය කරණ කොට; සිවං පුරම්පි, නිර්වාණ පුරය ද; ලභන්ති, ලබත්. තස්මා, එහෙයින්; සතතං අපි, නිරතුරුවම; දනෙ, දනයන්; දදෙථ, දෙව්.

**කිස්ස්ව් සංසාය වත්ථුං, කිස්ස්ව් සංසාවගේ කථාව; නවමං, නවවැන්නයි.**

## 10. ශ්‍රද්ධා සුමනාවගේ කථාව.

**(6) 10. සද්ධා සුමනාය, ශ්‍රද්ධා සුමනාවගේ; වත්ථුම්හි, වස්තුවෙහි; අයං, මෝ; ආනුපුබ්බී කථා, පිළිවෙල කථාවයි.**

1 .එකස්මිං කිර සමයෙ, එක් කාලයෙක්හි; අනුරාධපුරෙ, අනුරාධපුරයෙහි; මහාවාලුක වීථියා, මහවැලි වීථියෙහි; සුමනා නාම, සුමනා නම්; එකා මාතුගාමා, එක් ස්ත්‍රියක්; සද්ධා හොති, ශ්‍රද්ධා ඇත්තී වේ. පසන්නා, (තුනුරුවන් කෙරෙහි) ප්‍රසන්නය; තත්‍ථ තත්‍ථ, ඒ ඒ තන්හි; චෙතිය බොධියාදිනි, දගැබ් මහ බෝ ආදියෙහි; පුප්ඵාදිනා, මල් ආදියෙන්; පූජෙන්තී, පුදමින්; මානෙන්තී, බුහුමන් කරමින්; ධම්මං, බණ; සුනන්තී, අසමින්; භික්ඛූ, භික්ෂූන්ට; උපට්ඨහන්ති, උපස්ථාන කරමින්; පටිවසති, වාසය කරයි. තස්සා, ඇයගේ; සද්ධාවන්තාය, ශ්‍රද්ධාවත් බව නිසා; සද්ධා සුමනා ඉති, ශ්‍රද්ධා සුමනා යයි; නාමං අහොසි, නම් විය. තස්මිං සමයෙ, එසමයෙහි; රොහණ ජනපදෙ, රුහුණු දනව්වෙහි; මහාගාමතො, මාගමින්; එකො මනුස්සො, එක් මිනිසෙක්; කෙනචි දෙව කරණීයෙන, කිසියම් කටයුත්තකට; අනුරාධපුරං ආගම්ම, අනුරාධපුරයට අවුත්; මහාවාලුක වීථියං එව, මහවැලි වීථියෙහිම; නිවාසං ගණ්හි, නවාතැන් ගත්තේය. සා, ඕතොමෝ; තෙන සද්ධිං, ඔහු සමග; මිත්ත සන්‍ථවං කත්වා, මිතුරුදම් කොට; තස්මිං, ඔහු කෙරෙහි; පටිබද්ධචිත්තා, පිළිබඳ සිත් ඇත්තී; අහොසි, වූවාය. මාතුගාමානං, ස්ත්‍රීන්ගේ; චිත්තස්ස, සිත්හි; අවිසෙසතා, අශිෂ්ටත්වය; අහො, පුදුමයි. තථාහි, ඒ එසේමැයි.

2. යථා, යම්සේ; ලතා, වැල; අයං, මේ; කණ්ටක රුක්ඛො ඉති, කටු ගසක් යයි ද; අයං, මේ; විසරුක්ඛො ඉති, විෂ ගසක් යයිද; අයං, මේ; චන්දන රුක්ඛො ඉති, සඳුන් ගසක් යයි ද; න විසෙසෙති, වෙනසක් නොකරයි.

3 .ලොකෙ, ලෝකයෙහි, කාමන්ධා, කාමයෙන් අන්ධ වූ; වනිතා, ස්ත්‍රීහු; හීන උක්කට්ඨ මජ්ඣිමෙ, පහත්, උසස්, මධ්‍යම යන අයද; කුලීනෙ, උසස් කුලවතුන් ද; දුක්කුලීනෙ අපි, කුලහීනයන්දැයි; ලතා විය, වැලක් මෙන්; න ජහන්ති, අත් නොහරිත්.

4. සො'පි, හෙතෙමේ ද; තස්සා, ඇය කෙරෙහි; පටිබද්ධ චිත්තො,

පිළිබඳ සිත් ඇත්තේ; තං, ඇය; මහාගාමං, මාගමට; නෙසි, ගෙන ගියේය. තතො, ඉක්බිති; සා, ඕතොමෝ; තත්‍ථ, එහි; ගන්ත්වා, ගොස්; තස්ස ගෙහෙ, ඔහුගේ ගෙයි; වසමානා, වාසය කරමින්; නිච්චමෙව, නිතරම; අට්ඨන්නං, භික්ඛූනං, භික්ෂූන් අට නමකට; සලාක භත්තං, සලාක බත්; දෙති, දෙයි; නිච්චං, නිතර; ධම්මං, බණ; සුණාති, අසයි; චෙතිය බොධියාදිනි, දගැබ් මහ බෝ ආදිය; වන්‍දනති, වදිමින්; පුඤ්ඤමෙව, පින්කම්ම; කරොති, කරයි. අථ, එකල්හි; එක දිවසං, එක් දවසක්; සා, ඕතොමෝ; ආසන සාලා, ආසන ශාලාවට; ගන්ත්වා, ගොස්; භික්ඛූනං, භික්ෂූන් වහන්සේට; වෙය්‍යාවච්චං, වතාවත්; කුරුමානං, කරමින්; කාලං වීතිනාමෙස්, කල් යැවීය. තස්සා, පන සාමිකො, ඇගේ සැමියා; අස්සද්ධො, සැදැහැනැත්තෙකි. තස්මා, එහෙයින්; තං, ඇ; ගෙහං, ගෙදරට; ආගතෙ, ආකල්හි; ත්වං, තී; පුඤ්ඤකම්මං, පින්කම්; කරිස්සාමි ඉති, කරන්නෙමියි; ගෙහෙ, ගෙයි; කිඤ්චිකම්මං, කිසි වැඩක්; න කරොසි ඉති, නොකරහි යි; තස්සා, ඇට; කුජ්ඣිත්වා, කිපී; ගෙහතො, ගෙදරින් නිහරි, නෙරපීය. සා පන, ඕ තොමෝ වනාහි; සත්ත දිවසං, සත්දිනක්; ජඩ්ඩිත, (මිනිසුන් විසින්) අත්හළ; පතිත, වැටුණු; ගෙහ කුඩ්ඩං නිස්සාය; ගෙබිතක් ආධාර කොට ගෙන; නිරාහාරං, නිරාහාරව; වසමානා, වාසය කරන්නී; නිස්සංසයෙන, නිසැකයෙන්ම; අත්තනො, තමන්; ජහිතභාවං, අත්හළ බව; ඤත්වා, දැන; අනුරාධපුරෙ, අනුරාධපුරයෙහි; මම, මගේ; මාතා පිතුන්නං, මවුපියන්; සන්තිකං එව, සමීපයටම; ගමිස්සාමි ඉති, යන්නෙමි යි; අනුරාධපුරගාමී මග්ගං, අනුරාධපුරයට යන මාවතට; පටිපන්නා, පිළිපන්නාහු; තත්‍ථ තත්‍ථ, ඒ ඒ තන්හි; චෙතිය බොධියාදීනි, දගැබ් මහබෝ ආදිය; වන්‍දන්ති, වදිමින්; අනුපුබ්බෙන, පිළිවෙලින්; නිග්‍රොධ සාල බණ්ඩද්වාරං, නුගහල් කඩ දෙරට; සම්පාපුණි, පැමිණියාය. සෙරිචාරි විහාරින, හුදකලාව ඇවිදින්නන්ට; එවමෙව, මෙවැනි; පරිහානි, පිරිහීමක්; හොති, වේමය. අහො, ඛෙදයකි; තථාහි, ඒ එසේමැයි.

5. ඛුද්දකං වා, කුඩා වූ හෝ; මහන්තං වා, මහත් වූ හෝ; ඉට්ඨා නිට්ඨං, ඉටු අනිටු වූ; ක්‍රියාවිධිං, යම් කිසි ක්‍රියා විධියක්; මාතා පිතාදි, මවුපියාදී; වුඩ්ඪානං, වෘධයන්ගේ; අනුඤ්ඤාය එව, අනුදැනීමෙන්ම; කාරයෙ, කරන්නේය.

6. වෙ, ඉදින්; ජනකෙ ජනෙ, මවුපියන්; න ඉච්ඡාය, නොකැමැත්තෙන්; රජ්ජං, රාජ්‍ය සම්පත්තික්; ලභනෙතන අපි, ලබන්නේ නමුදු; අනුජාතෙන සූනුනා, අනුජාත පුත්‍රයා විසින්; සො ලාභො, ඒ සම්පත්ති ලාභය; න බහු මන්තබ්බො, බහුමාන නො කටයුතුයි.

7. වුඩ්ඪෙහි; දෙමාපියන් ආදී වැඩිමහල්ලන් විසින්; අනනුඤ්ඤාය, අනුනොදැනීමෙන්; යං අබ්භුතං, යම් අද්භුත කායයීයක්; කතං, කරන ලද්දේ; එසො, මෙතෙම; සෙරිචාරි ඉති, හිතුවක්කාරයෙක් යයි; ඤතකා, නෑයෝ; තස්ස, ඔහුට; ගරහන්ති එව, නිඳ කරත්මය.

8. අනුද්ධතො, උද්ධතු නොවූ; අචපලො, චපල නොවූ; නිපකො, ප්‍රඥා ඇත්තාවූ; සංවුතින්ද්‍රියො, සංවුත් ඉඳුරන් ඇති; පුතෙතා, පුත්‍රතෙම; පසංසා, ප්‍රශංසාව; ලභතො, ලබන්නේය. සබ්බසො, සර්වප්‍රකාරයෙන්; වුඩ්ඪිං, අභිවෘධියට; පපෙපාති, පැමිණෙන්නේය.

9. සා පනෙසා සද්ධා සුමනා, ඒ මේ ශ්‍රද්ධා සුමනාවෝ; මාතා පිතූනං, මවුපියන්ට; අනාරොචෙත්වා, නොකියා; ආගතත්තා, ආ හෙයින්; එත්තකං, දුක්ඛං, මෙපමණ දුක්; අනුභවි, අනුභව කළාය. අථ, එකල්හි; තත්‍ථ ඨිතං, එහි සිටි; තං, ඇය; දෙව මනුස්සෙසු, දෙව් මිනිසුන් අතරෙහි; චාරිකං චරමානො, සැරිසරන්නා වූ; සක්කො දෙවානමින්දො, සක්දෙව් රජ; දිස්වා, දැක; එසා සද්ධා, මෝ ශ්‍රද්ධාවත්ය.; වත්‍ථුත්තය මාමිකා ඉති, තෙරුවන් මාමක යයි; චින්තෙත්වා, සිතා; මහල්ලක වණ්ණෙන, මහළු වෙසකින්; භත්තපුටං, බත් මුලක්; ආදය, රැගෙන; තස්සා, ඇගේ; අභිමුඛෙ, ඉදිරියෙහි; පාතු භවිත්වා, පහළව; තස්සා, ඇගේ; සන්තිකං, සමීපයට; ගන්ත්වා, ගොස්; අම්ම, මෑණියෙනි; කුහිං ගච්ඡසි ඉති, කොහි යන්නෙහි දැයි; පුච්ඡි, විචාළේය. තාය, ඇය විසින්; අනුරාධපුරං, අනුරාධපුරයට; ගච්ඡාමි ඉති, යමියි; වුතෙත, කී කල්හි; සක්කො, ශක්‍රයා; ත්වං, තී; අතිවිය, ඉතාම; ජාත රූපා'සි. බඩගිනි වෙහි. ඉමං භත්තං, මේ බත්; භුඤ්ජ ඉති, අනුභව කරවයි; භත්තපුටං, බත්මුල; අදසි, දුන්නේය. සා, ඕතොමෝ; භත්තපුටං, බත් මුල; ගහෙත්වා, රැගෙන; ඉමස්මිං ඨානෙ, මෙතැන; උදකං, ජලය; නත්‍ථී'ති, නැතැයි; වත්වා, කියා; අට්ඨාසි, සිටියාය, සක්කො, ශක්‍රයා; තස්සා, ඇයට; අවිදූරෙ ඨානෙ, නුදුරු තන්හි; සුපුප්ඵිතං, මල් පිපුණු; එකං පොක්ඛරණිං, එක් පොකුණක්; දසෙසසි, දැක්වීය. සා, ඕතොමෝ; පොක්ඛරණිං ගන්ත්වා, පොකුණට ගොස්; නහාත්‍වා, නා; හත්‍ථ පුටං, බත්මුල; ගහෙත්වා, ගෙන; හත්‍ථෙ, අත්; ධොවිත්වා, සෝද; ඨිතා, සිට; කාලං ඔලොකෙත්වා, කල්බලා; අයං පුරෙභත්තං තාව, මේ තවම පෙරබත් කාලයයි; ඤත්වා, දැන; කාලං ඝොසෙසි, කාල ඝොෂා කෙළේය. තං සුත්වා, එය අසා; තලගර සමුද්ද පබ්බත වාසී, තලගුරු මුහුදු පව්වෙහි වැසි; මහා ධම්ම දින්නත්‍ථෙරා, මහා ධම්ම දින්න තෙරුන් වහන්සේ; නිරොධ සමාපත්තිං සමාපජ්ජිත්වා, නිරෝධ සමාපත්තියට සම වැද; සත්තමෙ දිවසෙ, සත්වැනි දිනයෙහි; නිරොධා වුට්ඨිතො, නිරොධ සමාපත්තියෙන් නැගිට; පත්ත චීවරං ගහෙත්වා, පා සිවුරු ගෙන; තස්සා, ඇගේ; අවිදූරෙ, සමීපයෙහි; පාකටො, අට්ඨාසි, පෙනී සිටියේය.

අථ, ඉක්බිති; සා, ඕතොමෝ; ථෙරං, තෙරුන්; දිස්වා, දැක; පසන්න මානසා, පහන් සිතින්; පත්තං, පාත්‍රය; ගහෙත්වා, රැගෙන; භත්තං. බත්; පූරෙත්වා, පුරවා; ථෙරස්ස, තෙරුන් වහන්සේට; දත්වා, දී; භන්තෙ, ස්වාමීනි; මුහුත්තං, මොහොතක්; තිට්ඨථ ඉති, සිටිනු මැනැවැයි; වත්වා, කියා; පටිච්ඡන්නට්ඨානං, වැසුණු තැනකට; පවිසිත්වා, පිවිස; සාඛාභඞ්ගං නිවාසෙත්වා, කොළ අතු ඇඳ; අත්තනා, තමන්; නිවත්‍ථ වත්‍ථං, ඇඳි වස්ත්‍රය; ධොවිත්වා, සෝද; චුම්බටකං, කත්වා, දරණුවක් කොට; අදසි,

දුන්නාය. ථෙරො, තෙරුන්වහන්සේ; සා, ඕතොමෝ; මං,මා; පස්සතූ ති, දකීවායි; අධිට්ඨාය, අධිෂ්ඨාන කොට; වත්‍ථ චුම්බටකෙ, වස්ත්‍ර දරණුවෙහි; පත්තං, පාත්‍රය; ඨපෙත්වා, තබා; ආකාසං, අහසට; අබ්භුග්ගන්‍ත්වා, පැන නැගී; විහාරං එව, විහාරයටම; අගමාසි, ගියේය. සා පි, ඕතොමෝ ද; තථා ගච්ඡන්තං, එසේ වඩින්නාවූ; ථෙරං දිස්වා, තෙරුන් දැක; පීතියා, ප්‍රීතියෙන්; ඵුට සරීරා, පිනා ගිය ශරීර ඇත්තී; ථෙරෙ, තෙරුන් වහන්සේ; දස්සනපථං අතික්කන්තෙ, දර්ශන පථය ඉක්මවත්ම; පඤ්ච පතිට්ඨිතෙන, පසඟ පිහිටුවා; වන්දිත්වා, වැඳ; දින්නාවසෙස භත්තං, දී ඉතිරි වූ බත්; භුඤ්ජිත්වා, අනුභව කොට; අනුරාධපුර මග්ගං, අනුරාධපුර මාර්ගයට; පටිපජ්ජි, පිළිපන්නීය.

10. තස්මිං ඛණෙ, එකෙණෙහි; තස්මිං නිග්‍රොධෙ, ඒ නුග ගසෙහි; අධිවත්‍ථා දෙවතා, අධිගෘහිත දෙවතාවා; එකස්මිං පසිබ්බකෙ, එක් පසුම්බියෙක්හි; අට්ඨ දිබ්බ වත්‍ථං, දිව සළු අටක්; ඨපෙත්වා, තබා; එකස්මිං පසෙස, එක් පැත්තෙක්හි; දිබ්බ භත්තං ච, දිව්‍යමය බත්ද; ඨපෙත්වා, තබා; දිබ්බමය ගුළපූවෙ ච, දිව්‍යමය සකුරු හා කැවුම් ද; පූරෙත්වා, පුරවා; සකට යොග්ගං, සුදුසු වූ වාහනයකට; ආරුය්හ, නැග; තං, ඒවා; තත්‍ථ, එහි; ඨපෙත්වා, තබාගෙන; සකටං, ගැල; පාජෙන්තො, පදවමින්; තස්සා, ඇයට; අවිදූරට්ඨානෙ, නුදුරු තැනෙක්හි; පාකටො, හුත්වා, පෙනී සිට; අම්ම, මැණියෙනි, කුහිං ගච්ඡථ ඉති, කොහියෙහිදැයි; පුච්ඡි, විචාළේය. තාය, ඇය විසින්; අනුරාධපුරං, අනුරාධපුරයට; ගච්ඡාමි ඉති, යමියි; වුත්තෙ, කී කල්හි; තෙනහි, එසේ නම්; ආගච්ඡ, එන්න; ඉමස්මිං සකටෙ, මේ රථයෙහි; නිසීද, වාඩිවෙන්න; අහම්පි, මම ද; තත්‍ථ, එහි; ගච්ඡාමි ඉති, යමියි කීය. සා, ඕතොමෝ; සාධු අය්‍ය, මැනවි ස්වාමීනි; තයා සද්ධිං, ඔබ සමග; පච්ඡතො, පස්සෙන්; ගච්ඡාමි, එමි; සාඛා නිවාසෙත්වා, අතු ඇඳගෙන; සකටෙ, ගැලෙහි; නිසීදිතුං, හිඳින්ට; න සක්කා ඉති, නොහැකි යයි; ආහ, කීවාය. තතො, ඉක්බිති; සො, හෙතෙම; තස්සා, ඇයට; එකං දිබ්බ වත්‍ථං, එක් දිව්‍ය වස්ත්‍රයක්; අදසි, දුන්නේය. ඉමං, මෙය; නිවාසෙත්වා, ඇඳගෙන; සකටං, ගැලට; ආරුය්හථ, නගින්න; සා, ඕතොමෝ; තං, එය; නිවාසෙත්වා, ඇඳගෙන; සකටං, රියට; ආරුහි, නැංගාය. තං පන සකටං, ඒ රිය වනාහි; දෙවානු භාවෙන, දෙව ආනුභාවයෙන්; මුහුත්තමත්තෙන, මොහොතකින්ම; චෙතියගිරිං, සෑගිරියට; සම්පාපුණි, පැමිණියේය. තදා, එකල්හි; දෙව පුත්තො, දිව්‍ය පුත්‍ර තෙමේ; ගුළපූව, තින්තිණිස්මිං, සකුරු පූ තියඹරාව සමීපයෙහි; සකටං, රිය; නිවත්තෙත්වා, නවතා; ඉතොපට්ඨාය, මෙතැන් පටන්; මයා, මා විසින්; ගන්තුං, යන්ට; න සක්කා ඉති, නොහැකැයි; වත්වා, කියා; පසිබ්බකං, පසුම්බිය; තස්සා, ඇයට; දත්වා, දී; අන්තරධායි, අතුරුදහන් විය. තදා, එකල්හි; තත්‍ථ, එහි; නිබ්බත්තා, උපන්; තින්තිණික දෙවතා, සකුරුපූ තියඹරාවෙහි දෙවතාවා; තං පසිබ්බකං ආදය, ඒ පසුම්බිය ගෙන; ගච්ඡන්තිං, යන්නීය; දිස්වා, දැක; තස්සා, ඇගේ; වෙය්‍යාවච්ච කරො හුත්වා, මෙහෙකරුවෙකු මෙන් වී; තස්සා හත්‍ථතො, ඇගේ අතින්; තං

සබ්බං, ඒ සියල්ල; ගහෙත්වා, ගෙන; අනුරාධපුරං, අනුරාධපුරයට; පත්වා, පැමිණ; මහා පාලියං, මහාපාලි නම් දන්හලට; භික්ඛූනං, භික්ෂූන්; ඔසරණවෙලාය, රැස්වන වේලාවෙහි; තත්‍ථ, එහි; ඨපෙත්වා, තබා; අන්තරධායි, අතුරුදහන් විය. තතො, ඉක්බිති; සා, ඕතොමෝ; භික්ඛූ, භික්ෂූන්; දිස්වා, දැක; පසන්න මානසා, පැහැදිලි සිතැත්තේ; පඤ්ච මහාවාසෙ, පැහැදිලි සිතැත්තේ; පඤ්ච මහාවාසෙ, පඤ්ච මහා ආවාසයන්හි; නෙකසතානං භික්ඛූනංච, නොයෙක් සිය ගණන් භික්ෂූන්ටද; දිබ්බභත්ත, දිව්‍ය ආහාරද; දිබ්බපූව, දිව්‍යමය කැවුම් ද; දිබ්බ සාටකෙච, දිව්‍යමය සළු ද; අදාසි, දුන්නීය.

තද, එකල්හි; රාජා, රජතුමා; විහාරං, විහාරයට; ගච්ඡන්තො, යන්නේ; මහාපාලියම්හි ඨපිතං, මහාපාලී දන්සැලෙහි තබන ලද; එතං සබ්බං, මේ සියල්ල; දිස්වා, දැක; පසන්නමානසො, සතුටු සිතැත්තේ; කෙන, කවරෙකු විසින්; ඉදං දින්නං ඉති, මෙය දෙන ලද්දේ දැයි; පුච්ඡි, විචාළේය. මනුස්සා, මිනිස්සු; සද්ධා, සුමනාය, ශ්‍රද්ධා සුමනාව විසින්; දින්නභාවං, දුන් බව; කථෙසුං, කීවාහුය. රාජා, රජතුමා; තං, ඇය; පක්කොසා පෙත්වා, කැඳවා; දානස්ස, දානොපකරණ; ආගමනං, ආගැටි; පටිපුච්ඡි, විචාළේය. සා, ඕතොමෝ; තං සබ්බං, ඒ සියල්ල; විත්‍ථාරෙත්වා, විස්තර කොට; කථෙසි, කීවාය. රාජා, රජතුමා; තස්සා, ඇයට; තුස්සිත්වා, සතුටුව; අත්තනො, තමන්ගේ; අග්ගමහෙසිත්තෙන, අගමෙහෙසුන් බවෙන්; අභිසෙකං, අභිෂෙකය; අදාසි, දුන්නේය. සා, ඕතොමෝ; අභිසෙකං පත්වා, අභිෂෙකයට පැමිණ; රාජානං ආදිකත්වා. රජතුමන් ආදිකොට ඇති; සකල නගර වාසීනං, සියළු නගරවැස්සන්ට; දිබ්බ වත්‍ථං එව, දිව්‍ය වස්ත්‍රම; අදාසි, දුන්නාය. අට්ඨ දිබ්බ සාටකානි, දිව සළු අට; පරික්ඛයං, අඩු බවකට; නාගමිංසු, නොගියාහුය. සා, ඕතොමෝ; තතො පට්ඨාය, එතැන් පටන්; දානාදිනි පුඤ්ඤානි කත්වා, දන්දීම් ආදී පින්කම් කොට; දෙවලොක පරායනා අහොසි, දෙව්ලොව උපන්නී විය.

11. හො, පින්වත්නි; ජනානං, ජනයන්ගේ; සද්ධා බලං, ශ්‍රද්ධා බලය; පස්සථ, බලව්. ඉධ එව, මේ ජාතියෙහිදීම; දෙවා, දෙවතාවෝ; තං, ඔහු; උපාසන්ති, උපස්ථාන කරත්. පරත්‍ථ, පරලොව ද; දෙවෙසු ච, දිව්‍ය ලෝකයෙහි ද; මනුස්සෙසු, මනුෂ්‍ය ලෝකයෙහි ද; තෙසං, ඔවුන්ගේ; මහතිං විභූතිං, මහත් වූ ශ්‍රී විභූතිය; කථන්නු, කෙසේ නම් වන්නේද?

**සද්ධාසුමනාය වත්‍ථුං, ශ්‍රද්ධා සුමනාවගේ කථාව; දසමං, දස වැන්නයි;**

**උත්තරොලිය වග්ගො ජට්ඨො-සවැනි උත්තරොලිය වර්ගයයි.**

මාදම්පෙ - ඉරට්ටකුලම්හි "වනමල්" වෙශ්මාධීශ. පාඨශාලාචාර්‍ය්‍ය
**පණ්ඩිත, රන්ජිත් වනරත්න (බී.ඒ.)** විසින් ලියන ලද
රසවාහිනී-වනරත්න ව්‍යාඛ්‍යාවෙහි මිගපොතක වර්‍ගය
සහ උත්තරොලිය වර්‍ගය නිමියේය.

# රසවාහිනී අනුවාදය
## ද්විතීය භාගය
## ලංකාදීප උප්පත්ති කථා

## 5.1. මුවපැටියාගේ කථාව.

1. සිංහලද්වීපයෙහි උද්දලොලක නම් එක් සිත්කළු විහාරයක් විය. ඒ විහාරය සමීපයෙහි බොහෝ මුවෝ හා ඌරෝ වසති. එකල්හි එක් වැදි ගමක වැදි පුතෙක් මේ වනයෙහි, බොහෝ මුවන් හා ඌරන් දැක එක් දිනක් වනයෙහි එක් පැත්තක කොටුවක් සාද වනයෙහි කෙළවර කොළ අතු බැඳ දුනු කලප් රැගෙන මුවන්ගේ පැමිණීම බලමින් කොටුවෙහි සිටියේය.

ඉක්බිති මුවෙක් එහි ගොදුරු ගෙන පැන් බොන්නට තොටට යන්නේ එම විහාරයෙහි බණ අසනු සඳහා ඝෝෂා කළ ශබ්දය අසා දික්කළ ගෙලින්, උස් කළ කනින් හා බිම නොතබන ලද දකුණු පාදයෙන් යුතුව දම් දෙසන භික්ෂුවගේ කඩ හඬෙහි නිමිති ගෙන සිටියේය.

2. එකෙණෙහි වැද්ද එක පහරින්ම විද මරණයට පත් කෙළේය. ඉක්බිති ඒ මුවා කළුරිය කොට එම වෙහෙර වැසි අභය හිමියන්ගේ නැගණියගේ කුසෙහි පිළිසිඳගෙන දසමස් ඇවෑමෙන් මවු කුසින් බිහිවී පිළිවෙළින් වැඩෙන්නේ සත් වයස් ඇත්තෙක් විය. මවුපියවරු ඒ දරුවා අභය හිමියන් ළඟට ගෙන ගියාහුය. හේ නොබෝ කලකින් පැවිදි කරවිය. ඒ කුමරා පෙර මුව දිවියෙහි දී කරන ලද දහම් දෙසුම්හි බලයෙන් කර අගදීම රහත් බවට පැමිණියේය. ඔහුගේ මයිලණුවන් වන හිමියෝ අවබෝධ කළ පඤ්චාභිඥා අෂ්ට සමාපත්ති ඇත්තෝ නමුදු රහත් බව් නොලැබූවෝය. ඉක්බිති එක් දිනක් සාමණේරයන් වහන්සේ උදෑසනම උපාධ්‍යය ස්ථවිරයන් වහන්සේ කරා ගියහ. ඉක්බිති උපාධ්‍යයයන් වහන්සේ අත ඔසවා සඳ මඬල පිරිමදිමින් සිටියේය. සාමණේරතෙම ස්වාමීනි, මෙය රැකීම සුදුසුය කීයේය. ස්ථවිරයන් වහන්සේ සාමණේර තැන අගපල රහත් බවට පත් බව නොම දැන ඔහුගේ වචනය මෙනෙහි නොකළහ. ඉක්බිති සාමණේර තෙම සෘද්ධියෙන් දහසක් චන්ද්‍රයන් ගෙන හැර පා තෙරුන් වහන්සේට දක්වා ස්වාමීනි, චන්ද්‍රයන් දහසක් ලක්ෂයක් ගෙන හැර පෑම අමාරු නොවේ. යමෙක් එකම තෘෂ්ණාව අත හරීද එයම ශ්‍රේෂ්ඨය වැදගත් යයි සලකමින් මෙසේ කීයේය.

3. යම් නැණහීන මිනිසෙක් ඉවුරෙහි සිට මහමුහුද දැක මහ මුහුද

දැක්කෙම් යි කියයිද?

4. මෙවැනිම මහණ තමා ළඟ ඇති කෙලෙස් පහකොට නොහැර ඒකාන්තයෙන් අභිඥා බලය ලබා ගෙන,

5. කෙලෙස් නොනසා කෙලෙස් නැසුයෙමියි හඟීද (හේ) තෘෂ්ණා නමැති දසකමින් යුක්ත වූයේ නො මිදීම පවතී.

6. ඉතා නිශ්‍රක වූ, ක්ෂෙම නොවූ බියජනක වූ අත්හැර නොයන්නා වූ තෘෂ්ණාව යමෙක් ඉවත් කෙරේද හේ මරුගේ බැඳුම්වලින් නිදහස් වූවා වේ.

7. මෙය අසා ස්ථවිරයන් වහන්සේ එදිනම රහත් වූ සේක. ඉක්බිති දෙවැනි දින තෙරුන්ගේ නැගණියෝ සාමණේරයන් වහන්සේත් සමග තෙරුන්ට ආරාධනාවක් කළහ. ස්ථවිරයන් වහන්සේ සොහොයුරියට මෙසේ වදළහ.

උපාසිකාව තී විසින් අද බොහෝ මහණුන්දැ දැක සිත පැහැදිය යුතුය. එහෙත් (ආහාර) කොටස දෙදෙනාට පමණක් විය යුතු යයි ඇය යවා පෙරවරු සමයෙහි හැඳ පොරවාගෙන පා සිවුරු ගෙන මහණුන්දැ තිස් දහසක් සමග වැඩම කළහ. ඇය එය දැක මාමාට හා බෑණාට පමණක් ආසන පැනවූවාය. ඒ ආසන උන්වහන්සේලාගේ ආනුභාවයෙන් තිස් දහසක් පමණ විය. උන්වහන්සේලාගේම ආනුභාවයෙන් ඇගේ ගෙය ද විශාල විය. භික්‍ෂූහු පැමිණි පැමිණි අසුන්වල වැඩ හුන්හ. ඒ දෙදෙනා වහන්සේට පිළියෙල කරන ලද සූපව්‍යාඤ්ජනාදිය ඒ තිස් දහසක් පමණ භික්‍ෂූන්ට සෑහිණ. වළඳ අවසානයෙහි ඒ උවසිය අනුමෙවෙනි බණ සඳහා සාමණේරයන්ගේ පාත්‍රය ගත්තාය. ඒ හෙරණුන්දැ ද උන්වහන්සේලාගේ මැද අභිවෘද්ධිය වඩවමින් මිහිරි වදන් පිට කරමින් ධර්මය දෙසූහ. දෙසුන් අවසන මවුපියන් මුල් කොට කුල පන්සියයක් සෝවාන් පෙලෙහි පිහිට වූහ. බොහෝ දෙනාට ධර්ම දේශනාව සාර්ථක වූවාය.

8. දහම් දෙසන විට වන සත්තු ද ඒ ශබ්දයේ නිමිත්ත පමණක් ලැබගෙන මිනිස් සැප හා නිවන් සැප ලබති. බුදුරජාණන් වහන්සේ කෙරෙහි යොදවන ලද ශ්‍රද්ධාව ඇති අය බණ අසා බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද වර්ණනාවට සුදුසු දෙව් විමන්වල නො ඇලේද (ඇලේමැයි)

1. මිගපොතක කථාව නිමි.

## 5.2. බණ ඇසූ උපාසිකාවගේ කථාව.

1. ලක්දිව රුහුණු දනව්වෙහි සිය ගණන් මහණ මෙහෙණින්ගෙන්

ගැවසුණු, සිය ගණන් වෙහෙර විහාරයන්ගෙන් ද නොයෙක් රන් රුවන් ඈ වස්තූන්ගෙන් ද සමන්විත ප්‍රභූ ජනයාගෙන් ද ගැවසුණු, නන් නළු ගී හඬින් නිතොර දනමන පුබුදු කරවන නිරතුරු දන්දීම් නමැති ක්‍රීඩාවෙහි යෙදුණු මිනිසුන්ගෙන් හෙබි, තුනුරුවන්ට පූජා කිරීමෙහි නියැලුණු, සැදැහැති කුලයන්ගෙන් ගැවැසුණු, ඒ ඒ තැන හැසිරෙන දහම් සොඬ මිනිසුන් විසින් එකතින් පැවැත්වෙන සාධු නාදයෙන් යුත් මහගම නම් එක් සිත්කළු ගමක් විය.

ඒ ගමෙහි රජමහ වෙහෙර මැද සුදෝ සුදු පවුරින් වට කරන ලද මුතු ඇතුරුවා වැනි සිය ගණන් සුදු වැලි තලාවෙන් සැරසුණු මලුව මැද මිහි අඟන මත කරන ලද රිදී ඔටුන්නක් වැනි සොබා දහමින් අගතැන් පත් මැණික් වෙහෙර නම් මහ වේහෙරක් විය. ඒ විහාරයෙහි මහ දෙරටුව සමීපයෙහි පිළියෙල කරන ලද දහම් මඩුයෙහි නිතොර දහම් දෙසුම් පැවැත්වේ.

2. බණ ඇසීමට එක් උවැසියක් තමන්ගේ පුතා ඇහිල්ලෙහි එල්ලාගෙන පැමිණ පිරිස් කෙළවරෙහි හිඳ විපිළිසර නොවී බණ ඇසුවාය. ඇයගේ පුතා (මේ අතර) සෙල්ලම් කරමින් පවුර සමීපයට ගොස් වැලි කෙළි කෙළියි. එක් නයෙක් පවුරේ සිදුරෙන් පිටට පැමිණ ඒ ළමයාට දෂ්ට කොට සැඟවුනේය.

ඈ පුතා දෂ්ට කළ නයා දැක ඉදින් කිසිවෙකුට කියම් නම් මගේ ධර්‍මය ඇසීම අනතුරට පත් වේ. පුත්‍රයෝ දුර්ලභ නොවෙත්. බුද්ධොපාදය දුර්ලභය. අමාරුවෙන් ලැබූ මිනිස් දිවියක් ඇති මා විසින් දුලබ දහම් ඇසීම ඉතා වටිනේ යයි කිසිවෙකුට නොකියා ධර්මය ඇසීය. ඇගේ පුතා ද විෂ වේගයෙන් මූර්ඡා වූයේය. ඊට පසු ධර්‍මදේශනාව කෙළවරට ගිය කල්හි උවැසිය නැගිට දරුවා සමීපයට ගොස් විෂ වේගයෙන් තදවූ සිරුරක් ඇති පුතා දැක මන්ත්‍ර හා ඖෂධයන්ගෙන් ප්‍රයෝජනයක් නොමැත. සත්‍යක්‍රියා නැමැති ඖෂධයම උසස් යයි පුතාගේ හිස ගෙන සත්‍යක්‍රියා කරන්නී මෙසේ කීවාය.

3. යම් සත්‍ය වචනයක් හේතුකොට මම බුදුරජාණන් වහන්සේ ගේ සරණයෙහි පිහිටියෙම් නම් ඒ සත්‍ය වචනය හේතු කොට ගෙන මාගේ මේ පුතා විස නැතිව සුවපත් වේවා.

4. යම් සත්‍ය වචනයක් හේතුකොට මම ධර්‍මයෙහි පිහිටියෙම් නම් ඒ සත්‍ය වචනය හේතුකොටගෙන මාගේ මේ පුතා විස නැතිව සුවපත් වේවා.

5. යම් සත්‍ය වචනයක් හේතුකොට මම සඟ සරණයෙහි පිහිටයෙම් නම් ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන මාගේ මේ පුතා විස නැතිව සුවපත් වේවා

6. යම් සත්‍ය වචනයක් හේතුකොට මම මොහොතක් නො

විපිළිසරව ධර්මය ඇසීම් නම් ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන මගේ පුතා විස නැතිව සුවපත් වේවා.

7. අකුරක් හෝ පදයක් හෝ කථාමාර්ගය අත් නොහැර උතුම් ධර්මය ඇසුවෙමි. ඒ සත්‍ය වචනය කරණ කොට ගෙන විස නසීවා.

8. බුදුරජාණන් වහන්සේ සවිනේ ගෙවා දැන නෛයර්‍යානික සේක් වී නම් ධර්මය මේ ජීවිතයේම අකාලික ඵල දෙන්නේවී නම් ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන මාගේ පුතාගේ විස නැතිවී සුවපත් වේවා.

9. සුපිළිපන් මහා සංඝයා වහන්සේ සුප්‍රතිපන්න සේක් වී නම් සතරමග සතර ඵලයෙහි පිහිටි සේක් වී නම් ඒ සත්‍ය වචනය හේතු කොට ගෙන මාගේ පුතාගේ විස නැතිව සුවපත් වේවා.

10. මේ බුදු සසුන අවුරුදු පන්දහසක් පවතී නම් ඒ සත්‍ය වචනය හේතු කොට ගෙන මගේ පුතාගේ විස නැතිව සුවපත් වේවයි (සත්‍යක්‍රියා කළාය.)

11. මේ සත්‍යක්‍රියාවගේ කෙළවර ඇගේ පුතා සුවපත්ව නිදුක්ව නිද පිබිදියෙකු මෙන් නැගිට මවු සමීපයෙහි සිටියේය. ඇ මෙසේ සත්‍යක්‍රියාවෙන් පුතා නිදුක් කොට ගෙන ගෙදරට ගෙන ගොස් ඒ සොම්නසින්ම බොහෝ පින්කම් කොට එයින් චුතව ස්වර්ගයෙහි උපන්නාය.

12. මෙසේ පිනාගිය සිතින් යුතුව බණ අසන ස්ත්‍රීහු ද එවැනි තද විෂ පවා නැති කොට දෙව්ලොව ඉපද එහි සැපවිඳිති. ශ්‍රද්ධා බුද්ධි සම්පන්න ජනතාව යහපත් ධර්මයෙහි හැසිර දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ නිවන් ද ලබති.

**2. බණ ඇසූ උපාසිකාවගේ කථාව නිමි.**

## 5. 3. කුඩ්ඩ රාජවාසී තෙරුන්ගේ කථාව.

1. සිංහල ද්වීපයෙහි මහගම නොයෙක් සිය ගණන් භික්ෂූන් වහන්සේ වාසය කරන මහවැව නම් විහාරයක් විය. එකල ඒ විහාරයෙහි වසරක් පාසා අරියවංස ධර්ම දේශනාව පවත්වන්නේය. දුර සිටත් බොහෝ දෙනා පැමිණෙති. මහත් වූ ජනසමාගමය වේ. මේ දනව්වෙහි වාසය කරන එක් මහ තෙර නමක් මම ද අරියවංශ ධර්මදේශනාව අසමි එහි ගොස් ඉඩක් නොලැබ මහ පිරිස් කෙළවර මලුවෙන් පිටත තණ පඳුරෙන් යුත් තැනෙක්හි අවසරයක් ලැබීය. හේ එතැන සිට මුළු රැයම බණ අසමින් අධික සන්තෝෂයට පැමිණියේ ලොමු ඩැහැගත් සිරුර ඇත්තේ වීය. ඒ තණ පඳුරෙහි පොළඟෙක් වසයි. ඉක්බිති ඒ පොළඟා තමා වසන තැනින් නික්මී තෙරුන්ගේ කකුල් අතර වැද සතර දළ ඇනා

තට්ටමට දෂට කෙළේය. මෙ කරුණ දුටු තෙරුන් වහන්සේ ඉදින් මම මෙතැනින් පහව ගියෙම් නම් බණ ඇසීමට කරදර වේ යයි අත පාත බහා පොළහාගේ හිස දැඩිකොට අල්වාගෙන වහන් පසුම්බියෙහි බහා කට බැඳ එක් පසක තබා ධර්මය ඇසීය. බණ ඇසීමේ ආනුභාවයෙන් ඔහුගේ ශරීරයෙහි විෂ නො පැතිරිණ. ඉක්බිති අරුණ උදාවූ විට මිනිසුන් (විහාරයෙන්) ගිය කල ස්ථවිරයන් වහන්සේ මා විසින් සර්පයෙක් ගත්තේ යයි සර්පයා දැක්වීය. කවර වේලාවක සර්පයා ගත්තේ දැයි භික්ෂූන් විසින් විචාරණ ලද්දේ නිධාන කථාව ආරම්භ කළ කාලයේම යයි කීයේය. පුදුමයි ස්වාමීනි පුදුමයි. තමුන්නාන්සේ විසින් සිදු කොට ඇත්තේ මහා පුදුම දෙයකි. මෙබඳු ඝෝරවූ සර්පයකු විසින් දෂට කරන ලද්දේ නමුදු විෂ වේගයෙන් විපිළිසර නොවී බණ අසන ඔබ විසින් කරන ලද්දේ යයි කීවාහුය. ඉක්බිති තෙරුන් වහන්සේ, එම්බා ඇවැත්නි, මාගේ ශරීරයෙහි විෂ ඉතිරි විය. එය සත්‍යක්‍රියාවෙන් අත හරින්නෙමියි සත්‍යක්‍රියා කරන සේක් මෙසේ කීහ.

බුදුරජාණන් වහන්සේ විසින් ලෝ වැස්සනට හිත පිණිස මොනවට වදරණ ලද නව ලොව්තුරා සදහම් අද මා විසින් ඉඳුරා අසන ලද්දේ වී නම් ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන පොකුරු පත නො ඇලි පහව යන පැන් ටිකක් මෙන් මාගේ ශරීරගත විෂය විනාශයට පැමිණේවා.

3. ඒ අසන්නා වූ ධර්මයෙහි එක අකුරක් පදයක් නොනසමින් පදගත අර්ථය ද ධර්මයද මෙනෙහි කරමින් ඉඳුරා බණ ඇසීම්. මෙ සත්‍ය වචනය හේතුකොට ගෙන පොකුරු පත නො ඇලී පහව යන දිය සේ ශරීරයෙහි ද විෂ විනාශයට යේවා.

4. බුදුරජාණන් වහන්සේගේ ගුණානුභාවයෙන් ද එම බුදුරජාණන් වහන්සේ විසින් දෙසන ලද ධම්මානුභාවයෙන් ද සංඝයා වහන්සේගේද තේජස කරණකොට වහාම මේ විෂ වේගය විනාශයට පැමිණේවා.

5. මේ සත්‍යක්‍රියාවගේ කෙළවර පියුම් පත්හි දිය බින්දු සේ විෂ පෙරලී පොළොවට පිවිසියේය. ඉක්බිති හෙතෙම විෂයෙන් තොරවූයේ භික්ෂූන්ට ධර්මානුභාව විශේෂය දක්වමින් ස්තුති කරමින් මෙසේ වදළහ.

6. මේ ධර්මය බුදුරජාණන් වහන්සේ විසින් පසස්නා ලදි. සංසාර නමැති සාගරයෙන් එතරවීමට මහ නැවක් වැන්න. බ්‍රහ්ම සුරාසුරයන් විසින් වැන්ද යුතුය. තුන් ලොවෙහිම ඇති එකම රසය ධර්ම රසයයි.

7. ධර්මය ජරාමරණ නමැති රෝග පහ කිරීමට දිව ඔසුවක් වැන්න. සියළු උපද්‍රව නැමැති විෂ නැසීමට දිව්‍ය මන්ත්‍රයක් වැන්න. කැමැති කැමැති දෑ දෙන බැවින් කප්රුකක් වැන්න. එසේම සිතුමිණි රුවනක් වැන්න. බදුරු කළයක් වැන්න.

8. දහමින් තොර මවුපිය කෙනෙක් නොමැත. ධර්මයම රක්ෂස්ථානය වේ; පිහිට වේ. එසේ හෙයින් පින්වත්නි, සෙසු කාර්ය තබා ධර්මය අසව්;

සිතිනුත් ධර්මයෙහි ම හැසිරෙව්; දරව්.

9. මෙසේ හේ ධර්මස්තුතියෙන් මහණුන්ට අවවාද කොට සිය තැනටම ගොස් බොහෝ කලක් එහි වාසය කොට ආයු කෙළවර ස්වර්ගයෙහි උපන් සේක.

10. මෙසේ ඒ තෙරුන් වහන්සේ සතුටු සිතින් බණ අසා ඒ දහම් ආනුභාවයෙන් විෂඝෝර සර්පයා දෂ්ට කළ එවැනි විෂ වේදනා ඉවසා නිදුක් වූ සේක. එබැවින් පින්වතුනි,. තොපි හැමදෙනාම ද සෙසු ද නැතත් බණ පමණක් අසව්. ඒ බණ තොපට අනාගතයෙහි දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිර්වාණ සම්පත්තිය සාද දෙන්නේය.

**3. කුඩ්ඩරජ්ජවාසී තෙරුන්ගේ කථාවස්තුව නිමි.**

## 5.4. ආරණ්‍යක මහා අභය තෙරුන්ගේ කථාව.

1. සිංහලද්වීපයෙහි මහවැව නම් විහාරයෙක් විය. එහි අභය නම් පරියත්ති හා ත්‍රිපිටකධාරී එක් මහ තෙර නමක් ග්‍රාමසේනාසනය අතහැර එයට සමීප එක් වන ලැහැබක කරන ලද පන්සලක වසයි. හේ මැත භාගයක ආරණ්‍යක මහා අභය ස්ථවිර යයි ප්‍රසිද්ධ විය. ඉක්බිති එක් කලෙක උපාසක කෙනෙක් උන්වහන්සේ කරා එළඹ වැද බණ අසා සතුටු සිත් ඇත්තේ උන්වහන්සේට අභියාචනය කොට අවුරුදු දෙළසක් සිවු පසයෙන් උවටැන් කෙළේය. හේ තෙරුන්ට සිවුරු සඳහා කලින් කල සළු දෙයි. දුන් දුන් සළු ඒ ගෙය තුලදීම හරන්තික නම් එක් හොරෙක් රාත්‍රියෙහි ගොස් පැහැර ගනී. තෙරුන් වහන්සේ දිරූ සිවුරු ඇත්තේම වී.

ඉක්බිති එක් දිනක් උපාසක තෙම විහාරයට ගොස් තෙරුන්ගේ දිරුණු සිවුරු දැක සිවුරු සඳහා සළු පිළි ගන්වා මෙසේ සිතීය. මා විසින් මුන් වහන්සේට බොහෝ සිවුරු දෙන ලදි. නමුත් සිවුරු මසා නොපොරවයි. එකතු කිරීමක් හෝ වෙන කෙනෙකුට දීමක් හෝ නොපෙනේ. මොකක් හෝ කරුණක් විය යුතු යයි ආසන්න ස්ථානයක පාරෙන් ඉවත්ව යන එන්නන් පරීක්ෂා කරමින් සැඟවී සිටියේය. ඉක්බිති සොරා තෙරුන් වහන්සේට සිවුරු පිළී පිළිගැන්වූ බව දැනගෙන එය ගනිමියි රෑ යාමෙහි විහාරයට ගොස් සළු ගෙන නැවත ඒ මඟින්ම එයි. ඉක්බිති උපාසකයා බඩු සහිත සොරා දැක වේගයෙන් දිව ගොස් ඔහුගේ ඔළුවෙන් අල්ලාගෙන මෙතෙක් කල් ආර්යයන් වහන්සේට දුන් සළු ගත්තේ බොල, තෝ නොවෙහි දැයි ඇසීය. ඔහු විසින් එසේ යයි පිළිගත් කල්හි උපාසක තෙම ඔහුගේ අතින් සිවුරු පිළි ගෙන අත් පා වලින් ඔහුට තලා දුර්වල කොට අමු සොහොනට ගෙන ගොස් මළ මිනියක් යටිකුරු කොට ඔහුගේ පිටෙහි උඩුකුරු කොට හොවා අත් පා පිට ආදියෙන් බැමි කොට වෙන වෙනම දැඩි කොට බැඳ හොවා පින්වත් ගම් වැසියෙනි,

මගේ වචනය අසව්! අද රාත්‍රි එක අමනුෂ්‍යයෙක් එයි. හේ නුඹලාට මහා විනාශයක් කරන්නේය. (එම නිසා) නිර්භය ස්ථානයකට පිවිස දෙරවල් වසා හිඳිව්. මම අසවලා වෙමි. අසවලාගේ නෑයාය, මිත්‍රයාය ආදිය කියා කථා කරන්නේ නමුදු ඔහු හා සමග කථා නොකොට යුතු යයි උද්ඝෝෂණය කෙළේය.

2. ගම් වැස්සෝ එය අසා බියව ත්‍රස්තව දෙරවල් වසාගෙන ඒ ඒ තැන සැඟවුණහ. රාත්‍රියෙහි සොරාට මළ මිනිය මුදා ගැනීමට නොහැකි වූයේ එය සමගම එකට බැඳුණේ තමන්ගේ දෙරකඩට ගොස් බිරියට ඇමතීය. මම හරන්තික වෙමියි. ඇය බිය පත්ව ත්‍රස්තව යක්ෂයා යන කල්පනාවෙන් සැඟවී ගති. සොරා තමා නන් අයුරින් අඳහවන්නේ නමුදු දෙර ඇරවා ගන්නට නොහැකි වන්නේ එසේම දෙමාපියන් නෑ සහලේ නෑයන් යහළුවන්ගේ ද ගෙවලට ගොස් එසේ දෙර අරවා ගැනීමට බැරි විය. ගිය ගිය තැන මිනිස්සු අමනුෂ්‍යයා ආයේ යයි යන කල්පනාවෙන් බියට පැමිණ දෙරවල් විවෘත නොකළහ.

සොරා ගම සෑම තැනම ඇවිද වෙන පිළිසරණක් නොලබන්නේ තෙරුන් වහන්සේම පිළිසරණ කර ගනිමියි විහාරයට ගොස් ස්වාමීනි, ඔබ වහන්සේගේ දසයාට පිහිට වන්න. මේ මළ සිරුර මුදවා මා සුවපත් කරනු මැනැවැයි ඉල්ලීය. තෙරුන් වහන්සේ වෙවුලන සිරුර ඇති ඔහු දැක වහාම මළ මිනිය මුදා දුරට දමා ඔහු උණුදියෙන් නහවා කුලාවෙන් තෙල් ගෙන ඔහුගේ මුළු සිරුරෙහි ගල්වා ඔහු විසින් පහර දුන් තැන් පිරිමදිමින් හුන්නේය. රාත්‍රිය පහන් වූ විට උපාසක තෙම සොරා කොහි ගියේ දැයි විචාරමින් සොයන්නේ තෙරුන් සමීපයට ගොස් ඔහුගේ පිට තෙල් ගල්වනු දැක තෙරුන් සමග කථා කරමින් මෙසේ කීවේය.

3. මොහු මගේ යහළුවා යයි යමෙක් උපකාර කෙළේද, ඒ සොරා එය සිහි නොකෙරේ. සොරා සමග යහළු කමක් නැත.

4. කමින් ද බොමින් ද එකට නිදිමින් ද සිටින්නේ නමුත් සොරා තමන්ගේ ස්වභාවය අත් නොහරී. සොරා සමග යහළුකමක් නැත.

5. සොරා කටින් එකක් කියයි. (එසේම) හේ කයින් අනිකක් කරයි. අවකාසයක් ලැබුණු හැටියේම සොරකම් කරයි. සොරා සමග මිතුරු කමක් නොමැත.

6. මවුපියෝ ද නෑදෑයෝ ද මිතුරෝ ද හොරා දැක දුරින්ම දුරු කරත්. හැමද ඔහු හා එක්වීම සැක කෙරෙති.

7. මෙසේ කියා ස්වාමීනි, මෙබඳු අනුන්ගේ වස්තුව පැහැර ගන්නා මිත්‍රද්‍රෝහියාට උපකාර නොකරනු මැනවි. පලවා හරිනු මැනවියි කීයේය. ඉක්බිති ඔහුට අවවාද කරන ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

8. යම් බල්ලෙක් යමෙකුගේ පාදය ඩසින්නේ ද ඔහු බල්ලාගේ

පාදය දෘෂ්ට නොකෙරේ. මෙසේම දුෂ්ට ගති ඇති අසත්පුරුෂයා කවරතරම් අපරාධයක් කළත් උන්ට සත්පුරුෂයෙක් නපුරක් නොසිතති.

9. කෙළෙහිගුණ නොදන්නා මිනිසාට යම්කිසි සත්පුරුෂ කෙනෙක් මෛත්‍රී නොකරන්නාහු නම් ඔහු කවරෙකුට මෛත්‍රිය කෙරෙද්ද, එය උතුම් වයඹාව යැයි පණ්ඩිතයෝ කියත්.

10. මෙසේ ද කියා පින්වත, දූෂණය වූ සිතින් තමා විසින් කරන ලද කර්‍මයාගේ විපාකය ඔහු විසින් ලබන ලදැයි කියා උපාසකයා යැවීය. හරන්තික කිහිප දිනකින් ශරීර ශක්තිය ලබා තෙරුන් වහන්සේ කරා පැමිණ වැද ස්වාමීනි, මම මේ දිවියෙන් අනිකෙකු සේ වීමි. නැවත ගිහිගෙයි වාසය කරන්ට නොහැක්කෙමි. අනුකම්පා උපදවා මා පැවිදි කරනු මැනවි ස්වාමීනියි, පැවිද්ද ඉල්ලීය. ඉක්බිති තෙරුන් වහන්සේ ඔහු මහණ කරවා උපසම්පද කරවීය. හේ වත් පිළිවෙත්හි දක්ෂ වූයේ භාවනානුයෝගීව වසන්නේ නොබෝ කලකින්ම රහත් බවට පැමිණ හරන්තික ස්ථවිරයයි ප්‍රකට වීය.

11. යමෙක් ප්‍රථම වයසෙහි පව්ටෙක් වී පස්කම්හි ගිජුවූයේ ද නුවණින් කල්පනා කිරීමෙන් පසුව ඒ මද ගතිය අත්හරිත් ද ඔහු කාමය පහකොට ත්‍රිභවයෙහිම බුදුරජාණන් වහන්සේ පැසසූ නිර්වාණ පුරයට යති.

**4. ආරණ්‍යක අභය තෙරුන්ගේ කථාව නිමි.**

## 5.5. සිරිනාගගේ කථාව

1. සිංහල ද්වීපයෙහි සිරිනාග නම් බමුණු පුතෙක් වීය. හේ එක් දිනක් විවේකයෙන් යුක්ත වූයේ මෙසේ සිතීය, ධනය සොයාගෙන එයින් යුද්ධ හමුදාවක් නඩත්තු කොට අනුරාධපුරයෙහි සේසත් ඔසවා රජ වන්නෙම් යනුයි. ඊට පසු හෙතෙම ධනය කොහෙන් ලබන්නෙම් දැයි ධනය ලැබෙන සැටි බලන්නේ දක්ෂිණ මහා විහාරයෙහි චෛත්‍යයක් දුටුවේය. මෙය බිඳ ධනය ගෙන පිරිසට සංග්‍රහ කරන්නෙමියි හේ බොහෝ මිනිසුන් සෙන ඒ ඒ තැන පැහැර ගත්තේ දක්ෂිණ මහා විහාරයට පැමිණ ස්තූපය බිඳින්න යයි මිනිසුන් යෙදවීය. මිනිස්සු චෛත්‍යයේ සන්ධිය සොයන්නෝ සන්ධිය නොදකිමු ස්වාමීනියි කීහ. ඉක්බිති කවරෙක් එය දනීදැයි සිරිනාග විසින් අසන ලද්දී ස්වාමීනි, හෙල්ලෝලි ගම බහුල නම් සැඩොලෙක් වේ. හේ එය දනීයයි (ඔවුහු) කීවාහුය.

ඉක්බිති හේ ඔහු කැඳවා කොල, මේ සෑයෙහි සන්ධිය නුඹ විසින් දන්නා බව මිනිස්සු බොහෝ සෙයින් කියති. සන්ධිය දැන සෑය බිඳින්න යයි කීයේය. ඉක්බිති හෙතෙම ස්වාමීනි, දෙවියන් මරුන් බඹුන් මහණ බමුණන් සහිත මෙලොව අග්‍රවූ ශ්‍රේෂ්ඨ වූ භගවත් වූ අර්හත් වූ සම්මා

සම්බුදුන්ගේ සරණය දිවි තෙක් මම සරණ කොට ගිය උපාසකයෙක්මි. මම ඒ දේවාති දේවවූ උන්වහන්සේගේ ධාතු නිදන් කොට පිහිටෙව් සෑය බිඳිම ආනන්තර්ය කර්මයක් සමානයි ස්වාමීනි, කීයේය.

2. ඔහුගේ මෙවන් බුදු ගුණ කනෙහි පිවිසි යකඩ උල් මෙන් විය. හේ ඔහුට කිපී මොහු ගෙන ගොස් දිවස් උලෙහි තබවයි නියෝග කෙළේය. ඔවුහු ඔහු දිවස් උල තැබූහ. මොහුට පුත්තු සත්දෙනෙක් ඇත. ඔවුහු මේ සන්ධිය දනිතියි කීහ. හේ ඔවුන් ද කැඳවා සන්ධිය බිඳුවව් යයි නියෝග කෙළේය. ඔවුහු ද එසේම බුදුරජාණන් වහන්සේගේ ධාතු නිධානයෙන් කළ චෛත්‍යය බිඳින්නට නොහැකි වෙමුයි අකමැති වූහ. සිරිනාග ඔවුනට ද කිපී එසේම දිවැස් උලෙහි තැබ්බවීය. ඒ එසේමැයි.

3-4. සත්පුරුෂ නැමැති සඳුන් අගිල් ආදී සුවඳ ද්‍රව්‍යවල සුවඳ ආඝ්‍රාණය කළ නිලමැස්සෝ එයින් වෙන්වෙති. කුණපයෙහිම ඇලෙති.

බුදුරජාණන් වහන්සේ දැකද කනට රස ඇති කරවන ධර්මය අසාද සසර කණු වැනි ඒ අසත්පුරුෂයෝ සිතේ සතුට නූපදවත්.

5. ඉක්බිති මේ අටදෙනාගේ ගුණ ආනුභාවයෙන් දෙවියෝ දේවලෝකයෙන් වාහන ගෙන අවුත් සියල්ලන්ම බලාගෙන ඉඳිද්දීම රියෙහි නංවාගෙන දේව සේනාවන් සමග තුසිත දිව්‍ය ලෝකයට ගෙන ගියහ. එහි රැස් වූ මහජනා මේ ආශ්චර්ය කාරණය දැක පැහැදුණු සිතැත්තෝ දේවයන් වහන්ස; සෑය නොබිඳුණු මැනවයි සිරිනාගට දැන්වූහ. ඉක්බිති හේ ඔවුන්ගේ වදන් අසා සෑය අතහැර දමා නැගෙනහිර මහ ගඟ සමීපයෙහි මීවිටි නම් ගම කොල්ලකා එහි මීවිටි නම් සෑය බිඳුවා ධනය ගෙන එයින්ම මහත් වූ සේනාවට සංග්‍රහ කොට යුද කර රාජ්‍යය ගෙන අනුරාධපුරයෙහි සේසත නංවා රජසිරියට පැමිණියේය. ඒ මේ අකුශලය නිසා නොබෝ කලකින්ම අතිශය දරුණු පින්කම් නොකළ හැකි බඩේ අමාරුවක් ඇති විය. පිළියම් කරන්නෝද ඒ රෝගය නිමා කිරීමට නොහැකි වූහ. ඉක්බිති හෙතෙම ධනය රැස්කොට සෑයෙහි පිහිටුවා ප්‍රකෘතිමත් කරන්නේ රෝගය සංසිඳුවාගන්නට නොහැකිව ඒ ආබාධයෙන්ම මහ දුකට පැමිණ කුස පලා කළුරිය කොට පා උඩුකොට හිස යටකොට දිළිසෙන අඟුරුවලින් ගැවසුණු මහා නරකයෙහි උපන්නේය. ඒ එසේ මැයි

6. යමෙක් සධාතුක සෑයක් බිඳී ද හෙතෙම සිරිනාග සේ හුදෙක් දුකට පැමිණේ.

7. යමෙක් බුදුපිළිමයක අත් පා සිඳිම් කෙරේ ද හෙතෙම සිරිනාග මෙන්ම අපායවල උපදී.

8. යමෙක් බෝරුකට සිඳුම් බිඳුම් ආදිය කෙරේ ද ඔහු ප්‍රත්‍යක්ෂයෙන් මෙලොව විනාශයට ද, මරණින් මතු රෞරව නරකයට ද යයි.

9-10-11. යමෙක් මහා සංඝයා වහන්සේට අපරාධ කෙරේද හෙතෙම ඒකාන්තයෙන් අපායගාමී වේ. යමෙක් බණ ලියූ පොත්පත් සිඳ බිඳ දමා විනාශ කෙරේ ද හේ මෙලොව අතපය සිඳීම් ඇත්තෙක් වේ. නරකයට ද යයි. නුවණැත්තා මෙය මහත් හානිකර මහක් යයි දැන උවදුරු සහිත මහ දුරින්ම දුරු කරයි.

12-13. මෙසේ දෙවියෝ කළ සුචරිත ඇති සැඩොලා පවා තුනුරුවන් පූජා කරන්නේ නම් තව්තිසා වැසි දෙවියෝ දෙව්ලොවට ගෙන ගොස් ස්වර්ග සම්පත්ති දෙති. එසේම කුසල් දම් නොකළ රජවරුන් පවා සොරවූ අපායට යති. එහෙයින් මේ පින ය පව යයි දැන පව් දුරු කරව් පින් කරව්.

**5. සිරිනාගගේ කථාවස්තුව නිමි.**

## 5.6. සැදැහැතිස් ඇමැති කථාව.

1. ලක්දිව සද්ධාතිස්ස මහරජතුමා රාජ්‍ය කරවන කාලයෙහි යුවරජ තනතුරෙහි තිස්ස නම් එක් ඇමැතියෙකු වීය. සැදැහැයෙන් යුත් හෙතෙම ඔහුගේ ශ්‍රද්ධාබලය නිසා සද්ධාතිස්ස අමාත්‍යයායි නමක් ලැබීය. එකල්හි හේ අනුරාධපුරයට ගොස් රජුට උවටැන් කරමින් වසයි. ඉක්බිති එක් දිනක් හේ රජුට උවටැන් කොට තමන්ගේ ගෙට ආපසු එන්නේ **තාළචතුෂ්ක** නම් ස්ථානයෙහි වූ සුදස්සන පදන් ශාලාවෙහි වාසය කරන පිණ්ඩපාතික තිස්ස ස්ථවිරයන් වහන්සේ පිඩු පිණිස හැසිරෙනු දැක පාත්‍රය ගෙන තමන්ගේ ගෙට ගොස් බත් පිස නොමැත්තේ බත් මුලක් රැගෙන යන එක මිනිසෙකු දැක මිත්‍රය කහවණුවක් ගෙන බත්මුල මට දෙනු මැනවයි කීයේය. මම තට නොදෙමියි කී කල්හි පිළිවෙළින් කහවණු මිළ දියුණු කොට කහවණු 8ක් ගෙන දෙන්න මෙ පමණමයි මා අතේ ඇත්තේ යයි කීය. ඉක්බිති හෙතෙම යහපතැයි දුන්නේය. හේ එය ගෙන පාත්‍රයට බෙදා තෙරුන් වහන්සේ පිණ්ඩපාතය ලැබූ සැටි දැන තමා තමාටම අවවාද කරමින් මෙසේ කීය.

2. තිස්සය, මේ උපාසකතෙම ඔබේ පියාවත්, මවවත්, මාමාවත්, නෑයෙක්වත් සහ ලේ නෑයෙක්වත් මිත්‍රයෙක්වත් නොවේ.

3 පෙර ඔබ විසින් ඔහුට කරන ලද උපකාරයක් නැත. සීලවන්තයෙක යන හැඟීමෙන් ඔබට ආහාර දුන්නේය.

4. ඉදින් ඔබ සතුටු නම් ඔහුට මහත් වූ ආනිසංසයක් දිය හැකියි. මැරුණත් මේ බොජුන සරාගීව අනුභව නොකරනු.

5. ඒ ධෛර්යවත් තෙරුන් වහන්සේ තමන්ට අවවාද දී එකල්හි දුක ක්ෂය කොට බුඩශාසනය බබුළුවන්නෙක්ව බත් කිස කළහ.

6. මෙසේ හේ තමන්ටම අවවාද කොට ගෙට ගොස් කරජකය ගැන සිතා විදර්ශනා වඩා අරහත්ව පිණ්ඩපාතය වැළඳීය. එකල්හි රජුගේ සේසතෙහි අධිගෘහිත දේවතාදුව සාධුකාර දුන්නීය. රජතුමා කුමක් නිසා සාධුකාර දුන්නේදැයි විචාරණ ලද්දී සඩාතිස්සගේ දනය නිසා සාධුකාර දුනිමියි සියල්ල කීවාය. රජතුමා ඔහුද ඔහුගේ දෙමවුපියන් ද කැඳවා ඔවුනට බ්‍රහ්මදෙය්‍ය කොට වඩමන් නගරය දුන්නේය.

විෂමව ගිය ගොවිතැන නිසා පසු කලක ලංකාව දුර්භික්‍ෂයකින් පෙළිණ. මිනිස්සු පැන් නොලබන්නෝ ක්ලාන්ත වෙති. එකල්හි මොහුගේ පින්බලයෙන් දෙවියෝ මවන ලද විලකින් පැන් කළ එළවූහ.

ඉක්බිති හෙතෙම ආර්යයන්ට පැන් නොදී පාවිච්චි කිරීම නුසුදුසු යයි සිතා මට අනුකම්පා, කොට ආර්යවරු පැමිණෙත්වායි කල් දැන්වීය.

තිස් දහසක් පමණ භික්‍ෂූහු එක්වූහ. ඉක්බිති හෙතෙම ඒ භික්‍ෂූන් වහන්සේට කැමැති සේ පැන් කළයෙන් වැළඳවීය. එකල්හි ද රජුගේ සේසතේ අධිගෘහිත දෙව්දූ සාධුකාර දුන්නාය. රජතුමා ද ඔහු කැඳවා විචාරා ඇති සැටියේ අසා කොටදෙර අතර ගහ නම් තැනක් දුන්නේය.

7. ඉක්බිති එක් දිනක් අනතර ගමට යන්නේ කඩදෙරට පැමිණ මොනර මස් කනු කැමැත්තේ මිනිසුන් අතින් විචාළේ නැතැයි කීහ. ඉක්බිති ඔහුගේ පින් තෙදින් දෙවියෝ මොනර මස් එළවූහ. ඉක්බිති හෙතෙම ආර්යයන් වහන්සේලා පැමිණෙත්වායි අඩ ගැසීය. එකල්හි බොහෝ භික්‍ෂූහු එක්රැස් වූහ. හේ කැමතිතාක් මොනර මසින් වැළඳවීය. එද ද දෙවතා දූ සාධුකාර දුන්නීය. ඉක්බිති රජතුමා ඔහු කැඳවා බොහෝ සම්පත් දුන්නේය. ඊට පසු කාලයෙහි රජතුමා සෑ පව්වෙහි අම්බස්ථල මහ සෑයෙහි හිරියල් මඩින් විලේපන කරනු කැමැත්තේ ඒ තිස්ස ඇමතියා ද සමග අම්බස්ථලයට ගොස් සෑය හිරියල් සුන්නෙන් උලා පූජා කෙළේය. ඇමතියා ද එකල දෙළොස් දහසක් භික්‍ෂූන් වහන්සේට හිරියල් පාට වැනි පාට ඇති තුන් සිවුරු දුන්නේය. සියළුම පින්වතුන් වහන්සේලා මේ සිවුර පොරවා සෑය වඳිත්වායි. ඉක්බිති ඔවුහු මනාව හැඳ පැළැඳ හිරියල් මඩෙහි ගැලුණුවුන් මෙන් බබළමින් ඒ සෑය පැදකුණුකොට පිළිවෙළින් රන් හසුන් බසින්නා සේ බසිති. එයින් හේ අධික සතුටට පැමිණියේ ප්‍රීතියෙන් පිනා ගිය සිරුරු ඇත්තේ එහි සිටම සෝවාන් විය. රජ පිරිසෙන් ද ඇතැමෙක් සෝවාන් වූහ. මේ පුදුමය දුටු බොහෝ දෙනා දන් දී සිල් රැක පොහොයකම් කොට දෙව් ලොව උපන්හ.

8. එසේ හෙයින් පින්වත්නි, මෙසේ ආශ්චර්යමත් ලෙස කරන ලද කුශල ධර්මයෝ දෙවියෝ පවා සාධුකාර දෙමින් අනුමෝදන්ව ස්තුති කරමින් පින් කරන්නන්ගේ ගුණ වර්ණනා කරති.

මෙසේ දැන ගත් පණ්ඩිත මිනිස්සු මානයෙන් තොරව ලෝකයෙහි

පින් රැස් කරති. මොහොතක්වත් හිස් නො කරවා නිතර කුසල් කරනු මැනවි.

**6. සැදැහැතිස් ඇමැති කථාව නිමි.**

## 5.7. ශ්‍රමණග්‍රාම කථාව

1. එක් කාලයක සැපවි වැසි දෙළොස් නමක් භික්ෂූහු ලඩ්කාවෙහි තැනින් තැන බෝධි චෛත්‍යයන් වඳිමින් පිළිවෙළින් සමණගමට (මහණ ගමට) පැමිණියෝ ය. එකල්හි හිරු බැස ගිය කල්හි රාත්‍රියෙහි අන් අතක යැමට නොහැක්කෝ එහි පෙර පස පූර්වපාදයෙහි සෙවණැති මහත් මයිල ගසක් දැක ගස මුලට ගොස් නිදගත්හ. ඉක්බිති ඔවුනතුරෙන් එක් භික්ෂුවක් නැගිට කාශ්‍යප සර්වඥයන් වහන්සේ විසින් දේශනා කරන ලද, නන්ද බ්‍රාහ්මණයා විසින් අපගේ සුතසෝම බෝධිසත්වයන්ට කියන ලද අතිශයින් උසස් වූ අදහසින් යුත් සීයක පරිත්‍යාගයට සුදුසු සතාරහ නම් වූ ගාථාවන් පිරිවහා පින් දුන්නේය. කෙසේද යත්?

2. සුතසෝමයෙනි, සත්පුරුෂයන් හා එක්වීම එකවරද යහපති. අසත්පුරුෂයන් හා සියක් අවුරුදු එක තැන් වාසය කිරීම අයහපත සඳහා වේ.

3. යහපත් අය සමගම මිතුරු දම් කරව්. සත්පුරුෂයා සද්ධර්මය දැනගෙන ශ්‍රේෂ්ඨයෙක් නොවේ.

4. මනාව සරසන ලද රජුන්ගේ වාහන පවා දිරති. ඉක්බිති ශරීරය ජරාව කරා යයි. සත්පුරුෂ ධර්මය ජරාවට නොපැමිණේ. සත්පුරුෂයෝ ඒකාන්තයෙන් ශාන්තිය ප්‍රකාශ කරති.

5. අහසට පොළව දුරු වූවා සේ ද, සමුද්‍රයෙහි මෙතෙරට එතෙර දුරු වූවාසේ ධර්මය අධර්ම දෙක අතර දුර ප්‍රමාණය ඊට ද වඩා දුර යයි කියත්.

6. ඒ රුකෙහි අධිගෘහිත දේව පුත්‍රයා මේ ගාථා අසා පැහැදී රාත්‍රිය පහන් වූ කල්හි මහණුන් ගමන කරන වේලෙහි මිනිස් වෙසින් පැමිණ ඔවුනට මෙසේ කීහ. ස්වාමීනි, අද නොයනු මැනවි, ගස මුලම හිඳිනු මැනවි. මම නුඹ වහන්සේලාට පිණ්ඩපාතය එළවන්නෙමියි භික්ෂූහු ඔහුගේ ආරාධනාව පිළිගෙන වැඩ හුන්හ. ඒ දේවපුත්‍රයාට ආහාර ඉපදවීමෙහි පිනක් නොමැත. නිතරම බදලතා කොළම ලැබේ. හේ මෙය වළඳමින් එහි වසයි. භික්ෂූන් වහන්සේලාට ද දිව ඕජසින් පිරී ගිය බදලතා කොළම එළවීය.

භික්ෂූහු ද එයින් නිම කරන ලද ආහාර කිස ඇත්තේ ටිකක් විශ්‍රාම ගෙන අපි යමු නිදුකාණෙනියි දේවපුත්‍රයාට කීවාහුය. මේ ඇසූ දේවපුත්‍රයා පින්වත් ස්වාමිවරුනි, මට සමාවන්න මා ළඟින් රළු කොළම

වැළඳූහ. මගේ මිත්‍රයා එක් දිව්‍ය පුත්‍රයෙක් වේ. හේ දවසක් මෙහි පැමිණ පිරිවර සහිතව මහත් ආනුභාවයෙන් දිව්‍යමය භෝජන වළඳන්නේය. හෙට එන දවසයි. ආර්යයන් වහන්සේලා බත් කිස කොට යන සේක්වායි ආරාධනා කෙළේය.

ඉක්බිති ඒ රාත්‍රිය ගෙවීමෙන් පසු මිතුරු දෙව් පුතා පිරිවර සහිතව ඔහුගේ සමීපයට ගියේය. ඔහුගේ පරිභෝගයට තුන් ගව්වක් පමණ තැන මග දිව්‍යමය කෑද භාජන ගෙන පිළිවෙළින් සිටියාහු ය. ඉක්බිති ඒ දිව්‍ය පුත්‍රයා තෙරවරුන් වඩා හිඳුවා දිව්‍යමය කෑද වළඳවා පසුව පිරිවර සහිතව තමා පාවිච්චි කෙළේය. ඊට අනතුරුව අවුළුපත් ගෙන එසේම සිටියාහු ය. දිව්‍යපුත්‍ර තෙම දිව්‍ය ආහාරවලින් තෙරවරුන් මනාව වළඳවා සත්කාර කෙළේය. ඉක්බිති ඒ ස්වාමිවරු දිව්‍ය පුත්‍රයාගේ මහත් වූ දිව්‍ය සම්පත්තිය දැක පුදුමයට පැමිණි සිත් ඇත්තෝ ඒ පින්කම් ගැන විචාරමින් මෙසේ ඇසූහ.

7. දිව්‍ය පුත්‍රයාණෙනි, (ඔබ) මහත් වූ දිව්‍යමය සෘද්ධියට පැමිණියෙහි, ඔබගේ ආලෝකය හැම දිසාවක්ම එළි කරයි. දිව්‍යමය පිරිස පිරිවරති. ඔවුහු නොයෙක් ආයුධ, සෙමෙර මොනර ආදි නොයෙක් අත් ඇතිව පිරිවරා සිටිත්.

8. දෙවඟනෝ නෘත්‍ය භූමියට ගියෝ නෘත්‍යයෙන් ගීතයෙන් යුක්තව ලයෙන් තොර නොව සවනට අමාවක් වැනි උත්සව ගීතයෙන් ගී කියා නටති; ගයති.

9. සමහර දෙවඟනෝ වීණා, වස් දඬු, තන්ත්‍රි ආදිය ගෙන ඒවායේ හඬ හා ගීත ස්වරය නො ඉක්මවා නානා විලාස දක්ව දක්වා තොප සතුටු කරවති.

10. නොයෙක් දෙනා සැරසී බෙර, මුතිඞ්ග, මුරජ, දෙණ්ඩිම ඝන හා නොයෙක් තලා වර්ග ගෙන වාදනය කරති. නටති. ;කෙළිති.

11. දිව්‍යමය ආහාර පාන වර්ගයන්ගෙන් පිරී ගිය රන්මය භාජන අරගෙන තුන් ගවු පමන මග සිටිති. පිරිවර සහිත, තෝ ඒ කරුණෙන් සතුටු වෙහි.

12. මහත් ආනුභාව ඇති දේවතාවාණෙනි, මම ඔබගෙන් අසමි. මිනිසෙක් වූ සමයෙහි කෙබඳු වූ පිනක් කෙළෙහි ද? කවර ශීලයක කවර ව්‍රතයක, කවර බ්‍රහ්මචරියාවක, කවර පරිශුද්ධත්වයක මේ විපාකද?

13. ඉක්බිති ඒ දිව්‍ය පුත්‍රයා උන්වහන්සේලාට තමන් විසින් පෙර භවයෙහි සෑ පව්වේ භික්ෂුවක් වී තමන්ට වස් අගින් ලැබුණු බතින් කොටසක් සංඝයා වහන්සේට පූජා කොට මේ සම්පත්තිය ලබා ගතිමියි ප්‍රකාශ කරමින් මෙසේ කීයේය

14. ලඞ්කාවේ මිස්සක පව්ව නමින් මහා විහාරයක් ප්‍රසිද්ධ විය

නොයෙක් සෑ වලින් බබළන, පිළිම ගෙවල් පඞ්ක්ති ඇති.

15. බෝධීන් වහන්සේගෙන් බබළන, සුදු වැලියෙදූ මළුවෙන් අලඞ්කාර, මනාව පිපීගිය මලින් හා සිහිල් දියෙන් පිරුණු නොයෙක් පොකුණු පතැස් ආදියෙන් ගැවසී ගත්තේය.

16. එක් දහස් සාරසීය සතළිස් සයක් පමණ පිරිවෙන් පෙළවල් සතකින් අතිශයින්ම දැකුම් කළු වූ ඒ විහාරය සැමදම මිනිසුන්ට ප්‍රීතිය ගෙන දේ.

17. එහි වාසය කරන යති සමූහයා සුපෙශලාදි නොයෙක් ගුණ ඇත්තෝය. සියළුම ජනයා වාසය කරති. ආත්මාර්ථය හා පරාර්ථය සිද්ධ කරති.

18. ස්වාමිවරුනි, මම දෙවන ජාතියහි එහි එක් ශ්‍රමණයෙක් වීමි. ඒ මම ශ්‍රද්ධාව, ශීලය දරමින් පිළිවෙතින් තුණුරුවන්ට පිදීමි.

19. පසු කාලයක මහජනයා භික්ෂූන් උදෙසා එලවන ලද අතිශයින් පිරිසිදු ප්‍රණීත මහත් ආහාර පාන තම තමාම භික්ෂූන්ට වළඳවත්.

20. මම ද එයින් කොටසක් ලදිමි. එයින් අඩක් ඒ දනයාගේ ආනිසංස අදහමින් බුද්ධානුභාවය ද සිහි කරමින් සංඝයාට පූජා කෙළෙමි.

21. මා විසින් කරන ලද මේ දනයාගේ ශීල සංරක්ෂණයේ ආනුභාවයෙන් එයින් පරලෝ සැපත්ව භූමට්ඨ කෙනෙක්ව අනූනවූ දිව්‍යශ්‍රී අනුභව කෙළෙමි.

22. සුදුසු ස්ථානයෙහි ශ්‍රද්ධාවෙන් කරන ලද මේ දනමය සුළු පින්කමෙන් මහත් වූ සම්පත්තියක්ම ලබමි. මනා කෙතක වපුරණ ලද බීජය ගොවියාගේ සිත සතුටු කරන්නා සේ (මගේ සිත) සතුටු විය.

23. මෙසේ හෙතෙම තමා විසින් කරන ලද කුශල කර්ම ප්‍රකාශ කළේය. භික්ෂූහු ඔහුගේ කථාව අසා ගිය ගිය තැන දේව පුත්‍රයා විසින් කරන ලද කර්මය ප්‍රකාශ කරමින් බොහෝ දෙනා දන්දීම් ආදී කුශල කර්මයන්හි යෙදවූවාහු ය.

24. මෙසේ කුශලයෙහි නිරත වූ පින්වත්හු හොඳ කෙතක් බලා එහි කුඩා වූ බිත්තර වියක් වපුරා බොහෝ වූ අස්වැන්නක් ලබති. සුසිල් කෙතක භක්තියෙන් නැමී එක් කබලක් පමණ ආහාර පූජා කොට දිව්‍යලෝක මනුෂ්‍යලෝක සම්පත් ලබා නිවන් සැපද ලැබිය හැක.

**7. සමණගාම කථා වස්තුව නිමි.**

## 5.8. අභය ස්ථවිරයන්ගේ කථාව.

1. ලඞ්කාවෙහි බස්නාහිර පලාතෙහි මල්වැස්ස නම් සිත්කළු විහාරයක් විය. ඒ විහාර ආසන්නයෙහි දේව ග්‍රාමයෙහි දේව නම් ඇමැතියෙක් ඔහුගේ ප්‍රධානත්වය පතුරුවයි. එක් දිනක් ඇමතිතුමා ගමෙහි ඇවිද ගෙදරට පැමිණ වතාවත් කරන්නන් අමතා වැළඳිය යුතු යයි කීයේය. එකල්හි ඔහුට වතාවත් කරන්නෝ කෑම එළවූහ. එකෙණෙහි බඩසයින් පෙළුණු එක් බල්ලෙක් බඩගින්නෙන් පෙළුණේ වෙවුලමින් විත් බත් දැක මෙයින් කිසිවක් ලදිම් නම් මැනවයි ඔහු සමීපයට පැමිණියේය. ඔහුගේ එක් සුළු සේවකයෙක් බල්ලා එළවමියි දණ්ඩක් ඇරගෙන දිවීය. ඇමැතියා සුනඛයා කෙරෙහි කරන ලද කරුණාවෙන් පින්වත, ඌට පහර නොදෙන්න යයි වළක්වා නොයෙක් රසයෙන් යුත් ලොකු බත් පිඩක් ගුලි කොට දුන්නේය. බල්ලා බත් අනුභව කරන්නට පටන් ගති. මේ දුටු ඇමැතියා තමා විසින් දෙන ලද දනයෙහි ම සිත පැහැදවීය. හේ- මේ පින්කමින් පමණක් කළුරිය කොට එම ගමෙහිම එක් කුල ගෙදරක උපන්නේය. හේ පිළිවෙලින් වැඩිවියට පැමිණ අඹුවන් පෝෂණයෙන් ගෙදර වාසය නොකොට මහළු කාලයෙහි මල්වැස්ස විහාරයට ගොස් භික්ෂූන් වහන්සේ සමීපයෙහි පැවිදිව පර්යාප්ති සද්ධර්මය ඉගෙන මහා අභය ස්ථවිර යයි ප්‍රකට විය. ඒ එසේ මැයි. සිත පැහැදුණු කල්හි තිරිසන් ගතයෙකුට පවා දුන් දනය මහත් විපාකයක් වේ.

2. මේ ලෝකයේ යම් මිනිසෙක් ශ්‍රද්ධාව මුල් කොටගෙන තිරිසන්ගත කුහුඹියෙකුට පවා දන්දේද.

ඒ දනයේ විපාකය දිව්‍ය මානුෂික සැප දී කෙළවර නිර්වාණ සම්පත්තිය දෙන්නේය.

3. ඉක්බිතිව ඊට පසු කලක ලඞ්කාවෙහි බැමිණිතියාසාය නම් සොරබියක් විය. අවුරුදු දොළසක් මනාකොට නොවැස්සේය. දුබික් බියක් හා රෝ බියක් ඇති විය. ඒ නිසා විහාර සමීපයෙහි මිනිසුන්ට ජීවත් වීමට නොහැක්කේ අන් තැනකට ගොස් ජීවිකාව කරමුයි තෙරුන් වහන්සේ සමීපයට පැමිණ මෙසේ කීහ.

ස්වාමීනි, දුබික් බියක් ඇති විය. මෙහි වසමින් ජීවත් වීමට නොහැකිය. නුඹවහන්සේත් වඩින්වා යි ආරාධනා කළහ. තෙරුන් වහන්සේ ඔවුනට මෙසේ කීහ. බුදුරජාණන් වහන්සේගේ ධාතු නිදන් කොට කරන ලද චෛත්‍යය හා බෝධියට ජීවමාන බුදුන්ට මෙන් පුද සත්කාර කරමින් නිරත වසමි. ඒ වස්තු අත්හැර යන්නට නොහැක. මෙහිම වසමින් දිවිතෙක් උන්වහන්සේට පිළි දැගුම් කරමි. මා කැඳවා ගෙන යෑමට උත්සාහ නොකරනු මැනවි. මේ අසා මිනිස්සු ඒ ඒ තැන්වලට පලා ගියාහුය.

තෙරුන් වහන්සේ ආහාර නොගෙනම පළමු වැනි දවසෙහි වත් පිළිවෙතින්ම දවස ගෙවීය. දෙවැනි දවසෙහි ද එසේම ගෙවී ගියේය. තුන්වැනි දින සැමළු බෝමළු හැමදීම් ආදියෙන් කළ යුතු දේ කොට විතර්කමාලයෙහි සිටියේය. ඉක්බිති උන්වහන්සේගේ ගුණ තේජසින් මළුව කෙළවරෙහි සිටි කරගසෙහි අධිගෘහිත දිව්‍ය පුත්‍ර තෙම සිරුර මැලවුණු තෙරුන් දැක තමන්ගේ බිරිය කැඳවා මේ අභය හිමි සැයත් බෝධියත් අතහැර අන් තැනක නොයම්යි කරන ලද පිළිණ ඇත්තේය. මෙවැනි දුක් බික් බියක් ඇතිවූ කල කිසි තැනක නොගොස් බතින් තොරව වත් පිළිවෙත් කරයි. උන්වහන්සේට භික්ෂාවෙහි හැසිරෙන්ට තැනක් නොමැත. යම් විදියකින් උන්වහන්සේ කාලක්‍රියා කළොත් එය නුසුදුසු ය. අද මුන්වහන්සේට දනය දෙමු දැයි ඇසීය. ඉක්බිති සැමියාණෙනි, ඔබ තෙරුන් වහන්සේට අහර දෙමියි කීයෙහි. උන්වහන්සේ පෙර කරන ලද පින්කම් මට කියනු මැනවයි අසන්තියට මෙසේ කීයේය.

4. දේවයෙනි, මොහු සසර නමැති මහා දුර්ගයෙහි හැසිරෙද්දී භව භෝග සම්පත් ලැබීමට කිනම් පින්කමක් කෙළෙහිද? කුමන කරුණක් නිසා උන්වහන්සේට දනක් දීමට ඔබගේ සිත මෙහෙයවී දැයි මම ප්‍රශ්න කරමි. එය ප්‍රකාශ කරනු මැනවි. දේව පුත්‍රයා ඇයට මේ පින මෙසේ ප්‍රකාශ කෙළේය.

5. මේ භික්ෂුව ගිය ජීවිතයේ දී දේව නමින් ප්‍රකට විය. හේ ආහාර ගැනීමට සූදනම් වූ විට බඩසයින් යුත් ක්ලාන්තවූ බල්ලකු දුටුවේය.

6. කනු කැමැත්ත ඇති ඒ සුනඛයාට ඒ බතින් මහ ලොකු පිඩක් ගසා දුන්නේය. සොඳුර, ඒ මේ දනයේ විපාකයෙන් මේ ජීවිතයෙහි විපාක එන්නේය. දන සුළු යයි නොසිතිය යුතුය. කුඩාම බීජයකින් මහ නුගයක් හට ගන්නාක් මෙනි.

7. මෙසේ කියා දෙව්පුත් තෙමේ තමන්ගේ ආත්මභාවය අත හැර මිනිස් වෙසින් තෙරුන් වහන්සේ කරා පැමිණ පාත්‍රය ගෙන දිව්‍යාහාර දී මෙසේ කීය. ස්වාමීනි, ජීවිතාන්තය තෙක් නුඹවහන්සේට ආහාර දෙමි. ඔබ වහන්සේ පමා නොවී මහණකම කරනු මැනවි. මගේ විමන කරඳ රුකයි. ඔබ වහන්සේ එතැනට වැඩිය මැනවයි ආරාධනා කොට විමනට ගියේය. එතැන් පටන් තෙරුන් වහන්සේ ගසමුලට එළඹෙති, දිව්‍ය පුත්‍ර තෙමේ නිතර දිව අහරම දෙමින් වසයි.

ඉක්බිති එක් දිනක් බඩසයින් පෙළුණු මිනිස්සු මිනීමස් කමින් ඒ විහාරයට පැමිණ දිව්‍යමය ආහාරයෙන් වැඩුණු සිරුර ඇති තෙරුන් දැක මොහු මරා කමුයි සාකච්ඡා කොට තෙරුන් සෑ මළුව හැමද නික්මුණු කල්හි මහා හඬ නගමින් දඬු මුගුරු ආදිය ගෙන වැටලූහ. තෙරුන් විසින් පෙර අමාත්‍ය කාලයෙහි බල්ලාට ගසනු පිණිස මුගුරු ඔසවා එළඹී මිනිසා වැළකීය. ඔහුගේ මේ පින්කමින් වෙහෙර මැද මහත්

පවවක් පැනනැගී විවරයක් තැබීය. සොරු පැමිණ ඔබ මොබ බලා එහෙත් නොදැක රහත් භික්ෂූන් වහන්සේ නමක් වන්නේ යයි සිතා පලා ගියහ.

8. දඬුවමකට නුසුදුස්සෙකුට යමෙක් දඬුවම් කෙරේද හේ භවයක් භවයක් පාසා දඬුවම් ලබන්නෙක් වේ. යමෙක් කෝපය නසා දඬුවම් නො කෙරේද දෙවි මිනිස්සු ඔහු රක්ෂා කෙරෙති.

9. සථවිරයන් වහන්සේ දෙවියන් විසින් දෙන ලද සුධා භෝජන වළඳන්නෝ දෙළොස් අවුරුද්දක් පුහුදුනෙක්ව විසූහ. පසුව විදර්ශනාව වඩා රහත් බවට පැමිණ එසේම අවුරුදු දෙළසක් ගෙවීය. මෙසේ දිව්‍ය පුත්‍ර තෙම අවුරුදු විසිහතරක් දිව්‍ය ආහාරයෙන් තෙරුන්ට පිළි දැගුම් කෙළේය. තෙරුන් වහන්සේ එම විහාරයෙහිම පිරිනිවියෝය.

10. බඩසයින් පෙළුණු එක් බල්ලෙකුට ආහාර පිඩක් දී දිව්‍යාහාර ලැබුවේය. එසේම ඒ යතීන්‍ද්‍රයා නිවීමට පත්වූයේය. තුඹලාද නිතර කාට හෝ යමක් දිය යුතුය. එය සංසාරයෙහි දී පිළිසරණ වේ. කෙළවර නිර්වාණයද ලබයි.

**8. අභයහිමිගේ කථා වස්තුව නිමි.**

## 5.9. නාගාවගේ කථාව.

1. බුදුරජාණන් වහන්සේ ජීවත්ව වාසය කරන සමයෙහි ලඬකාවෙහි නාගදීපයෙහි දී චූලෝදර-මහෝදර යන මාමා බෑණලා අතර මැණික් පුටුවක් උදෙසා මහා යුද්ධයක් එළඹ සිටියේය. එකල්හි බුදුරජාණන් වහන්සේ බෝධියෙන් 5 වැනි අවුරුද්දෙහි දෙව්රම් වෙහෙරෙහි වැඩවාසය කරමින් අළුයම ලොව බලන්නේ ඔවුන් දැක අද මම එහි ගොස් කලහය සංසිඳවීම සුදුසු යයි සිතා බලන්නේ සමිද්ධි සුමන නම් දෙව් රජුන් දුටහ. මේ දෙව් රජ කවරෙක් ද? හේ මීට පෙර ජීවිතයෙහි නාගදීපයෙහි එක්තරා මිනිසෙක් වී. එකල්හි ගන්ධමාදන පර්වතයෙහි වසන එක් පසේබුදු කෙනෙක් පිඩු පිණිස හැසිර ඒ කිරිපලු නුග ගස තුබුණු තැන හිඳ බත්කිස කෙරෙති. හේ ඒ දැක එකෙණෙහිම සිත පහදවා පාත්‍රය සේදීමට කොළ කඩා දුන්නේය. හේ ඒ පින්කමෙන් එයින් චුතව දෙව්ලොව ඉපද අපගේ බුදුන් වහන්සේලාගේ කාලයෙහි දෙව්රම දෙරටු කොටුවෙහි පසක කිරිපලු රුකක දේවතාවා වී උපන්නේය. භාග්‍යවතුන් වහන්සේ ඒ දෙව්රජුට කථාකොට මා සමග නාගදීපයට එන්නැයි කීහ. ඉක්බිති ඔහු විසින් තමන්ගේ භවනය වූ කිරිපලු ගස උදුරා භාග්‍යවතුන් වහන්සේගේ හිසට කුඩයක් මෙන් දරමින් යන මොහු සමග භාග්‍යවතුන් වහන්සේ නාගදීපයට වැඩිසේක.

එහෙයින් මහා වංශයෙහි කියන ලදි.

2. බක් මස කළුවර පක්‍ෂයෙහි පොහෝ දිනයෙහි උදයෙහි උතුම් පා සිවුරු ආදිය ගෙන, බුදුරජාණන් වහන්සේ කිරිපළු ගස රැගත් සුමන දෙවියා සමගම අහසින් පැමිණ නයින්ට අනුකම්පාව සඳහා නාගදීපයට වැඩි සේක.

3. ඉක්බිති බුදුරජාණන් වහන්සේ මේ නාරජුන් දෙදෙනාගේ සංග්‍රාමය මැද අහසෙහි හිඳ වැස්ස, සුළඟ, අඳුර ආදියෙන් බිය හා තැති ගැන්ම උපදවා එයින් ඉතා ඝන අඳුරු පටල පැන නැඟි සූර්යා සේ සවණක් රැසින් බබළමින් ආකාශයෙහි තමන් දක්වා ඔවුන් අස්වසා සියළුම බිය සංසිඳවීය. ඉක්බිති නාගයෝ සවණක් රසින් බබළන භාග්‍යවතුන් වහන්සේ දැක පහන් සිතින් ගත් ගත් ආයුධයන් හැර බුදුරජාණන් වහන්සේගේ දෙපා හිසින් වැන්දහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ ඔවුන්ට ධර්මය දේශනා කළ සේක. මහා වංශයෙහිම කියන ලදි.

4. බුදුරජාණන් වහන්සේ ඔවුනට සමගි කරන ධර්මය දේශනා කළ සේක. ඒ දෙදෙනාම සතුටුව මැණික් පුටුව බුදුපියාණන් වහන්සේට දුන්නාහුය.

5. භූමියට වැඩම කළ බුදුරජාණෝ රතනාසනයෙහි වැඩ හුන් සේක. දිව්‍යමය ආහාර පානයෙන් නාගරාජයන් විසින් තර්පණය කරන ලදි.

6. ජලයෙහි හා ගොඩ වාසය කරන නාගයෝ අසූ කෙළකි. බුදුරජාණන් වහන්සේ ඔවුන් සරණ ශීලයෙහි පිහිටවූ සේක.

7. බුදුරජාණන් වහන්සේ ඒ කිරිපළු ගස ද මහාර්ග වූ ආසනයද නා රජුන්ට පූජා කරන්නට දුන් සේක.

8. නාරජුනි, මගේ පාරිභෝගික චෛත්‍යයන්ට නමස්කාර කරව්. එය නාග රජුනි, ඔබට හිත සැප පිණිස වේ.

9. මේ ආදී ක්‍රමයෙන් ධර්ම දේශනා කොට ඔවුන් සමගි කරවා සමිඩි සුමන දෙවියන් කිරිපළු ගසත් සමග එහිම නවතා දෙව්රම් වෙහෙරටම ගිය සේක. ඉක්බිති නාගයෝ එහි සෑයක් හද නිතර වඳිමින් පුදමින් වාසය කළාහු ය. ඉක්බිති බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි එහි මිනිස්සු සෑයක් කළාහුය. අද ද එය රාජායතන චෛත්‍ය නාමයෙන් ප්‍රකට ය. මේ රාජායතන චෛත්‍යයාගේ උත්පත්තියයි.

10. එක් කලෙක ලඞ්කාද්වීපයෙහි සැට නමක් පමණ භික්‍ෂූහු සමන්කුළු කැළණි ආදි මහා විහාරයන් වඳිමින් පුදමින් සැරිසරති. ඉක්බිත ඔව්හු නාගද්වීපයෙහි රාජායතන චෛත්‍යය වඳිනු කැමැතිව පිළිවෙළින් එහි ගොස් රාජායතන චෛතයය වැඳ පුද රැය පහන් වූ කල්හි උන්වහන්සේලා මනාව හැඳ පැළඳගෙන ගමට පිඩු පිණිස පිවිස මුළු

ගමෙහිම ඇවිද කිසිවක් නොලැබ සේදූ පාත්‍රයෙන්ම නික්මුණාය. එකල්හි එගමෙහි කහවණු සැටකට දසියක වී එක ගෙදරක වාසය කරන්නා වූ නාගා නම් දැස්සක් කළයද රැගෙන දිය සඳහා යන්නී ගම්දෙර ඒ භික්ෂූන් දැක ඔවුන්ගේ සමීපයට ගොස් වැඳ ආර්යවරුනි, භික්ෂාහාර ලැබුවාහුදැයි විචාළහ. උපාසිකාව තවම පෙර බත් කාලය යි කීවාහු ය. ඕ තොමෝ උන්වහන්සේලාට කිසිවක් නොලැබුණු බව දැනගෙන දොම්නස්ව කිනම් උපායකින් අද ආර්යයන්ට දන් දෙම්දැයි සිතන්නී පෙර කහවණු හැට ණයට ගෙන පරකුලයක සේවය කරමි. දැන් මම රාත්‍රිකාල දසියක්ව දන් දෙමියි සනිටුහන් කොට ගෙන භික්ෂූන් කරා පැමිණ උන්වහන්සේලාගේ ඉදිරිපස කළය තබා ස්වාමීනි, මේ කළය රන් පාදයක් වටී. මා එනතුරු මෙතැනින් ඉවත් නොවනු මැනවැයි කියා ඉක්මන් කොට ඒ ගෙදරටම ගොස් තවත් කහවණු සැටක් මට දෙන්නැයි කීවාය. හේ එය අසා පින්වතිය, තී පරකුලයෙහි දැස්සක්ව පරණ ණයෙන් නොමිදුණෙහි, එසේ වුවත් නැවතද වැඩියෙන් ධනය ගනී. මේ කිමෙක්ද? ධනය ගැන නොසිතනු මැනව ස්වාමීනියි ඈ කීවාය. ඔබගේ ගෙදර රාත්‍රි සේවිකාවක්ව කර්මාන්ත කරමින් ණය ගෙවමි. කහවණු සැටක් මට දෙන්න. හේ යහපතැයි හසුනක් ලියා කහවණු දුන්නේය. ඉක්බිති ඇය එය රැගෙන මුළු මහත් ගමෙහි ම ඇවිද එක එක ගෙදරට එක එක කහවණුව බැගින් කහවණු හැටම දී බත් පිළියෙළ කොට පාත්‍රවලට බෙද පිළිගන්නවා තමා විසින් කරන ලද වෑයම භික්ෂූන්ට මෙසේ කීවාය.

11. ආර්යයන්ගේ ශ්‍රී පාදය වඳිමින් මෙය දන්වමි. එය හොඳින් ශ්‍රවණය කරනු මැනවි. දුගී බවෙන් මා හා සම කෙනෙක් මේ මිහිපිට නොමැත.

12. මම පළමු ණයට ගත් කහවණු ඇති නිසා ඉණ දසියක් වීමි. පිස අනුභවයට සාල් නැළියක් වත් නොමැතිව භෝගයන් ගෙන් තොරව නෑයන් නැත්තියක්ව වසමි.

13. අද දන් දුන්නී රාත්‍රි දසී බවට පත්වීමෙනි. ආර්යවරු මවිසින් දෙන ලද දුප්පත් දනය වළඳත්වා!

14. මේ ආදි ක්‍රමයෙන් තමා විසින් කරන ලද සියල්ල කියා වැඳ කළයද රැගෙන ගියාය. භික්ෂූහු ඇගේ කථාව අසා අහෝ! පුදුමයි යන විස්මිත සිතින් බත් ගෙන මහානාම නම් විල සමීපයේ මුවලිඳ වනයට ඇතුල්ව සිටියාහු ය. ඉක්බිති ඔවුනතුරින් ප්‍රධාන භික්ෂූන් වහන්සේ ඇවැත්නි, යයි භික්ෂූන් අමතා ආයුෂ්මත්හු මැයගේ ශ්‍රද්ධාබීජයට කෙත ශුද්ධ කරත්වා! රාගීව හිඳ මේ දනය නොවළඳත්වායි කියා මෙසේ කීහ.

15. එම්බා ඇවැත්නි, මෝ ස්ත්‍රීතොමෝ අපගේ මවක්, සොහොයුරියක්, නැන්දණියක්, යෙහෙළණියක් නෑයෙක්, මිතුරියක් නොවන්නීය.

16. මේ භික්ෂූහු ශීලවන්තයහ, ගුණවන්තයහ, මනාවූ ව්‍රත ඇත්තේයි.

මොවුන් වහන්සේලාට දුන් සුළු දෙය තමාට ඵල ගෙන දේයයි.

17. ඉතා දීනවූ දිළිඳු වූ ඕ තොමෝ අනුන්ගේ වැඩට තමා තමාම විකුණා අපට අද දන් දුන්නීය.

18. ඒ උපාසිකාවට මහ ආනිසංස ඇතිවනු සඳහා ආත්මයන් පිරිසිදු කරමු. එයම කැමැත්තෙන් රාගීව, ආශ්‍රවයන් දුරු නොකොට නොවළඳමු.

19. මෙසේ කියා ඔවුහු මුවලින්ද වනයෙහි ඒ ඒ තැන හිඳිමින් විදසුන් වඩා සිවුපිළිසිඹියාපත් රහත් වූහ. ඉක්බිති උන්වහන්සේලා එම වනයෙහි දෙවියන් විසින් සාධුකාර පවත්වද්දී පැමිණ බත් අනුභව කළහ. ඉක්බිති ඇගේ ද භික්ෂූන් වහන්සේගේ ද ප්‍රවෘත්තිය දැන දෙවියන්ගේ සාධුකාරය අසා රජුගේ සේසතෙහි අධිගෘහිත දෙව්දුව සතුටුව සාධුකාර දෙන්නී.

20. මහා ශ්‍රද්ධා ඇති තැනැත්තිය, තී විසින් කරන ලද්දේ ඉතාම යහපත් ක්‍රියාවකි. දනය නමැති බීජය කෙත් වතට ගියේය. තිට යහපත් ලාභයක් විය.

21. රජතුමා දෙව්දුවගේ සාධු නාදය අසා බොල දෙවතාවිය. කිමෙක් ද තී අපගේ දනය සඳහා ද සාධුකාර දුන්නීද, නැතහොත් කවර කෙනෙකුගේ දනයට සාධුකාර දුන්නී දැයි ඇසීය. තමුන්නාන්සේගේ දනය ගැන නොවේ. නාගාවගේ දන ගැනයි කීහ.

22. යමෙක් සිඳුම් බිඳුම්වලින් පෙළා මහදන් පවත්වතියි ද, එවිට එය මහත් ඵල නොවෙයි.

23. ආදරය පෙරදැරි නොකොට, ශ්‍රද්ධාවෙන් තොරව, නුවණින් නොසිතා කෙත් නොවන තැනකට යමෙක් දන්දේද එය මහත් ඵල නොවේ.

24. දිළිඳු වූයේ නමුදු මහා ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ ආදර සහිතව පිරිසිදු සිතින් ඉතා සුළු දෙයක් හෝ දන් පිණිස දේද? එය හැම කල්හි අප්‍රමාණ විපාක ගෙන දෙන්නේය.

25. මේ ආදි විසින් මහත්ඵල බව වණා මහරජ, නාග දීපයෙහි නාගා නම් සැට කහවණුවක් ණයට ගත් ඉණ දසියක වී භික්ෂූන්ට මෙසේ මෙසේ දන්දුන්නීය. භික්ෂූහු ද ඇගේ දනය නිසා රහත්වූහ. මම ඇයට සතුටුව සාධුකාර දුනිම්යි සියල්ල විස්තර වශයෙන් කියේය. රජතුමා එය අසා සතුටු වූයේ ණය දුන්නාට නියමයෙන් ණය දී ඇය දසි බවෙන් මුදවා ඒ මුළු දිවයිනම උතුම් දයාද කොට ඇයට දී මහ සම්පත්ද දෙවීය. එතැන් පටන් ඒ දිවයින නාගදීපයයි ප්‍රකට විය. ඇය එතැන් පටන් බොහෝ පින්කම් කොට දිවි කෙළවර දෙව්ලොව උපන්නීය.

26. මෙසේ නුවණ ඇති ශ්‍රද්ධාවන්තයෝ තමන්ගේ ජීවිතය පවා

අනුන්ට දසකොට දී දන් පින් කොට මෙම ජාතියෙහි දිව්‍ය මනුෂ්‍යාදී බොහෝ දෙනාගේ ප්‍රශංසා ලැබ දිව්‍යලෝකයට යති. එනිසා දනය නම් කැමැති කැමැති දෑ දෙන කප් රුකක් සම ය. සත්‍වයන් විසින් මසුරු සතුරා විනාශ කොට දන නැමැති මිත්‍රයා භාජනය කරව්.

**9. නාගාවගේ කථාව නිමි.**

## 5.10. වප්‍පුල පර්වත කථාව.

1. එක් කලෙක සිංහල රටෙහි බැමිණිතියාසාය නම් බියක් දෙළොස් අවුරුද්දක් පැවතිණි. මෙතෙක් කල් ලක්දිව වැස්ස මනාව නොවැස්සේය. එනිසා ගොවිතැන මනාව නොවැඩුණු නිසා සා බිය හටගති. නරක ආහාර ගැනීමෙන් උවදුරට පත් මිනිසුන්ට රෝ බියද හටගති. මෙසේ මිනිස්සු ඇට හා හම ඉතිරි බවට පත්වූහ. ස්ත්‍රීහු ගෙයක් ගෙයක් පසා යකින්නන් මෙන් වූහ. පිරිමි ප්‍රේතයන් හා පිශාචයන් වැනි වූහ. ඒ ඒ දෙරවල අවමඟුල් කොලාහල හඬින් හඬන්නන්ගේ විලාප හඬින් ද එකනින් කොලාහල විය. ඒ ඒ තැන මළවුන්ගේ කුණප ගඳින් රැස්වුණු අමනුෂ්‍යයන් ගේ වශයෙන් මහත් බියක් විය. මෙසේ නොයෙක් බිය වලින් උවදුරට පත් ලක්වැස්සෝ පර්වත ගංගා ආදී තැන්වලට ගොස් ජීවත් වෙති. එකල්හි වප්‍පුල පර්වත සමීපයෙහි මිනිස්සු ඒ පර්වතය පිහිට කොට බොහෝසෙයින් පර්වතපාදයෙහි වාසය කරති. එකල්හි පර්වත පාදයෙහි වසන ගම්වැසි එක් මිනිසෙක් තමන්ගේ මාගම සමග ජීවත්වීමට උපායක් සොයන්නේ පර්වතයට ඇවිදිමින් පර්වත මස්තකයෙහි එක් කර රුකක් දැක වාසය කරන්නෙමියි රුක ආශ්‍රය කොට ගෙදරක් කොට එහිම වාසය කරයි. ඒ කර රුකෙහි අතු තුනක් වේ. හෙතෙම ඒ අතු වලින් එකකින් ආගන්තුක සත්කාර කරන්නෙමු. එකකින් දනක් දෙමු. එකක් අපට පරිභෝගය සඳහා වන්නේයයි නියමිත කොට තමන්ට නියමිත අත්තෙහි කොළ අනුභව කරමින් එහි වසයි.

2. ඉක්බිති එක් දිනක් එක් භික්‍ෂුවක් භික්‍ෂාචාරස්ථානයක් සොයන්නේ ඔවුන්ගේ ගෙයි දුම් දැක සංඥාවෙන් ඔහුගේ ගෙට ගියේය. ඉක්බිති ඒ පුරුෂයා එය දැක සොම්නසට පැමිණියේ පුදුමයි මම මේ කර කොළ නිසා මහත් පින්කම් රැස්කරමි. ආර්යයන් වහන්සේ ද බොහෝ කාලයකින් දක්නා ලද්දහු අභිවාදනය ද කරමියි ගොස් තෙරුන්ගේ අතින් පාත්‍රය ගෙන පහසු තැනක උන්වහන්සේ වඩා හිඳුවා කොළ ගෙන එන්නෙමියි කරගස සමීපයට ගියේය. එකල්හි රාත්‍රිභාගයෙහි ඒ ගසේ කොළ පටන් යටත් පිරිසෙයින් දල්ලක් දක්වාම පණුවෝ කෑහ. හේ මේ ගස දැක දුකට පැමිණ දෙම්නස්ව ආපසු හැරී ගෙදරට ගියේය. ඉක්බිති ඔහුගේ භාර්යාව හිස් අතින් එන ඔහු දැක අද හිමියනි! කුමක් නිසා හිස් අතින් එන්නේදැයි ඇසීය. එකල්හි හේ මෙසේ කීය.

පින් ඇත්තෝ යමක් සිතත් ද එයම සමෘද්ධ වේ. නමුත් පින්මද අයට තමන් පතන දේ සිද්ධ නොවේ.

බොහෝ කාලයකින් දකින ලද ආර්යයන් වහන්සේට අද දන් සඳහා දීමට කොළයක්වත් නොලද්දෙමි. අපේ මඳපින් ඇති බව අනේ!

5. මෙසේ ද කියා සොඳුර කරගසේ කොළයක් හෝ දල්ලක් යන හැම දෙයක්ම පණුවෝ කෑහ. ඇය එය අසා මෙසේ කීවා ය.

6. ලොව කළ පින් ඇති සත්වයාට ඇතිවන ස්වභාවය මෙයයි. මුතු වෛරොඩි ආදිය පින්වතා කරා ඉබේටම පැමිණේ. මෙය ස්වභාව ධර්මයකි.

7. පින් මද කාලකණ්ණි සතුන් විසින් බොහෝ උත්සාහයෙන් සොයාගත යුතු යම් වස්තුවක් ඇති නමුත් එය කිසියම් සැලැස්මකින් විනාශව යන්නේය.

8. මෙසේ ද කියා දැන් කුමක් කරමුද? තෙරුන් වැඩ හිඳුවා ටිකක්වත් නොදෙන්නට නුසුදුසු යයි කියන්නී, තමන්ගේ සිරුරෙහි මස් පිස තෙරුන්ට නොදන්වා දෙමියි සිතා ලියන ආයුධයක් රැගෙන තමන්ගේ කලවා මාංශය කපනු කැමැතිව ගෙට පිවිසියාය. ඇගේ සැමියා ද එසේම තමන්ගේ මස් තෙරුන්ට එසේම දෙමියි මස් කපනු කැමතිව එසේම පිවිසියේ බිරිය එසේ කරනු දැක කුමක් කරන්නේදැයි විචාළේය. ඕ මාගේ සිරුරෙහි මස් පිස තෙරුන්ට දෙමි ස්වාමීනියි කීවාය. ඒ අසා සැමියා ද තමන්ගේ සිරුරෙහි මස් දෙනු කැමැත්තේ සොඳුර, ස්ත්‍රිය නම් ස්වල්ප නුවණ ඇත්තේ දුක් ඉවසන්ට නොහැකි වෙත්. මගේ සිරුරෙහි මස් දෙමියි කීයේය. ඉක්බිති ඔහුගේ බිරිය මස් දෙන්ට කැමතියි සැමියා ද එසේය. පුදුමයි ඔවුන්ගේ දන් දීමෙහි මහත් අදහස, කියන ලදමැයි.

9. මෙසේ දනපතියන්ට දනයෙහිම සිත ඇලේ. මෙසේ ආධ්‍යාත්මික ශරීර මස් දෙන්න කැමැත්තා බාහිර දනය ගැන කියනුම කවරේද?

10. මේ දෙදෙනාම මම දෙමි මම දෙමියි සිතන්නෝ:

මෙසේ ඔවුන් විසින් මස් දීමෙහි උත්සාහවත් වූ විට ඔවුන්ගේ ශ්‍රද්ධා බලයෙන් ශක්‍රයාගේ පණ්ඩුකම්බල ශීලාසනය උණු විය.

11. හේ බලන්නේ ඒ අඹුසැමි දෙදෙනාගේ පිරිසිදු ආධ්‍යාත්මික දන අධ්‍යාසය දැන මේ බෝසත් අදහසමය යි සතුටු සිත් ඇත්තේ රත් ඇල්හාල් තිඹක්ද මුව පිඩියක් ද දී කළයක්ද තෙල් කළයක් ද රැගෙන මොහොතකින් ගොස් මිනිසෙකු මෙන් ඔවුන්ගේ ගෙදෙර සිට මේ ගෙදර මිනිස්සු කොහි ගියාහුදැයි ඇසීය. මේ හඬ අසා අඹුසැමි දෙදෙනා ගේතුළයැයි කියමින් ගෙදරින් පිටවූවාහු ය. ඉක්බිති ඔවුනට ශක්‍රයා පින්වත්නි, මේ ආර්යයන්ට දිය යුත්තක් තිබේදැයි ප්‍රශ්න කළ කල්හි

ස්වාමීනි! අපි දුප්පත් වෙමු. ආර්යයන් වහන්සේට කොහෙන් දිය යුතු දෙයක් ලබම් ද යටත් පිරිසෙයින් කොළයක්වත් නැතැයි සියල්ල කීවෝ ය. ඉක්බිති ශක්‍රයා එසේ නම් මේ සහලින් බත් පිස මේ උපකරණත් සමග තෙරුන් වළඳවි. ඉදින් මම පසුවෙම් නම් මා ගැන නොසලකා නුඹලාත් අනුභව කරව්. ඉතිරිවා කැමැති හැටියක් කරවයි කියා ඒ ආහාර අඩු නොවන සේ අධිෂ්ඨාන කොට දෙව් ලොවටම ගියේය.

ඉක්බිති ඔව්හු ඒවායෙන් බත් පිස තෙරුන්ට වළඳවා ඔහුගේ පැමිණීම බලාපොරොත්තු වූයේ නො පැමිණි නිසා ඔව්හුදු අනුභව කළහ. සැළියෙහි එක හැන්දක් ගත් පමණක්ම පෙනේ. උපකරණ එසේම ඉතිරිව ඇති. ඉක්බිති ඔවුහු මේ ආශ්චර්යය දැක සතුටුව එතැන් පටන් බොහෝ භික්ෂු සංඝයා රැස්කරවා සත්කාර ගරුකාර කරමින් පුදමින් පර්වතපාදයෙහි මිනිසුන් හා නොයෙක් දුගී මගී යාචකාදීන්ට දිව්‍යමය ආහාර පානයන්ගෙන් සතපවා සිල් රකිමින් පෙහෙකම් කරමින් දැහැමෙන් සෙමෙන් වැස ආයු කෙළවර දෙව්ලොව උපන්නාහු ය.

12. පින්වතුනි, ශ්‍රද්ධා බලය බලව්. අඹුසැමි දෙදෙනා ශරීර මාංස දීම සඳහා කළ දන්දීම් අදහස් පුරා ඔවුහු දනයාගේ ආනිසංස ලැබූහ. තෙපිද ශ්‍රද්ධාධූරය සේවනය කරව්.

**10. වසුල පර්වත කථා වස්තුව නිමි.**

**5. මිගපෝතක වර්ගය නිමි.**

## 6.1. උත්තරෝලිය කථාව

1. සිංහලද්වීපයෙහි බුද්ධාගම පිහිටි කල්හි ඒ ඒ තැන පැතිර ගිය ධර්මය හා විනය ඇති රජරට උතුරාලු නම් එක් විශාල ගමක් විය. ඒ ගම අසළ ගොපලු ගමෙහි එක් ගොපලු සේවකයෙක් දහඩිය වැකුණු සිරුර ඇතිව කඩමාල්ලක් ඇඳ කැඳ බී පාදමයක් හා කෙවිටක් ගෙන උදෑසනම ගවයන් බැලීමට වනයට යයි. ඉක්බිති ඔහුගේ මහළු මවු තොමෝ දරුව, නුඹ සමීපයට එන්නට කෙනෙක් නැත. මෙය කන්න යයි පිළුණු කටු අලයක් දුන්නේය. හේ එයත් රැගෙන යන්නේ අතරමග එක පිණ්ඩපාතික තෙර නමක් දැක වැඳ කටු අලය පාත්‍රයට බෙදුවේය. තෙරුන් වහන්සේ එය පිළිගෙන මෙසේ සැළකූහ. මේ ළමයා ඉතාම දුප්පති, ඔහුගේ මේ දන වස්තුව සඵල කරන්නෙමියි එහිම සිටගෙන විදසුන් වඩා රහත් බවට පැමිණ වැළඳූහ. බුද්ධපුත්‍රයන්ගේ කරුණා මහත්ත්වය පුදුමයි.

2. සත්පුරුෂයන්ගේ කරුණා මහිමය මෙබඳු තන්හි පවතී. මේ බුද්ධපුත්‍රයන් වහන්සේ ඉතාම දුප්පත් ළමයා පිළිගැන්වූ පිට පොත්ත හරිහැටි ඉවත් නොකළ පිළුණුවූ ලුණු නොදැමූ පිසූ කටු අලය අනුභව

කොට බාලයා සැපවත් කළසේක.

3. ඉක්බිති ඒ දරුවා ආයු කෙළවර කලුරිය කොට එම ගම එක්තරා ස්ත්‍රියකගේ කුසෙහි පිළිසිඳ ගත්තේ ය. එකල්හි ඔහු පිදූ කටු අලයේ ආනුභාවයෙන් එක් නිධානයක් හට ගත්තේය. ඒ නිධානය උතුරා ලූ වැවෙහි ඔබිනොබ පෙරළෙමින් හැසිරේ. එකල්හි එක් ස්ත්‍රියක් පෙරළෙනු ලබන ඒ නිධානය දැක වේගයෙන් ගොස් එය ගත්තීය. ඉක්බිති එහි අධිගෘහිත දේවතාවා ඇගේ අත මිදවීය. ඉක්බිති ඇය එක අතක් මිදෙන කල එක අතකින් ගත්තීය. ඉක්බිති දේවතාවා ඇගේ එක් අතක් එහිම ඇලවීය. ඇය ඒ අත අදින්නට නොහැකි වන්නී හැඳි වස්ත්‍රාදිය හා පැළඳි අභරණද නිධානයටම දමා දෙවියන් ආරාධනා කොට මිදුණු අත් අත්තී නැවත ඒ නිධානය බැලීමට ද නොහැකි විය. ඉක්බිති ඇයගේ අතින් මිදුණු හැටියේම නිධානය ගොස් පොළොවෙහි පිහිටියේය. ඉක්බිති ඒ ස්ත්‍රිය ගොස් ඒ ප්‍රවෘතිය මිනිසුන්ට සැලකළාය. ගම්වැසි බොහෝ මිනිස්සු නිධානය බැලීමට වැවට ගියාහුය.

4. ඉක්බිති කටු අලය පිදූ ළමයාගේ මවද ඔහු කුසින් දරමින් තවත් පුතෙකු ඇකයෙන් වඩා ගෙන වැවට ගියාය. එකල්හි මේ නිධානය පොළොවෙන් මතුවී දිය මත ඔබිනොබ හැසුරුණෝය. එකල්හි මිනිස්සු අප සමීපයට ඒවායි පතමින් සිටියහ. ඉක්බිති ඒ කුමාරයාගේ මව් තොමෝ එසේ කියා සිටියාය. නිධානය ටිකක් දුරට පැමිණ ඇයගේ ඉදිරියෙහි සිටියේය. නැවත ඇය මගේ ඇකයේ වස දරුවාගේ පිනට පැමිණේවායි කීවාය. නොපැමිණියේමය. ඉක්බිති ඈ මගේ කුසහොත් දරුවාගේ පින කරණකොට පැමිණේවා යි කීවාය. එය කියූ සැටියේම නිධානය වහම පැමිණ ඇගේ ඉදිරියෙහි සිටියේය. ඉක්බිති ඇය නිධානයට ඔබට සුදුසු තැන ඔබම දැන ගන්නයි කී හැටියේම නිධානය පොළොවෙහි පෙරළෙමින් ගොස් ඇගේ ගෙයි සුදුසු තැන පිහිටියේය. කුමාරයාට වැය කරණය හැර අන් කිසිවක් නිධානය කරන්නට ඉඩ නොදේ. ඉක්බිති මෑත කාලයක කුමරා මව් කුසෙන් නික්මී ක්‍රමයෙන් ශිල්ප ඉගෙන ගන්නා වයසට පැමිණියේය. එකල්හි දිවයිනෙහි මිනිස්සු පස්මැසි කුමාරයා සම්පත්තියට ගැලපෙන ආභරණයන්ගෙන් සරසා මංගල මොහොතින් ඉගැන්වීම් කරවති. එකල්හි ඔහුගේ මෑණියෝ අකුරු කියවීමේ මංගල උත්සවය දින පුතාට ආභරණ පළඳවන්නී, නිධානයෙන් එද ස්ත්‍රිය විසින් අත්හරින ලද වස්ත්‍රය ගෙන හැන්දවූවාය. ඉක්බිති වස්තුව අයිතිකාරයෝ ඒ ගෙදරට ආවෝ වස්ත්‍රය හැඳින ගෙන මෙය මගේ වස්ත්‍රය යයි ගත්තෝ ය. කුමාරයාගේ මවු තොමෝ එය දැක වස්ත්‍රය ලැබුණු සැටි සියල්ල කීවාය. ඇය මේ නිධානය ලැබගෙන සහවාගෙන වළඳන්නෙහි ය. නිධාන රජුට අයිති බව නොදන්නෙහි ද? කුමක් නිසා තී විෂයකටත් වඩා වැඩි නිධානයක් වළඳන්නෙහිදැයි කියා මෙසේ කීයේය.

5. සර්ප දෂ්ට විෂ විෂ නොවේ. රජුන් සන්තක ධනය ගැනීම

නියම විෂ යයි, සර්ප විෂයෙන් කෑ එක තැනැත්තාම මැරේ. රජුන්ගේ ධන සංඛ්‍යාත විෂයයෙන් කුලයම නැසේ.

6. වනයෙහි ගස් ලැව් ගින්නෙන් දැවී ඉතිරිව ගිය ගස් තිබේ. රජ කෝප නමැති ගින්නෙන් දැවුණු කලැ මිනිස්සු ඉතුරු නොවෙති.

7. රජදරුවන්ට වඩා බලවත් මාරයා ද නැතහොත් මාරයාට වඩා රජතුමා බලවත් ද මෙසේ තොප සිතට සංශයක් වේද කල්ගත නොකර විපාක දෙන නිසා මාරයාට වඩා රජතුමා බලවත්ය.

මෙසේ කියමින් තර්ජන කළාය. ඉක්බිති කුමාරයාගේ මව මෙසේ කීවාය.

8. යමෙකු විසින් යම් ධනයක් අයුක්තියෙන් ලබන ලද්දේ නම් ඔහුට රාජාදි භය ලැබෙයි. යමෙකු විසින් පූර්වජන්මයෙහි වාසනාවෙන් ලබන ලද ධනයක් වේ නම් එය දෙවියන්ට ද විනාස කිරීමට නොහැකි වේ.

9. මෙසේ ඇලා අතර වස්ත්‍රය නිසා ඇති වූ කලහය මුල් කොට ඇති මෝ කථාව රජු ළහට ගියේ ය. රජතුමා එය අසා ධනය ගෙන ඒමට මිනිසුන් යැවීය. මිනිස්සු ධන හිමියා ළහට ගොස් නිධානය දැක නිධානය ඇල්ලූහ. ඉක්බිති ඒ නිධානය බියජනක ශබ්ද පවත්වමින් ඔබිනොබ පෙරලෙමින් දිගු කළ අත් එහිම ඇලෙමින් ගන්නට නොහැකි විය. රාජපුරුෂයෝ මේ ප්‍රවෘත්තිය රජුට කියා යැවූහ. රජතුමා එය අසා පුදුමව එසේ නම් ධනය අයිතිකරු ධනයත් සමග ගෙන ඒවා යයි කියා යැවීය. ඔවුහු නිධානයත් සමග ධන හිමියා ගෙන ගොස් රජුට පෙන්නූහ. රජතුමා නිධානයෙහි පුදුමය දැක ධනහිමියාට මෙසේ කීය. පින්වත, ඔබගේ නිධානයෙන් අපට ද ධනය දෙව, ඉක්බිති දිය ගෙන නිධානයට වත් කෙළේය. එකෙණෙහිම නිධාන මුඛයෙන් උඩට ආ මහත් වූ ධන රාශියක් විය. රජතුමා එය දැක ඉතා පුදුමයට පැමිණි සිත් ඇත්තේ නිධානය සමග ඔහුට මහත් වූ භෝග සමූහයක් දී ඒ ජනපදය ඔහුටම දී මහත් පිරිවරින් යැවීය. හෙතෙම එතැන් පටන් දන්දීම ආදී පින්කොට ආයුෂ කෙළවර අඹුදරුවන් සහිතව ගොස් දෙව්ලොව උපන්නේය.

10. යමෙක් ඒකාන්තයෙන් ගුණයන්ට ආධාර වූ භික්‍ෂූන්ට ශ්‍රද්ධාවෙන් දන වස්තුව දේද; හෙතෙම පරලොව සංසාර නමැති මහා දුර්ගයෙහි සම්පත් නමැති නැවෙහි පිහිටීමට පැමිණේ.

**1. උත්තරොලිය කථා වස්තුව නිමි.**

## 6.2. තම්බසුමන ස්ථවිරයන්ගේ කථාව.

1. එක් කලෙක ලඞ්කාවෙහි සද්ධාතිස්ස නම් රජ කරවයි. එකල්හි

එක් රාජපුරුෂයෙක් රජතුමා විසින් කොටහල් දනව්වට යැවිය. රාජකාර්යයෙහි යෙදුණු එගම් වැසි මිනිස්සු ඔහුට ආගන්තුක සත්කාර කරමින් ගිතෙල් ව්‍යඤ්ජන සහිතව බත් පිස කාලය සැලකවූහ. ඉක්බිති ඔහු බොජුන් සඳහා හුන් කල්හි එක් භික්ෂුවක් පිඩු පිණිස හැසිරෙමින් එතැනට පැමිණියේය. හේ තෙරුන් දැක පැහැදී එතැනට පැමිණ පාත්‍රය ගෙන ගිතෙල් සහිත බත් තෙරුන්ට දුන්නේය. ස්ථවිරයන් වහන්සේ බත් වළඳ ගිතෙල් බෙහෙත් සඳහා එළවූය. හේ මෙතෙක් පින්කම් කොට ආයු කෙළවර කළුරිය කොට මේ දිවයිනෙහිම වල්ලව ගමෙහි එක්තරා ගෙදරක උපන්නේය.

ඉක්බිති ඔහුගේ දෙමවුපියෝ සුමන යයි ව්‍යවහාර කළහ. හේ ක්‍රමයෙන් වැඩිවිය පැමිණ විවාහ වී ගෙදර වාසය කරන්නේ ගිහිගෙයි ආදීනව ද පැවිදිවීමේ ආනිසංසය ද දැන සැපත් අත්හැර බ්‍රාහ්මණාරාම විහාරයට ගොස් පැවිදිව පටන්ගත් වීර්ය ඇත්තේ වත් පිළිවෙතින් යුක්තව නොබෝ කලකින්ම විදසුන් වඩා රහත් බවට පැමිණ තම්බසුමණ තෙරණුවෝ යයි ප්‍රකට වූහ. ඉක්බිති ඔහුගේ පින් බලෙන් එම වෙහෙරෙහි තිඹිරි ගසක අධිගෘහිත දෙවියා තෙරුන්ට නිතොර දිව්‍යමය ආහාරයෙන් උපස්ථාන කෙරේ. ඒ තෙරුන්ගේ දෙළොස් වස් කාලයෙහි ලක්දිව බැමිණිතියාසාය පැමිණියේය. එකල්හි දුබ්භික් දුකින් මිනිසුන් පෙළෙන කල්හි තෙරුන් වහන්සේ පන්සියයක් භික්ෂූන් ආහාරයෙන් ක්ලාන්තවෙනු දැක ඔවුන් අමතා ඇවැත්නි, අපි කොහි ගොස් ජීවත් වෙමුදැයි කියා එක්සිත් වූ කල්හි තෙරුන්වහන්සේ ගමනට සූදනම් වූහ. මේ දෙව්පුත්තෙම සවාමීනි, කුමක් නිසා ගමනට සූදනම් ද? කොහි වඩිනා සේක්ද? ඇසූහ. මේ අසා තෙරුන් වහන්සේ දෙව් පුතාට මෙසේ කීහ.

2. එම්බා දිව්‍ය පුත්‍රය, දැන් මේ ලඞ්කාද්වීපය හුදෙක් දුර්භික්ෂා විය. විල් පොකුණු වේළී පැලී ගියාහුය.

3. මත්ස්‍යයෝ විනාශ වූහ. පිපාසයෙන් යුත් මුවෝ ඌරෝ දුර පෙනෙන මිරිඟු දිය දැක දුවති.

4. වෘක්ෂයෝ වැටී ගිය කොළ ඇත්තෝ වූහ. පොළොවෙහි හටගත් තෘණ හා පැලැටි වර්ග සැඩ සුළඟින් බොහෝ සෙයින්ම වියළී ගියහ.

5. දිවයිනෙහිම මිනිස්සු නරක ආහාරයෙන් පෙලුනාහ. ඇට හා මස් පමණක් ඉතිරිව ගිය මොවුන්ගේ ලේ වියළී ගියහ.

6. දේවතාවුන් වහන්ස, ජීවිත ආශාව ඇති මිනිස්සු ජීවිත ආසාව නිසා අඹුදරුවන් රැගෙන යම් තැනෙක ජීවත්වීමට හැකිවෙද්ද ඒ ඒ තැන්වලට ද අඹුදරුවන් සමග ගියාහු ය.

7. දේවතාවුන් වහන්ස, මේ සිංහල රටෙහි ජීවත්වීමට නොහැකිය. එනිසා දඹදිව යන්නෙමුයි කීය.

8. මේ අසා, දෙව්පුත් තෙම ඔහුගේ අතීත කර්මය ප්‍රකාශ කොට ගමන් සිත වලක්වමින් මෙසේ කීය.

9. ස්වාමීනි, නුඹවහන්සේ අතීත කාලයෙහි එක් භික්ෂු නමකට පින්ඵල විශ්වාස කරමින් ගිතෙල් සහිත බත් දුන්නේය.

10. එයින් වුතවූ ඔබ ඒ පින්කමේ ආනුභාවයෙන් සැපවත් වූ මේ දෙවැනි ආත්මභාවයෙහි ඉපිද - සැපයෙහි පිහිටියේය.

11-12. දෙමවුපියන් අතහැර අමු රන් සහිත සිය ගෙදර අත හැර බුදු සසුන්හි බැඳ සිතැතිව එහි මහණව, පිළිවෙත් පුරන්නෙක් වී තිලකුණු වඩා ඒ ඔබ රහත් වූයෙහි. එය එකල්හි දුන් දනයාගේ විපාකයයි.

13. මා විසින් දෙන ලද යම් ඒ දිව්‍යමය ආහාර වළඳන්නෙහි. ඒ මේ එද දුන් දනෙහි විපාකයයි.

14. මේ සිංහලද්වීපයෙහි දුබ්බික් බිය යම් කලෙක සංසිඳේද ඒතාක් කඩනොකොට දනය දෙමි. මට කරුණා කොට ශිෂ්‍යයන් සමග මෙහිම වාසය කරන්න.

15. සිවුරු පිණ්ඩපාත බෙහෙත් යහන් ආසන යන මේවා ඔබගේ පින් බලයෙන් උපන්නේය.

16. පින්වතුන් වහන්සේලා කිසි දිනක දඹදිවට නොවඩිනු මැනව. ධ්‍යාන භාවනා කොට දුක් කෙළවර කෙරෙත්වා.

17. මෙසේද කියා දෙව්පුත් තෙම දඹදිව් ගමන නවතා එතැන් පටන් තෙරුන්ට දිව්‍යමය සිවුරු පිණ්ඩපාත සේනාසනයන් ගෙන් උපස්ථාන කෙරේ. එය පන්සියයක් දෙනා වහන්සේට පොහෝනේ විය. මේ දෙව් රජ තෙම දොළොස් අවුරුද්දක් උපසථාන කෙළේය. දුබ්බික් බිය සංසිඳුණු කල්හි සථවිරයක් වහන්සේ දිව්‍ය පුත්‍රයාට අමතා දනව් සැරිසරන්නෝ පන්සියයක් භික්ෂූන් සමග පිළිවෙළින් රජ රට කඩරොද්ද නම් මහගමට පැමිණ පිඩු පිණිස හැසිර එක් තැනක හිඳ වළඳන්නට පටන් ගති. භික්ෂු සංඝයා ද එද වැසි වලාකුල් වලින් ගැවසී ගත් කල්හි සූර්යාලෝකය නොදක්කෝය. ඉක්බිති ඇතැම් භික්ෂූහු කුකුස් කරන්නෝ නොවැළඳූහ. ඉක්බිති සථවිරතෙම ඔවුන්ගේ කුකුස නැති කිරීමට එක් (සකුරු පහනක්) ගල් කැටයක් ගෙන තිය අගින් අහසට දැම්මේය. හේ අහසට පැන නැගී හිරු මෙන් දිලිහෙමින් සිටියේ ය. ඉක්බිති ඒ භික්ෂූහු සැක නැත්තෝව වැළඳූහ. එනිසා ඒ සථානය එතැන් පටන් මිණිසූරිය නාමයෙන් ප්‍රකට විය. ඉක්බිති තෙරුන් වහන්සේ නික්මී ගහ අසල සුළුවැසර නම් ගම පිඩු පිණිස හැසිර ගං ඉවුරෙහි හිඳ වළඳන්නේ ඒ භික්ෂූහු ව්‍යඤ්ජන මඳව රූක්ෂ බත් වළඳනු දැක ඇවැත්නි රළු බත් නොවළඳව්. සුවඳ ගිතෙල් මගේ පිනෙන් හට ගනී. එය සමග වළඳන්න යයි කීයේය. එය භික්ෂූහු නිශ්ශබ්ද වීමෙන් ඉවසූහ. තෙරුන් වහන්සේ

ද එකල්හි තමා විසින් මුල් ජීවිතයේ එක භික්ෂුවකට දෙන ලද ස්වල්ප ගිතෙල් ගැන කල්පනා කොට මේ ගඟෙහි දිය ගිතෙල් වේවායි අධිෂ්ඨාන කළෝය.

ඉක්බිති සුළු වැසර විහාරතොට සිට බත්බුන්නතොට දක්වා යොදුන් දෙකක් පමණ ජලය වෙනස්ව ගිතෙල් විය. භික්ෂූහු හැකිතාක් වැළඳූහ. කියන ලදී.

18. ගිතෙල් ටිකක් දීමෙන් මෙවැනි ප්‍රතිඵල ලැබීය. යමෙක් බොහෝ බෙහෙත් දෙද්ද එහි ප්‍රතිඵල කවරෙක් කියත් ද ?

19. ඉක්බිති ගඞ්ගාවේ දෙපස ගම්වැස්සෝ එය අසා මහසැල, කළ කොතලාදිය පුරවා තම තමන් ගෙවල එක්රැස් කළහ.

20. එක් භික්ෂුවකට එක් වරක් දුන් දනයාගේ ප්‍රතිඵල මේ යයි දන පින්වත්හු දන වස්තුව ඇති කල්හි සිල්වතුන් සොයා ශ්‍රද්ධාවෙන් දන් දෙව්.

**2. තම්බසුමන ස්ථවිරයන්ගේ කථා වස්තුව නිමි.**

## 6.3. පූවපබ්බතවාසී තිසස ස්ථවිරයන්ගේ කථාව

1. ලෝ වැස්සා ධර්ම අමෘත රස පානයෙන් නිවන් මහ නුවර පුරමින් අපගේ භාග්‍යවතුන් වහන්සේට පෙර කාශ්‍යප නම් බුදුරජාණන් වහන්සේ ලෝකයේ පහළ වූහ. එකල්හි දනව් වැසි මිනිසෙක් වෙළෙඳමෙන් ජීවත් වෙමින් වසයි. ඉක්බිති පසු කාලයක හෙතෙම හිරියල් සුණු විකුණමින් ගම් නියම්ගම්හි හැසිරෙයි. එකල්හි එක් ගමෙක යොවුන් ස්ත්‍රියක් එය දක කැඳවා මිළෙන් මනො සිලා සුණු ගත්තේය. ඉක්බිති වෙළෙන්ද විසින් බඩ සා ඇත්තෙමි මැණියෙනි යි කී කල්හි ඕ තොමෝ ඔහුට මොනර මස් රසයෙන් සුවඳ ගිතෙල් සමග ඇල්හාලේ බත් වැඩුවේය. එකෙණෙහි එක් සුනඛයෙක් වෙවුලමින් බඩසයින් යුක්ත වූයේ කෙළ ගිලිමින් ඔහුගේ ඉදිරියට ගියේය. ඉක්බිති හේ ඔහු දුකට පත් වූ බව දක කරුණාවෙන් කම්පාවන හෘදය ඇත්තේ මොනර මස් රසයෙන් හා තෙලෙන් මිශ්‍ර කොට මහත් වූ බත් පිඩක් දුන්නේ ය. ඒ බල්ලා බත් අනුභව කොට සතුටු වූයේ වල්ගය හොල්ලමින් ඔහුගේ ඉදිරියට පැමිණියේය. මේ දක වෙළෙන්ද ද සතුටුව මෙසේ ප්‍රාර්ථනාවක් තැබීය.

2. මේ පින්කමින් ජාතියක් ජාතියක් පාසා මම ගිතෙල් හා මොනර මස් සහිත උසස් ඇල්සාල් බත් ලබම්වා අවසානයෙහිදී නිවන් පුරය භජනය කරම්වා!

3. ඒ වෙළෙන්ද මෙපමණ පිංකම් කොට ජීවිතය කෙළවර දෙව්ලොව ඉපද බුද්ධාන්තරයක් මහත් දිව සැපත් අනුභව කොට එයින්

චුතව මිනිස් ලොව පන්සියයක් වරක් ඉපදී මොනර මස් ගිතෙල් සමග ඇල්හාලේ බතම ලැබීය. එහෙයින් මේ බුද්ධොත්පාද කාලයෙහි බුදුරාජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හි සිංහල රටෙහි මහවැලි ගං-ඉවුරෙහි පුගලු නම් ගමැ එක්තරා ගෙදරක පිළිසඳ ගෙන පිළිවෙලින් ගැබ මෝරා මවු කුසින් නික්මුණේය. ඔහුගේ මවුපියෝ තිසස යයි නමක් කළහ. හේ වැඩිවියට පැමිණියේ ගිහි ගෙදර විපාක ද පැවිද්දෙහි ආනිසංස ද අසා සියළුම සම්පත් අතහැර පුගලු විහාරයට එළඹ පැවිද්ද ඉල්ලීය. භික්ෂුහු ඔහු පැවිදි කොට උපසම්පද කළාහු ය.

හෙතෙම බොහෝ කලකින්ම උත්සාහ කරන්නේ උසස් ඵලය වූ රහත් බවට පැමිණියේ පින්වතෙක් හා නැණවතෙක් විය. තිසස තෙරණුවෝ යයි මුළු සිංහල රටෙහිම ප්‍රසිද්ධ වූහ. ඒ තෙරුන්ගේ පාත්‍රය යම්කිසි ඉසුරුමත් කෙනෙක් හෝ දිළින්දෙක් ගත්තාහු නම් හේ වනාහි ඔහුට මොනර මස්, සුවඳ ඇල්හාලේ බත් හා ගිතෙල් සමග පුරවා දෙයි. මේ ක්‍රමයෙන් මොහුට සැට අවුරුද්දක් ඉක්ම ගියහ.

4. ඉක්බිති මෑත කාලයෙහි එක් ඇමැති පුතෙක් මෙසේ සිතී ය. මේ තෙරුන්ට නිතොර මොනර මස් සුවඳ ගිතෙල් සහිත ඇල්සාල් බත්ම උපදී යයි බොහෝ දෙනා කියත්. මෙය අප විසින් වනාහි මේ කරුණ පරීක්ෂා කරන්නට සුදුසු යයි සිතා ගෙදරට ගොස් රෑ යාමයෙහි භාර්යාවට මෙසේ කීයේය. සොඳුර, පුගලු විහාරයෙහි වාසය කරන තිසස ස්ථවිරයන්ට අද දනක් දෙනු කැමැත්තෙමි. තෙරුන් වහන්සේ මෙහි පැමිණි කාලයෙහි තිවුඩු සාලෙන් කුඩුමුසු කැඳ පිස වළඳවා වේලාව සමීප වූ කල්හි පලා මාලුවක් හා කාඩි ඇඹුල් දෙවැනි කොට තිවුඩු සාලේම බත් දෙන්නැයි කියා රැය පහන් වූ විට තමාම විහාරයට ගොස් තෙරුන් වැඳ ස්වාමීණි, අද අපට අනුග්‍රහය කරන්න යයි ආරාධනා කොට තෙමේ අන් තැනක ගියේ ය.

ඉක්බිති ඔහුගේ ගෙදර අධිගෘහිත දෙවියා රාත්‍රී භාගයෙහි භාර්යාව සමග කථා කරන ඒ වචන අසා මොවුහු ඒකාන්තයෙන් මේ තෙරුන් විසින් පෙර කරන ලද කර්මය විපාකය කිසිවෙකු විසින් නොවැලක්විය හැකි බව සිතා ඒ ගෙදර මහළු මිනිසෙකු මෙන් ඇල්සහල්, මොනර මස් සහ ගිතෙල් කළයක් ද ගෙන ගෙදරට පැමිණ ඔහුගේ භාර්යාවට දුන්නේය. ඈ විසින් කොහෙන් ගෙන එන ලද්දේ දැයි ඇසූ කල්හි දේවතාවා මෙසේ කීයේය. මැණියෙනි, අමාත්‍ය පුත්‍ර තෙම මා දක පින්වත, මා විසින් අද පුගලු වාසි තිසස හිමියන්ට දනට ආරාධනා කරන ලදී. තෝ මේ උපකරණ ගෙන ගෙදරට ගොස් ගෘහිණියට දී මෙසේ කියව. මෙයින් බත් පිස ව්‍යඤ්ජන සහිතව තෙරුන් වළඳවන්න යයි මට කීවේය යයි කියා අතුරුදහන් විය.

5. ඕ තොමෝ ද ඔහුගේ කථාව අසා මස් සහිත බත් පිළියෙල කොට තෙරුන් වහන්සේ පැමිණි කල්හි පාත්‍රය ගෙන වැඩ හිඳුවා

ව්‍යඤ්ජන සහිත බත් වැළඳ වීය.

තෙරුන් වහන්සේ බත් කිස නිමවා විහාරයට වැඩි සේක. ඊටපසු ඇමැතියා පැමිණ භාර්යාවන්ගෙන් තී තෙරුන්ට ආහාර දුන්නේ දැයි විචාළේය. ඕ තොමෝ නුඹ වහන්සේ එවූ උපකරණයන්ගෙන් බත් පිළියෙල කොට දෙන ලදැයි කීවාය. ඇමැතියා, සොඳුර, මා විසින් නොඑවන ලදී. කා විසින් එය ගෙන එන ලද්දේ දැයි ඇසීය. අසුවල් මහල්ලා විසිනැයි කී කල්හි ඔහු ද විචාරා ඔහු විසින් මෙවැන්නක් නොගෙනෙන ලදී යයි කී කල්හි එය තෙරුන් වහන්සේගේ ආනුභාව යෙන් මේ දෙවියන්ගේ වැඩක් යයි දැන කළ පින් ඇත්තහුගේ කුසල් විපාකය වලක්වන්නට නොහැකි යයි කියා බුදුසසුන්හි පැහැදුනේ දනපතියෙක් විය. ඊට මෑත භාගයෙහි තෙරුන් වහන්සේ පිරිනිවන් මඤ්චකයෙහි වැදහොත්තේ වෙහෙර බෙර හසුරුවා භික්ෂූන් කැඳවා තමන් පිරිනිවන් පානා බව ප්‍රකාශ කෙළේ ය. ඉක්බිති භික්ෂූහු නුඹ වහන්සේ මහ පින් ඇත්තෙකී. නුඹ වහන්සේගේ පින මුළු ලඞ්කාවෙහිම ප්‍රකටය. අතීතයෙහිදී කවර නම් පින්කමක බලයෙන් මේ විපාකය ලැබී දැයි විචාළහ. එය අසා තෙරුන් වහන්සේ තමා විසින් අතීතයෙහි කරන ලද කර්මය ප්‍රකාශ කරමින් මෙසේ කීය.

6. මේ භද්‍ර කල්පයෙහි කාශ්‍යප නම් බුදුරජාණන් වහන්සේ නමක් මුළු සත්වයන්ට හිතවත්ව උපන්නේය.

7. මම එද හිරියල් වෙළඳම් කරන වෙළෙන්දෙක් වීමි. ඒ වෙළෙඳ කර්මයෙන්ම ඒ ඒ තැන ඇවිදිමින් ජීවත් වූයෙමි.

8. ඉක්බිති එක් දවසක වෙළෙඳම සඳහා ජනපදයකට ගියෙමි. එහි එක ගෙදරක කුලදූරියක් මා දැක,

9. මගෙන් බඩු රැගෙන බඩසයින් පෙලුණු මා දැක්කාය. ඉක්බිති ඇය මොනර මස් සුවඳ ගිතෙල් සමග,

10. ඇල්හාලේ බත් ද කරුණාවෙන් වැළඳීමට මට දුන්නීය. ඉක්බිති මම බත් කනු කැමැති බල්ලකු දැක,

11. ගිතෙල් සහිත බත් පිඩකින් සතපවා මෙසේ පැතීමි. මම ඒ පින්කමින් දෙව්ලොවට ගියෙමි.

12. එහි දී දෙවියන් සමග රුවන්මය ප්‍රාසාදයෙහි මිහිරි නෘත්‍ය ගීත වාදිතයන්ගෙන් සතුටුව,

13. දෙවඟනන් පිරිවරා දිව්‍ය සේනාව මුල් කරගෙන දිව්‍ය සම්පත් අනුභව කොට බොහෝ කාලයක් ගත කෙළෙමි.

14. එයින් චුතව මිනිසුන් අතර ජාති පන්සියක් මහත් ධනය ඇති මහා භෝග ඇති විශාල වූ ලෝකයා ගරු කිරීමට භාජන වූ,

15. නෑ සමූහයා විසින් පූජා කරන ලද උසස් කුලයක උපන්නෙමි. කර්මයට සුදුසු සම්පත් මම අනුභව කෙළෙමි.

16. ගිතෙල්, මොනර මස්, ඇල්හාලේ බත් පන්සියයක් ජාතිවල නිතර වළඳන ලද මගේ ආහාරය විය.

17. මේ අන්තිම ජීවිතියේදී එවැනි භෝජන හැම කල්හිම ලැබීමි. මගේ එක බත් පිඩක ආනිශංස බලන්න.

18. පින්වතාගේ පින්කම මාරයාට ද වැළැක්වීමට නොහැක. එය වැළැක්වීමට සමත් අන් කවරෙක් වේද ?

19. තිරිසන්ගතයකුට පවා යමෙක් දන් දේද මා සේ හේ සියළුම භවයන්හි ත්‍රිවිධ සම්පත්ති විඳින්නේය.

20. මෙසේ උන්වහන්සේ භික්ෂු සංඝයා මැද තමා විසින් කරන ලද කුශල කර්මය ප්‍රකාශ කොට අවවාද කොට පිරිනිවන් පෑ සේක. තෙරුන් වහන්සේගේ වචන අසා මහාජනයා දන්දීම් ආදී පින් කොට මැරී ගොස් දිව්‍ය ලෝකයෙහි උපන්නාහ.

21. ඉතා සුළු දන්දීමකින් පවා මිනිස්සු මෙසේ පුදුම විපාකයක් ලබති. බොහෝ කාලයක් මුළුල්ලේ දුන්නාවූ දනයාගේ විපාක බුදු නොවූ කිසිවෙකුට මෙපමණ යයි කියා නිම කිරීමට නොහැක.

**3. පූවපබ්බත තිස්ස කථා වස්තුව නිමි.**

## 6.4. චූලතිස්ස කථාව

1. එක් කලෙක ලඞ්කාවෙහි දුටුගැමුණු අබය නම් රජෙක් රජ කරවීය. එකල්හි ඔහුට තිස්ස නම් එක් සුළු සේවකයෙක් අභ්‍යන්තරව රජකම් කරයි. එකල්හි රජුගේ කණ්ඩුල නම් ඇතා යදම හා බැඳි කණුව බිඳ නැගෙනහිර බලා කැලයට වැදී සල් බෝ ගස් කොළ ආදිය සිඳ බිඳ කමින් පිළිවෙළින් මහකඳුරු නම් විහාරයට ගොස් ඒ ඒ තැන්වල රුක්මුල්සුන්‍යාගාර ආදී තැන්වල ධ්‍යානඞග දරණ භික්ෂූන් දක පසන් සිත් ඇත්තේ ඔවුනට කුඩා ගෙඩි මහා ගෙඩි ගෙනවිත් උපසථාන කරන්නේ එහිම වාසය කෙළේය. රජතුමා ඒ ඇතා ගිය තැන් පරීක්ෂා කරන්නේ නොදක අමාත්‍යයන් සතර දෙනෙක් සතර දිශාවට යවා සුළු සේවක තිස්ස ඇමතියා නැගෙනහිර දිශාවට යැවී ය. අන් දිශාවන්ට ගියෝ ඇතා නොදක්කෝය. ඒ ඇමතියා ගම් නියම්ගම් පරම්පරාවෙන් හැසිරෙන්නේ පිළිවෙළින් එම විහාරයටම පැමිණියේය. එම විහාරයෙහි,

2. යම් යහපත් විහාර උපවනයෙක්හි රුකඛමූලිකාඞග භාවනා වඩන්නෝ, ඒ ඒ රුක්මුල්හි හුන්නාහු ය.

3. ඒ ඒ විහාරයෙහි අභ්‍යවකාශයෙහි භාවනා කරති. යහපත් භාවනා ක්‍රම ගෙන සුන්‍යාගාරයෙහි ඇලෙති.

4. පාංශුකූලික අඞ්ග සමාදන්වූවෝ ද කසිණ භාවනා වඩන්නෝ ද මැණික් පොරෝනා පෙරවූ එකචාරී ඇතුන් මෙන් භාවනාවෙහි සිත් අලවා වෙසෙති.

5. යම් තැනක සෝසානිකාඞ්ගය රකින නිතර මරණ සිහිය ඇති බුද්ධපුත්‍ර භික්ෂූහු බුද්ධ ශාසනයෙහි මනාව ඇලෙති.

6. මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා (යන බ්‍රහ්ම විහරණ ) වඩන පිණ්ඩපාතික භික්ෂූහු මේ විහාරයෙහි වාසය කරති.

7. ඒ ඒ තැන්වල නෙසජ්ජික ධූතාඞ්ගධාරීහුය. ඒකාසනිකාඞ්ග ධූතාඞ්ගධාරීහු ය. බුද්ධානුස්සති ආදි අනුස්සති භාවනා වඩන භික්ෂූහු විහාරයෙහි වාසය කෙරෙති.

8. සිල්වත් ගුණවත් බුද්ධශාසන මාමකයෝ යම් වෙහෙරක වසත් ද එතැනට චූලතිස්ස ඇමැති තෙමේ ද පැමිණියේය.

9. මේ අමාත්‍යයා විහාරයට ගොස් භික්ෂු සංඝයාට වැඳ එකත් පස්ව සිටියේය, ඉක්බිති කණ්ඩුල නම් ඇති එකල්හි මනාව පැසුණු කරගෙඩි සහිත කර අත්තක් කඩා, භික්ෂූන් වහන්සේලාට පිළිගැන්වීය. ඇමැතියා එය දැක මෙවැනි කැකුළු ඵරුෂ මිනිසුන් මරණ තිරිසන්නු ද ගුණවන්තයන්ගේ ගුණයෙහි පැහැදුනේ වතාවත් කරති. මේ භික්ෂූහු නොයෙක් වතාවත්වලින් මහණකම මුදුන් පමුණුවා ප්‍රත්‍යදායකයන්ට ද තමන්ටද ප්‍රත්‍යය වෙයි. බුදුරජාණන් වහන්සේගේ ගුණානුභාවය නොසිතිය හැකියයි පුදුම විය. ඒ එසේමැයි.

10. අපිස් සතොස් හා විවේකකාමීන්ට තපසම ධන කොට්ැති පිරිසිදු සිල් ඇති බව දැක මිහිරි බව දැනගෙන කාගේ නම් සිත ප්‍රීතියට පත් නොවන්නේද? වන්නේමැයි.

11. ඉක්බිති ඇමැතියා භික්ෂූ සංඝයා වහන්සේට වැඳ රජු සමීපයට ගොස් රජතුමනි, කණ්ඩුල ඇතා මහ කඳුරු වෙහෙරට ගොස් මහා සංඝයා වහන්සේට වතාවත් කරනු මා විසින් දක්නා ලදැයි කීයේය. ඒ අසා කොල, තෝම ඇතා අල්ලා ගෙන එන්න යයි රජතුමා කීයේය. ඉක්බිති හේ යහපතැයි පිළිගෙන සංඝයා වහන්සේට බොහෝ උක් සකුරු ආදිය ගෙන්වාගෙන වෙහෙරට ගොස් මනාව ඉදුණු කරගෙඩි ගෙන්වා සකුරුත් සමග මිරිකා පැන් කොට භික්ෂූන්ට වළඳවා පැහැදුණු සිත් ඇත්තේ ඇතා ගෙන නගරයට ගියේය.

හෙතෙම මෙපමණක් පින් කොට එයින් චුතව මේ ලංකාද්වීපයෙහිම උතුරෙහි අඹවිටි, නම් ගමෙහි එක් ගෙදරක උපන්නේය. ඔහුගේ මවුපියෝ ඔහුට තිස්ස යයි නම් තැබූහ. හේ වැඩි වයසට පැමිණ සුදුසු කුමාරිකාවක්

සමග වාසය කරන්නේ ගිහිගෙහි කළකිරී පැවිදිව තිස්ස තෙරණුවෝ යයි ප්‍රකටව ප්‍රතිපත්තියට ගරු කරන්නෙක්ව වාසය කරයි.

ඉක්බිති හේ මැත භාගයෙහි ජයමහ බෝධිය වදිනු සඳහා යන්නාවූ භික්ෂූන් හා උපාසක උපාසිකාවන් සමග නැවට නැංගේය. මෙසේ නැවෙහි ගමන් කරන ඔවුනට ජලය නිමාවට පත්විණ. එකල්හි ඒ තෙරණුවෝ පවස ඇත්තේ පැන් සොයා නොලැබ පවස ඉවසන්නට නොහැක්කේ පාත්‍රය බහා මුහුදු දිය ගෙන බිමට පටන් ගත්තෝය. එකෙණෙහිම ඒ ලුණු දිය උන්වහන්සේගේ ආනුභාවයෙන් වෙනස්ව මිහිරි රස ඇති සකුරු පැනක් සේ වීය. කියන ලද මැයි.

12. සුළු පින්කමක ආනුභාව මහත් බව අහෝ පුදුමයි. අද්භූතයි. ලොම් කෙලින් සිටුවයි. අතීතයෙහිදී භික්ෂූන් වහන්සේට සකුරු පැන් දී හේ මහසයුරේ වතුර මිහිරි බවට පෙරළිණ.

13. ඉක්බිති ඒ තෙරණුවෝ පැන් බී නැවේ සියළු දෙනාට ද දුන්නෝය. එය රසවත්, ඔජවත්, කෂය නොවන දිව ආමවතුර සේ විය. ඒ සියළුම මහාජනයා මහ බෝ වැඳීමට යන එන කල්හි එම පැන්ම බීවාහුය. ඉක්බිති ආයුෂ ඇතිතාක් පින් කොට කළුරිය කොට දෙව්ලොව දෙළොස් යොදුන් රන් විමනක ඉපිද අප්සරාවන් දහසක් දෙනා විසින් පිරිවරා මහත් වූ දිව්‍ය සම්පත් අනුභව කෙළේය. ඔහුට ඒ සකුරු පැන් දිව්‍ය මනුෂ්‍ය ලෝකවලද නිතරම ඇතිවේ. ඒ ඒ තැන දිව්‍යමය පැන් සැළි පුරා සිටිති. පැමිණි පැමිණි දෙවියෝ ඒවායින් පැන් බී නටමින් ගයමින් කෙළිමින් තම තමන්ගේ ගෙවලට ද පැන් ගෙන යති. මෙබඳු ආනුභාව සම්පන්න පැනක් විය.

14. ලෝකයෙහි සමහර කෙනෙක් පැන් ටිකකින් මෙසේ මහත් වූ සම්පත් ලබති. බොහෝ දනවස්තු දුන් මිනිසාට මේ ලෝකයෙහි ලැබෙන විපාකය කවරෙක් වර්ණනා කෙරෙත්ද?

**4. චූලතිස්ස කථා වස්තුව නිමි.**

## 6.5. තිස්සාවගේ කථාව

1. සද්ධාතිස්ස මහරජතුමාගේ කාලයෙහි රුහුණු දනව්වෙහි තිස්සම්බතොට නම ගමෙහි මුණ්ඩගුත්ත නම් එක් දුගියෙක් විය. ඔහුගේ භාර්යාව ද තිස්සා නමි. ඕ ද එබඳුම ය. ඔවුහු අමාරුවෙන් එහි ජීවත් වන්නෝ අනුන්ගෙන් කහවණු සැටක් පමණ ණයට ගෙන එය ගෙවන්නට නොහැකි වන්නෝ ණයෙන් මිදෙන තුරු ඔහුගේ ගෙදර දසකම් කොට කාලය ගත කරති. එසමයෙහි ගම්වැස්සෝ බොහෝ භික්ෂු සංඝයාට ආරාධනා කොට දන් දෙමින් සිල් රකිමින් පින්කම්හි නිරතව වසත්. ඉක්බිති මේ අඹුසැමි දෙදෙනා සියල්ලෝම දන් දෙති. අපි

හොඳටම දුප්පත් නිසා දන් දීමට නොහැකි වෙමු. පෙර කිසිවක් නොකළ නිසා දැන් මහ දුප්පත්තු වූහ. දැනුදු කිසිවක් නොකොට අනාගතයේහිද මෙසේ වන්නෙමු. යම්කිසි උපායකින් දන් දීමට වටී යයි සාකච්ඡා කළහ. ඉක්බිති ඇයගේ ස්වාමියා සොඳුරු ගම්වැස්සෝ නොයෙක් සූප ව්‍යඤ්ජනයන්ගෙන් පංච ගව රසය සමග දන් දෙති. අපි කෙසේ දෙමු දැයි කියා සැඟවුනේ ය. ඕ තොමෝ අද ද හෙට ද මරණය යයි නොපැණේ. රළු හෝ ප්‍රණීත වූ හෝ දෙයක් දුන්නේ නම් එයම උසස් යයි කියති. මෙසේ කීහ.

2. අද අදම කළ යුත්ත කටයුතු ය. හෙට මරණය සිදුවේ දැයි කවරෙක් දන්නේද? නොයෙක් සේනා වාහන ඇති මාරයා හා අප අතර විශ්වාසයක් නැත.

3. එනිසා හිමියාණෙනි, ප්‍රණීත හෝ රූක්ෂ හෝ වේවා ලබන ලද්දක්, එයින් අවස්ථා පැමිණිවිට සංඝයාට දන් දෙමු. ක්ෂණ සම්පත්තිය ඉක්ම නොයාවා.

4. මෙසේ කියා දෙවැනි දවස තමන්ගේ දිළිඳුකම නිසා කාඩි බත ලුණු නොදමා පිසූ කර කොළ සමග එක භාජනයක් පුරා හිසින් උසුලන්නී. ආසන ශාලාවට ගෙන ගොස් සිටියේ මහළු කල පැවිදි වූ එක් මහළු පැවිද්දෙක් පැවිදී පඬිකති ලැබ ඒ භික්ෂුවගේ පාත්‍රයෙහි බල්ලන්ට බත් දෙන පෝරුවෙහි දැම්මේ ය. මෝහයාගේ විපාක පුදුමයි. ඒ එසේමැයි.

5. මෙය සුදුසුය, මෙය නුසුදුසු යයි යන්න මුළාවූ විට නොදනිති. කළ යුත්ත නොකළ යුත්ත, කරුණ නොකරුණ නොදනිති.

6. ඔවුහු මෙලොව පමණක් දකිති. පරලොවත් නොබලති. හරිහැටි කරුණු නොදන්නා හෙතෙම ගර්භාවෙන් මිදීමට පත් නොවේ.

7. මෙසේ අවැඩදායක වූ මෝහය නිතරම අනිටු ඵල ගෙන දේ. සියළු සතුන්ගේ සිත්හි නොම පවතීවා.

8. ඉක්බිති ඒ උපාසිකා තොමෝ එදක දෙමිනසට පැමිණියේ ගෙට ගොස් ශෝක කරමින් වැදහොත්තීය. ඉක්බිති ඇගේ ස්වාමියා කැලෑවෙන් පැමිණ ඒ දැක සොඳුර, අමාරුවක් දැයි ඇසීය. ඕ තොමෝ සැමියාට නොකැමැත්තෙන් දන් දුන් නිසා පිළිවදන් නොදුන්නී ය. ඉක්බිති ඕ තොමෝ සැමියා විසින් නැවත නැවතත් විචාරණ ලද නිසා සියළුම ප්‍රවෘත්තිය කීවේය. ඒ අසා හෙතෙම නොසතුටු සිත් ඇත්තේ සොඳුර, කුමක් කරමුද? මෙය අපේම වැරැද්දයි. මේ බුද්ධොත්පාද කාලයෙහි අපට පිහිටක් නොකර ගත්තමු නම් අපේම පිරිහීම වන්නේය. ඒ නිසා දන් දිය යුතුමය යයි කියා ඔවුහු දෙදෙනාම එක් ඊශ්වර කුලයකට ගොස් තමන්ගේ පුතා මිළ කොට ඒ ගෙදරට දී කහවණු 8ක් වටිනා එළදෙනක් ගත්හ. ඒ එළදෙන එදවසම එක් වස්සකු වාදුවාය. දෙවැනි

දවස්හි ඕ තොමෝ ඒ දෙනගේ කිරි දොවනා කාලයෙහි දන්දීමේ අදහසට පැමිණ නැලි දෙකක් පමණ තෙල්ම දුන්නීය. ඉක්බිති ඔවුහු තෙල් ගෙන දන් සම්පාදනය කොට භික්ෂූන්ට දන් දුන්හ. ඉක්බිති ඕ තොමෝ දෙවැනි දින පටන් පෙර බත් කාලයෙහි සතරක් ය, පසු බත් කාලයෙහි සතරක් යයි නිත්‍යයෙන්ම නැළි අටක් පමණ සුවඳ ගිතෙලම දෙන්නීය. එයින් මේ දෙමාල්ලෝ පෙර බත් කාලයෙහි ලබන ලද නැළි සතර ගෙන භික්ෂූන්ට ගිතෙල් බත් දෙති. බතින් පසු ලැබූ ගිතෙලින් පහන් පූජා කරති. භික්ෂූන් වහන්සේට බෙහෙත් පිණිස දෙති. මෙසේ කල් ගෙවෙත්ම මේ ගමේ වසන එක් රාජ පුරුෂයෙක් ඔවුන්ට ගිතෙල් ලැබීමේ පුවත අසා කොළ මටත් පින්වත්නි, ගිතෙල් ගෙන එත්වා! යයි මිනිසුන් යැවීය. ඒ පණිවුඩ කරුවන්ගේ කථාව අසා මෙසේ කීවාහුය. අපිදු ගිතෙල් පාවිච්චි නොකරමු. ලැබූ හැටියෙන් භික්ෂු සංඝයට දන්දෙමු. පහන් පූජාදීය කරමුයි එයින් කිසිවක් නුදුන්නේය.

ඉක්බිති ඒ රාජපුරුෂයා යවන ලද මිනිසුන්ගෙන් ඒ කථාව අසා බොලව් තෙපි රජුන්ට සුදුසු ගවරසය සහවාගෙන වළඳව්. රජුට දන්වා ගිතෙල් තෙපිට කවන්නෙමියි තර්ජනය කරන්නේ බිය කරවීය. ඉක්බිති මුණ්ඩගුතත බිරියට කීවේය. සොඳුර, මිනිසුන්ට යම්කිසි බියක් උපදීනම් එය අසත්පුරුෂයකුගෙන්ම උපදී. මේ හිස් මිනිසා රජුට කියා අපගේ දනයට අනතුරු කරන්නේ ය. මෙය නොමැනවි. ඔහුට නැලි බාගයක් පමණ දෙමු යයි කියා නිතරම නැලි බාගයක් පමණ තෙල් දෙති. ඉක්බිති පසු කාලයක ඒ රාජ පුරුෂයා රජුගේ උවටැනට ගියේය. ඔහු ගිය බව දන ඔව්හු ඔහුට තෙල් නුදුන්හ. ඉක්බිති හේ රජුගේ උපස්ථානයට ගොස් අවුත් බත් අනුභව කරන්නේ ගිතෙල් ගෙන්වීය. ඔහුගේ බිරිය ස්වාමිනී, නුඹ වහන්සේ ගිය කාලයේ සිට ගිතෙල් නුදුන්නහුය යයි කීයේය. එය අසා දණ්ඩෙන් පහර ලත් සර්පයකු සේ කිපුණේ ය. ඒ එසේමැයි අසත් පුරුෂයෝ නොතැන්හිම කිපෙති. එහෙයින් කියන ලදි.

9. කාරණයක් ඇති කල්හිම බියජනක සර්පයෝ කිපෙති. අධම මිනිස් සර්පයෝ කරුණක් නොමැතිව කිපෙති.

10. ඉක්බිති හෙතෙම රජු සමීපයට ගොස් දේවයන් වහන්ස, ඔබ තුමාට සුදුසු භාණ්ඩයක් එකෙක් සහවා ගෙන තෙමේම වළඳයි කීවේය. රජතුමා අසත්පුරුෂයාගේ වචනයෙන් එම මගට පිළිපන්නේ එසේනම් කොළ එකම ඒ දෙන ගෙන ඊම අයුතුය. ඔබම ඒ එළදෙනත් සමග කපිලවන් දෙනුන් සීයක් ගෙනෙවයි නියෝග කෙළේය. හෙතෙමේද ගම් නියම්ගම් වල හැසිර ඒ දෙනත් සමග දෙනුන් සියයක් ගෙන රජු දන්වීය. ඉක්බිති දේවිය සියළු අලඞ්කාරයෙන් සරසා තෙල් දෙවයි කීයේය. දේවිය විසින් දෙවන කාලයෙහි එක තෙල් බිංදුවක්වත් පියයුරෙන් නොපැමිණියේය.

ඉක්බිති රජතුමා දෙනගේ අයිතිකාරිය කැඳවව් යයි කැඳවා ඇයද

සියළු අලංකාරයන් ගෙන් සරසා තෙල් දෙවවයි කීයේය. ඕ තොමෝද යහපති දේවයන් වහන්ස යයි කියා දෙන නොදෙව් දින ගණන බොහෝ ය. දෙකක් තුනක් සැළවල් ගෙන්වාගෙන තමන්ගේ ශ්‍රද්ධාව කල්පනා කොට දෙනගේ පියයුරු ගත්තේය. ඉක්බිති ඇගේ අතින් ස්පර්ශ කළ හැටියේම පියයුරෙන් ඉබේටම තෙල් වැගිරිණ. ඕ තොමෝ සැළි පිරවූ ගිතෙල් රජුට දක්වීය. රජතුමා තෙල් බලා මෙතෙක් කල් මේ ගිතෙලින් කුමක් කෙළේදැයි ඇසීය. ඕ තොමෝ තමන්ට දෙන ලැබුණු සැටි ද ගිතෙල් භික්ෂූන් වහන්සේට දීමට දෙන ගෙන ආ බව ද යන සියල්ල කීවාය. මේ අසා රජතුමා මෙසේ නම් මේ ගිතෙල් අප විසින් පාවිච්චි කිරීම නුසුදුසු යයි කියා නුවරද පස්මහ ආවාසවල භික්ෂූන් වහන්සේ ද රැස් කරවා ඇයගේ ශ්‍රද්ධා බලය ප්‍රකාශ කොට ගිතෙල් සංඝයාට දෙව වීය. ඊට පසු දෙනගේ අයිතිකාරිය කැඳවා ඒ ජනපදය ඇයටම දී භේදකාරී රාජ පුරුෂයා ඇයටම මෙහෙකාරයෙකු කොට දුන්නේය. ඉක්බිති ඒ අඹු සැමි දෙදෙන එම දනව්වෙහිම වසමින් දිවි තෙක් කුසලකම් කොට දෙව් ලොවට ගියාහුය.

11. දිළිඳු ධනය නොමැති මිනිස්සු තුනුරුවන්හි ශ්‍රද්ධාව වඩා බොහෝ ස්වර්ග සම්පත්තිය ලබති. එනිසා රත්නත්‍රයෙහිම ශ්‍රද්ධාව වඩව්.

**5. තිස්සාවගේ කථාව නිමි.**

## 6.6. අරියගාල තිස්ස කථාව

1. හෙතෙම අතීතයෙහි රුහුණු දනව්වෙහි ජගාම වාරයෙහි එක්තරා කුල ගෙයක ඉපදි වැඩිවිය පැමිණියේ වීය. හේ එක් දිනක් ජගාම බෝධියඞ්ගනයට ගොස් බෝධිය ද භික්‍ෂු සංඝයා ද වැඳ එතැන් පටන් නිතරම බෝමළුවෙහි වැලි විසුරුවමින් මලුවෙහි මැටිකම් කරමින් මල් පූජා කරමින් බෝධිය ගඳ පැනින් ඉසිමින් සුවඳ පසැඟිලි කරමින් දන් දෙමින් බොහෝ පින්කම් රැස් කොට එයින් චුතව එම රෝහණ ජනපදයෙහි මහාගාම මහුල් වීථියෙහි මහාධන දේව නම් ප්‍රධානියෙකු නිසා ඔහුගේ භාර්යාවගේ කුසෙහි පිළිසඳ ගත්තේය. හෙතෙම ගැබ මේරීමට පැමිණ මවු කුසින් නික්මිණ. ඔහුගේ මවු පියෝ ඔහුට තිස්ස යයි නමක් කළහ. ඉක්බිති ඊට මෑත භාගයෙහි ඔහුට අවුරුදු පහක් හයක් ගිය කල සෙල්ලම් කිරීම ඔහුගේ ස්වභාවය නිසා කේළිය තිස්ස යයි ව්‍යවහාර කළහ. ඉක්බිති හෙතෙම මෑත භාගයෙහි බුදු සස්නෙහි පැහැදුනේ භික්ෂූන් වහන්සේ සමීපයෙහි පැවිදිව පිළිවෙත් පුරන්නේ පස් වසක් විසී ය. ඉක්බිති හෙතෙම සාසන ප්‍රතිපත්තිය පුරන්නට නොහැකි වූයේ සිවුරු හැරීමට කැමැත්තේ විය.

2. ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයා විසින් බුදු සසුන්හි පැවිදිව ඉතිරි තිස්ස

නොකොට ප්‍රාතිමොක්ෂ සංවර ශීලය පාලනය කළ යුතුයි.

3. චක්ඛු සොත ආදී දෙරටුවලට රූප ශබ්ද ආදිය ගොදුරු වන දේ වැළැක්විය යුතුයි. හැම කල්හි ඔහු විසින් ශ්‍රද්ධාවෙන් ඉන්ද්‍රිය සංවර ශීලය රැකිය යුතුයි.

4. කුලදූෂණාදිය නොපවත්වා හැමද ශුධවූ වූ ආජීවයෙන් තමන්ගේ දිවිය මෙන් ආජීව පාරිශුද්ධි ශීලය රැකිය යුතුයි.

5. සතර පසය නුවණින් නිතර මෙනෙහි කරන්නා විසින් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය හැමකල්හි ආදර සහිතව රැකිය යුතුයි.

5. සතර පසය නුවණින් නිතර මෙනෙහි කරන්නා විසින් ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලය හැමකල්හි ආදර සහිතව කිය යුතුයි.

6. මේ සතර ශීලය පුරණ යතිතෙම සඟීමොකෂ සම්පත්තිය අවශ්‍යයෙන්ම අනුභව කරන්නේය.

7. යමෙක් රාග වේශ මෝහයන් කරණකොට සීලයන්හි ආදර රහිතව අලසව නිරයෙහි උපදින්නේ ය.

8. හෙතෙම දයකයන් සතුටු නොකරයි. හෙතෙම තමා ද සතුටු නො කෙරේ. සොහොන් ගිණිපෙනෙල්ලක් සමාන වේ. හෙතෙම ඥානවන්තයන් විසින් නින්ද කරන ලද්දෙක් වේ.

9. එනිසා එය පුරන්නට නොහැකි භික්ෂුව විසින් එහි නොඇලී ශාස්තෘ ශාසනයෙන් උපැවිදි බවට යා යුතුය.

10. හේ මෙසේ සිතා සෙනසුන පිළියෙල කොට තබා සිවුරු සෝධා පාත්‍රය සමග පිළියෙල කොට තබා නිවැරදි සලුවක් නොමැති කමින් නග්නව ජලයෙහි සැහවී ගඞ්ගාවෙහි වැටී යන්නේ ජලයෙන් පාවෙන ඒ දරකඩ පපුවට තබාගෙන එතෙරව යටි ගං බලා යයි. එකල වනිතාවන් දෙදෙනෙක් යටි ගංතොට නහන්නෝ ගඟ දියෙන් ගසාගෙන එන දරකඩ දුරින්ම එනු දැක ඔවුන්ගෙන් එකියක් මේ දරකඩ මගේ යයි කීවාය. අනික් තැනැත්තිය යමක් එහි වේ නම් එය මගේ යයි කීවාය. ඊට පසු ඒ දරකඩ ළංවෙත්ම දෙදෙනාම පීනා ගොස් අල්ලාගෙන ඒ දර කඩ සමග ඉවුරට පැමිණ වූවාහු ය. ඉක්බිති ඇලාගෙන් යම් තැනැත්තියක් එහි විද්‍යාමාන දේ මගේ යයි කියූ තැනැත්තිය වස්ත්‍ර නැති ඔහු දැක ඔහුට සළුවක් ගෙන එන්නෙමියි කියා තමන්ගේ ගෙදරට ගියාය. ඇය ගියාට පසු ඉතිරි තැනැත්තී තමන් ඇඳි වත මැදින් ඉරා එය හඳවා මවුපියන්ගේ ගෙදරට ගෙන ගියා ය. ඇගේ මවුපියෝ ඔහුගේ කුලවංශය විචාරා ඇයටම භාර කළහ. ඕ තොමෝ නමින් සුමනා නම් වූවාය. ගම්වැස්සෝ ඔහු ගඟෙන් පැමිණි නිසා ගඞ්ගාතිස්ස යයි නම් කළහ. මේ ගඞගාතිසස ගෙදර වසන්නේ කෘෂි වණික් ආදී කිසි කර්මාන්තයක් නොකරන්නේ ඒ ඒ තැන හැසිරේ. ඒ නිසා ඔහුගේ අකර්මන්‍ය ශීලතාවයෙන් යුක්ත නිසා නිකම්

තිසස යයි ව්‍යවහාර කරති. ඉක්බිති සුමනාවගේ සහෝදර සහෝදරියෝ එක් රැස්ව මවුපියන්ට මෙසේ කීහ. සුමනාවගේ හිමියා අලසකමින් යුක්තව වසයි. අපි ඔහුට කුමක් කරමුදැයි ඉක්බිති ඔව්හු දරුවන්ට දන්විමට තිසස පිට ගිය වේලෙහි සුමනා කැඳවා මෙසේ කීවාහුය.

11. තිගේ හිමියා කෘෂිකර්මය හෝ වෙළෙඳමක් හෝ නොකොට අලස ස්වභාවයෙන් යුක්තව කෙසේ නම් කුලය ගෙන යන්නේද ?

12. අඹුදරුවන් නෑයන් සමග කුලය දියුණු කරගනු කැමැති අය විසින් සියළු කටයුතුවල හැමදම අලසයෙකු නොවී පැවතිය යුතුයි.

13. කෙත්වත් දැසි දස් මීමුන් ආදින් කෙරෙහි අලස නොවූයේ නම් හේ පිදිය යුත්තෙක් වේ. සිය නෑයන් අතර ද පිරිවර ජනයා අතර ද පිදිය යුත්තෙක් වේ.

14. මේ සීත කාලය, මේ උෂ්ණ කාලය යයි නොසිතමින් කායික දුක් ඉවසන්නේ කාලය - අකාල යයි දැන සැම කල්හි වීර්ය කටයුතුයි.

15. වෙළෙඳම් වලින් ද ශිල්ප උද්ග්‍රහණ ධාරණ අවස්ථාවෙහිද අනලස්ව හැමදම නොමියන කෙනෙක් මෙන් උත්සාහ කළ යුතුයි.

16. මෙසේ ද කියා ඇයට නැළියක් පමණ සහල් ද එක භාජනයක් ද දී අද සිට තෙපි වෙනම වසව්. අපගේ ගෙයි නොවසව් යයි කියා යැවූහ. ඒ එසේමැයි.

17. මව, පියා, සහෝදරයා, සහෝදරී, අඹු, නෑයන් යනාදී සියල්ලෝ දිළින්දන් කැමැති නොවෙති. මෙය ලෝක ස්වභාවයයි.

18. ධනවතා කුලවතෙක් නොවූවත් ඒ ප්‍රභූවරයා ධනවත් වේ නම් ලෝ වැස්සා ඔහුට සැළකිලි කරති. මෙය ලෝක ස්වභාවයයි.

19. ඉක්බිති සුමනා ඒවා රැගෙන පාලු ගෙදරක කඳුලූ සල සලා හඬමින් හුන්නීය. තිසස තමා ගිය තැනින් අවුත් හඬන භාර්යාව දැක සොඳුර, කුමක් නිසා හඬන්නේ දැයි විචාළේ ය. ඕ තොමෝ මවුපියන් කියූ හැම දෙයක්ම කියා වෙන් කළ බව කීවේ ය. එය අසා අප වෙන් කරන්නෝ කුමක් දී එසේ කළාහුද ? එක සහල් නැළියක් හා පිසන බඳුනක් දුන්නාහු යයි කී කල්හි හෙතෙම එය අසා සොඳුර තී අමුත්තක් නොසිතව, අපි කිසියම් උපයාකින් ජීවත් වෙමු. සොඳුර, අපි වෙන් කළ දින සිට හිකුෂු සංඝයාට කිසිවක් නොදී නොවළඳමුයි කියා තෙමේ මහා විහාරයට ගොස් සලාකයක් නියමකොට ගෙන අවුත් බිරිය අමතා සොඳුර මම එන තුරු ණයක් ගෙන හෝ කිසියම් උපායකින් නොපමා වී ආර්යයන්ට දන් දෙන්නෙහි යයි කියා තෙමේ කම්කරු වැඩක් සොයමින් ගියේය.

එකල්හි ඔහුගේ පියා වූ මහාධන දේවයන්ගේ මිත්‍ර චන්ද්‍රසූරිය නම්

රාෂ්ටික පුත්‍රයෙක් චිත්තසර කෙතෙන් පන්සිය කිරියක් ලැබ ශශ්‍ය කරවීය. එකල්හි පැසුනේ විය.

එකල්හි තිසස බැළ මෙහෙයක් සොයමින් රාෂ්ටිකගේ ගෙදරට ගොස් ඔහු දුටුවේය. රාෂ්ටික ඔහු දක කුමක් සඳහා පැමිණියෙහිදැයි විචාළේය. බැළමෙහෙයට ගොයම් කැපීමේ වැඩක් සොයාගෙන ආමි යි කී කල්හි රාෂ්ටික ඔහු දෙස බලා දරුව, ඔබ සිය අතින් කර්මාන්ත මීට පෙර නොකළ විරූය. ඔබට වී කපන්නට හැකි දැයි ඇසී ය. මම ගොයම් කපමි යයි කී කල්හි පිළි නොගත්තේ ය. ඉක්බිති තිසස එහෙනම් මගේ වීර්ය බලව් යයි දකැත්ත ගෙන කෙතට බැස පෙරවරු කාලයෙහි ම ඒ කිරිය පන්සියයම කැපී ය.

රාෂ්ටික මේ දක පුදුමයට පත්ව ඔහුට සතුටු වී තමන් සඳහා ගෙනත් තුබූ බත් භාජන ද දසි දස්සන් ද දුන්නේය. ඊට පසු තිසස ඒ සියළු කෙත තමාම එක් කොට මැඩ පිදුරු ඉවත්කොට තමාම පොළා වී මහ ගොඩක් කෙළේය. මහාරාෂ්ටික මේ මිනිසාගේ වීර්ය දක ඉතාම පැහැදී ඒ කෙතෙහි සියළුම ධාන්‍ය ඔහුට දුන්නේය.

20. තිසස එතැන් පටන් භික්‍ෂූන්ට සලාක දන අටක් දෙයි. දෙන්නේ වතුර ලුණු පමණක් කොට සප්පාය නොවන සේ දෙයි. එනිසා ඔහුට උදකලොණ තිස්ස යයි ව්‍යවහාර කෙරේ. මේ භික්‍ෂූන් අතර වැඩි ප්‍රව්‍රජිතයෝ මහළු භික්‍ෂූහු ඒ බත් ගෙන බල්ලන්ට බත්ලන පෝරුවෙහිම බහාලති. භික්‍ෂූන්ගේ ඒ ක්‍රියාව දනගෙන එතැන් පටන් දහසය කිරියක කිරි හා සලාක බත් එළවීය. එනිසා ඔහුට භික්ෂූන් වහන්සේ ඛීරභත්ත තිසස යයි නම් කළහ.

මෙසේ බොහෝ කලක් කිරිබත්ම වැළඳීමෙන් ඒ භික්ෂූන් වහන්සේට අරුචියක් හට ගති. ඒ කිරිබත් සිත නොපැහැදේ. ඉක්බිති ඛීරභත්තතිස්ස ඒ කාරණය දනගෙන දෙනුන් සීයක් ලැබ තමන්ගේ ශ්‍රද්ධාව ගැන සිහිකොට තනය ගති. සුවඳ ගිතෙල්ම වැගිරිණ. හේ එතැන් පටන් භික්ෂූන් වහන්සේලා දහසය නමකට ගිතෙල් මිශ්‍රකොට සෑදූ බතක් දෙයි. ඉක්බිති ඔහුට කල්‍යාණ භත්ත තිසස යයි නම් විය. හෙතෙම පිළිවෙලින් දනය දියුණු කරමින් පන්සියයක් භික්ෂූන් වහන්සේට ගිතෙල් මිශ්‍ර බත් දෙයි. හෙතෙම එක් දිනක් භික්ෂු සංඝයාට අල වර්ග දනයක් මා විසින් දිය යුතුය සිතා බෙහෝ මිනිසුන් සමග කුම්බුල පර්වතයට නැග අල ජාති සොයන්නේ නිධන් සැටක් දක තමන්ගේ ගෙදර නිධන් ගෙන ගොස් එයින් පසු වැඩිපුර දන් දෙමින් වාසය කරයි.

එසමයෙහි අනුරාධපුරයෙන් පන්සියයක් භික්ෂූහු ඒ ඒ තැන බෝ පිළිම ආදිය වඳිමින් පිළිවෙලින් මහගමට ගියාහු ය. ඒ කල්‍යාණභත්ත තිස්සයෝ ඔවුන් දක සතුටට පත්ව ආරාධනා කොට මහදන් දී අනුමෙවෙනි බණ කෙළෙවර ආර්යයන් වහන්සේ කොහි සිටි පැමිණියේ දැයි ඇසීය.

උන්වහන්සේලා උපාසකවරුනි, අනුරාධපුරයේ සිට ආවෙමුයි කීහ. හෙතෙම ස්වාමිනී, දන් කොතැනක බොහෝ භික්ෂූන් වසත් දැයි ප්‍රශ්න කෙළේය. ඉක්බිති ඒ භික්ෂූහු නිදුකාණෙනි, දූන් ලඞ්කාද්වීපයෙහි චෛතියම්බ විහාරයෙහිද අනුරාධපුරයෙහි හා නාගද්වීපය යන තුන් තැන නොයෙක් සිය ගණන් භික්ෂූහු වාසය කරතියි කීවාහුය. ඔවුන්ගේ මේ කථාව අසා සතුටුව එහි ගොස් මා විසින් දන් දිය යුතුය යයි සිතා මුලින්ම චෛතියම්බ විහාරයට ගොස් එහි භික්ෂූන්ට දන් දී ඊට පසු අනුරාධපුරයෙහි පඤ්චමහා ආවාසයෙහි නොයෙක් දහස් ගණන් භික්ෂූන්ට දන් දී රජතුමාටද පඬුරු දී ඔහු විසින් අනුග්‍රහ කරන ලදුව නාගදීපයට ගොස් එහි භික්ෂූන් වහන්සේට මහ දන් දී එයිනුදු නික්ම අරියගාල තීත්ථියෙහි වාසය කරයි.

එකල්හි හෙතෙම තමන්ගේ භාර්යාව කැඳවා සොඳුර, භික්ෂු සඞ්ඝයාට දන් වැට නෙකඩා දන් දෙව. මම ගංගාවෙහි ඔබිනොබ මිනිසුන් එගොඩ මෙගොඩ කරවමින් පින් රැස් කරවමියි අවවාද කොට තෙමේ මිනිසුන් නැවෙන් ඉවුරට පමුණුවමින් දවස ගෙවීය. ඒ අරියතිත්ථයෙහි නියුක්ත බැවින් ඔහුට අරියගාල තිසස යයි නම් කළහ.

මෙසේ ඒ පින්කමින් ඔහු කල් ගත කරන ක්ලහි ශක්‍රයා ඔහුගේ ශ්‍රද්ධාබලය දන්නේ නමුදු ඔහු විමසනු කැමැත්තේ බමුණු වෙසකින් පැමිණ නැවෙහි හුන්නේය. අරියගාල තිසස තෙම ඔහු ගෙන පදින්නේ පරතෙර සමීපයට පැමිණියේය. ඉක්බිති බමුණුතෙම පින්වත, සැරම්ටිය අමතක වීමියි කීයේය. හෙතෙම නැවත පදිමින් එය ගෙන ගියේය. නැවත පයෙහි ගාන තෙල් නැලිය අමතක වී යයි කී කල්හි නැවත ගොස් එයද ගෙනාවේය. මෙසේ හේ යමක් කමක් කියයි ද ඒ ඒ දේ ගෙන එමින් සිත දූෂණය නොකොට ඔබිනොබ සැරිසරන්නේ ශක්‍ර තෙම මෙසේ එය විමසා ඔහුගේ ශ්‍රද්ධාව නිශ්චල යයි දැනගෙන සතුටුව තමා අතහැර අහසෙහි තමාගේ ශක්‍ර විලාසයෙන් සිට අවවාද කොට අරියගාල සමීපයෙහි එක් විලක බොහෝ ස්වයංජාත වී මවා සත් රුවනින් ඔහුගේ ගෙය පුරවා අප්‍රමාදයෙන් අවවාද කොට දෙව් ලොව ගියේ ය.

ඉක්බිති අරියගාල තිස්ස රන් අමුරන් ආදිය ගෙදර පමුණුවා නොයෙක් දනාදී පින්කම් කොට එහිම වසයි. ඉක්බිති මෑත කාලයක පියඟු දිවයිනෙහි භික්ෂූ සඞ්ඝයා වහන්සේ එක් කලක එක් තැනක රැස්කොට හුන්නාහු මෙසේ කථාවක් නැංගුවාහුය. දූන් දස දහසක් යොදුන් දඹදිවෙහි ශ්‍රද්ධාවන්තයෝ කොහි වාසය කරන්නෝ ද ඉක්බිති මේ භික්ෂූන් අතර සම්බෝධි ස්ථවිරතෙම දූන් සිංහලද්වීපවාසීහු ශ්‍රද්ධා සම්පන්නයෝ යයි කීහ. යොන් රට රජපුත් බුද්ධරක්ඛිත ස්ථවිරයන් වහන්සේ යොන් රට වැස්සෝ ශ්‍රද්ධාවන්තයෝ යයි කීහ. ඒ අසා භික්ෂූහු අදම එය විමසමුයි ඒ ඒ රටට යැවූහ. ඔවුන් අතුරෙන් බුද්ධරක්ඛිත තෙරුන් වහන්සේ [illegible]ලාව සමීප වූ කල්හි යොනක රටට ගියේ ය. සති

සම්බෝධි ස්ථවිර තෙම ලංකාවේ අරියගාල තිස්සගේ ගෙදරට පැමිණියේය. එද අරියාගල තිස්ස භාය්‍යාව සුමනා දෙළොස් දහසක් භික්ෂූන් වහන්සේට දසවරක් දන් දී තමන්ගේ දනය ගැන මෙනෙහි කරන්නී කුඩා යහනක හුන්නී ය.

22. මා විසින් සිවුරු ආදී මේ මේ දේ දෙන ලදී. එසේම සියුම් සැප ස්පර්ශය ගෙන දෙන ඇඳ පුටු ආදිය ද, දෙන ලදි.

23. මිහිරි ආහාර පාන කැයුතු පිය යුතු දෙයින්ද බුලත් මුව සුවඳ දෙයින්ද බෙහෙත් ආදියෙන් මනා කොට, සන්තර්පණය කරන ලදී.

24. මෙම හෙට මීට අධිකව එය මනා කොට සපයා දෙන්නෙමි. දැයි දසි ගණයා විසින් පිරිවරා විචාරමින් උන්නීය.

25. මෙසේ හුන්නේ පැමිණි තෙරුන් දක කාලය බලා දන් බත් පිස දීමට නොහැකි යයි වහ වහා තෙල් කපාලයක් ගෙන උදුනට නගා සුවඳ ගිතෙල් බහා කැඳ බත් භාජනයෙහි බත් උළු පෙරා සෝද ගිතෙලින් බැද එහි චතුමධුර බහා දිව්‍ය භෝජනයක් මෙන් පාත්‍රය පුරවා වස්ත්‍ර සුඹුලුවක් තබා තෙරුන්ට එලවීය. තෙරුන් වහන්සේ ඇගේ ප්‍රසාදය වැඩීම සඳහා සොහොයුරිය, පාත්‍රය අහසෙහි හරින්න යයි කීහ. ඕ තොමෝ බියෙන් අත නොහැරියේය. තෙරුන් වහන්සේ විසින් ඔබගේ ශ්‍රද්ධා ගුණය ගැන කල්පනා කොට අත්හරින්නැයි කී කල්හි එසේ කොට අහසෙහි අත්හැරියේය. තෙරුන් වහන්සේ මේ බත වළඳන භික්ෂූන් වහන්සේ මෝ තොමෝ දකීවායි අධිෂ්ඨාන කොට බුද්ධරක්ඛිත තෙරුන් නොපැමිණෙන්නට පෙර ගොස් භික්ෂූන් වහන්සේලාගේ පාත්‍රවලට පිණ්ඩපාතය දී වැළඳ වූහ. ඕතොමෝ දනය වළඳන භික්ෂූන් වහන්සේලා දක හටගත් ප්‍රීතිය ඇත්තී සාධුකර දෙමින් ගෙදරට ගොස් සැමියා පැමිණි කල්හි ඔහුට තමා විසින් හා තෙරුන් වහන්සේ විසින් කරන ලද සියල්ල කීයේය. හෙතෙම එය අසා ඉතාමත්ම පැහැදුනේ ය. මෙසේ පුදුම එළවන පින්කම් රැස් කරමින් මෑත භාගයෙහි මරණපරායණ විය. එය එසේමැයි. පින්වතුන්ට මරණ වේදනාවක් නොවැත. නිද පිබිදියෙකු සේ කැමැති ස්ථානයක උපදී. ඒ නිසා පැරණියෝ කීහ.

26. පින් කළ අය යම් කලෙක මරුගේ වේගයෙන් අදිනු ලබන කල්හි මරණ මඤ්චකයෙහි ගැහෙමින් හොත්තේ වේද,

27. එසමයෙහි ඔහු විසින් කරන ලද යම් කුශලකර්ම කෙනෙක් වෙත්නම් ඒවා ඒ වේලාවෙහි ඔහුගේ මනසෙහි එල්බ ගනිත්.

28. එකල්හි ස්වර්ගයට යන සත්වයාට උසස් වාහන විමන් ආදියද ඉටුවූ අනුකූල නිමිතිද දකිත්.

29. සිය ගණන් අප්සරාවන්ගේ නෘත්‍යගීතාදියෙන් ද විමාන යානාවක් ද දක ඔහුගේ (සිත) සතුටු වේ.

30. එකල්හි ඒ දයක මිනිසා පරම ආස්වාදය ලබයි. පරණ මඩුවක් අතහැර ප්‍රාසාදයකට නගින්නා මෙනි.

31. සසර බියෙන් එතෙරවනු සඳහා මා විසින් යහපත් දෙය කරන ලදී. කුශලානුභාවයෙන් හටගත් උදර පුණ්‍ය විපාකය අනුභව කරමි.

32. මෙසේ හෙතෙම සතුටට පත්ව අභීතව අතශයින් සතුටුව තමන්ගේ පින්කමින් අතිශයින් නැලවී

33. පණ්ඩිත තෙම පින්කළ අයට ආවාසයක් වූ ස්වර්ගයාට පමුණුවයි. ඔහුට නුමුළා මරණය සිදුවේ. පින්කම් කරන්නන්ට එය නියතයි.

34. මෙසේ හොත්තාවූ ඔහුට දෙවියෝ දෙව් ලොවින් රථ සයක් ගෙනවිත් තම තමන්ගේ දෙව්ලොව වර්ණනා කළාහුය.

හේ එය අසා සදහම් අසා පුරුදු නිසා තුසිත දෙව් ලොවින් ගෙන ආ රථය හැර ඉතිරි ඒවා ගෙන යන්න යයි කීයේය. ඒ අසා ඒ අසල සිටි සුමනා තොමෝ කිමෙක්ද ස්වාමීනී, මෙතෙක් කුසල් කොට මෙසේ මරණාසන්න කාලයෙහි විලාප කරන්නෙහිද, තිසස, එය අසා සොඳුරු, මම විලාප නොකියමි. දෙව්ලොව දෙවියෝ රිය සයක් ගෙනාවාහුය. මම ඔවුන් සමග කථා කෙළෙමි යි කීයේය. එය අසා සුමනා තොමෝ මම ඒවා නොදකිමි කොහි දැයි විචාරන ලද්දී මල්දමයන් ගෙන්වා ගෙන අහසට දම්මවීය. එය ගොස් රිය හිසෙහි එල්බුණේ ය. ඒ දැක සුමනා තොමෝ ගැබට පිවිස ඇඳට ගොස් නාසිකාවාතය හිරකොට කළුරිය කොට සැමියාට මුලින් ගොස් රථයෙහි පහළ වූවා ය. ඕ තොමෝ එහි සිටිමින් සැමියාට හඬුනක් එවමින් මෙසේ කීවා ය.

35. සාරයක් නොමැති ඒ මිනිසත් බවෙහි කුමක් නිසා බොහෝ කල් පමා වන්නෙහිද? අශුචියෙන් අපිරිසිදු පණුවන්ට නිවසක් වූ මේ මිනිස් සිරුර අතහැර වහා එන්න. මේ දිව්‍යශ්‍රීය බලන්න මම පළමු කොටම ආවෙමි. හිමියනි, දැන් තුසිත දිව්‍යලෝකයට යමු.

36. මෙය අසා සිටි හෙතෙමේද කළුරිය කොට එම රියෙහිම උපන්නේය. ඔවුහු දෙදෙනාම සමගියෙන් සතුටුව දෙව් පිරිස පිරිවරා මහජනයා බලාසිටිද්දීම තුසිත පුරයට ගියාහු ය.

37. බුද්ධිමතුන්ගේ මේ චරිත දැනගෙන දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සැපත් පතමින් කල්ප වෘක්ෂය හා සමාන සංසාරයෙහි වසනා තෙක් කැමැති ද ලැබෙන නිර්මල ශීල ඇති බුද්ධ පුත්‍රයන්ට දන් දෙව්.

**6. අරියගාල තිස්ස කථා වස්තුව නිමි.**

# 6.7 ගම්දැරියගේ කථාව

1. ලඞ්කාවෙහි දකුණු පස බ්‍රහ්මවෝල නම් ගමක් විය. එහි මිනිස්සු විශාල බිම් පෙදෙසක් සීසෑමට පිළියෙල කොට එහි මෑ ඇට වැපුරූහ. ඉක්බිති ඔවුහු මෑ පැසුණු කල්හි මෑ සිඳින්නෙමියි පැන් ගෙන මහා ග්‍රීෂ්ම කාලයෙහි එහි ගියහ. එසමයෙහි එක් ගම්වැසි පිපාසායෙන් මැඩගත් භික්ෂුවක් මිනිසුන් සමීපයට ගියේය. මෙහිදී පැන් ලබමුයි. එකල්හි එක් ගම්දැරියක් ක්ලාන්ත ඉඳුරන් ඇත්තේ පිපාසයෙන් පීඩිත වූ භික්ෂුව දක උපන් ශ්‍රද්ධා ඇත්තී මිනිසුන්ට නොදන්වා කළයෙහි තුබූ පැන් ගෙන ඒ භික්ෂුවට දී එහි සතුටින් සිත පහදවා යන තෙරුන් විඳිමින් සිටියේය. ඉක්බිති මෑ කපන්නෝ පැමිණ කළයෙහි වූ පැන් නොදක කවුරුන් විසින් පැන් ගන්නා ලදදැයි විචාළහ. ඕ තොමෝ ස්වාමිනී, මා විසින් ගෙන පිපාසිත වූ එක් භික්ෂුවකට දෙන ලදැයි කීහ. එකල්හි මිනිස්සු එය අසා පිපාසිත වූ අපට බීමට ගෙන ආ පැන් අපට නොදන්වා භික්ෂූන් වහන්සෙට තමා දුන්නීය. අනේ මැගේ ශ්‍රද්ධාව යයි අපහාස කොට කිපී අපි සුළඟින් අව්වෙන් වේළෙන්නමෝ මෑ කපමින් පිපාසිතයම්හ. වහාම අපට පැන් ගෙන එව යයි ඇය සමග කළහ කළහ. ඉක්බිති ඕ තොමෝ ඔවුන් ආක්‍රොශ කරද්දී පරිභව කරද්දී නොකිපෙමින් දන් නිසා ඇති වූ සොම්නස් මෙනෙහි කරන්නී කළයක් ගෙන ඔවුන්ට පැන් ගෙන එන්නෙමියි සිටගෙන තමන්ගේ ශ්‍රද්ධාව කල්පනා කොට මෑ කෙත දෙස බැලීය. ඇගේ ශ්‍රද්ධා බලය නිසා මහ පොළොව බිඳගෙන මැණික් වැනි ලොකු දිය බුබුලක් නැග පොළොවෙහි පැතිරී පැවතුනේ ය. අහෝ ඇගේ ශ්‍රද්ධාවේ මහත් බව, භික්ෂූන් වහන්සෙට පැන් ටිකක් දී එහිදීම නොසිඳෙන පැන් ලැබුණේ ය. එහෙයින් කියන ලදී.

2. දන්දීමට ශ්‍රද්ධාවම මුල් වේ. ත්‍රිවිධ සම්පත්තියට ශ්‍රද්ධාව මුල් වේ. ශ්‍රද්ධාවෙන් දෙන ලද කුඩා වූ දනය ද කල් නොයවා විපාක දෙන්නේය.

3. දන් දීම ස්වර්ගයට නිදනයයි. එසේම අනුගාමික නිධානයයි. සියළු ලෝ වැස්සන් වශී කරන්නකි. එය පරම ඖෂධයකි. මන්ත්‍රයකි.

4. ඒ දනය විපතක් පැමිණි කල්හි මිත්‍රයෙකු සමානය. කැමැති දේ දෙන්නාවූ උතුම් සිතුමිණි රුවනකි. දනය ඒකාන්තයෙන් භද්‍රඝටයක් සමානය. දනය ඒකාන්තයෙන් දිව්‍ය වෘක්ෂයෙක් හා සමානය.

5. මේ ගම්දැරිය ශ්‍රද්ධාවෙන් පැන් ස්වල්පයක් දී, ඕතොමෝ එම ඇසිල්ලෙහිම ක්ෂය නොවන්නා වූ සිසිල් ජලය ලැබීය.

6. උත්තම - අධම - මධ්‍යම යන සියල්ලන් කෙරෙහි හැම කල්හි දනයක් දිය යුතුය. මුල මැද අග යන තුන් තැන ශ්‍රද්ධාව මුල්ව දිය යුතු වේ.

7. ඉක්බිති ඒ කුමාරිකා තොමෝ ගලන දිය දක සතුටු සිත් ඇත්තේ කැමැති සේනා පැන් බී එක් පැන් කළයක් ගෙන් පිපාසිත මිනිසුන්ට දුන්නී ය.

එවැනි දිය කඳක් අන් අය නොමදකිති. ඕ තොමෝ ම දකී. ඒ නිසා ඕ තොමෝ නැවත එහි ගොස් නහන්නීය. පැන් බොන්නීය. කළයෙන් දිය ගෙන මිනිසුන්ට දෙන්නීය. ඒ දක මිනිස්සු අපි මීට පෙර මෙහි පැන් නොදක්කෙමු. මැණියෙනි, කොහෙන් තී නා පැන් ගෙන එන්නෙහිද ? අපට ද එය පෙන්වවයි ඉල්ලූහ. ඕ තොමෝ ඔවුන්ගේ ඒ කථාව අසා සතුටු සිත් ඇතිව ඉදින් මේ පැන් මගේ පුණ්‍යානුභාවයෙන් උපන්නේ ය. එය සියළුම මිනිසුන්ටත් මුව ඌරු කුරුලූ ආදීන්ටද පාවිච්චියට සුදුසුව පෙනේවායි අධිෂ්ඨාන කළාය. එකෙණෙහිම ඇගේ ශ්‍රද්ධා බලයෙන් පාවෙන පෙණ සමූහයෙන් ද බිඳි බිඳී නැගෙන තරඟ මාලාවෙන් ද විසිරී යන ජල කර්ණිකාවෙන් යුක්ත වූ ජල වේගයෙන් හට ගත් ඝොෂාවෙන් යුතුව ගලා බසින මහ දිය කඳ දක පුදුමයට පත් සිත් ඇත්තාහු අහෝ මැගේ දනානිශංසය මැය සකසා සිල්වතුන් කෙරෙහි පිහිට වී යයි ඇයට පසසමින් නා පැන් බී ගියාහුය. ඉක්බිති මෑත සමයෙහි එහි මිනිස්සු ගමක් පිළියෙල කර ගත්හ. ඒ ගමට මාස පිට්ඨි ගම යයි නම් කෙළේය.පසුව ඒ ජලාශය ආශ්‍රය කරගෙන එහි විශාල විහාරයක් කළාහුය. ඕ කුමාරි තොමෝ ආයුෂ ඇතිතාක් වාසය කොට පින්කම් කොට දිව්‍ය ලෝකයෙහි උපන්නීය. ඕ තොමෝ එහිදී නොයෙක් ගස් සමූහයෙන් සැරසුණු උයන් ද බබළන පස්වණක් පියුමෙන් ගැවසීගත් මිහිරි ජලයෙන් පිරී ගිය ජලාශයන්ගෙන් ගැවසුණු නොයෙක් අප්සරා දසදහසක් විසින් මනාව වාදනය කරන ලද බෙර - තූර්ය නාදයන් ගෙන් ගැවසී ගත් නටන නොයෙක් දෙව් තිළියන්ගෙන් ගැවසුණු දෙළොස් යොදුන් දෙව් විමනක උපන්නීය. ඇගේ පින ප්‍රකාශ කරනු පිණිස දිව පැනින් පිරී ගිය එක් රන් කළයක් එහිම හටගති. එය ඇය යන යන තැනට යයි, දෙදෙව් ලොව දෙවියන් පරිභොග කරන සමයෙහි ද සිඳීමට නොගියේ ය.

8. මෙසේ යහපත් සත්පුරුෂයෝ ශ්‍රද්ධාවෙන් පැන් දන් දී මහ සම්පත් විඳිති. බොහෝ කොට දන්දෙන්නහුගේ සම්පත්තිය බුදු නොවූ කවර සත්වයෙක් ඉතිරි නොකොට කියන්නට සමර්ථ වේද ? නොවේමැයි.

**7. ගම්දරියගේ කථා වස්තුව නිමි.**

## 6.8. ධම්මාවගේ කථාව

1. සිංහල දිවයිනෙහි ලජ්ජතිස්ස රජතුමා රාජ්‍ය කරන කාලයෙහි රුහුණු දනව්වෙහි ගිරිතිම්බිල තිස්ස පර්වත මහා විහාරවාසී භික්ෂූන්

වහන්සේ භික්ෂාව පිණිස හැසිරෙන තැන සිව නම් ගමෙක් විය. ඒ ගමෙහි එක් දුගී ධර්මා නම් ස්ත්‍රියක් අනුන්ට දර කොළ දිය ආදිය ගෙනෙමින්, වී කොටමින් පිදුරු වනමින් ගොයම් පාගමින් අමාරුවෙන් ජීවිකාව කරමින් වසන්නීය. ඕ තොමෝ මැත කාලයෙහි මෙහෙකාර කම් කොට දුක සේ එක් වස්ත්‍රයක් සපයාගෙන මෙසේ සිතී ය. ඒ එසේමැයි.

2. රාග නමැති ගින්නෙන් දැවී ද්වේෂ නමැති රකුසාගෙන් පෙළී, මෝහයෙන් මුලාවී බොහෝ කළක් සංසාරයෙහි හැසුරුණෙමි.

3. පෙර පිනක් නොකරන ලද්දේද, නැවත කිසිවක් කිරීමට ද, නොහැකි දුප්පත් වීමට ඒකාන්තයෙන් කවර නම් පාපයක් මා විසින් කරන ලද ද?

4. එනිසා මම අනුන්ගේ ගෙවල්වල අපහසුවෙන් මෙහෙකාරකම් කරමින් ජීවත් වෙමි. මට සැපයක් නම් අහසට පොළොව මෙන් දුරය.

5. දැන් බුද්ධොත්පාද කාලයයි. ලෝකයෙහි ධර්මය බබළයි. ගුණ සාගර වූ බුද්ධපුත්‍රයෝ ලෝකයෙහි පවතිත්.

6. මා විසින් ඒකාන්තයෙන් ක්ෂණයක් ලබන ලදී. දැන් මගේ ආත්මය ගොඩ නගා ගත නොහැකි වූයේ නම් සසර ගිලුනා වූ මම කවද හිස ඔසවන්න ද?

7. දුකසේ උපදවා ගත් එක් සළුවක් මට ඇත. දැන් ඒ සළුවෙන් භව සාගරයෙහි පිහිට කරගන්නෙමි.

8. ඕ ධර්මාවෝ මෙසේ සිතා එකල්හි ඒ වස්ත්‍රය සංඝයා වහන්සේට මහත් ඵල ගැන විශ්වාසය තබමින් ශ්‍රද්ධාවෙන් දුන්නීය.

9. එකල්හි ගිරිතිම්බිල තිස්ස පර්වත විහාරයෙහි පන්සියයක් භික්ෂූහු වස් එළඹුනහ. එයින් භික්ෂූහු සිව ගමට පිඬු පිණිස බොහෝ සෙයින් එළඹෙත්. එකල්හි ඕ තොමෝ උපන් ශ්‍රද්ධාව විනාශ නොකොට වස්ත්‍රය ගෙන ආසන ශාලාවට ගොස් එක භික්ෂුවකට මෙසේ කීවාය. ස්වාමිනී, මේ වස්ත්‍රය එක විහාරයක භික්ෂූන්ට වස්වාසික කොට දෙන්නෙමි. නුඹ වහන්සේලා එහි වැඩම කරවා මගේ දුප්පත්කමත් මේ සළුව දුකින් ලැබුණු බවත් භික්ෂූන්ට කියා දෙනු මැනව. උන් වහන්සේට වස්ත්‍රය දී සොම්නසින් ගියාය. ඉක්බිති උන්වහන්සේ ඒ වස්ත්‍රය ගෙන විහාරයට ගොස් රැස් වූ මහණුන්ට ඇය කියූ වචන කියා ස්වාමිනී, මේ වස්ත්‍රය අදින්නට සමත් කෙනෙකුට දෙනු මැනැවැයි භික්ෂු සංඝයාට වස්ත්‍රය දුන්නේය.

ඒ අසා භික්ෂූන් අතර එක නමක් ස්වාමිනි, මට තුන් මසකට දෙන්න. එය මම පරිභෝග කරමියි කීයේය. එය අසා අනික් භික්ෂුවක් මට දෙමසකට දෙන්න, එක් භික්ෂුවක් ස්වාමිණී මට මසකට, සති

දෙකකට, දස දිනකට යයි මෙසේ කාලය අඩු කරමින් ක්‍රමයෙන් එක් භික්ෂුවක් මට එක දිනකට දෙන්න, මම එය පාවිච්චි කරමි. ඉක්බිති භික්ෂූහු ඔහුට ඒ සළුව දුන්හ. හෙතෙම ඒ වස්ත්‍රය ගෙන දහවලූ කපා මසා කප් බිඳු තබා සිවුරු පොරවා සක්මනට නැග පියවර සතක් ගෙවා අවසානයෙහි කෙලෙස් සතුරා දිනමින් රහත් බවට පැමිණ ඒ සිවුර සෝද , දෙවෙනි දවසෙහි භික්ෂූන්ට දුන්නේය. මේ ක්‍රමයෙන් එම සිවුර නිසා ඇතුල් වසම පන්සියයක් භික්ෂූහු රහත් බවට පැමිණියහ.

10. ඉක්බිති ලජ්ජිතිසස මහරජතුමා මහා පාවාරණ දවසෙහි රජ ගෙදරින් නානා පාට වස්ත්‍රයන් ගෙන්වාගෙන වියන් බඳිව්., තොරන් ඔසවව්, ධ්වජ හා පතාක බඳිව්, විහාර අලඞ්කාර කරව් යයි මිනිසුන් යෙදවීය.

ඉක්බිති ඔවුහු විහාරය අලඞ්කාර කළහ. භික්ෂූහු ද විහාරය අලඞ්කාර කරන කළ සිවුර ගෙන මේ සිවුර බොහෝ දෙනාගේ කෙලෙස් මළ නැති කිරීම සඳහා හේතු වී යයි මුළු දෙර කොඩියක් කොට එසවූහ. ඉක්බිති රජතුමා මළ දෙර ඔසවන ලද මේ අර්හත් ධ්වජය දැක, අපි නොයෙක් පාට වස්ත්‍ර එවීමු. කුමක් නිසා දිරුණුක් ඉදිරිපිට බැන්දහු දැයි ආරාමියකන් ගෙන් ඇසූහ. මහරජ, ආර්යයන් වහන්සේලා තමන්ට මෙය උපකාරිවී යයි ඉදිරි පස බැන්දවූහයි කී කල්හි රජු විසින් ඔවුන්ට මෙය විසින් කවර උපකාරයක් කෙළේ දැයි කී කල්හි දේවයන් වහන්ස, අපි නොදනිමු. ආර්යයෝම දනිතියි කීහ. ඉක්බිති රජතුමා භික්ෂු සංඝයා වෙත එළඹ වැඳ එකත්පස්ව හුන්නේ ස්වාමිනි, මේ වස්ත්‍රය සංඝයාට බොහෝ උපකාර යයි කියති. ඊට හෙතු කවරේද? භික්ෂු සංඝ තෙමේ මහරජ, මේ වස්ත්‍රය නිසා මේ ඇතුල්වස පන්සියයක් භික්ෂූහු රහත් බවට පැමිණියෝය. එනිසා භික්ෂූන්ට එය බොහෝ උපකාර යයි සිවුරෙහි ගුණ කියමින් මෙසේ කීයේය.

11. මලමුත්‍ර වලින් තැවරුණු අපිරිසිදු පිලෝතික රහත් ධ්වජය දැක යම් තැනක අනාදර නො කළ යුතු වේ.

12. මිනිසුන් විසින් පිදිය යුතු ඒ අරහත් ධජය ක්ෂේම භූමියට පමුණුවයි, එනිසා ආදර කළ යුතු වේ.

13. රජතුමාණෙනි, රහතන් වහන්සේලා විසින් පරිභෝග කරන ලද ඒ මේ දිරුණු ඔසවන ලද අරහත් ධ්වජය රහතුන් විසින් පරිභෝග කරන ලදි. එහෙයින් ඒ වස්ත්‍රය පූජාවට සුදුසුය.

14. මේ ආදී ක්‍රමයෙන් ධර්මය දේශනා කරන ලදී. මේ ඇසූ රජතුමා සත්තෝෂව මේ වස්ත්‍රය දෙන ලද්දේ කවුරුන් විසින් දැයි විචාළේය. ඒ අසා භික්ෂූහු, මහරජ, සිව ගමෙහි දිළිඳු ධර්මා ස්ත්‍රියක් ඇත. ඇ විසින් මෙය දෙන ලදැයි කීවාහුය. රජතුමා එය අසා ඇය කැඳවා ඇයට බොහෝ වස්තු දී සිවගම ඇගේ බත්ගම කොට දුන්නේ ය. එතැන් පටන් ඒ ගම

ධම්මසීව ගම යයි ප්‍රසිද්ධ විය. රජතුමා ඇය තමන්ගේ දූ තනතුරෙහි තබා මහත්වූ සම්පත් දුන්නේය. ඕ තොමෝ එතැන් පටන් දන්දී සිල්රැක ආයු කෙළවර ගොස් දෙව්ලොවැ උපන්නීය.

15. දිළිඳු ගැහැණියක විසින් සුපේශල සංඝයා වහන්සේට දෙන ලද වස්ත්‍රයාගේ ආනිශංස ආනුභාවය පුදුමයි. ධර්මා තොමෝ ද භවභෝග සම්පත් ලැබුවාය. භික්ෂූහු ද ක්ෂීණාශ්‍රවයෝ වූහ.

**8. ධර්මාවගේ කථා වස්තුව නිමි.**

## 6.9. කිඤ්චිසඞ්ඛාවගේ කථාව

1. ලංකාවේ කාවන්තිසස රජතුමා රාජ්‍යය කරන කාලයෙහි අනුරාධපුරයෙහි සඞ්ඛනම් මහා අමාත්‍යයෙක් විය. රජතුමා ඔහුට රුහුණෙහි මහගම බත්ගම් කොට දුන්නේය ය. හෙතෙම එනාහි තමන්ගේ චුල්ලසඞ්ඛ නම් මල්ලී අමතා තෝ රජුගේ මෙහෙකරුවෙකු වී උවටැන් කරවයි රජු සමීපයෙහි නවතා තමා මහගමට ගොස් වසයි. එකල ඔහුට එක් දුවක් වූවාය. නමින් කිඤ්චිසංඝා නම්. රූපයෙන් යුත් දෙවඟනක් වැන්නී ය. මවු පියවරු ඇයට සූප ශාස්ත්‍රය උගන්වා පිසීම් ශාස්ත්‍රය උගැන්නුවාය. ඉක්බිති ඔවුහු ඇය විසින් මුලින් පිසූ කොටස භික්ෂු සංඝයාට දුන්හ. ඕ තොමෝ එතැන් පටන් බොහෝ සෙයින් සංඝයාට බත් හා ව්‍යඤ්ජන පිස උපස්ථාන කරන්නීය. ඔව්හු ඇයට සංඝ උපස්ථායිකාව යයි ව්‍යවහාර කරති.

2. මැත කාලයෙහි සංඝාමාත්‍ය තෙම ජනපදය පෙළමින් කොල්ල කමින් කලබල කරති. ඒ ප්‍රවෘත්තිය මිනිස්සු ගොස් රජුට කීවෝය.

රජතුමා එය අසා ඔහුගේ මළණුවන් කැඳවා සහෝදරයා ජනපදය සංග්‍රහ කිරීමට යවන ලදි. දන් ජනපදය පෙළා කලබල කරයි. මෙයට ඔබේ සහෝදරයාට ලිපියක් යවා වලක්වන්න යයි කීයේය. හෙතෙම එය අසා සහෝදරයාට ලියුමක් යවමින් මෙසේ කීයේ ය.

3. මගේ සහෝදරයාට වැඳ මෙහි පැතිරී ඇති ප්‍රවෘත්තිය කියමි. සහෝදරය, වංචාව නැතිව රජවරු සේවනය කළ යුත්තෝය.

4. මේ පොළොවෙහි, යම, ආදිත්‍ය, චන්ද්‍ර, මාර, කුවේර, අග්නි, යන සයදෙනා එක්කිරීම් විසින් රජවරු මවන ලදහ.

5. යම තෙම පින්පව් අනුව සත්වයන් ස්වර්ගයට හා අපායට පමුණුවයි. යම හා සමාන රජතුමා ද එසේ පවතී.

6. ප්‍රබෝධ කළ යුත්තන් ප්‍රබෝධ කරයි, වියලවීමට සුදුස්සන් වියලවයි. මෙසේ සූර්යා ලෝකය ආලෝකය කෙරේ. සූර්යා සමාන රජතුමා ද එසේමය.

7. චන්ද්‍රයා ග්‍රහතාරකා සමූහයා විසින් පිරිවරණ ලද්දේ දස දික්හි අති සිසිල් රශ්මි කදම්බයන් පතුරුවමින් ලෝකයා සතුටු කරයි. ලොව රජු ද චන්ද්‍රයා මෙනි.

8. මාරයා මැරිය යුතු අය දයාවෙන් තොරව මරා ද , රජවරු ද මාරයා මෙන් අසත්පුරුෂයන්ට නිග්‍රහ කළහ.

9. ධනය දීමෙන් කුවේරයා සතුටු කරනාතර ධන නැමති දිය සිදීමෙන්ද කුවේරයා කටයුතු කරයි. මෙසේ රජතුමා ද කුවේර වැනිය මිත්‍ර - සතුරු අය ධන දීමෙන් හා ධනය ගැනීමෙන් කුවේර වැනිය.

10. ගින්න ලොවැ ඇති සියළු භූතයන් දවයි. රජතුමා ද ගින්න මෙන් අසතුටු පුද්ගලයන් දවයි.

11. ගින්න තරකට ඇසුරු කළොත් ඒ අයම ගින්න විනාශ කර දවයි. රජ නමැති ගින්න නෑයන් සහිත වූ චරාචර සියළු සතුන් සහිත කුලයම දවයි.

12. දවුණු වනයෙහි ඇතැම් ගස් තිබේ. රජුගේ කෝප නැමැති ගින්නෙන් මනුෂ්‍ය නැමැති වනයෙහි අපරාධ කළ කිසිවෙක් ඉතිරි නොවෙත්.

13. දිග අත් ඇති රජවරු දූර යයි සලකා අවමන් නොකළ යුතුය. ලෝකය පෙළන්නාවූ සතුරා වහා දඬි කොට අල්වා ගනිති.

14. ප්‍රත්‍යන්තය නොපෙළව්. ගැමියන් පැහැර නොගනිව්. අනුන්ගේ ගේ දේ පැහැර ගන්නෙක් නොවේවා. තමන්ගේ මුල් නොසිඳුව මැනවි.

15. රජවරු පක්ෂපාති උපකාරී හිත එළවන්නාවූ මිනිසාට කීර්ති දීම් ආදියෙන් මනාව වර්ධනය කරත්.

16. මෙසේ ද කියා අප නොබලව් ද, අප්‍රමාද වී ජනයාට සංග්‍රහ කරමින් වාසය කරව් යයි සන්දේශයක් යැවීය. හෙතෙම ඒ සන්දේශය අසා මගේ බාල මල්ලී රජුගේ අදහස දන සන්දේශය එවිය. රජු කිපී කලක සිට අපට මෙහි වාසය කරන්නට නොහැකැයි සිතා දුවත්බිරියත් හරුබස්තත් රැගෙන යන්නේ පිළිවෙළින් නිග්‍රොධසාලඛණ්ඩ යට පැමිණියේය. එහිදී මෙසේ සිතීය. මම රජුට බියෙන් පලායමි. නැවත ඔහු දකින්නට නොහැකිය. අනුරාධපුරයට නොගොස් මලය රටට ගොස් යම්කිසි තැනක වාසය කොට ජීවත් වෙමියි මේ කරුණ තමන්ගේ භාර්යාවට කියා ඇය පිළිගත් කල්හි තමන්ගේ දුවගේ රූසපුව සලකා ඉදින් අපට බිය උපදී ද, එය මැ නිසා උපදී යයි සිතා සොඳුර, කිමෙක්ද? සංසයා නිසා අපට බියක් හටගනී. ඉදින් ඔබට රුචි නම් ඇය අත්හැර යමු යි කීයේය . එය අසා ඕ තොමෝ ඔබට යමක් කැමැති නම්, එය කරවු. මම ඔබ සිත නොබිඳින්නෙමි යි කීවාය. ඉක්බිති හෙතෙම දුව අමතා, දුවණියෙනි, අපි ඇතුළු ගමට ගොස් ආහාර සොයා එනතුරු

ටිකක් මෙතන ඉන්න යයි දුව නවතා පලා ගියහ. පුදුමයි, බියට පත් සතුන්ට ලෝකයෙහි ප්‍රේමණීය අය කෙරෙහි ප්‍රේමය හෝ ලෝභ කටයුතු වස්තුවෙහි ලෝභය ගෙවීමට යේ. ඒ එසේමැයි.

17. මෙබඳු වූ දුක් ඇතිවූ කල්හි මේ මිනිස්සු පුතුන්ට ඇති ප්‍රේමය අත්හරිති. තමන්ගේ දරුවන් කන කිඹුලන් හා කැස්බන් මෙනි.

18. ඉක්බිති එහි සිටි කුමාරිකාව යන එනවුන් දැක මේ කුමාරිකා තොමෝ අභිරූපය, සුකුමාරය කුමක් සඳහා මෙහි සිටින්නී දැයි පුදුමව ළඟට එළඹ අප සමග මැණියෙනි, එන්න යයි කියති. ඕ තොමෝ ඔවුන්ගේ ක්‍රියාව අසා මාගේ මවුපියන් වචනය කඩ නොකෙරෙමියි සිතා නිශ්ශබ්දව එහි සිටියේය. මෙසේ එතැන කල් ගෙවන්නාවූ ඇයට දින හතක් ඉක්මිණි. මෙතෙක් කල් නිරාහාරව සිටියේ ය. එකල්හි ශක්‍රතෙම දෙව් මිනිස් ලොවෙහි සැරි සරන්නේ එසේ සිටි ඇය දැක මහ ගුණවත් කුමාරිකාවකැයි ඇය විමසමියි සිතා සිත් කළු තරුණ රූපයක් මවා ගෙන ඇගේ සමීපයට එළඹ ඇය සමග කතා කරමින් මෙසේ කීයේය.

19. නිල් වූ අග්බඹුරු වූ කෙස් කලාපයෙන් යුත්, පිපී ගිය නෙළුම් වනයක් වැනි මුහුණක් ඇති නිල් පළල් ඇස් ඇති ඇසට උත්සවයක් වැනිය තී.

20. සොඳුර, ලීලාවෙන් රන් ලීයක් බඳු නඳුන් උයනෙහි දිව්‍ය කන්‍යාවක් බඳු අහසෙහි චන්ද්‍රලේඛාවක් බඳු තී, මෙහි සිටින්නෙහිය.

21. සිත්කළු තැනැත්තිය, තී කවුද ? කාගේ දුවක්ද ? කොහිසිට මෙහි පැමිණියෙහිද? කුමක් සඳහා මෙහි සිටින්නෙහිද තිගේ ස්වාමියා කව්ද ?

22. තරුණයෝ තරුණියක්ම කැමැති වෙති. යෞවනියද එසේම තරුණයන් කැමැති වේ. සොඳුර! මෙහි දැන් තීද මමද සමාන වයසෙහි සිටියෝ වෙමු.

23. තී අද පටන් හැම කල්හි භාර්යාභාවයෙන් පෝෂණය කරමි. මම තීගේ හිමියා වන්නෙමි. තී මගේ බිරිය වෙහි.

එය අසා කුමාරිකාව මෙසේ කීවාය.

24. මිත්‍රය, නුඹ යමක් සඳහා මා සමග කථා කරන්නෙහිද එය කරුණක් මෙන් පෙනේ. ලෝකයෙහි ස්ත්‍රීහු පුරුෂ නමැති ආභරණ යෙන් තොරව නොබබලත්.

25. යම් හෙයකින් ඇලාට ස්වාමිවරුන් නැත්නම් විධවා (වැන්දඹු) යයි කියති. හැමදම වැන්දඹුව සියළු දුකට කොටස් කාරයෙක් වේ.

26. මට මවු හා පියා ඇත. ඔවුහු මට මෙසේ අනුශාසනා කළහ. දුවණිය අප එනතුරු මෙහිම නවතින්න.

27. මවුපියන්ගේ වචනය යමෙක් මේ මනුලොව නොකරත්ද හේ මේ ලෝකයෙහි විනාශයට ද පරලොව දුගතියටද පැමිණෙත්.

28. තරුණය, යම් හෙයකින් මගේ දෙමව්පියෝ ඔබ සමග එක්වීම අනුමත කරත් නම් එක්වීම සිදුවේ. එසේ නොවුවහොත් එක්වීමක් නොමැත.

29. ඉක්බිති ශක්‍රයා ඇගේ කථාව අසා එසේ නම් පින්වතිය, තී අධික බඩගිනි ඇත්තෙහිය. මේ බත් වළඳවයි කියා එක බත් මුලක් ඇයට දී ගියේ ය. ඕ තොමෝ බත් ගෙන කාලය බලා තවම පෙරවරු යයි දැන දන් දී වළඳිමියි කාල ඝොෂා කළා ය. .තුන්වැනි ශබ්දය කෙළවර සිතුල්පව් වෙහෙර වැසි එක් රහත් නමක් එය අසා අහසින් අවුත් ඇගේ ඉදිරියෙහි පහළ විය. ඕ තෙරුන් දැක සතුටු සිතැතිය පසහ පිහිටුවා වැඳ පාත්‍රය බතින් පුරවා තෙරුන්ට දී ටිකක් සිටින්න ස්වාමීනි යි කියා වහ වහා ලැහැබකට පිවිස ගස් අතු කඩා ඇඳගෙන වැලකින් බැඳගෙන හැදිවත් සෝද සුඹුලක් දරණක් කොට තෙරුන්ට දුන්නේය. තෙරුන් වහන්සේ ඒ පාත්‍රය සුඹුලෙහි (දරණෙහි) තබා මෝ මා දකීවායි අධිෂ්ඨාන කොට ඈ දකිද්දීම අහසට නැග විහාරයට ගියෝය. ඕ තොමෝ එය දැක සතුටු සිතින් දන් දී ඉතිරි වූ දෙය අනුභව කොට තමන්ගේ දනය ගැන සලකා ලැහැබක සැඟවී සිටියාය. එකල්හි රජුගේ සේසතෙහි අධිගෘහිත දෙව්දුව ඇයගේ දනයෙන් සතුටුව සේසත් පිඩු චීවරයෙන් නික්ම සාධුකාර දෙමින් මෙසේ කීවාය.

30. කුමරිය, මැනවි, මැනවි, ධර්මයෙන් ජීවත්වන තැනැත්තිය ශ්‍රද්ධා ඇත්තී වෙහි. තී යහපත් කොට දන් දුන්නෙහි. හැම කල්හි යහපත් පූජා ඇත්තියක් වෙව.

31. රජතුමා එය අසා කවරෙකුට පිනැත්තිය සාධුකාර දුන්නෙහිද? යි විචාළේය. ඕ තොමෝ මහරජතුමාණෙනි, මහාගමෙහි සංඝාමාත්‍යයාගේ කිංචිසංඝා තොමෝ තුගගල්කඩ දෙරදී දනක් දුන්නීය. ඇයට මම සාධුකාර දුනිමි යි කීවාය. රජතුමා එය අසා ඇමැතියන් ඇණවීය. පින්වත්නි, තෙපි වහා එහි ගොස් ඇය යෝග්‍ය වූ රථයක් වඩා හිඳුවා සරසා ගෙන එව් යයි කීයේය. ඔවුහු ගොස් ලැහැබ අතර හුන් කුමරිය දැක මෑණියෙනි, අපේ රජතුමා තී ගෙන ඊම පිණිස අප එවී ය. එන්න යන්න යයි ඉල්ලූහ. ඉක්බිති ඕ තොමෝ මගේ මවුපියන් නොපැමිණ දින සතකි. දන් මා අතහැර එක්කෝ ගියාහු ය. නැතහොත් මළාහු විය යුතු යයි සිතා ඔවුන්ගේ වචන මැනවයි පිළිගත්තාය.

ඉක්බිති ඇමතියන් විසින් උනන්දු කරන ලද (ඇය) ජලය බී නහා කොළ අතු දියෙහි දමා ඇඳීමට වස්ත්‍ර ගෙන එන්න යයි අත දික් කළාය. ඇමතියෝ රජතුමා විසින් එවන ලද සළුව බැහැර කොට ඇගේ අතෙහි තැබූහ. ඕ තොමෝ එය දැක පින්වත්නි, මේ වස්ත්‍ර රළුය. සිත්කළු නොවේ. වෙන එකක් ගෙන එන්න යයි කීවා ය. ඉක්බිති ඇතැම් කෙනෙක් එය

අසා අතු ඇඳ සිටි තැනැත්තියට මේ සළු ප්‍රිය නොවේ යයි කියා මිනිස් ලොවට මීට වඩා සියුම් වස්ත්‍රයක් නැතැයි කීවාහු ය.

32. එකෙණෙහි ශක්‍රයා ඇයගේ පින් බලෙන් දිව්‍යමය කිසිම දිනක විනාශයට නොයන සළු පසක් යැවීය.

ඕ තොමෝ එක් සළුවක් ගෙන ඇඳ වාහනයට නැග මහියංගන විහාරයට ගොස් එහි බොහෝ භික්ෂූන්ට සිවුරු පිණිස වස්ත්‍ර දී තමන්ගේ පිරිවර ජනයාටද දිව්‍ය වස්ත්‍රම දුන්නීය. පැසින් වස්ත්‍ර ගත් ගත් තැන අඩුව පිරිණ. ඉක්බිති ඕ තොමෝ පිළිවෙලින් අනුරාධපුරයට ගොස් රජතුමා දැක්කාය. රජතුමා ද ඇය දැක සතුටුව ඇයට මහත් සැපත් දුන්නේ ය. ඕ තොමෝ එහි සියළු භික්ෂු භික්ෂුණී සංඝයාටද රජතුමා ප්‍රධාන සියළු රජ පිරිසටද නුවර වැස්සන්ටද දිව්‍ය වස්ත්‍ර දුන්නීය. රජතුමා ඇය එක පුතෙකුට පාවාදී ඇයට මුළු රුහුණු ප්‍රදේශයම බත්කම් කොට දුන්නේය. ඕ තොමෝ එතැන් පටන් එහිවසමින් දන්දීම ආදී බෙහෝ පින්කම් කොට ආයු කෙළවර පිරිස් සහිතව දෙව්ලොව උපන්නී ය.

35. දනය කරණකොට ගෙන සත්වයෝ දෙව් ලොව යති. දනය කරණකොට ගෙන මිනිසුන් අතර සම්පත් විඳිති. දනය කරණකොට ගෙන නිර්වාණයද ලබති. එනිසා නිතර දන් දෙව්.

**9. කිසද්වි සංසාවගේ කථා වස්තුව නිමි.**

## 6.10. ශ්‍රද්ධා සුමනාවගේ කථාව

1. එක් කලෙක අනුරාධපුරයෙහි මහවැලි වීථියෙහි සුමනා නම් ශ්‍රද්ධාවත්, තුණුරුවන් කෙරෙහි පැහැදුණු ඒ ඒ තැන සෑබෝ ආදියට මල් ආදියෙන් පුදන බණ අසන භික්ෂූන් වහන්සේට උපස්ථාන කරන එක් ස්ත්‍රියක් වූවාය. ඇයට ශ්‍රද්ධාවත් බව නිසා ශ්‍රද්ධා සුමනා යයි නමක් වූවාය. එසමයෙහි රුහුණු දනව්වෙහි මහගමින් එක් මිනිසෙක් කිසියම් කටයුත්තකට අනුරාධපුරයට පැමිණ මහවැලි වීථියෙහිම නවාතැන් ගති. ඕ තොමෝ ඔහු සමග මිතුරු දම් පවත්වා ඔහු පිළිබඳ සිතැත්තී වූවාය. ස්ත්‍රීන්ගේ සිත්හි පවත්නා අශිෂ්ටත්වය පුදුමයි.

2. මේ කටුගසකි; මේ විෂ ගසකි; මේ සඳුන් ගසකි. යයි වැලකට මෙන් වෙනසක් නොමැත.

3. ලෝකයෙහි කාමයෙන් අන්ධ වූ ස්ත්‍රීහු හීන උත්කෘෂ්ඨ මධ්‍යම යන මිනිසුන්ය, කුලීනයයි හීන කුලීනයයි, වැලක මෙන් අත් නොහරිත්.

4. හෙතෙමේ ද ඇය පිළිබඳ සිතැති නිසා ඇය මහගමට ගෙන ගියේ ය. ඉක්බිති ඕ තොමෝ එහි ගොස් ඔහුගේ ගෙයි වසමින් නිතරම භික්ෂූන් වහන්සේලා අට නමකට සලාක බත් දුන්නාය. නිතර බණ ඇසුවාය. වෙහෙර බෝධි ආදියට වඳිමින් පින්ම කළාය.

ඉක්බිති ඕ තොමෝ අසුන්හලට ගොස් භික්ෂූන් වහන්සේට වතාවත් කරමින් කාලය ගෙවූවාය. ඇගේ හිමියා ශ්‍රද්ධාවනතයෙක් නොවේ, එනිසා ඔහු ගෙදරට පැමිණි කල්හි තී පින්කම් කරමියි ගෙදර කිසිවක් නොකරන්නෙහි යයි ඇයට කිපී ගෙදරින් බැහැර කෙළේය. ඕ තොමෝ සත් දිනක්ම කැඩුණු වැටුණු ගෙබිතක් නිසා නිරාහාරව වාසය කොට නිසැකයෙන්ම තමා අත්හැරී බව දන ගෙන අනුරාධපුරයෙහි මගේ දෙමවුපියන් සමීපයට යන්නෙමියි අනුරාධපුර මගට පිළිපන්නී ඒ ඒ තැන සෑ බෝ ආදිය වඳිමින් පිළිවෙළින් නුගගල්කඩ දෙර පැමිණියාය. හුදෙකලාව ඇවිදින්නන්ට මෙවැනි පිරිහීමක් වේමය. ඒ එසේමැයි.

5. කුඩා වූ හෝ මහත් වූ හෝ ඉටු අනිටු වූ යම්කිසි කාර්යයක් මවුපියන් ආදී වැඩිමහල්ලන් විසින් අනුදත් දේම කළ යුතුය.

6. දෙමාපියන්ගේ අනු දනුම නොමැතිව රාජ්‍ය සම්පත්තියක් ලබන්නේ නමුදු ඒ සම්පත්තිය ද අනුජාත පුත්‍රයා විසින් බහුමාන නොකරන්නේ ය.

7. මවුපියන් ආදී වැඩිමහල්ලන්ගේ අදහස් නොබලා යම් කිසි ආශ්චරයමත් වූ කාර්යයක් කළත් හිතුවක්කාරයෙක් යයි නෑයෝ පවා ඔහුට නින්ද කරති.

8. එමනිසා උඩඟු නොවී චපල නොවී ඥානවන්තව, සංයම වූ ඉඳුරන් ඇතිව වැඩ කරන පුත්‍ර තෙමේ ප්‍රශංසාවක් ම ලබයි. හැම අතින්ම ප්‍රශංසාවට පැමිණේ.

9. ඕ ශ්‍රද්ධා සුමනාවෝ මවුපියන්ට නොදන්වා පැමිණි නිසා මෙතෙක් දුක් අනුභව කළාය. ඉක්බිති එහි සිටි ඇය දිව්‍ය මනුෂ්‍යයන් අතර සැරිසරණ ශක්‍රයා දක මෝ තොමෝ ශ්‍රද්ධාවත් ය. තුනුරුවන්හි ඇලුණි යයි සිතා මහළු වෙසකින් බත් මුලක් රැගෙන ඇයගේ ඉදිරිපිට පහළව ඇයගේ සමීපයට ගොස් කොහි යන්නෙහි ද මෑණියෙනියි විචාළේය. ඇය අනුරාධපුරයට යමියි කී කල්හි ශක්‍ර තෙම තිට අධික බඩගිනි වෙහි, මේ බත් අනුභව කරවයි බත්මුල දුන්නේය. ඕ තොමෝ බත් මුල රැගෙන මෙතැන ජලය නැතැයි කියා සිටියා ය. ශක්‍රයා එයට නුදුරු තන්හි පිපීගිය එක් පොකුණක් දක්වීය. ඕ තොමෝ පොකුණට ගොස් නා බත් මුලගෙන අත සෝදා සිට කල් බලා තවම පෙර බත යයි දන කල් දන්වීය. මෙය අසා තලගුරු මුහුදු පව්වෙහි වාසය කරන ධම්මදින්න තෙරුන් වහන්සේ නිරෝධ සම්පත්තියට සමවැද සත්වැනි දිනයෙහි නිරෝධ සමාපත්තියෙන් නැගිට පා සිවුරු ගෙන ඇගේ ඉදිරියෙහි ප්‍රකට විය. ඉක්බිති ඕ තොමෝ තෙරුන් දැක සතුටු සිතින් පාත්‍රය රැගෙන බත් පුරවා තෙරුන්ට දී ස්වාමීනි, මොහොතක් වැඩ සිටිනු මැනවයි කියා සැඟවුණු තැනකට පිවිස කොළ අතු ඇඳ ඇඳන් සිටි වස්ත්‍රය සෝද සුඹුලුවක් කොට දුන්නීය. තෙරුන් වහන්සේ ඕ තොමෝ මා බලාවයි අධිෂ්ඨාන කොට වත් සුඹුලුවෙහි පාත්‍රය තබා අහසට පැන නැගී විහාරයටම වැඩි සේක.

ඕ තොමෝ තෙරුන් වහන්සේ වඩිනු දක ප්‍රීතියෙන් පනාගිය ශරීර ඇත්තී දර්ශන පථය ඉක්මෙත්ම පසඟ පිහිටුවාට වැඳ දී ඉතිරි වූ බත් අනුභව කොට අනුරාධපුර මගට පිළිපන්නීය.

10. එකෙණෙහි ඒ නුග ගසෙහි අධිගෘහිත දෙවියා එක් පසුම්බියක දිව්‍ය වස්ත්‍ර 8ක් තබා එක් පැත්තක දිව්‍යමය බතක් ද තබා දිව්‍යමය කැවිලි වර්ගයෙන් පුරවා සුදුසු වාහනයකට නැඟී එය එහි තබා ගෙන ගැල පදවමින් ඇට නුදුරු තන්හි පෙනී සිට මෑණියෙනි, කොහි යන්නෙහි දැයි විචාළේය. ඈය විසින් අනුරාධපුරයට යමි යි කී කල්හි එසේ නම් එන්න. මේ ගැලෙහි වාඩිවෙන්න. මම ද එහි යමියි ඕ තොමෝ මැනවි ආර්යය, ඔබ සමග පසුව එමි. කොළ අතු ඇඳ රියෙහි නගින්නට නොහැකි යයි කීවා ය. ඉක්බිති හේ ඇයට එක් දිව්‍ය වස්ත්‍රයක් දුන්නේය. මෙය ඇඳගෙන රියට නගින්න. ඕ තොමෝ එය ඇඳගෙන රියට නැංගාය. ඒ රිය දෙවියන්ගේ ආනුභාවයෙන් මොහොතකින්ම සෑගිරියට පැමිණියේය. එකල්හි දිව්‍ය පුත්‍ර තෙම සකුරා පූ සියඹරාව සමීපයෙහි ගැල නතර කොට මෙතැන් මතු මට යා නොහැකියි කියා පසුම්බිය ඇයට දී අතුරුදහන් විය. එකල්හි සකුරු පූ සියඹරාවෙහි වාසය කරන දේවාතාවා ඒ පසුම්බිය රැගෙන යන්නිය දක වතාවත් කරන්නෙකු මෙන් වී ඇගේ ඒ සියල්ල ගෙන අනුරාධපුරට පැමිණ මහා පාලියෙහි වාසය කරන භික්‍ෂූන් දක සතුටු සිත් ඇත්තේ පස්මහ ආවාසයෙහි නොයෙක් සිය ගණන් භික්‍ෂූන්ට ද භික්‍ෂුණීන්ටද දිව්‍යමය රස කැවිලිද දිව්‍යමය සාධක ද දුන්නේය.

11. එකල්හි රජතුමා විහාරයට යන්නේ මහා පාලි දන්සැලෙහි වූ මේ සියල්ල දක සතුටු සිතැතිව කවරෙකු විසින් මෙය දෙන ලද්දේදැයි විචාළේය. මිනිස්සු ශ්‍රද්ධා සුමනාව විසින් දුන් බව කීවාහුය. රජතුමා ඇය කැඳවා දන් උපකරණ ලැබුණු සැටි විචාළේය. ඕ තොමෝ ඒ සියල්ල විස්තර කොට කීවාය. රජතුමා ඇයට සතුටුව තමන්ගේ අග මෙහෙසුන් බවෙන් අභිෂේකය දුන්නේය.

ඕ තොමෝ අභිෂේකයට පැමිණ රජතුමා ආදි කොට ඇති සියළු නුවර වැසියන්ට දිව්‍ය වස්ත්‍ර දුන්නීය.

දිව සළු අට ගෙවීමකට (නිමාවට) නොගියේය. ඕ තොමෝ එතැන් පටන් දන් දීම් ආදී පින්කම් කොට දිව්‍ය ලෝක පරායණ වූවාය.

12. පින්වත්නි, ජනයන්ගේ ශ්‍රද්ධා බලය බලව්! දෙවියෝ මෙලොව දීම ඔහුට ගරුසත්කාර කරති. දෙව් - මිනිසුන් අතර ඉපද විඳිනු ලබන මහත් වූ සම්පත්තිය ගැන කියනුම කවරේද?

**10. ශ්‍රද්ධාසුමන කථා වස්තුව නිමි.**

**සයවැනි උත්තරොලිය වර්ගයයි.**

**රසවාහිනී වනරත්න ව්‍යාඛ්‍යා**

**ප්‍රථමභාගය නිමි.**